


ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

# වාර්ෂික වාර්තාව

2017

# අන්තර්ගතය


| | |
|---|---|
| තේමාව | 05 |
| ආයතනික තොරතුරු | 07 |
| අපගේ උත්සාහයන්හි අභිමථාර්ථය | 10 |
| මූල්‍ය සුවිශේෂතා | 12 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 14 |
| අපගේ නායකත්වය | 17 |
| අපගේ ව්‍යාපාරයේ සක්‍රියතාවන් | 28 |
| ආයතනික ව්‍යුහය | 30 |
| කළමනාකාරීත්වයේ විමසුම | 31 |
| කාර්යසාධන සාරාංශය | 41 |
| ආයතනික පාලනය | 48 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 56 |
| අවදානම් කළමනාකරණ වාර්තාව | 61 |
| විගණන කමිටු වාර්තාව | 68 |
| මූල්‍ය ප්‍රකාශන | 71 |
| විගණන වාර්තාව | 106 |
| දස වසරක සාරාංශය | 140 |





# ශ්‍රී ලංකාවේ ජීව බලය

ඉහළ ජීවන තත්වයක් සහිතව තිරසාර රටක් බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාව සිය සංවර්ධන න්‍යායපත්‍රය සමඟ ඉදිරියට ගමන් කරන විට ගෙවී යන සෑම වසරක් පාසාම එහි බලශක්ති අවශ්‍යතාවන් ඉහළ ගොස් ඇත. රටේ එම සමස්ත බලශක්ති ප්‍රමාණයෙන් ප්‍රධාන කොටසක් සමන්විත වන්නේ ඛනිජ තෙල් නිෂ්පාදනවලිනි. කෙසේවුවද, දැනට කැණීම් මඟින් ලබාගත හැකි ස්වාභාවික ඛනිජ තෙල් සම්පත් නොමැති බැවින් ප්‍රවාහන ක්ෂේත්‍රයට මුළුමනින්ම පාහේ සහ විදුලිබල ක්ෂේත්‍රයට ද්විතියක වශයෙන් සිය ඉන්ධන ලබාගැනීමට සිදුව ඇත්තේ දැනට ඒ සඳහා ක්‍රියාකාරීව කටයුතු කරන ඉන්ධන සැපයුම්කරුවන් දෙදෙනාගෙන් වන අතර, ඒ අතරින් ප්‍රධාන සැපයුම්කරු වනුයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවයි (CPC).

සෙසු ගැටලු අතරින් බලශක්තිය සහ මූල්‍ය යන අංශ දෙක සම්බන්ධයෙන් ලෝකය අර්බුදයකට මුහුණ දී සිටින අතර, මේ අංශ දෙකම එකට එක්ව ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරීත්වයට තදබල ලෙස බලපෑම් එල්ල කරමින් ඉහළ ආර්ථික පීඩනයක් යටතේ ජනතාවට ඛනිජ තෙල් නිෂ්පාදන ලබාදීමේ අභියෝගය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හමුවේ තබා ඇත. එය සැමවිටම කටයුතු කරනුයේ මිල සම්බන්ධයෙන් සිදු වන සුළු වෙනසකින් පවා එක් අතෙකින් සියලු ජනතාවගේ ජීවිත සහ ජීවන රටාවන් කෙරෙහිද, අනෙක් අතට ක්ෂේත්‍රය කෙරෙහිද විශාල වශයෙන් බලපෑම් ඇති කළ හැකිය යන කරුණ සැලකිල්ලට ගනිමිනි. රටේ සමස්ත සංවර්ධන ක්‍රියාදාමය ඛනිජ තෙල් නිෂ්පාදන සපයාගැනීමේ හැකියාව සහ ඒවායේ මිල කෙරෙහි දක්වන සංවේදීතාව පිළිබඳ අවබෝධය අනුව, ගෙවී ගිය වසර තුළදී ජනතාව කෙරෙහි අනවශ්‍ය පීඩනයක් එල්ල නොවන බව සහතික කරගැනීම සඳහා ලාභ සම්බන්ධයෙන් ආකර්ෂනීය නොවන වසරක් ලෙස එය සැලකීමට සිදු විය. දැරිය හැකි මිලට ඉන්ධන සැපයීම සඳහා වන එහි අරමුණ සාක්ෂාත් කරගැනීමට කැපවීම, සැලකිල්ල සහ ඉදිරිදැක්මක් සහිතව එය අඛණ්ඩව කටයුතු කරනුයේ එසේ නොවුවහොත් දේශීයව අස්ථාවර වන බව හොඳින්ම දන්නා බැවිනි. එබැවින්, විමසුමට ලක් කෙරෙන වසර තුළදී එය ලාභ නොතකා කටයුතු කරමින්, ශ්‍රී ලංකාව බලශක්තියෙන් සවිමත් කිරීම සඳහා වන සිය කාර්යභාරය අධිෂ්ඨානශීලී ලෙස ඉටු කළේය.

# ආයතනික තොරතුරු





| | |
|---|---|
| ආයතනයේ නම | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| නීතිමය ස්වරූපය | 1961 වසරේ අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද පොදු සංස්ථාවකි |
| ලියාපදිංචි කාර්යාලය | 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09. |
| දුරකථන | +94 11 5455455 |
| විදුලිපණිවුඩ | "LANKA OIL" |
| කේබල් | CEYPETCO |
| ටෙලෙක්ස් | 21235 CEYPETCO CE |
| ෆැක්ස් | +94 11 5455400 |
| ඊමේල් | cpcsec@ceypetco.gov.lk |
| වෙබ්අඩවිය | www.ceypetco.gov.lk |
| බදු ගෙවීම් අංකය | 409000053 |
| වැට් බදු ලියාපදිංචි අංකය | 409000053 - 7000 |
| මූල්‍ය වර්ෂය | ජනවාරි 01 සිට දෙසැම්බර් 31 |
| සභාපති | දම්මික රණතුංග මහතා |
| කළමනාකාර අධ්‍යක්ෂ | එන්. ආර්. ආර්. ජයසේකර මහතා |
| අධ්‍යක්ෂවරු | කේ. ඒ. විමලෙන්තිරරාජා මහතා<br>ආර්. ඒ. එන්. ජයසුන්දර මහතා<br>ඒ. ටී. බණ්ඩාර හේරත් මහතා<br>එස්. ධනතුංග මහතා<br>ඩබ්ලිව්. එස්. පෙරේරා මහතා |
| අනුබද්ධ සමාගම | සීමාසහිත ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, නිමාව, කොලොන්නාව. |
| විගණකවරු | විගණකාධිපති |
| බැංකුකරුවන් | මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව,<br>ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව,<br>නේෂන්ස් ට්‍රස්ට් බැංකුව |

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම

**ඊ. ඒ. එස්. එදිරිසිංහ මහතා**
වැඩ බලන පිරිපහදු කළමනාකරු

**වී. එන්. වීරසූරිය මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මූල්‍ය)

**ඩබ්ලිව්. එම්. කේ. ආර්. බී. වික්‍රමසිංහ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)

**එම්. ඒ. ඩී. මල්ලිකාරච්චි මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(තාක්ෂණික සේවා හා ආයතනික කටයුතු)
(වැඩ බලන)

**එස්. ඩබ්ලිව්. ගමගේ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් සහ පරිපාලන)

**එම්. කේ. ගරුසිංහ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(වාණිජ හා සැපයුම් ජාලය)

**එල්. පී. එම්. ආර්. පෙරේරා මහතා**
නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු
(විදුලි හා උපකරණ)

**ඩී. එම්. පී. දිසානායක මහතා**
නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු
(නඩත්තු හා ව්‍යාපෘති)
(වැඩ බලන)

## කළමනාකාරීත්ව කණ්ඩායම

### තෙල් පිරිපහදුව

පිරිපහදු කළමනාකරු
(වැඩ බලන)
**ඊ. ඒ. එස්. එදිරිසිංහ මහතා**
BSc Eng. (Chemical Engineering), C.Eng. (Chemical), MIE(SL), MSLEMA

නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු
(නඩත්තු හා ව්‍යාපෘති) (වැඩ බලන)
**ඩී. එම්. පී. දිසානායක මහතා**
BSc Eng. (Mechanical Engineering) Hons., LLB Hons., C.Eng., MIE(SL), Attorney-at-law

නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු
(විදුලි හා උපකරණ)
**එල්. පී. එම්. ආර්. පෙරේරා මහතා**
BSc Eng. (Electronics & Telecommunication Engineering) Hons.

නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු
(තාක්ෂණික සේවා)
**සී. වීරසේකර මහතා**
BSc (Eng.), C.Eng., MIE (SL)

### තාක්ෂණික සේවා හා ආයතනික කටයුතු

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(තාක්ෂණික සේවා හා ආයතනික කටයුතු) (වැඩ බලන)
**එම්. ඒ. ඩී. මල්ලිකාරච්චි මහතා**
BSc Eng. (Production), MPMI, MIE(SL)

කළමනාකරු
(මෙහෙයුම් - තොග හා පර්යන්ත මෙහෙයුම්)
(වැඩ බලන)
**එන්. බී. එම්. පී. ජීවසිරි මහතා**

### ගුවන් මෙහෙයුම්

කළමනාකරු
(ගුවන් - මෙහෙයුම්) (වැඩ බලන)
**ආර්. විජයකුමාර් මහතා**
EDBA - Colombo

### ඉංජිනේරු හා පරිශ්‍ර

කළමනාකරු
(ඉංජිනේරු හා පරිශ්‍ර)
**ජී. පී. කේ. විජේකෝන් මහතා**
BSc Eng. (Civil Engineering), AMIE (SL), PG Dip in Structural Engineering Designs

## මූල්‍ය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මූල්‍ය)
**වී. එන්. වීරසූරිය මහතා**
B.Sc. (USJP), MBA (PIM), ACA, FCMA, ASA (Aus)

ජ්‍යෙෂ්ඨ කළමනාකරු
(මූල්‍ය)
**එම්. සී. ඩී. පෙරේරා මෙනෙවිය**
ACA, BCom (Sp) Hons

කළමනාකරු
(තොරතුරු තාක්ෂණ)
**එම්. එස්. ආර්. ප්‍රනාන්දු මිය**
BSc (Computer Science) Hons. – Colombo, MIT (IT Management)– Colombo, EMBA - Colombo

## නීති

ප්‍රධාන නීති නිලධාරී
**ආර්. ඒ. කේ. සී. ආරියරත්න මිය**
Attorney-at-law, Post Attorney Diploma in International Law

## ආරක්ෂක හා විමර්ශන

කළමනාකරු
(ආරක්ෂක හා විමර්ශන)
**මේජර් එම්. ආර්. එස්. පී. සමරසිංහ මහතා**
RWP RSP PG Dip in Conflict Resolution & Peace Preparedness, Dip in HRM

## මානව සම්පත්

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් හා පරිපාලන)
**එස්. ඩබ්ලිව්. ගමගේ මහතා**
MBA - PIM-USJP, MSc - WAU-Holland, BSc - Ruhuna, PG Dip B&FA - CASL, Assoc. M (CIPD-UK), FCPM

කළමනාකරු
(මානව සම්පත්)
**කේ. ඩබ්ලිව්. එස්. පුෂ්පලාල් මහතා**
BA (Political Science) Sp. Hons – Colombo, Certified professional member of AHRI – Australia, ACPM

## අලෙවි

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අලෙවි)
**ඩබ්ලිව්. එම්. කේ. ආර්. බී. වික්‍රමසිංහ මහතා**
MBA - Colombo, BSc (Chemistry) - UOP, M.I.Chem.C, CMSLIM

කළමනාකරු
(අලෙවි) (වැඩ බලන)
**ඩබ්ලිව්. ඩී. එල්. සී. අබේගුණවර්ධන මහතා**
BSc (Bus. Admin) – USJP, PGDM (Mgt) - Wayamba

කළමනාකරු
(අලෙවි - ලිහිසි තෙල් හා විශේෂ නිෂ්පාදන)
**පී. එම්. යූ. ඩබ්ලිව්. දොළොස්වල මහතා**

## කෘෂි රසායන

කළමනාකරු
(කෘෂි රසායන)
**බී. එස්. එස්. පෙරේරා මහතා**
MSc (Crop Science) - UOP, BSc (Agriculture) - UOP

## වාණිජ හා සැපයුම් ජාලය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(වාණිජ හා සැපයුම් ජාලය)
**එම්. කේ. ගරුසිංහ මහතා**
BSc - Colombo, MSc (Maritime Affairs) - WMU – Sweden, MBA - PIM-USJP, MICS (UK), MISMM, EDBA - Colombo, Dip in Professional Shipping - Norway

වාණිජ කළමනාකරු
**ඩබ්ලිව්. කේ. එස්. ගුණවර්ධන මහතා**
MSc (Maritime Affairs) - WMU – Sweden, MSc (Mgt & IT) - Kelaniya, BSc. (Mathematics) Sp. (2nd class upper) - Kelaniya, MSLIM

ප්‍රසම්පාදන හා ගබඩා කළමනාකරු
(ප්‍රසම්පාදන හා ගබඩා)
**එස්. ඩී. එස්. රාජපක්ෂ මහතා**
BSc Eng. (Mechanical), C.Eng., PG Dip in Industrial Engineering, Dip in Supplies & Materials Manager

කළමනාකරු
(නැව්ගත කිරීම්)
**පී. ඒ. යූ. ආර්. කරුණාරත්න මහතා**
BSc (Physical Science) – Colombo, Dip in General Management – NIBM, PG Certificate of Training in Management - PIM, Certificate in Shipping & Clearance – ISMM

## අභ්‍යන්තර විගණන

කළමනාකරු (විගණන)
**ආර්. ඒ. ටී. අයි. රණසිංහ මහතා**
ACA, CGMA, ACMA (UK), BSc (Bus Admin) – Sp - USJP

# අපගේ උත්සාහයන්හි අභිමථාර්ථය

## දැක්ම

අපගේ දේශයේ සෞභාග්‍යය උදෙසා දායකත්වය ලබාදෙන අතරම කලාපයේ ඛනිජ තෙල් හා ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි පාරිභෝගික අවශ්‍යතා සපුරන ප්‍රමුඛතම, පරිසර හිතකාමී ව්‍යාපාර ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

සෞඛ්‍යය, ආරක්ෂාව සහ පරිසරය පිළිබඳ ඉහළම අවධානය සහිතව සියලු ක්‍රියාකාරකම්වල ඉහළ සදාචාරාත්මක සම්මතයන් පවත්වා ගනිමින්, සමස්ත සේවක සහභාගීත්වය සහ නව්‍යකරණය සහිතව ව්‍යාපාරයේ දියුණුව සහ වර්ධනය උදෙසා ඉහළ තාක්ෂණ පදනමක් උපයෝගී කරගන්නා අතරම, කැපවීමෙන් යුතු වෘත්තිකයින් කණ්ඩායමක් සහ විශ්වාසවන්ත මෙන්ම කාර්යක්ෂම නියෝජිත ජාලයක් ඔස්සේ ඛනිජ තෙල් පිරිපහදුකරණයේද, ඉහළ ගුණාත්මකබවින් යුතු නිෂ්පාදන විකිණීම සහ අලෙවිය සම්බන්ධයෙන්ද විශිෂ්ඨතාව අත්පත් කරගනිමින්, පාරිභෝගික අපේක්ෂාවන් ඉක්මවා යන පූර්ණ විසඳුම් සහ සේවාවන් සැපයීම.



# ඉලක්ක

- වෙළෙඳපොළ කොටස ඉහළම මට්ටම පවත්වාගැනීම
- තරඟකාරී වෙළෙඳපොළක් තුළ විකිණුම්, අලෙවි සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධ විශිෂ්ටතාව අත්පත් කරගැනීම
- කලාපයේ බලශක්ති කේන්ද්‍රස්ථානය බවට ශ්‍රී ලංකාව පත්කිරීම සඳහා දායකත්වය සපයන ප්‍රමුඛතමයා බවට පත්වීම
- කාර්යමණ්ඩලයේ සියලු මට්ටම්වල වෘත්තීයභාවයේ ඉහළ මට්ටම් වැඩිදියුණු කිරීම සහ පවත්වාගැනීම
- ඵලදායීතාව සහ කළමනාකරණය ඉහළ නැංවීම සඳහා ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකිරීම
- අපේක්ෂිත ප්‍රමිතීන් ඉක්මවායෑම සඳහා සෞඛ්‍යය, ආරක්ෂාව සහ පරිසර හිතකාමීත්වය සම්බන්ධ පියවර ගැනීම
- ජනසමාජය වඩා යහපත් කිරීම සඳහා වන ජාතික සහ සමාජ වගකීම් ඉටුකිරීම
- ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා දැවැන්ත දායකත්වයක් සපයන්නා බවට පත්වීම
- ඛනිජ තෙල් අංශයේ ශ්‍රී ලාංකේය පාලනය රඳවාගැනීම



# මූල්‍ය සුවිශේෂතා

## මෙහෙයුම් ප්‍රතිඵල

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| ආදායම | 490,381 | 525,182 | 376,734 | 423,061 | 446,502 |
| විකුණුම් පිරිවැය | -464,374 | -499,956 | -337,119 | -326,441 | 418,961 |
| දළ ලාභය | 26,007 | 25,226 | 39,615 | 96,620 | 27,541 |
| ශුද්ධ මෙහෙයුම් වියදම් සහ පොලිය | -33,897 | -24,532 | -59,501 | -27,067 | -24,174 |
| බදු පෙර ලාභය/අලාභය | -7,890 | 694 | -19,886 | 69,553 | 3,367 |

### ආදායම

| | 2016 | 2017 |
|---|---|---|
| % | 100% | 100% |
| | රු. මි. 423,061 | රු. මි. 446,502 |

### විකුණුම් පිරිවැය

| | 2016 | 2017 |
|---|---|---|
| % | 77% | 94% |
| | රු. මි. 326,441 | රු. මි. 418,962 |

### දළ ලාභය

| | 2016 | 2017 |
|---|---|---|
| % | 23% | 6% |
| | රු. මි. 96,620 | රු. මි. 27,541 |

**ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය - ප්‍රමාණයන් ලීටර් මිලියන**

| වසර | පෙට්‍රල් | ඩීසල් | භූමිතෙල් |
|---|---|---|---|
| 2013 | 785.21 | 1,842.74 | 142.32 |
| 2014 | 831.36 | 2,077.16 | 138.51 |
| 2015 | 993.75 | 1,866.54 | 155.63 |
| 2016 | 1,123.33 | 2,216.64 | 167.41 |
| **2017** | **1,210.23** | **2,269.11** | **198.09** |

## ඛාණ්ඩ ලාභදායීත්වය

**ප්‍රවාහනය**
රු. මි. (27,778)

**බලශක්ති උත්පාදනය**
රු. මි. 19,004

**ගුවන්ගමන්**
රු. මි. 1,930

**කර්මාන්ත (සමස්ත)**
රු. මි. 3,795

**ගෘහස්ථ**
රු. මි. (5,201)

**තාර**
රු. මි. (13)

**ලිහිසි තෙල්**
රු. මි. 162

**කෘෂි රසායන**
රු. මි. (121)

**සමස්ත ව්‍යාපාර ඛාණ්ඩ**
රු. මි. (8,371)

**මූල්‍ය ආදායම**
රු. මි. 11,067

**වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)**
රු. මි. 670

**ආදායම් බදු**
රු. මි. (1,898)

**කාලපරිච්ඡේදය සඳහා ලාභය**
රු. මි. 1,470

## අනුපාත

| **අනුපාත** | **2016** | **2017** |
|---|---|---|
| දළ ලාභ අනුපාතය | 22.8% | 6.2% |
| මෙහෙයුම් ලාභ අනුපාතය | 19.2% | 1.74% |
| ශුද්ධ ලාභ අනුපාතය | 12.5% | 0.3% |
| **සමස්ත වත්කම් මත ලැබීම්** | **27.75%** | **0.7%** |

| | **සංස්ථාව** | | **සමූහය** | |
|---|---|---|---|---|
| | **2017** | **2016** | **2017** | **2016** |
| | Rs. Mn | Rs. Mn | Rs. Mn | Rs. Mn |
| **වසර සඳහා ලාභය / (පාඩුව)** | 1,469.627 | 53,027.081 | 3,999.545 | 54,439.000 |



# සභාපතිතුමාගේ පණිවුඩය

පසුගිය වසර කිහිපය තුළදී ඛනිජ තෙල් ක්ෂේත්‍රය අවිනිශ්චිතතාවන් රැසකට මුහුණදෙමින් සිටි අතර, 2016 වසර අවසාන වන විට එය නැවත යථා තත්වයට පත් වන ලකුණු දැකගත හැකි විය. ගෝලීය වශයෙන් පැවති මේ ප්‍රවණතාව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් ව්‍යාපාර කටයුතු කෙරෙහි මෙන්ම සමස්ත වශයෙන් රට කෙරෙහිද බලපෑවේය. මෙම කාලය අතරතුරදී, මහා පරිමාණ පිරික්සුම් හා සංවර්ධන ව්‍යාපෘති අතරින් බොහොමයක වැඩකටයුතු පමාවීම සහ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ඉල්ලුම ඉහළ යෑම මඟින් දේශීය වෙළෙඳපොළ කෙරෙහිද බලපෑමක් එල්ල වූ අතර, එමඟින් මිල ඉහළ යෑමක් සිදුවිය. වැඩිවූ මිල හේතුකොටගෙන ඇතිවූ මූල්‍ය පීඩනය දරාගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදුවිය. ඒ අනුව, සංස්ථාවේ සමස්ත කාර්යසාධනයට ආනයන වියදම් ඉහළ යෑම මෙන්ම දේශීය විනිමයෙහි අගය අඩුවීම මඟින්ද විශාල වශයෙන් බලපෑම් එල්ල විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අදායමෙහි 5%ක ඉහළයෑමක් හිමිකර ගන්නා ලද නමුදු, ලාභයෙහි 97%ක පහත වැටීමක් ඇති විය.

**බලශක්ති ප්‍රවණතා වෙනස්වීම සහ පොසිල ඉන්ධන කර්මාන්තය**

බලශක්තිය සඳහා විශේෂයෙන්ම ආසියාවේ නව ආර්ථික රටාවන් තුළ ඇති ඉල්ලුමෙහි ඉහළ යෑමක් සිදුව පවතින අතර, ගෝලීය බලශක්ති ක්‍රම ආශ්‍රිත අවධානය වඩාත් පුනර්ජනනීය සම්පත් වෙත කැපීපෙනෙන ලෙස යොමුව ඇත. සුසමාදර්ශ වෙනසක් ඇතිකිරීමට කැපවූ, පූර්ණ වශයෙන් රජයට අයත් ව්‍යාපාර ආයතනයක් වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමාජයේ සහභාගීත්වය සහිතව තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ඉලක්ක සපුරාලීම වෙනුවෙන් මුළුමනින්ම කැපවී සිටියි. එහිදී සිදු කෙරෙන වෙනස මඟින් පොසිල ඉන්ධන කර්මාන්තය කෙරෙහි ඇති කරන ලද බලපෑම සුවිසල් වන අතර, නුදුරු අනාගතයේදී එය තව තවත් ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. ඛනිජ තෙල් මිල ගණන් සම්බන්ධ විචල්‍යතාව හැරුණු විට, කර්මාන්ත යුගයෙන් තිරසර යුගයට යොමුවීම සඳහා ගෝලීය වශයෙන් ඇතිව පවත්නා නැඹුරුව අවධානයට ලක් කළ යුතුව ඇත. පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම සඳහා වන සිය කාර්යභාරය ඉටු කරන අතරම, කාබන් විමෝචනය පහත දැමීම මඟින් සිය සමාජ වගකීම උපරිම වශයෙන් ඉටුකිරීමටද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කටයුතු කර ඇත.

කෙසේවුවද, ක්ෂය වෙමින් පවතින ප්‍රභවයකින් පුනර්ජනනීය සම්පත් සමුදායක් වෙත යොමුවීමක් සිදු වන අනාගතයන් මේ වන තුරුත් නිසි පරිදි හඳුනාගෙන නැති අතර, එමඟින් ඉදිරි වසර කිහිපය තුළ තිරසර ලොවක ඛනිජ තෙල් නිෂ්පාදන සම්බන්ධ තත්වය සහ අදාළත්වය පිළිබඳ පිළිතුරු සැපයිය යුතු බරපතළ ප්‍රශ්න මතු කෙරෙයි. පොසිල ඉන්ධන ආනයනය හා විනිමය ශක්තිය සම්බන්ධයෙන් ඉහත සඳහන් කරන ලද බාහිර කරුණු සහ තිරසාරත්ව බලපෑම මඟින්, සංස්ථාව



හමුවේ දැනටමත් පවතින අපහසුතා තවදුරටත් උග්‍ර කරනු ඇත.

මෙහිදී ගන්නා ලද වැදගත් පියවරක් වූයේ කලක් තිස්සේ දැඩි අවශ්‍යතාවක්ව පැවති පිරිවැය මත පදනම් වූ මිල යාන්ත්‍රනයක් වූ අතර, පොදු මහජනතාව ඇතුළු බලපෑමට ලක්වූ සියලු පාර්ශ්වයන් ප්‍රමාණාත්මකව සහ එක සමානව නියෝජනය වන පරිදි එම මිල යාන්ත්‍රනය සකසනු ලැබ ඇත.

**ශ්‍රී ලංකාවේ මෙහෙයුම් සන්දර්භය**

විමසුමට ලක් කෙරෙන වසර සඳහා අදාළ වන පරිදි පෙර වසරට සාපේක්ෂව ආර්ථික වර්ධනයෙහි 4.5%ක සිට 3.1%ක් දක්වා පහත වැටීමක් මහබැංකු සංඛ්‍යාලේඛන මඟින් දැක්වෙයි. බදු වශයෙන් රු. බිලයන 146ක් ගෙවීම සහ සහන මිල ගණන් සහිතව දැයට ඉන්ධන සැපයීම මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ජාතික සංවර්ධනයට සුවිසල් දායකත්වයක් සපයා ඇත.

එසේම, 2016 වසරේ පැවති දැඩි දේශගුණ තත්ව 2017 වසර දක්වාද බලපෑම් එල්ල කළ බැවින් කෘෂිකර්ම අංශය 0.8% කින් හැකිළීමට ලක්විය. වසර පුරා රුපියලෙහි සාපේක්ෂ ස්ථාවරත්වයක් පැවතිණි. විමසුමට ලක් කෙරෙන වසරේ පළමු මාස දෙක තුළදී එල්ල වූ පීඩනය පහත දැමීම සඳහා රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළේ විදෙස් ආයෝජන වැඩිකිරීමට රජය විසින් පියවර ගෙන ඇති අතර, අපනයන ක්‍රියාවලීන් ආශ්‍රිත විනිමය ඉහළ යෑම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ආධාර ලැබීම වැනි තත්වයන්ද ඇති විය. විමසුමට ලක් කෙරෙන වසර තුළදී ඇතිවූ මෙවැනි තත්වයන් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමට මහත් සේ වැදගත් වී ඇත.

**ශ්‍රී ලංකාවට ජවබලය**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රජයට අයත් ප්‍රධානතම ක්‍රමෝපායයික ව්‍යාපාර ආයතනයක් (SoSE) වන අතරම සංවර්ධන ප්‍රතිපත්ති, නීතිරීති සහ ක්‍රමවේද සම්බන්ධයෙන් ජනතාවගේ ජීවිත මත පැටවී ඇති බර අඩු කිරීම සහ සියලු අංශවල වර්ධනයක් ඇතිකිරීම සඳහා රජයට හැකි වන පරිදි වැදගත් වූත්, අවිවාදාත්මක වූත් කාර්යභාරයක් ඉටු කරයි. එබැවින්, ජනතාවට බර නොපැටවෙන පරිදි වෙළෙඳපොළේ අර්බුදකාරී තත්වයන් සහ දුර්වල වෙමින් පැවති විනිමය තත්වයන් හමුවේ කටයුතු කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදුවිය. සංස්ථාවේ මෙම මූලික ප්‍රතිපත්තිය සහ හර වටිනාකම් නිසා විමසුමට ලක් කෙරෙන වසර තුළදී ලාභ සම්බන්ධයෙන් ඉතා බරපතළ පහත වැටීම් සහ වසර පුරාම දැඩි තීරණ ගැනීමට සිදුවිය.

පිරිපහදුව මඟින් කලින් වසරේ පැවති බොර තෙල් මෙට්‍රික් ටොන් 1,639,047 ප්‍රමාණයේ සිට මේ වසරේදී බොර තෙල් මෙට්‍රික් ටොන් 1,950,000ක ප්‍රමාණයක් සකසනු ලැබිණි. සියලු ඉන්ධන, තෙල් සහ වායු සඳහා ඉල්ලුම 11.01%කින් ඉහළ ගිය නමුදු, කලින් සඳහන් කළ බාහිර කරුණු හේතුවෙන් පිරිවැය

28%කින් ඉහළ ගියේය. රටට අවශ්‍ය සැපයුම් අඛණ්ඩතාව පවත්වාගැනීම සඳහා පිරිපහදු කළ නිෂ්පාදනවල හිඟය පිරිපහදු කළ නිෂ්පාදන ආනයනය මඟින් පුරවනු ලැබිණි.

දීර්ඝ කාලයක් තිස්සේ පැවති නියඟය හේතුවෙන් ජලවිදුලි බලය හිඟවීම නිසා විදුලිබල ක්ෂේත්‍රය තුළ ඉල්ලුම කැපීපෙනෙන ලෙස ඉහළ යෑමත් සමඟ සියලු අංශවලින් ඇතිවූ ඉල්ලුම ඉහළ යෑමෙන් පෙර වසරට සාපේක්ෂව මෙම වසරෙහි ආදායම රුපියල් බිලියන 423 සිට රුපියල් බිලියන 445 දක්වා රුපියල් බිලියන 23ක ඉහළ යෑමක් ඇති විය. කෙසේවුවද, ලාභයන්හි සමස්ත පහළ වැටීම විශේෂ අවධානයට ලක් විය යුතු තත්වයක් වන අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරි වසරවලදී ප්‍රමාණවත් පරිදි පිළියම් යෙදිය යුතුව ඇත.

**සංවර්ධනයේ කැපීපෙනෙන අවස්ථා**

ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් සේවය සලසන අතරම, ඛනිජ තෙල් ක්ෂේත්‍රය තුළ පූර්ණ වශයෙන් යෙදීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදුකළ යුතුව පැවති අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු ගණනාවක් තිබිණි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉතා ඉහළ විනිවිදභාවයකින් යුතුවූ ශූන්‍ය විචල්‍යතා මත පදනම් වූ අයවැය යාන්ත්‍රණයක් සකසන ලද අතර, මූල්‍ය දර්ශකයන් නිරන්තරව අධීක්ෂණය කිරීම සහ ඉහත සඳහන් කරන ලද බාහිර සාධකවල අයහපත් බලපෑම නිශේධනය කිරීම සඳහා ත්‍රෛමාසිකව ගන්නා ලද පියවර එයට ඇතුළත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඒ වන විට ක්‍රියාත්මක කළ යුතුව පැවති ව්‍යාපෘති වඩාත් බලගන්වන ලද අතර, එමඟින් තිරසර සංවර්ධනය වෙත යොමු කරනු ලැබිණි. ජාත්‍යන්තර මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සහ ආනයනය කරන ලද ගුවන් තෙල් සඳහා ගෙවීමට සිදුවූ අමතර වියදම් පහත දැමීම සඳහා ගුවන් තෙල් (ජෙට් ඒ-1) පර්යන්තයේ පෙරණයන් සවිකිරීම සඳහා දිගු කලක් තිස්සේ ක්‍රියාත්මක කිරීමට නියමිතව පැවති ව්‍යාපෘතිය ඇරඹීමට අවශ්‍ය සැලසුම් සිදුකරන ලද අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ලැබිණි. රටේ තාර වෙළෙඳපොළෙහි දැවැන්ත වෙළෙඳපොළ කොටසක් හිමිකර ගැනීම සඳහා පිරිපහදුව විසින් තාර සැකසුම් අංගනය වැඩිදියුණු කිරීමේ කටයුතු පුළුල් ලෙස සැලසුම් කරනු ලැබිණි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පුළුල්කිරීම් කටයුතු හා සමගාමීව සිදුකිරීමට සැලසුම් කරන ලද ගුවන් තොටුපොළේ ඉන්ධන නළ පද්ධතිය සම්බන්ධ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන අදියර වසර තුළදී සම්පූර්ණ කිරීමට හැකි විය.

**ඉදිරි ගමන් මඟ**

අප කැපවී සිටින්නේ ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම සහ අනර්ඝත්වයෙන් යුතු ඛනිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව සැපයුම පවත්වා ගැනීම සඳහාය. මේ කටයුත්තේදී අපගේ වටිනාකම් ජාලය ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම, එහි දිවයින පුරා ව්‍යාප්ත පිරවුම්හල් ජාලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන් දක්වා ඉහළ නැංවීම සඳහා අපි කටයුතු කරන්නෙමු. එයට අමතර වශයෙන්, අපගේ පිරිපහදු පහසුකම් වැඩිදියුණු කිරීමට සහ පුළුල් කිරීමට කටයුතු කරන අතරම, කොළඹ වරාය සහ කොලොන්නාව අතර දිවෙන නළ මාර්ග අලුත් කිරීම සඳහා 2016 වසරේදී අරඹන ලද කටයුතු සම්පූර්ණ කිරීමටද අපි කටයුතු කරන්නෙමු.

මෙවැනි උත්සාහයන් දරන නමුදු, දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් පවතින විචල්‍ය පරිසරය සහ ආහාර, බලශක්තිය, කාලගුණය සහ එහි ප්‍රධාන ව්‍යාපාර සඳහා වන මූල්‍ය තත්වයන් සම්බන්ධයෙන් දැනට පවතින අර්බුදකාරී තත්වය මඟින් ඇති කෙරෙන බලපෑම පිළිබඳව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පූර්ණ දැනුවත්භාවයෙන් කටයුතු කරනු ලැබේ. අභියෝග සහ දුෂ්කර තීරණ ගැනීමේ අවශ්‍යතාව ඇති නමුදු, සංස්ථාවට හිමි ස්ථානය පවත්වා ගැනීමට සහ මෙරට සංවර්ධනය රඳා පවතින කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීමට හැකි බව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විශ්වාස කරයි.

**සමාප්තිය**


විශේෂයෙන්ම දේශීය හා ගෝලීය ආර්ථික තත්වයන් හා සංවර්ධන කටයුතු මඟින් එල්ල වූ පීඩනය හමුවේ පවා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිශ්චිත ඉලක්ක සපුරාලීම සඳහා කළමනාකර අධ්‍යක්ෂතුමාගේ මඟපෙන්වීම යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආයතනික කළමනාකරණ කණ්ඩායම වෙහෙස නොබලා කටයුතු කරන ලදී. පැවති අර්බුද විසඳා ගැනීමටත් අපගේ කාර්යශූර සේවා බලකායේ උපරිම විශිෂ්ටත්වය මතුකරගැනීමට මෙන්ම අන්තර් ආයතනික සබඳතා වඩාත් සවිමත් කරගනිමින් අපේක්ෂිත ප්‍රතිඵල සපුරාගැනීමටත් මෙම ආයතනික ප්‍රවේශය උපකාරී විය.

සංස්ථාවේ අභිවෘද්ධිය තහවුරු කිරීම සඳහා ලබාදුන් සහයෝගය වෙනුවෙන් මාගේ ආයතනික කණ්ඩායමට මම අතිශයින් කෘතඥ වෙමි.


සැමවිටම අපගේ ගමනට මඟපෙන්වීම ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ ගරු ඇමතිතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමිය සහ නිලධාරී මණ්ඩලය වෙතින් ලද අතර, සංස්ථාවේ දියුණුව උදෙසා ලබාදුන් ඔවුන්ගේ සහාය කැපවීම වෙනුවෙන් අපගේ හෘදයාංගම ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

අවසාන වශයෙන්, සිය අතිවිශිෂ්ට නායකත්ව මඟපෙන්වීම ලබාදීම සම්බන්ධයෙන් මාගේ කාර්යශූර, පළපුරුදු සහ විශිෂ්ට හැකියාවෙන් යුතු හිතවත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික පිරිසටත් මාගේ ප්‍රසාදය පිරිනමමි. විමසුමට ලක් කෙරෙන වසර මෑත කාලයේදී ගත වූ දුෂ්කරතම කාලපරිච්ඡේදයක් වූ අතර, ඔවුන්ගේ සහාය නොවන්නට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සවිමත් රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස පවත්වා ගැනීමට හැකි නොවන්නට ඉඩ තිබිණි. මේ සමස්ත අමිල මානව ප්‍රාග්ධනය සමඟ ඉදිරියේ ඇති වන ප්‍රවණතාවන් මුළුමනින්ම වෙනස් කරමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව එළඹෙන ඉදිරි කාලයේදී ජයග්‍රාහී ලෙස සාර්ථකත්වයෙන් අතිසාර්ථකත්වය කරා ගෙන යෑමට අපට හැකි වන බව මාගේ විශ්වාසයයි.

ස්තුතියි



**දම්මික රණතුංග**



# අපගේ නායකත්වය



**ආර්. ඒ. එන්. ජයසුන්දර මහතා**
අධ්‍යක්ෂ

**එන්. ආර්. ආර්. ජයසේකර මහතා**
කළමනාකර අධ්‍යක්ෂ

**දම්මික රණතුංග මහතා**
සභාපති



**කේ. ඒ. විමලේන්තිරරාජා මහතා**
අධ්‍යක්ෂ

**ඩබ්ලිව්. එස්. පෙරේරා මහතා**
අධ්‍යක්ෂ

**ඒ. ටී. බණ්ඩාර හේරත් මහතා**
අධ්‍යක්ෂ

**එස්. ධනතුංග මහතා**
අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය



**දම්මික රණතුංග මහතා**
සභාපති

දම්මික රණතුංග මහතා 1981 වසරේදී තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීය ජීවිතය ඇරැඹූ අතර, වසර 37කට අධික කාලයක් පුරා විහිද යන වෘත්තීය විශේෂඥතාවන් රැසක් සහිත සේවා පළපුරුද්දක් ඔහුට ඇත. වර්ෂ 1987 දී ප්‍රවර්ධන කළමනාකරුවකු (වෙළෙඳ හා අලෙවි) ලෙස සිංගර් ශ්‍රී ලංකා සමාගමට බැඳී 1996 දක්වා එහි සේවය කළේය. වර්ෂ 1996 දී, ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ ප්‍රථම ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත්වූ ඔහු, අද ශ්‍රී ලංකා ක්‍රිකට් වෙළෙඳ නාමය යටතේ ක්‍රියාත්මක වන ඵලදායී ආයතනය බවට ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය පත්කිරීම ඉලක්ක කරගත් ආයතනික උපාය මාර්ගික සැලසුම් වැඩිදියුණු කිරීමේ වගකීම ඉසිළීය.

වර්ෂ 2001 - 2013 අතර කාලපරිච්ඡේදය තුළ ඔහු ඇමෙරිකා එක්සත් ජනපදයේ අලෙවි උපදේශකවරයකු, අන්තර්ජාල අලෙවි කළමනාකරුවකු, අන්තර්ජාල අලෙවි අධ්‍යක්ෂවරයකු මෙන්ම අලෙවි හා විද්‍යුත් වාණිජ අධ්‍යක්ෂවරයකු ලෙසද සේවය කළේය.

රණතුංග මහතා ක්‍රිකට් සහ මලල ක්‍රීඩාවලදී විශිෂ්ටතා පළ කරමින් සෑම අතින්ම කැපීපෙනුණු ක්‍රීඩකයකුද විය. ටෙස්ට් සහ එක් දින තරඟවලදී ශ්‍රී ලංකා කණ්ඩායම වෙනුවෙන් ක්‍රීඩා කර ඇත. ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් ඔහු සතුව පැවති පළපුරුද්ද සහ විශේෂඥතාව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රථම ප්‍රධාන විධායක නිලධාරියා බවට පත්වීමට ඔහුට අතිශයින් වැදගත් වූ අතර, වසර 5ක කාලපරිච්ඡේදයක් පුරා ඔහු එම ධූරය දැරීය.

මෙම දශකයේ මුල් භාගයේදී ආපසු සිය මව්බිමට පැමිණීමෙන් පසු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති පදවියට ඔහුව පත් කරනු ලැබිණි. ඔහු ශ්‍රී ලංකා පෝර්ට් මැනේජ්මන්ට් කන්සල්ටන්සි සර්විසස් ලිමිටඩ්, ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සහ මාගම්පුර පෝර්ට් මැනේජ්මන්ට් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනවලද සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ ලෙසද කටයුතු කළේය.

අද වන විට ඔහු බොර තෙල් සහ පිරිපහදු කරන ලද තෙල් ආනයනය, ගබඩා කිරීම සහ පිරිපහදු කිරීම මෙන්ම සැකසූ ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය මඟින් මෙරට බලශක්ති සැපයුම පිළිබඳව වගකීම දරන ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශය යටතේ ඇති ප්‍රධානතම ආයතන වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා සහ ප්‍රවාහන පහසුකම් නඩත්තුව මෙන්ම මෙරට ශක්‍යතාවයෙන් යුතු ස්වභාවික වායු හා බොර තෙල් සංචිත සංවර්ධනය කිරීමේ වගකීමද ඔහු විසින් උසුලනු ලබයි.



## එන්. ආර්. ආර්. ජයසේකර මහතා
කළමනාකාර අධ්‍යක්ෂ

ජයසේකර මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරුවිද්‍යා උපාධියක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධියක් හිමිකරගෙන ඇත. ඔහු වරලත් ඉංජිනේරුවකු මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයකුද වෙයි. එයට අමතරව, ඔහු අබුඩාබියේ ADNOC පිරිපහදු මධ්‍යස්ථානවල (රුවයිස් සහ උම්-අල්-නාර්) පිරිපහදු නඩත්තුව පිළිබඳවද, ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවරදී නඩත්තු කළමනාකරණය පිළිබඳවද, ජර්මනියේ මෑන්හයිම් නුවරදී බලාගාර පුහුණුව හා පුද්ගල සංවර්ධනය පිළිබඳවත් වෘත්තීය වශයෙන් පුහුණුව ලබා ඇති අතර, තවත් එවැනි ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් රැසකටද සම්බන්ධවී ඇත.

සිය වෘත්තීය ජීවිතයේ සැලකිය යුතු කාලයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගත කර ඇති ඔහු, වර්ෂ 1992 - 1995 අතර කාලපරිච්ඡේදයේදී දෝහා කටාර් නුවර රස් අබු එබවුඩ් බලශක්ති මධ්‍යස්ථානයේ ජල සහ විදුලි අමාත්‍යංශයේ ඉන්ධන ඉංජිනේරු තනතුර දැරීය.

සිය වෘත්තීය ජීවිතය ඇරඹූ කාලයේදී ප්‍රථමයෙන්ම ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ උපදේශකයකු ලෙසද, ඉන්පසුව කන්තලේ සීනි කම්හලේ යාන්ත්‍රික ඉංජිනේරුවරයකු ලෙසද කටයුතු කළේය. එයින් අනතුරුව, 1981 වසරේදී යාන්ත්‍රික ඉංජිනේරුවකු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බැඳුණු ඔහු එහි වසර 37ක් සේවය කර ඇත. පසු කාලයේදී නියෝජ්‍ය ඉංජිනේරු කළමනාකරු (බලාගාර උපකරණ), ඉංජිනේරු කළමනාකරු (නඩත්තු), නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නඩත්තු සහ ව්‍යාපෘති) සහ පිරිපහදු කළමනාකරු ලෙසත් උසස්වීම් ලද ඔහු මේ වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි.



## කේ. ඒ. විමලෙන්තිරරාජා මහතා
අධ්‍යක්ෂ

විමලෙන්තිරරාජා මහතාගේ ප්‍රථම උපාධිය ආර්ථික විද්‍යාව සම්බන්ධයෙන් යාපනය විශ්වවිද්‍යාලයෙන් ලබාගෙන ඇත. ඔහු ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධයෙන් පශ්චාත් උපාධියක්ද, මහජන ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධියක්ද, සංවර්ධන අධ්‍යයනයන් හා මහජන ප්‍රතිපත්තිය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක්ද, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීති උපාධියක්ද, නීතිය පිලිබඳ ඇටර්නි සහතිකයක්ද ලබා ඇත. ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ සහතිකයක්ද හිමි කරගෙන සිටින ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකුද වෙයි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ විද්වත් සංසදයේ සාමාජිකයකුද වෙයි.

සිය දීප්තිමත් වෘත්තීය ජීවිතය තුළදී ඔහු ප්‍රධාන රාජ්‍ය තනතුරු රැසක් දරා ඇත. ඔහු ලංකා බැංකුවේ විකල්ප අධ්‍යක්ෂවරයකු මෙන්ම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂවරයකුද වෙයි. ඔහු වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මෙන්ම මුදල් අමාත්‍යංශයේද හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයකුද විය. එසේම, ඔහු චීනයේ බීජිං නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ හිටපු අමාත්‍යංශ උපදේශකවරයකු/අධ්‍යක්ෂවරයකු මෙන්ම SAARC සංවර්ධන අරමුදලේ ජාතික අධ්‍යක්ෂවරයකුද විය. මහජන සේවා පාරිතෝෂික අරමුදල් පදනමේ හිටපු භාණ්ඩාගාර නියෝජිතයකු, රාජ්‍ය පරිපාලන සහ දේශීය කටයුතු අමාත්‍යංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකු (IT & AR) / CIO ද විය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි ප්‍රතිස්ථාපන වැඩසටහනෙහි ධාරිතා සංවර්ධන කටයුතු පිළිබඳ හිටපු සහකාර වැඩසටහන් කළමනාකරුවකු, වරාය, නැවත පදිංචිකිරීම් හා ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ සැලසුම් හා ප්‍රතිසංස්කරණ පිළිබඳ හිටපු සහකාර ලේකම්වරයකු, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හිටපු SLAS කැඩේට් නිලධාරියකු, වව්නියා කොට්ඨාස ලේකම් කාර්යාලයේ හිටපු සමෘධි කළමනාකරුවකු සහ එම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේම හිටපු සංවර්ධන වැඩසටහන් සහකාරවරයකු ලෙසද ඔහු කටයුතු කර ඇත.



**ආර්. ඒ. එන්. ජයසුන්දර මහතා**
අධ්‍යක්ෂ

ජයසුන්දර මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ HNDA ආයතනවල වරලත් සහතික ලාභියකු, AAT ආයතනයේ සාමාජිකයකු සහ එක්සත් රාජධානියේ මූල්‍ය, විගණන හා සංවර්ධන ගිණුම්කරණය පිළිබඳ ආශ්‍රිත සාමාජිකයකුද වෙයි.

ඔහු සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයකු වන ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂවරයකු (FMC), ශ්‍රී ලංකා - චීන සංගමයේ භාණ්ඩාගාරික, දෘශ්‍යාබාධිතයන් සඳහා වන ශ්‍රී ලංකා මණ්ඩලයේ භාණ්ඩාගාරික සහ ශ්‍රී ලංකා - බෙල්ජියම් සංවිධානයේ භාණ්ඩාගාරිකවරයාද වෙයි. ඔහු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිටපු නියෝජ්‍ය මූල්‍ය කළමනාකරුවෙකුද වෙයි.



**ඒ. ටී. බණ්ඩාර හේරත් මහතා**
අධ්‍යක්ෂ

හේරත් මහතා ශ්‍රී ලංකාවේ නීති (LLB) උපාධියක් සහිත ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකි. ඔහු ලක්නව් නුවර භාත්ඛණ්ඩේ විශාරද ඩිප්ලෝමාවක්ද ලබා ඇත. ඔහු ඉඩම් මණ්ඩලයේ ප්‍රතිග්‍රහණ මණ්ඩලයේ හිටපු සාමාජිකයකු, කොළඹ කුලී මණ්ඩලයේ සභාපති මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හිටපු අධ්‍යක්ෂවරයකු සහ විගණන කමිටු සාමාජිකයකුද වෙයි.



**එස්. ධනතුංග මහතා**
අධ්‍යක්ෂ

ධනතුංග මහතා එක්සත් රාජධානියේ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයෙන් කළමනාකරණය පිළිබඳ උපාධියක්, එම ආයතනයෙන්ම ප්‍රජා සත්කාර පිළිබඳ NVQ 4 මට්ටමේ සුදුසුකමක්, එක්සත් රාජධානියේ ලන්ඩන් විද්‍යාලයෙන් ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක්, ඇමෙරිකා එක්සත් ජනපදයේ පැකේපින් ස්ටෝර් ආයතනයෙන් පරිගණක වැඩසටහන් හා පද්ධති සැලසුම් පිළිබඳ ඩිප්ලෝමාවක් සහ වෘත්තීය ඇසුරුම්කරණ සහ නියෝජිතකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත.

ඔහු සිලෝන් ෂිපිං කෝපරේෂන් ලිමිටඩ් හි හිටපු සභාපති, සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ් හි හිටපු අධ්‍යක්ෂ, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කමිටුවේ සාමාජික සහ සීමාසහිත ලංකා ගල්අඟුරු සමාගමේ හිටපු අධ්‍යක්ෂ ලෙස කටයුතු කර ඇත. එයට අමතර වශයෙන්, මාගම්පුර වරාය කළමනාකාර සමාගමේ හිටපු අධ්‍යක්ෂ, විවාන්ටා ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ප්‍රවර්ධකයකු / කොටස්හිමියකු, ඇඩ්මයර් ටුවර්ස් ඇන්ඩ් ඉවෙන්ට් (යූ.කේ.) ලිමිටඩ් හි හිටපු කළමනාකර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී, එසෙක්ස් නුවර වීලේ හි වයිට්හෙදර් කෙයාර් ලිමිටඩ් හි හිටපු ලියාපදිංචි කළමනාකරුවකු, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ හිටපු විධායක සහකාරවරයකු, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු පරිපාලන අධ්‍යක්ෂවරයකු සහ චාරිකා සංවිධාන ප්‍රධානියකු, MTL/මවුන්ටන් හෝවික් (ප්‍රයිවට්) ලිමිටඩ් හි හිටපු සාමාන්‍යාධිකරීවරයකු, මවුන්ටන් හෝවික් පැකේපිං (ප්‍රයිවට්) ලිමිටඩ් හි හිටපු අධයක්ෂ / සාමාන්‍යාධිකාරී, ඇමරිකා එක්සත් ජනපදයේ ෆෙඩෙක්ස් ආයතනයේ අනුබද්ධ සමාගමක් වන මවුන්ටන් හෝවික් එක්ස්ප්‍රස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි හිටපු ව්‍යාපාර සංවර්ධන කළමනාකරුවකු, මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි හිටපු වෙළෙඳපොළ විශ්ලේෂකවරයකු ලෙසද ඔහු කටයුතු කර ඇත.



**ඩබ්ලිව්. එස්. පෙරේරා මහතා**
අධ්‍යක්ෂ

පෙරේරා මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් භූවිද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇත. ඔහු ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම් සහ JCT තෙල් බැංකුවේ වැඩ බලන කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි. වරාය හා නැව්ගත කිරීම් කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගේ හිටපු සම්බන්ධීකරණ ලේකම්වරයකු, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ හිටපු පර්යේෂණ සහකාරවරයකු සහ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශයේ හිටපු විද්‍යා හා තාක්ෂණ නිලධාරියකු ලෙසද ඔහු කටයුතු කර ඇත.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම



**ඊ. ඒ. එස්. එදිරිසිංහ මහතා**

**පිරිපහදු කළමනාකරු**

රසායන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් සහ රසායන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වරලත් සහතිකයක් හිමි එදිරිසිංහ මහතා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයකු මෙන්ම ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමයේ සාමාජිකයකුද වෙයි.

වසර දෙකක කාලපරිච්ඡේදයක් සඳහා මුසුකිරීම් විශේෂඥයකු ලෙස සව්දි අරාබියේ යන්බුනුවර පිහිටි සව්දි ඇරැම්කෝ තෙල් පිරිපහදුවේ සේවයට බැඳීමට පෙර වසර හතරක කෙටි සේවා කාලයක් සඳහා ඔහු 1988 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බැඳිණි. වර්ෂ 1996 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ එක්ව කලින් දැරූ තනතුරෙහිම සේවය කළ ඔහු 2002 වසරේදී තාක්ෂණික සේවා (ව්‍යාපෘති) නියෝජ්‍ය කළමනාකරු ලෙස උසස්වීමක් ලැබෙන තුරුම එම ධූරය දැරීය. ඉන්පසුව 2005 වසරේදී තාක්ෂණික සේවා (ව්‍යාපෘති) නියෝජ්‍ය කළමනාකරු තනතුරටද, 2009 වසරේදී මෙහෙයුම් කළමනාකරු තනතුරටද උසස්වීම් ලැබූ ඔහු 2014 වසරේදී නියෝජ්‍ය පිරිපිහදු කළමනාකරු (නිෂ්පාදන හා මෙහෙයුම්) තනතුරට පත් විය. මේ වන විට ඔහු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වැඩ බලන පිරිපහදු කළමනාකරු ලෙස සේවය කරයි.







### වී. එන්. වීරසූරිය මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)**

වීරසූරිය මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ මූලික උපාධියක් සහ එම විශ්වවිද්‍යාලයේම කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් පශ්චාත් උපාධියක්ද හිමි කරගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයකු, CPA (ASA) හි ආශ්‍රිත සාමාජිකයකු මෙන්ම සහතික ලත් කළමනාකරණ ගණකාධිකාර ආයතනයේ (FCMA) අධි සාමාජිකයකුද වෙයි.

ඔහු 1994 වසරේදී වරලත් ගණකාධිකාරිවරුන් වූ බී. ආර්. ද සිල්වා සහ සමාගමෙහි විගණන ලිපිකරුවකු සහ බදු අධීක්ෂකවරයකු ලෙස වෘත්තීය ජීවිතය ඇරැඹීය. ඉන්පසුව මයික්‍රොසෙල්ස් ලිමිටඩ් හි ගණකාධිකාරිවරයකු, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ මූල්‍ය කළමනාකරු, තුඩාවේ බ්‍රදර්ස් හි කළමනාකාරිත්ව ගණකාධිකාරී, වීකොම් ඉන්ටර්නැෂනල් හි සමූහ මූල්‍ය හා පරිපාලන කළමනාකරු, වීන්කාර් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් ලිමිටඩ් හි සමූහ මූල්‍ය කළමනාකරු, ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්හි ෆෙස් ෆ්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් හි පරිපාලන කළමනාකරු, හන්ටර්ස් ඇන්ඩ් කම්පනි පී.එල්.සී. සමාගමේ මූල්‍ය කළමනාකරු යනාදී වශයෙන් විවිධ තනතුරු දැරූ ඔහු 2017 වසරේදී මූල්‍ය කටයුතු පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බැඳිණි.

ගිණුම් හා මූල්‍ය අංශ සම්බන්ධ සියලු ක්‍රියාකාරකම්, භාණ්ඩාගාර කළමනාකරණය, බදු හා රක්ෂණය, අයවැයකරණය, රජයේ රෙගුලාසීන්ට හා වාර්තාකරණ ක්‍රමවේදයන්ට අනුකූල වන පරිදි ගිණුම් හා මූල්‍ය ප්‍රතිපත්ති සැකසීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරකම් සඳහා විවිධ ආකාරයේ අනුමැතීන් ලබාගැනීමට අමාත්‍යාංශය සමඟ කටයුතු කිරීම යනාදිය ඔහුගේ අධීක්ෂණය යටතේ සිදුවේ.

### එස්. ඩබ්ලිව්. ගමගේ මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)**

ගමගේ මහතා රුහුණු විශ්වවිද්‍යාලයෙන් ජීවවිද්‍යා උපාධියක්ද, ඉන්පසුව නෙදර්ලන්තයේ වැගෙනින්ගන් කෘෂිකර්ම විශ්වවිද්‍යාලයෙන් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද හිමිකරගෙන ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද, එම විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක් සහ පුහුණුව හා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකයක්ද හිමිකරගෙන ඇත. ඔහු එක්සත් රාජධානියේ පුද්ගල සහ සංවර්ධනය පිළිබඳ වරලත් ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකුද වෙයි.

කළමනාකාරිත්ව පුහුණු වන්නකු ලෙස වර්ෂ 1991 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බැඳුණු ඔහු විවිධ කළමනාකාර තනතුරු ගණනාවක කටයුතු කරමින් සංස්ථාවේ වසර විසි හතක අඛණ්ඩ සේවා කාලයක් සපුරා ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා ගුවන් තෙල් කටයුතු හා සම්බන්ධව සිය වෘත්තීය ජීවිතය ඇරැඹූ ඔහු ගුවන් යානා ඉන්ධන නැවත පිරවුම් මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් "Shell-UK" සහතිකය සහ සුදුසුකම් ලත් නිලධාරියකු ලෙස ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල සේවය කළේය.

ඔහු දැනට දරන මානව සම්පත් හා පරිපාලන අංශයේ සාමාන්‍යාධිකාරී තනතුරට 2009 වසරේදී ඔහු උසස් කෙරිණි.

### ඩී. එම්. පී. දිසානායක මහතා

**නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නඩත්තු හා ව්‍යාපෘති) (වැඩ බලන)**

යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් හිමිකරගෙන සිටින දිසානායක මහතා වරලත් ඉංජිනේරුවකු මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයකුද වෙයි. නීතිය පිළිබඳ උපාධියක්ද ලබා සිටින ඔහු නීතිඥවරයකුද වෙයි.

ඔහු 1988 වසරේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පිරිපහදුවේ යාන්ත්‍රික ඉංජිනේරුවකු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සම්බන්ධ විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පිරිපහදුවේ දශක තුනක් පුරා විහිදෙන ඔහුගේ සේවා කාලය තුළදී ඔහු නියෝජ්‍ය ඉංජිනේරු කළමනාකරු, ඉංජිනේරු කළමනාකරු (යාන්ත්‍රික), ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු කළමනාකරු (නඩත්තු හා ව්‍යාපෘති), සහ අවසාන වශයෙන් 2016 වසරේ සිට වැඩ බලන නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නඩත්තු හා ව්‍යාපෘති) ඇතුළු තනතුරු දරා ඇත.





## එම්. ඒ. ඩී. මල්ලිකාරච්චි මහතා

### නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තාක්ෂණික සේවා හා ආයතනික කටයුතු) (වැඩ බලන)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යා (නිෂ්පාදන) උපාධියක් ලබා සිටින මල්ලිකාරච්චි මහතා ඇමෙරිකා එක්සත් ජනපදයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ සාමාජිකයකු මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සමාජිකයකුද වෙයි. ප්‍රමුඛතම දේශීය හා ජාත්‍යන්තර විද්වත්, වෘත්තීය හා කාර්මික ක්ෂේත්‍ර පහසුකම් යටතේ කළමනාකරණය සහ නායකත්වය සම්බන්ධ පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන් ගණනාවකටද ඔහු සහභාගි වී ඇත.

ගුවන් තෙල් මෙහෙයුම් කළමනාකරණය, ගුවන් තෙල් තත්ව සහතිකකරණය, සයුරු තීරයෙන් ඔබ්බෙහි තෙල් සම්බන්ධයෙන් සිදු කෙරෙන කටයුතු සහ සාගර ආශ්‍රිත නල මාර්ග යනාදිය සඳහා වන ඉදිකිරීම් ආශ්‍රිත ව්‍යාපෘති තත්ව සහතිකකරණය, ගුවන් තෙල් හා ඉන්ධන සැකසුම් පද්ධති ආශ්‍රිත ව්‍යාපෘති කළමනාකරණය සහ ගිවිසුම් පරිපාලනය, ඉංජිනේරු සහ සැකසම් සැලසුම් පරීක්ෂාව, නඩත්තු කළමනාකරණය හා සෞඛ්‍ය හා ආරක්ෂාව දැනුවත්භාවය ඇති කිරීම වැනි විවිධ අංශ ඔස්සේ තෙල් සහ වායු කර්මාන්තය තුළ වසර 17කට අධික පළපුරුද්දක් ඔහුට ඇත.

සහකාර යාන්ත්‍රික ඉංජිනේරුවකු ලෙස ඉන්ටර්බැච් පෝසිලේන් ප්‍රයිවට් ලිමිටඩ් හා සම්බන්ධ වීමට පෙර ඔහු 1996 වසරේදී ඉංජිනේරුවකු ලෙස ජිනසේන සමූහයෙන් සිය වෘත්තීය ජීවිතය ඇරැඹීය. යාන්ත්‍රික ඉංජිනේරුවකු ලෙස 1999 වසරේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බැඳුණු ඔහුව කොළොන්නාව නිමාවට අනුයුක්ත කෙරිණි. ඉන්පසුව ඔහු, බණ්ඩාරනායක ගුවන් තොටුපොළේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අදාළ ගුවන් තෙල් සඳහා යාන්ත්‍රික ඉංජිනේරු (ගුවන් තෙල් පිරවුම් ස්ථානය) මෙන්ම ව්‍යාපෘති ඉංජිනේරු (ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධති ව්‍යාපෘති), ගුවන් තෙල් මෙහෙයුම් නියෝජ්‍ය කළමනාකරු, ගුවන් තෙල් ව්‍යාපෘති කළමනාකරු, ගුවන් තෙල් මෙහෙයුම් කළමනාකරු සහ අවසාන වශයෙන් තාක්ෂණික සේවා හා ආයතනික කටයුතු සම්බන්ධ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස යනාදී වශයෙන් තනතුරු රැසක් දැරීය.

## එම්. කේ. ගරුසිංහ මහතා

### නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා සැපයුම් ජාල)

ගරුසිංහ මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යා උපාධියක් සහ ස්වීඩනයේ මැල්මෝ නුවර ලෝක සාගර විද්‍යා විශ්වවිද්‍යාලයන් සාගර විද්‍යා කටයුතු පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හිමි කරගෙන ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද හිමි කරගෙන ඇත. එක්සත් රාජධානියේ වරලත් නැව්කරුවන්ගේ ආයතනයේ සාමාජිකයකු වන ඔහු ශ්‍රී ලංකාවේ සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ ආයතනික සාමාජිකයකුද වෙයි.

මේ වන විට ඔහු වාණිජ හා සැපයුම් ජාල අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරයි.





### එල්. ජී. එම්. ආර්. පෙරේරා මහතා

**නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (විදුලි හා උපකරණ)**

පෙරේරා මහතා මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික් හා දුරකථන සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇත. ඔහු 1992 වසරේදී උපකරණ ඉංජිනේරුවකු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සිය වෘත්තීය ජීවිතය ඇරැඹීය. ක්‍රියාවලි පාලන උපකරණ ආශ්‍රිත ක්ෂේත්‍රයේ වසර 25ක කාලයක පළපුරුද්ද හිමි ඔහු උපකරණ දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරු රැසක් දැරීය. නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු ලෙස දැනට ඔහු දරන තනතුරෙහි කටයුතු කරන අතරම ඔහු පිරිපහදුවේ විදුලි, උපකරණ හා ද්‍රව්‍ය අංශවල ප්‍රධානියා ලෙසද කටයුතු කරයි.

### ඩබ්ලිව්. එම්. කේ. ආර්. බී. වික්‍රමසිංහ මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)**

වික්‍රමසිංහ මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යා උපාධියක් මෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද ලබා ඇත. ලංකා රසායන විද්‍යා ආයතනයේ සාමාජිකයකු වන ඔහු ශ්‍රී ලංකා අලෙවි ආයතනයේ සහතික ලත් සාමාජිකයකුද වෙයි. එයට අමතර වශයෙන් ඔහු දකුණු අප්‍රිකාවෙන් මානව සම්පත් නායකත්ව කළමනාකරණ විශිෂ්ටතාව, එක්සත් රාජධානියෙන් ව්‍යාපාර මෙහෙයවීම - ක්‍රමසැලසුම් හා අලෙවිකරණ සහයෝගිතාව, එක්සත් රාජධානියේ එවෙසියා වෙතින් කෘත්‍රීමකාරක යොදාගනිමින් පෘෂ්ඨ සැකසීම, සිංගප්පූරුවේ ඇක්වලොන් වෙතින් පෘෂ්ඨ ආලේපනයන් ආශ්‍රිත විද්‍යාත්මක සැකසුම්කාරක පිළිබඳ අධ්‍යයනය යනාදී වශයෙන් වෘත්තීය පුහුණුවද ලබා ඇත.

වර්ෂ 1999 - 2008 කාලපරිච්ඡේදය තුළදී කලින් ICI ලෙස හැඳින්වුණු කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් (කලම්බු) ලිමිටඩ් හි ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන කළමනාකරු ලෙස ඔහු සේවය කළ අතර, එහිදී ඔහුගේ ප්‍රධාන කාර්යභාරයන් අතර ශ්‍රී ලංකාවේ කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ආනයනය, ගබඩාකරණය සහ අලෙවිකරණය මෙන්ම ඉමල්ෂන් පොලිමර් නිෂ්පාදනය හා අලෙවියද අයත් විය. මූල්‍ය ප්‍රාග්ධනය සහ සේවක පිරිස් සඳහා අදාළ වියදම් ආශ්‍රිත අයවැය සැකසීම පිළිබඳ මනා ප්‍රායෝගික පළපුරුද්දක් සහ ශේෂවූ ලකුණු කාඩ්පත් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, පර්යේෂණ මෙන්ම ඉමල්ෂන් බලාගාර සම්බන්ධ සංවර්ධන අංශ පිළිබඳ පළපුරුද්දක්ද ඔහුට ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවි අංශ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස දැනට ඔහු දරන තනතුරෙහි කටයුතු කරන විට ඔහුට පැවරී ඇති කාර්යභාරයන් ලෙස ඉන්ධන වෙළෙඳපොළ, කෘෂි රසායන ක්‍රියාවලීන්, තාර, ලිහිසි තෙල් සහ විශේෂ නිෂ්පාදන ක්‍රියාවලීන් මෙන්ම පාරිබෝගික සේවා හා ආයතනික සන්නිවේදන ඒකක හා සේවා ස්ථාන උපකරණ වැඩමුළු යනාදිය ඇතුළත් වන පරිදි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවි මෙහෙයුම් පාලනය සහ සම්බන්ධීකරණය කිරීමය. අතිරේක වගකීම් අතරට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආයතනික සැලසුම් හා අභිමතාර්ථයන් සපුරාගැනීමේදී ව්‍යාපාර වටාපිටාව තුළ හමු වන අභියෝගවලට මුහුණ දීම සඳහා අදාළ වෙනස් කිරීම් මඟින් නිසි ව්‍යාපාර වටාපිටාවන් නිර්මාණය කිරීම අයත් වෙයි.

# අපගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ සක්‍රියතාවන්









### මූලික ක්‍රියාකාරකම්

- ආනයනය - මූලික වශයෙන් බොර තෙල් හා පිරිසිදු කල ඉන්ධන
- පිරිපහදුකරණය - බොර තෙල් පිරිපහදු නිෂ්පාදන බවට පත් කිරීම
- බෙදාහැරීම - දිවයින පුරා පාරිභෝගිකයින් වෙත

### සහාය ක්‍රියාවලි

- ව්‍යාපාර උපාය මාර්ගය
- තාක්ෂණික සේවා
- පුද්ගල කළමනාකරණය
- තොරතුරු තාක්ෂණ සහාය
- ආයතනික සමාජ ආයෝජනය

### අපගේ ආදායම් උත්පාදනය

- ප්‍රවාහන
- බලශක්තිය
- ගුවන් ගමන්
- ගෘහස්ථ
- කර්මාන්ත
- අපනයන






### අපගේ මිල ගණන් සඳහා දායක වන සාධක

- ගෝලීය තෙල් මිල ගණන්
- විනිමය අනුපාත
- ශ්‍රමය
- බෙදාහැරීම
- බලශක්තිය
- ප්‍රාග්ධන වියදම
- නඩත්තුව
- බදු
- මූල්‍ය වියදම


### අපගේ ප්‍රධානතම අවදානම් වර්ග දහය

- ආර්ථික අවදානම
- පාරිභෝගික ද්‍රව්‍ය මිල අවදානම
- ආරක්ෂාව පිළිබඳ අවදානම
- වෙළෙඳපොළ අවදානම
- විනිමය අනුපාත අවදානම
- පොලී අනුපාත අවදානම
- ද්‍රවශීලතා අවදානම
- ණය අවදානම
- සැපයුම් අවදානම
- මානව සම්පත් අවදානම

### වටිනාකම නිර්මාණයට බලපාන අපගේ මෙහෙයුම් සම්බන්ධ ගැටලු

- අඩු මිල යටතේ අලෙවි කිරීම
- බනිජ තෙල් මිල ගණන් සම්බන්ධ ගෝලීයව පවතින ඉහළයෑමේ ප්‍රවණතාව
- විනිමය අනුපාතය වෙනස්වීම
- තෙල් පිරිපහදු ධාරිතාව හා ගබඩාකරණ ඌනතාව
- ලබාගෙන ඇති ඇමෙරිකානු ඩොලර් ණය පියවීම සම්බන්ධයෙන් මුහුණ දෙන ගැටලු
- නළ මාර්ගයේ පවතින දුර්වල තත්වය

# ආයතනික ව්‍යුහය



Chairman
Managing Director
Refinery Manager
DRM (Elec. & Ins.)
DRM (Maint. & Pro.)
DRM (Tech. Ser.)
DRM (Manu. & Ops.)
DGM (A / HR)
DGM (F)
DGM (TS&CA)
DGM (MKT)
DGM (C & SC)
Snr. Mgr. (F)
Dy. Ops.Mgr. (Sapu.Ter.)
Mgr. Security & Inves.
Head of Secretary
HR Mgr.
IT Mgr.
Manager (R&D)
MKT Mgr.
Marketing Mgr. (Lubs & LPG)
Mgr. Agro
Mgr. Shipping
Commercial Mgr.
Mgr . Supplies
Chief Legal Officer
Mgr (Internal Audit)
Mgr. (Eng. & Premises)
Operations Mgr. (AV)
Mgr. (OP)
Head of CC & CCU



# කළමනාකාරීත්ව විමසුම

## මෙහෙයුම් පරිසරය

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද නිල තොරතුරුවලට අනුව, ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදන වර්ධනය 2016 වසරේ වාර්තා වූ සියයට 4.5 ක් වර්ධන ප්‍රමාණයේ සිට 2017 වසර තුළදී සියයට 3.1 දක්වා තවදුරටත් පහත වැටිණි. 2016 වසරේ සිට පැවැති දැඩි කාලගුණ තත්වයන්වල ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධ ක්‍රියාකාරකම්වල සියයට 0.8ක පහත වැටීමක් වාර්තා වූ අතර, සේවා හා කාර්මික අංශවල ආර්ථික ක්‍රියාකාරීත්වය සම්බන්ධ මන්දගාමීත්වයක් දැකගත හැකි විය.

2017 වසරේදී මහබැංකුව විසින් මූලික වශයෙන් වෙළෙඳපොළ පදනම් කරගනිමින් ක්‍රියාත්මක කරන ලද විනිමය අනුපාත ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකා රුපියලෙහි වටිනාකම සාපේක්ෂ ලෙස ස්ථාවර මට්ටමක පැවැතිණි. විශේෂයෙන්ම 2017 වසරේ මුල් මාස දෙක තුළදී පැවැති, රුපියල සඳහා බලපෑ අගය පහත වැටීමේ පීඩනය ඉන්පසුව රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සහ කොටස් වෙළෙඳපොළ වෙත ලැබුණු විදෙස් ආයෝජන ප්‍රමාණය ඉහළ යෑම සහ අපනයන ක්‍රියාවලින් ඔස්සේ ලද ආදායම ඉහළ යෑම වැනි තත්වයන් යටතේ සාමාන්‍ය අතට හැරිණි. ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමට හේතුකාරක වූ විදෙස් විනිමය වාර මූල්‍ය පහසුකම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැඩසටහන් වෙතින් ලද අනුග්‍රාහක වාරික දෙක යනාදී කරුණු හේතුකොටගෙන මැයි මාසයේ සිට රුපියලෙහි අගය පහත වැටීමේ තත්වය යහපත් අතට හැරිණි.

විදෙස් විනිමය ආදායම්වල සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ බැවින් 2017 වසරේ ශ්‍රී ලංකාවේ බාහිර ක්ෂේත්‍ර ක්‍රමයෙන් වැඩිදියුණු විය

යුරෝපීය සංගමයේ ප්‍රමුඛතා සම්බන්ධ සම්මතකරණය කරන ලද ක්‍රමය නැවත ක්‍රියාත්මකවීම සහ යුරෝපීය සංගමයේ ජී.එස්.පී. පහසුකම නැවත ක්‍රියාත්මක වීම

මෙන්ම සවිමත් ආයතනික සහ ප්‍රතිපත්ති සහාය යනාදිය හේතුවෙන් 2017 වසරේදී වෙළෙඳ භාණ්ඩ අපනයෙන් ලද ඉහළ විදෙස් විනිමය ආදායම්වල සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ බැවින් 2017 වසරේ ශ්‍රී ලංකාවේ බාහිර ක්ෂේත්‍ර ක්‍රමයෙන් වැඩිදියුණු විය. කෙසේවුවද, හානිදායී කාලගුණ තත්වයන් නිසා ඇති වූ බලපෑම පාලනය කරගැනීමට විශේෂයෙන්ම ඉන්ධන සහ සහල් ඇතුළු ආනයනයන් සඳහා මෙන්ම රන් ආනයනය සඳහා අපේක්ෂිත ප්‍රමාණයට වඩා දැරීමට සිදුවූ වියදම් මඟින් වසර තුළදී වෙළඳ හිඟයෙහි වැඩිවීමක් ඇති විය.

ප්‍රධාන වශයෙන්ම අයහපත් කාලගුණ ආශ්‍රිත තත්වයන් අනුව සිදු කරන ලද ආනයන සහ ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන් ඉහළයෑම හේතු කොටගෙන 2017 වසරේදී ආනයන වියදම සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගියේය. ජල පෝෂක ප්‍රදේශවල පැවති වියළි කාලගුණයෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය විදුලිබල උත්පාදන අංශයෙන් ඇතිවූ ඉහළ ඉල්ලුම මෙන්ම ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඉහළ තෙල් මිල ගණන් හේතුවෙන් ඉන්ධන ආනයන ප්‍රමාණයන් ඉහළ යෑම නිසා වසර තුළදී ඉන්ධන ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 3,428 දක්වා සියයට 38.2කින් ඉහළ ගියේය. මෙවැනි අවස්ථාවන්වලදී, රජයේ මූල්‍ය සම්පිණ්ඩනයන්ට අනුකූල වන පරිදි ඉන්ධන සඳහා වන ස්වයංක්‍රීය මිල යාන්ත්‍රණයන් ක්‍රියාත්මකකිරීම ප්‍රමුඛතා විෂය ක්ෂේත්‍රයන් අතරින් එකක් බවට පත් වෙයි.



# ඛනිජ තෙල් මිල

## ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් මිල ගණන්

ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා අදාළ මිල සංශෝධන ශ්‍රී ලංකාවේ දිගු කාලීන ප්‍රතිපත්ති ගැටලුවක් බවට පත්ව ඇත්තේ ජීවන වියදම සහ නිෂ්පාදන වියදම මෙන්ම සමස්ත ක්ෂුද්‍රආර්ථික ස්ථාවරත්වය කෙරෙහි එමඟින් එල්ල වන සෘජු බලපෑම හේතුවෙනි. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අංශ ප්‍රධාන වශයෙන්ම නියෝජනය වන්නේ රජයට අයත් උපාය මාර්ගික වශයෙන් වැදගත් ව්‍යාපාර ආයතනයක් වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මඟින් වන අතර, සිල්ලර වෙළෙඳපොළ කොටසෙන් ආසන්න වශයෙන් සියයට 86ක් සැපයෙන්නේ එමඟිනි. රටේ ප්‍රාථමික හා ද්විතියක බලශක්ති අවශ්‍යතාවන් සපුරාලීම සඳහා ශ්‍රී ලංකාව විශාල වශයෙන් ආනයනිත ඛනිජ තෙල් නිෂ්පාදන මත යැපෙයි. එසේම, කුඩා පරිමාණයෙන් තෙල් ආනයනය කරන රටක් ලෙස ලෝක වෙළෙඳපොළේ පවතින මිල අනුව කටයුතුකිරීමට ශ්‍රී ලංකාවට සිදුවෙයි. ඛනිජ තෙල් මිල ගණන් මඟින් නිෂ්පාදන වියදම කෙරෙහිත්, එමඟින් ජීවන වියදම කෙරෙහිත් එල්ල වන දැඩි බලපෑම නිසාම ඛනිජ තෙල් මිල ගණන් සැකසීම සැමවිටම දේශපාලනික වශයෙන් රටට බලපාන සංවේදී ගැටලුවක් බවට පත්ව ඇත. කෙසේවුවද, සැබෑ පිරිවැය නියෝජනය වන පරිදි ඉන්ධන සිල්ලර මිල ගණන් සකසනු නොලැබීමෙන් අවස්ථා ගණනාවකදීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ස්ථායීතාව බරපතළ ලෙස අභියෝගයට ලක්ව ඇති අතර, එමඟින් ක්ෂුද්‍රආර්ථික අසමතුලිතතා මෙන්ම පාරිභෝගික සුබසාධන අවස්ථා සැබැවින්ම පහත වැටී ඇත. පිරිවැය සැලකිල්ලට නොගනිමින් ක්‍රියාත්මක කරන ලද මිල ගණන් මඟින් ඉන්ධන සහනාධාර, රජයේ විශාල අවිනිශ්චිත වගකීම්, අතිශයින්

ඉහළ ආනයන බිල්පත් සහ ගෙවීම් ශේෂයන් ආශ්‍රිත ගැටලු, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අධික ණය ලබාගැනීම් මඟින් රජයේ බැංකුවල ශේෂපත්‍ර දුර්වලවීම මෙන්ම ප්‍රශස්ත නොවන සම්පත් වෙන්කිරීම සහ අකාර්යක්ෂම සහනාධාර ඉලක්ක කරගැනීම යනාදිය මඟින් ඉහළ රාජ්‍ය මූල්‍ය වියදම් තත්වයන් ඇතිව තිබේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීමේ සහ ඉන්ධන සහනාධාරවල රාජ්‍ය මූල්‍ය වියදම් පහත දැමීමේ අදහස ඇතිව, 2002 ජනවාරි මාසයේදී රජය විසින් පිරිවැය නිරූපිත මිල සූත්‍රයක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර, එය 2002 සහ 2003 අතර කාලයේදී බලපැවැත්විණි.


ගෙවී ගිය දශකය තුළදී ලෝක වෙළෙඳපොළ තුළ ඉන්ධන මිල ගණන් සම්බන්ධයෙන් විශාල උච්චාවචනයන් සිදුවූ නමුදු, ලෝක වෙළෙඳපොළේ සිදුවූ වෙනස්කම් නිරූපණය වන පරිදි දේශීය වෙළෙඳපොළේ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වූ මිල ගණන් සකසනු නොලැබිණි. දේශීය මිල ගණන් මඟින් නිෂ්පාදනයේ සමස්ත පිරිවැය, එනම් ආනයනිත හා දේශීය වශයෙන් පිරිපහදු කරන ලද නිෂ්පාදන සම්බන්ධ බදු ඇතුළත් පරිමා-බර සඳහා අදාළ සාමාන්‍ය පිරිවැය දැක්වෙන්නේනම් මිල ගණන් සැකසීම සම්පූර්ණ වන්නේ යැයි සැලකෙයි. ඛනිජ තෙල් නිෂ්පාදනවල පිරිවැයට මූල්‍ය වියදම, රක්ෂණ හා නැව්ගතකිරීම් කුලී (CIF) මිල, ගබඩා කිරීම සහ තොග බෙදාහැරීම සඳහා පර්යන්ත ගාස්තු, ප්‍රවාහන වියදම්, විනිමය අනුපාත විචල්‍යතා වියදම, මූල්‍ය වියදම් සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පුද්ගල හා පිරිස් වියදම් යනාදිය ඇතුළත් වෙයි. කෙසේවුවද, ගෝලීය තෙල් මිල උච්චාවචනයන් සම්බන්ධ තත්වයන් දේශීය වෙළෙඳපොළට අදාළ කරගැනීම පසුගිය කාලයේදී සම්පූර්ණ අයුරින් සිදුව නැති අතර, මේ අසම්පූර්ණ සැකසුම් ක්‍රියාවලියේදී ඇතිවූ ලාභ හෝ අලාභ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශේෂ පත්‍රයේ සටහන් වන්නට ඉඩ හැර තිබිණි.

වර්ෂ 2011 සිට 2014 දක්වා වූ කාලපරිච්ඡේදය අතරතුරදී ලෝක වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ගණන් ඉතා අධික ලෙස ඉහළ ගොස් තිබිණි. කෙසේවුවද, මේ කාලපරිච්ඡේදය සඳහා රජය විසින් පූර්ණ ලෙස ආවරණය කර ගැනීමට ඉඩ ලබාදී නොතිබුණු බැවින්, මූල්‍ය කාර්යසාධනයේ පහත වැටීමක් සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධික අලාභ ප්‍රමාණයක් එකතුවී, 2017 වසර අවසාන වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමුච්චිත අලාභය ප්‍රමාණය රු. බිලියන 218.7 ක් බවට පත්ව තිබිණි.

OPEC සහ OPEC නොවන තෙල් නිපදවන රටවල් විසින් තෙල් නිෂ්පාදනය සීමාකිරීම නිසා 2016 පෙබරවාරි මාසයේ සිට ලෝක තෙල් මිල ගණන් ඉහළ යමින් පැවතිණි. කෙසේවුවද, 2017 වසර මුල් භාගයේදී භූමි තෙල් මිල පහත දැමීම හැරුණු විට, 2015 වසරේ සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දේශීය සිල්ලර තෙල් මිල ගණන්වල වෙනසක් සිදු නොකෙරිණි. ලෝක තෙල් මිල ගණන් ක්‍රමයෙන් ඉහළ යමින් තිබියදී වුවද මේ අයුරින් දේශීය ඛනිජ තෙල් මිල ගණන් වෙනස් නොකිරීම නිසා බොහෝ රටවලට සාපේක්ෂව දේශීය සිල්ලර ඛනිජ තෙල් මිල ගණන් කැපීපෙනෙන තරම් අඩු අගයක පවතී.

## ජාත්‍යන්තර මිල ගණන් හා දේශීය සිල්ලර මිල ගණන් සැසඳුම

**පෙට්‍රල් 92 ඔක්ටේන්**






**ඔටෝ ඩීසල්**




**භූමිතෙල්**







**මූලාශ්‍රය:** globaloilprices.com

## ඉන්ධන මිල ගණන් ආශ්‍රිත ආර්ථික බලපෑම්

පාරිභෝගික සහනාධාර ලෙස සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ පූර්ණ පිරිවැය මත පදනම් මිල සහ නියම කරන ලද මිල අතර ඇති පරතරය වේ. සැපයුම් වියදම, ප්‍රවාහන වියදම, ලාභ ප්‍රමාණය සහ බදු යනාදියෙහි එකතුව වන පූර්ණ මිල නිෂ්පාදනයේ සමස්ත පිරිවැය වේ. කිසිදු ආකාරයක මිල සූත්‍රයක් ක්‍රියාත්මක නොවන විට, විකිණුම් ආදායම සහ සමස්ත පිරිවැය අතර ඇති පරතරය ශ්‍රී ලංකාවේ ඉන්ධන සහනාධාරය ගණනය කිරීම සඳහා පදනම ලෙස යොදාගැනෙයි.

| නිෂ්පාදනය | ශුද්ධ විකිණුම් ආදායම (ලීටරයට රු.) | සමස්ත පිරිවැය (ලීටරයට රු.) | සහනාධාරය (ලීටරයට රු.) | ප්‍රමාණය (ලීටරයට) | සමස්ත සහනාධාරය (රු. මි.) |
|---|---|---|---|---|---|
| ඔක්ටේන් 92 පෙට්‍රල් | 113.00 | 126.41 | 13.44 | 1,210.2 | 16,265 |
| ඔක්ටේන් 95 පෙට්‍රල් | 123.72 | 137.03 | 13.31 | 170.6 | 2,377 |
| ඔටෝ ඩීසල් | 92.46 | 97.46 | 5 | 1,871.8 | 9,352 |
| සුපර් ඩීසල් | 106.75 | 104.31 | - | - | - |
| විදුලිය සඳහා ඔටෝ ඩීසල් | 95.00 | 95.41 | 0.41 | 397.3 | 162 |
| භූමිතෙල් | 42.85 | 70.48 | 27.63 | 198.1 | 5,474 |

පැහැදිලිව දැක්වෙන පරිදි, විදුලිය සඳහා යොදාගැනෙන සුපර් ඩීසල් හා ඔටෝ ඩීසල් හැර ඉහත දක්වන ලද ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවි කෙරෙන්නේ සහනාදාරමය මිල ගණන්වලටය. ලීටරයට වැඩිම සහනාදාරමය මිල ඇත්තේ භූමිතෙල්වලට වන අතර, ඊළඟට එය අදාළ වන්නේ පෙට්‍රල් සහ ඩීසල් සඳහාය. කෙසේවුවද, අලෙවිවූ විශාල පරිමාව හේතු කොටගෙන 2017 වසරේ සහනාධාරය කෙරෙහි වැඩියෙන්ම දායක වූයේ පෙට්‍රල්ය. එසේම, විදුලි උත්පාදන අංශය මඟින් යොදාගනු ලබන දැවි තෙල් තීරණය කරනු ලබන මිලට යටත් නොවන අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඒවා අලෙවි කරනු ලබන්නේ පිරිවැය පියවා ගැනීම් මට්ටමට ඉහළ මිලකටය.





ඛනිජ තෙල් සහනාධාර සඳහා විධිමත් අයවැය ප්‍රතිපාදන නොමැති බැවින් තීරණය කරනු ලබන මිල ගණන් පිරිවැය පියවාගැනීම් මට්ටම්වලට වඩා අඩු වන අතර, එබැවින් වසර ගණනාවක් තිස්සේ අධික මූල්‍ය අලාභයන් වාර්තා කිරීම මඟින් සහනාධාර වියදමෙන් කොටසක්

ද්‍රාගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදුවෙයි. එහි ප්‍රතිඵල ලෙස සිදු වන පාඩු සහ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාගැනීමට බැංකු ණය මත යැපීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වෙයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් කරනු ලබන අධික ණයගැනීම රාජ්‍ය බැංකුවල ශේෂපත්‍රවලට බලපාන අතර, ණය වර්ධනය ඉහළ නංවමින් එමඟින් මහබැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයුම් සංකීර්ණත්වයට පත් කරයි. එසේම, එහිදී රජයේ අවිනිශ්චිත වගකීම් ඉහළ නංවමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණයගැනීම් සඳහා ඇපකරයන් සැපයීමට රජයට සිදුවෙයි.


නිෂ්පාදනයේ සැබෑ පිරිවැය ඉදිරිපත් නොකරන මිල ගණන් මඟින් නිෂ්පාදනය හා ඉල්ලුම ආශ්‍රිත ප්‍රශස්ත නොවන තීරණ වෙත යොමුවීමක් සිදුවෙයි. ඉහළ යන ගෝලීය මිල ගණන් දේශීය මිල ගණන් මඟින් නිරූපණය නොවන්නේ නම්, ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම ඒ අනුව සකස් නොවන අතර, එමඟින් ආනයන වියදමෙහි විශාල ඉහළයෑමක් සිදුවී, බාහිර අසමතුලිතතා ඇති වෙයි. ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල ගණන්වල වෙනස්වීම්

වාණිජ බැංකු මගින් CPC ආයතනයට සහ අනෙකුත් සියලුම සංස්ථා ණයවල මාසික වෙනස් වීම




දේශීය සිල්ලර මිල ගණන් වෙත සම්පූර්ණයෙන්ම යොමු නොකෙරෙන වෙළෙඳපොළ ආර්ථික ගැටලු රැසක් මේ වන විට මතුවී ඇත. සිල්ලර මිල ගණන් මේ අයුරින් සකස් නොවීම මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කෙරෙහි දැඩි බලපෑම් එල්ල විය. ඉන්ධන බදු යනු බොහෝවිට ආර්ථිකය තුළ අන් අංශයක ඉහළ මට්ටමේ වෙනස්වීමක් ඇති කළ හැකි ආකාරයේ බදු මඟ හැරවිය හැකි කාර්යක්ෂම හා සමකොටස් සහිත බදු ආදායම් ප්‍රභවයකි. එයට අතිරේක වශයෙන්, ඍජු බදු ආදායම් එකතුව අඩු අගයක් වන ශ්‍රී ලංකාව වැනි රටවල රජය විසින් සිදු කරනු ලබන මාර්ග යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකි ඵලදායී ආදායම් ප්‍රභවයක් ලෙස ඉන්ධන බදු සැලකිය හැකිය. එයට අමතරව, විශේෂයෙන්ම පොසිල ඉන්ධන වැනි පුනර්ජනනය කළ නොහැකි බලශක්ති ප්‍රභවයන් අධික ලෙස භාවිතා කිරීම මඟින් ඉතා ඉහළ හානි මට්ටම් සහිත පාරිසරික බලපෑම් රැසක් ඇති කෙරෙයි.

Brent බොරතෙල් සහ ආනයන වියදම්




## ඉදිරි ගමන් මඟ

මිල ප්‍රතිසංස්කරණය සාර්ථක කරගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (2017) විසින් විවිධ රටවල අත්දැකීම්වලින් උගත් පුළුල් පාඩම් පහක් හඳුනාගනු ලැබ ඇත: ඒවා නම්, ඒකාබද්ධ ප්‍රතිසංස්කරණ උපාය මාර්ගයක් සකසා ගැනීම, වඩාත්ම දුර්වල අංශය ආරක්ෂා කරගැනීම, පුළුල් මහජන සහයෝගයක් ගොඩ නගාගැනීම, ගැටලුවෙහි මූලය හා සම්බන්ධ නැති අනවශ්‍ය සකස්කිරීම්වලින් වැළකී සිටීම සහ සුදුසු අවස්ථාවේදී ක්‍රමයෙන් වෙනස්වීම යනාදිය වෙයි.

දේශීය ඉන්ධන මිල ගණන් සඳහා පිරිවැය දැක්වෙන මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාවේදී ද අනුගමනය කළ යුතු වන මූලික පාඩම් වන්නේ මේවාය. රජයට අයත් අදාළ ව්‍යාපාර ආයතනවල මූල්‍ය ස්ථායීතාව සහතික කරගැනීම සඳහා පිරිවැය නිරූපණය කෙරෙන මිල යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සෙසු අංශ වෙතට ව්‍යාප්ත කිරීමද කළ යුතුය. මේ සම්බන්ධයෙන් ගෝලීය වශයෙන් පවතින අදහස සුබවාදී එහෙත් අතිශය අවදානම යන වචන කිහිපයට ගොනු කළ හැකිය. දුර්වල මට්ටමේ ඉල්ලුම සහ අඩු මිල ගණන් යනාදියේ ප්‍රතිඵලයක් ලෙස දුෂ්කර වසර කිහිපයකට ක්ෂේත්‍රය මුහුණ පා ඇති අතර, උපාය මාර්ගික තීරණ ගැනීම සහ අනාගතය සඳහා සැලසුම් කිරීම දුෂ්කර කටයුත්තක්ව පවතී. ක්ෂේත්‍රය මේ අසීරු තත්වයන්ගෙන් මිදෙමින් සිටින අතරම, බලාපොරොත්තු තබාගත හැකි තත්වයක් උදාවෙමින් පවතින නමුදු, අවදානම පිළිබඳවද අවධානයෙන් සිටීමද අවශ්‍ය වෙයි.

තෙල් මිල ගණන් යථා තත්ත්වයට පත්වෙමින් තිබෙන අතර, සාමාන්‍ය බොර තෙල් බැරලයක මිල ඇමරිකානු ඩොලර් 50 පමණ දක්වා වූ නමුදු, එය 2011 වසරේ පැවති ඇමරිකානු ඩොලර් 115 තරම් ඉහළ මට්ටමෙන් බොහෝ දුරස්ථය. එබැවින්, සමාගම් විසින් නව සංවර්ධනයන් සොයා යන විට පවා, ඉහළ මට්ටමේ ඇති තෙල් ක්ෂේත්‍රය සැලකිලිමත්ව හා අවධානයෙන් කටයුතු කළ යුතුය. නිෂ්පාදනය නැවැත්වීමට OPEC විසින් මෑතකදී ගන්නා ලද තීරණය අනුව යම්තාක් දුරකට වේගවත් වූ සැපයුම් හා ඉල්ලුම් සම්බන්ධ මූලික තත්වයන් නැවත සමතුලිතවීමක් හේතුකොටගෙන මෑත කාලයේදී ලැබුණු තෙල් මිල ආශ්‍රිත වාසිදායී ප්‍රතිඵල, නුදුරු අනාගතයේදී එසේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. එම අපේක්ෂාව එසේ පවතින අතරතුරදී ක්ෂේත්‍රය පිළිබඳ සුබවාදී

අනාවැකි ගණනාවක බොහෝ දුර ඈතින්ය: බාර්ක්ලේස් සමාගම විසින් ඉතා මෑතකදීම සිදු කරන ලද ඊ ඇන්ඩ් පී ස්පෙන්ඩ්න් සමීක්ෂණයට අනුව තෙල් සහ ගෑස් කර්මාන්ත ප්‍රාග්ධන වියදම් 2017 වන විට සියයට 7 ක පමණ ප්‍රමාණයකින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.


# ගෝලීය තත්වය

වර්ෂ 2014 සිට දැවැන්ත ව්‍යාපෘති ආශ්‍රිත ආයෝජන සම්බන්ධයෙන් පමාවීමක් පැවති බැවින් ඉදිරි වසර 5 - 10 තුළදී තෙල් මිල ගණන්වල ඉහළ යෑමේ හැකියාවක් ඇති අතර, ඉහළ යන ඉල්ලුම සපුරාලීම ක්ෂේත්‍රයට අභියෝග යක් වනු ඇත. මිල පහත වැටීම සිදුවූ කාලය අතරතුරදී බැහැරව සිටි වෙළෙඳ සමාජය විසින් මේ අවිනිශ්චිතතාව භාරගනු ඇති නමුදු, වෙළෙඳ කටයුතුවල වැඩිවීමක් සිදුවීම මඟින් ඉදිරි වසර තුන සිට පහ දක්වා වන කාලය තුළදී තෙල් මිල ගණන් කැපීපෙනෙන ලෙස ඉහළ යෑමක්ද සිදු වනු ඇත.

මෙහිදී විශේෂ අවධානය OPEC රටවල් සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත යොමු වන නුමුදු, ඉදිරි වසර කිහිපය තුළදී සෙසු කලාපද ප්‍රධාන ක්‍රියාකාරීන් බවට පත් වනු ඇත. ලතින් ඇමෙරිකාවේ සහ මෙක්සිකෝවේ ආයෝජන වටපිටාව වැඩිදියුණු වෙමින් පවතින අතර, ඒ රටවල බලශක්ති ප්‍රතිසංස්කරණ මඟින් සාම්ප්‍රදායික නොවන බලශක්ති මෙහෙයුම් සිදු කරන්නන් සඳහා පිවිසුම් දොරටු විවෘත කරන බව අවධානයට ලක්කිරීම වැදගත්ය.

නව දත්තවලින් පෙනී යන පරිදි එලඹෙන වසරවලදී, ආයතනික උපාය මාර්ගික අරමුණු විශාල වශයෙන් තිරසර ලාභදායීත්වය කෙරෙහි යොමු වනු ඇත, වෙන්කර හඳුනාගත හැකි ශක්‍යතාවන් අනාගත සාර්ථකත්වය උදෙසා වන මූලික සාධක බවට පත් වනු ඇත, සහයෝගීතාව පිළිබඳ නව ව්‍යාපාර මාදිලි හා ආකෘති මතු වනු ඇත, නව ව්‍යාපාර මාදිලි විකාශනය වීමත් සමඟ තර්කානුකූලබව සහ දරාගැනීමේ හැකියාව පිළිබඳ තත්වයන් විමසුමට ලක් කෙරෙනු ඇත, සමාගම් විසින් තාක්ෂණය යොදාගැනීමේ නව ස්වරූප සොයා යනු ඇති අතර, අවසාන වශයෙන්, දිගු කාලීන සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය වන දක්ෂයින් බඳවාගැනීම සහ රඳවාගැනීම සඳහා නව්‍යකරණයෙන් යුතු ප්‍රවේශයන් උපයෝගී කර ගැනෙනු ඇත.

**ජාත්‍යන්තර ඉන්ධන**




## විමසුමට ලක් කෙරෙන වසරේ විශේෂ සිදුවීම්

විමසුමට ලක් කෙරෙන වසර ලාභවල විශාල පහත වැටීමක් සහිතව විශේෂයෙන් අභියෝගාත්මක වූවක් විය. අදායම ඉහළ ගිය අතර, වියදම්ද ඒ අයුරින්ම ඉහළ ගියේය.

## මූලික දර්ශක

### ආදායමෙහි 6%ක වැඩිවීමක්

පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 423 සිට රුපියල් බිලියන 446 දක්වා වැඩිවීම


විමසුමට ලක් කෙරෙන වසර තුළදී සියලු අංශවලින් ඉල්ලුම් පාර්ශ්වය 6%කින් (ආසන්න වශයෙන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 23කින්) ඉහළ ගිය අතර, බලශක්ති අංශයේ ඉල්ලුම 20%ක (ශ්‍රී ලංකා රුපියල් බිලියන 18ක) ඉහළ යෑමක් දැකගත හැකිවීම විශේෂ කරුණකි. එයට අමතර වශයෙන්, ගුවන්තෙල් සහ ප්‍රවාහන සඳහා වූ ඉල්ලුම පිළිවෙළින් 7%ක් (ලීටර් මිලියන 39.6) සහ 5%ක් (ලීටර් මිලියන 154) විය.

විකිණුම් පිරිවැයෙහි 28%ක වැඩිවීමක්


පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 326 සිට ශ්‍රී ලංකා රුපියල් බිලියන 418 දක්වා වැඩිවීම

සාමාන්‍ය බොර තෙල් මිල 2016 වසරේ පැවති ඇමෙරිකානු ඩොලර් 44.05 සිට 2017 වසරේදී 54.89 දක්වා ඉහළ ගියේය. එසේම, වාර්ෂික සාමාන්‍ය විනිමය හුවමාරු අනුපාතය 2016 වසරේ පැවති ශ්‍රී ලංකා රුපියල් 154.10 සිට 2017 වසරේදී ශ්‍රී ලංකා රුපියල් 155.41 දක්වා ඉහළ ගියේය. මෙමඟින් 2016 වසරට සාපේක්ෂ වශයෙන් සංස්ථාවේ විකිණුම් පිරිවැය ඉහළ ගියේය. එයට අමතර වශයෙන්, පිරිපහදු කළ නිෂ්පාදන හා බොර තෙල් සම්බන්ධයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළේ සිදුවූ කැපීපෙනෙන ඉන්ධන මිල ඉහළයෑමක් මඟින් සංස්ථාවේ පිරිවැය කෙරෙහි බලපෑමක් එල්ල වූ අතර, එමඟින් දළ ලාභයෙහි පහත වැටීමක් සිදුවිය.

**එ.ජ.ඩො. විකුණුම් අනුපාතිකය**



**බොරතෙල් මිල (ඩුබායි/මර්බන්)**




## පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 53ක සිට ශ්‍රී ලංකා රුපියල් බිලියන 1.5ක් දක්වා ලාභය 97%කින් පහත වැටීම

විශාල වශයෙන් ලාභ පහත වැටීමට හේතු වූයේ ඛනිජ තෙල් නිෂ්පාදන සම්බන්ධ ආනයන වියදම කැපීපෙනෙන ලෙස ඉහළ යාම සහ සංසථාවේ දළ ලාභ සීමාව පහත දැමීමට මුල්වූ විනිමය අනුපාතය වෙනස්වීමය. සංස්ථාවේ ලාභය 2016 වසරේදී දළ ලාභයට සමගාමීව බිලියන 53 සිට බිලියන 1.5 දක්වා පහත වැටිණි. ඒ සමඟම ශුද්ධ ලාභ අනුපාතය 2017 වසරේදී 12.5% සිට 0.3% දක්වා සමානුපාතික වශයෙන් පහත වැටී ඇත.

| අනුපාතය | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| දළ ලාභ අනුපාතය | 10.5% | 22.8% | 6.2% |
| මෙහෙයුම් ලාභ අනුපාතය | 7.1% | 19.2% | 1.7% |
| ශුද්ධ ලාභ අනුපාතය | -5.4% | 12.5% | 0.3% |
| සමස්ත වත්කම් මත ලැබීම් | 13% | 27.76% | 0.7% |

## ආයතනයේ ලාභදායීත්වය කෙරෙහි බලපාන මූලික සාධක

### ඉන්ධන සහනාධාරය

ඛනිජ තෙල් නිෂ්පාදන යනු රජය විසින් මිල ගණන් පාලනය කරනු ලබන නිෂ්පාදන කාණ්ඩ අතරින් එකකි. මෙසේ වන්නේ මේ නිෂ්පාදන ජනතාවට අත්‍යවශ්‍ය වන අතර, ඒවායේ මිල ගණන් ජීවන වියදම කෙරෙහි කැපීපෙනෙන ලෙස බලපාන බැවිනි. මෙහිදී ජනතාව වෙනුවෙන් දරනු ලබන විශාල සහනාධාර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභදායීත්වය කෙරෙහි සමානුපාතික වශයෙන් බලපෑම් එල්ල කර ඇති අතර, සිය ලාභය සමස්ත දේශය වෙනුවෙන් රජයේ සුවිසල් සමාජ සේවාවෙහි කොටසක් ලෙස සලකා එය කටයුතු කර ඇත.

## ඉහළට ගමන් කරන ගෝලීය මිල තත්වයන් තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මිල දරා සිටියි

ඛනිජ තෙල් සම්පත් නොමැති ශ්‍රී ලංකාව විසින් සිය ඛනිජ තෙල් නිෂ්පාදන සියල්ල ගෝලීය වෙළෙඳපොළ මිල ගණන්වලට ආනයනය කළ යුතුව ඇත. එයට අමතර වශයෙන්, මිල ගණන් අඩු වන විට ප්‍රමාණවත් තරම් සංචිත රඳවා ගැනීමට තරම් ශ්‍රී ලංකාවේ ගබඩා ධාරිතාවද ප්‍රමාණවත් නැත. මේ සාධක දෙක හේතු කොටගෙන ගෝලීය වෙළෙඳපොළේ මිල විචල්‍යතාවන්ට මුහුණදීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදුවෙයි.

විමසුමට ලක් කෙරෙන වසර තුළදී බොර තෙල් සඳහා අබුඩාබියේ මර්බන් (FOB) මිල 24%කින් ඉහළ ගිය අතර, එමඟින් ජනවාරි මාසයේ බැරලයකට ඇමෙරිකානු ඩොලර් 44.05ක් ලෙස පැවති සාමාන්‍ය මිල දෙසැම්බර් මාසයේදී බැරලයකට ඇමෙරිකානු ඩොලර් 54.89 දක්වා ඉහළ නැංවිණි. මෙය විකිණුම් පිරිවැය කෙරෙහි තදබල ලෙස බලපෑවේය. ඒ කාලපරිච්ඡේදය තුළදීම සුපර් ඩීසල් සහ ඔටෝ ඩීසල් මිල ගණන්ද පිළිවෙළින් 25%කින් හා 26%කින් ඉහළ ගොස් ඇත. මිල ගණන් කෙටි කාලීන වශයෙන් උඩුකුරු තෙරපුම් තත්වයකට යටත්ව පවතින අතර, වෙළෙඳපොළේ ඉහළසීමාව ඇත්තේ කුමන ස්ථානයකද යන බව හෝ එය ඉහළයෑමේ ප්‍රවණතාවක කොතරම් කාලයක් පවතිනු ඇත්දැයි යන බව හෝ පැහැදිලි නැත.

### රුපියල අවප්‍රමාණවීම

ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය අඩුවීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කෙරෙහි සෘණාත්මක ලෙස බලපෑ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රුපියල් මිලියන 53,027 ක ලාභයක් ලැබූ 2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී එය රුපියල් මිලියන 1,469ක ලාභයක් පමණි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ණය ලබාගැනීමට හැකියාව ඇත්තේ රාජ්‍ය බැංකු වෙතින් පමණක් වන තත්වය යටතේ වෙනත් බැංකු විසින් පිරිනමන ලද තරඟකාරී අනුපාත මඟින් සහන එල ලැබීමට නොහැකි වීමද ලාභදායීත්වයට තවදුරටත් බලපා ඇත.

## තෙල් පිරිපහදු ගබඩාකරණ ඌනතාව

### ප්‍රමාණවත් නොවන බොර තෙල් පිරිපහදු සහ ගබඩා ධාරිතාව

විවිධ බොරතෙල් සහ එයින් පිරිපහදු කරගනු ලබන නිෂ්පාදන එකම ටැංකිවල ගබඩා කළ නොහැකිය. මේවා අතරින් ඇතැම් නිෂ්පාදන සඳහා ගබඩා පහසුකම් ඇති නමුදු, සෙසු ඒවා සඳහා ටැංකි ධාරිතාව ප්‍රමාණවත් නැත. සිය පිරිපහදුකරණ සහ ගබඩාකරණ ධාරිතාවන් පුළුල් කිරීමට සහ වැඩිදියුණු කිරීමට සංස්ථාවට ඇති හැකියාව කෙරෙහි මූල්‍ය සීමාකරණයන් විසින් බලපෑම් එල්ල කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සිදුව ඇත්තේ ලෝක මිල ගණන් අඩු වූ විට විශාල සංචිත මිලදීගෙන

රඳවාගැනීමට හැකියාව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නොමැති වීමය.

## ඩොලර් ණය පියවීමේ දුෂ්කරතාව

සිය මූල්‍ය අභියෝග සපුරාගැනීම සඳහා වරින් වර ලබාගත යුතු වන ඩොලර් ණය පියවීමට ප්‍රමාණවත් අරමුදල් සපයාගත නොහැකිවීමේ අභියෝගයට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නිරන්තරයෙන් මුහුණ දෙයි. රුපියල් අරමුදල මඟින් විනිමය අනුපාත උච්චාවචනයන්ට මුහුණදීමට හැකියාවක් නොලැබෙන අතරම වෙළෙඳපොළේ ප්‍රමාණවත් තරම් ඩොලර් නොමැති වූ අවස්ථාවකදී පවා එයින් ප්‍රයෝජනයක් නැත. මේ තත්වයන් මඟින් ගෙවීමට ඇති ණය නිසි පරිදි පියවීමට අවහිරතා ඇති වනවා මෙන්ම සංස්ථාවේ ණය වාර්තාවන්ට හානිද සිදුවේ. එවැනි තත්වයන් හමුවේ වැඩි පොලී ප්‍රමාණයන් ගෙවීම මඟින් ශුද්ධ වත්කම් කෙරෙහි අහිතකර අන්දමේ පීඩනය එල්ලවීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්වය අවදානමට ලක් වෙයි.

## අබලන් වූ නළ මාර්ග

ආනයනය කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන කොළඹ වරායේ සිට පර්යන්ත දක්වා ගෙන යෑම සඳහා යොදාගනු ලබන නළ මාර්ග විශාල වශයෙන් අලුත්වැඩියාවන් කළ යුතු වන තත්වයක පවතී. බොහෝ අවස්ථාවලදී අනවසර අත්පත් කරගැනීම් සිදුවන බැවින් ඔවුන් ඒ ස්ථානවලින් ඉවත් කොට නළ මාර්ග ආශ්‍රිත බරපතළ නඩත්තු සිදුකිරීම අමිහිරි දේශපාලනික අත්දැකීම් ලබාදෙන කටයුත්තක් බවටද පත්ව ඇත. එබැවින්, මේ ප්‍රශ්නය වසර ගණනාවක් තිස්සේ නොවෙනස්ව පවතින අතර, නළ මාර්ග ආශ්‍රිත කාන්දුවීම් අඩුකරගැනීම සඳහා අඩු පීඩනයක් යටතේ තෙල් පොම්ප කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදුව ඇත. මෙමඟින් තෙල් ගොඩබෑමෙ ක්‍රියාවලිය මන්දගාමී කෙරෙන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වරායේදී තදබදයක් ඇතිවීම මෙන්ම තෙල් ගොඩබෑමෙ කාලය දීර්ඝවීමද නිසා ලංකා ඛනිජ තෙල් සංස්ථාවට දැඩි ලෙස පාඩු විඳීමට සිදු වෙයි.







# කාර්යසාධන විමසුම



## ආදායම

ප්‍රධාණ වශයෙන් ආදායම් ලබා ගැනෙන්නේ ඛනිජ තෙල් නිෂ්පාදන දේශීය වශයෙන් විකිණීම මඟිනි. විමසුමට ලක් කෙරෙන වසර තුළදී ප්‍රධාන ආදායම් ප්‍රභවය වූයේ ගෘහස්ථ විකිණුම්ය. ලෝක වෙළෙඳපොළේ මිල විචල්‍යතා පැවතියද විමසුමට ලක් කෙරෙන වසර තුළදී දේශීය ඛනිජ තෙල් මිල ගණන් ස්ථායීව පවතිනු දැකීමට ලැබීම වැදගත් කරුණකි.





අඛණ්ඩව 2017 වසරේදීද ඉහළම ආදායම ඉපැයුවේ ඔටෝ ඩීසල් වන අතර, දෙවැනියට ඉහළම ආදායම ඉපැයුවේ 92 වර්ගයේ පෙට්‍රල්ය. 95 වර්ගයේ පෙට්‍රල් සහ සුපර් ඩීසල් සඳහා වූ ඉල්ලුමෙහි වැඩිවීම මඟින් දැක්වෙන්නේ වඩාත් කාර්යක්ෂම හා පරිසර හිතකාමී ඉන්ධන සඳහා පාරිභෝගිකයාගේ ඇති කැමැත්තය. සල්ෆර් රහිත එම පරිසර හිතකාමී ඉන්ධන වර්ග පිරවුම්හල් වැඩි ප්‍රමාණයකට හඳුන්වාදීම මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවද සිය පරිසර හිතකාමී මෙහෙයුම් ඉහළ නංවා ඇත.

## වෙනත් ආදායම්

මෙම වසර තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රු. මි. 243 ක ලාභාංශ ආදායමක් ඉපැයූ අතර, එයට ප්‍රධාන වශයෙන්ම දායකත්වය ලැබුණේ එහි අනුබද්ධ සමාගම වන CPSTL වෙතිනි.

## විනිමය අනුපාත විචල්‍යතාව

මෙම වසර තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට විනිමය අනුපාත විචල්‍යතා පාඩුව රු. මි. 4,922 ක් වූ අතර මෙය 2016 වසරට වඩා 44%ක අඩු ප්‍රමාණයකි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මේ පාඩුව සඳහා හේතුව වන්නේ සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කරනු ලබන විට විදෙස් විනිමයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අගය පහත වැටීමය. 2017 වසරේදී ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව 2.50%ක සාමාන්‍ය අගයකින් පහත වැටිණි (2016: 3.83%).





## මූල්‍ය ආදායම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බැංකු අයිරාවන් ලබා නොගන්නේය යන ස්ථාවරයේ රැඳී සිටින අතරම, අමතර මුදල් පොලී ජනනය වන ලෙස ආයෝජනය කරනු ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ආදායම රු. බි. 2.6කින් ඉහළ නැංවුණු අතර, බැංකු අයිරා පොලියක් දැරීමට සිදු නොවිණි. මූල්‍ය ආදායම 2016 වසරට සාපේක්ෂව 32%කින් වර්ධනය වී ඇත. භාණ්ඩාගාර බැඳුම්කර, ස්ථාවර තැන්පතු සහ ඇමතුම් තැන්පතු වෙතින් ලද ආයෝජන ආදායම මේ වර්ධනය සඳහා දායක වූයේ ඒවායේ සිදු කරන ලද ආයෝජන තවදුරටත් ගොඩනැගීමත් සමඟය.

## මූල්‍ය වියදම

මෙම වසර තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රු. බි. 10.53ක මූල්‍ය වියදමක් දරා ඇති අතර, එය




කලින් වසරට වඩා 7%ක් අඩු ප්‍රමාණයකි. මේ වියදම අඩු කර ගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කටයුතු කරන අතර, මේ වසරේදීද කිසිදු අයිරා පොලියක් දැරීමකින් තොරව සිය අරමුදල් ඵලදායී අයුරින් කළමනාකරණය කරගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමත්ව ඇති බව දැකීමට ලැබීම සතුටට කරුණකි. ඵලදායී භාණ්ඩාගාර කළමනාකරණය මඟින් සිය මූල්‍ය වියදම රු. මි. 874කින් අඩුකර ගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකි විය.

## ආදායම් බදු වියදම

ලාභදායීත්වය අඩුවීමට සමගාමීව 2016 වසරට සාපේක්ෂව ආදායම් බදු වගකීම පහත වැටී ඇත. පවතින බදු නීතියට අනුව, බදු අය විය යුතු ආදායම් සඳහා රු. මි. 1,408ක් සහ බෙදාහැරිය හැකි ලාභය සඳහා බදු ලෙස රු. මි. 489ක් ගෙවීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදුවිය.

## ලාභදායීත්වය

සංස්ථාවේ සමස්ථ ලාභදායීත්වය ප්‍රමාණාත්මක ලෙස අඩු වී ඇත. ලාභ අනුපාතයක් පහත දක්වා ඇත.

| | 2017 | 2016 |
|---|---|---|
| දළ ලාභ අනුපාතය | 6% | 23% |
| මෙහෙයුම් ලාභ අනුපාතය | 2% | 19% |
| ශුද්ධ ලාභ අනුපාතය | 0.3% | 13% |





# කාණ්ඩ විශ්ලේෂණය

කළමනාකාරීත්වය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එහි මෙහෙයුම් ප්‍රධාන කාණ්ඩ හයකට බෙදා ඇති අතර, 2017 වසරේදී එම කාණ්ඩවල කාර්යසාධනය පහත ලෙස සාරාංශගත කර දක්වා ඇත.

| කාණ්ඩය | විකිණුම් ආදායම (රු. මි.) | ලාභදායීත්වය (රු.) |
|---|---|---|
| ප්‍රවාහනය | 341,349 | (27,778) |
| බලශක්ති උත්පාදනය | 109,204 | 19,004 |
| ගුවන් තෙල් | 43,109 | 1,930 |
| කර්මාන්ත | 12,724 | 3,795 |
| ගෘහස්ථ | 10,310 | (5,201) |
| කෘෂි | 75 | (121) |
| එකතුව | 516,771 | (8,371) |


## ප්‍රවාහන අංශය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වැඩිම ආදායම් ජනනය සිදු කෙරෙන්නේ ප්‍රවාහන අංශය මඟිනි. මෙම වසර තුළදී එමඟින් රු. බි. 341 ක ආදායමක් ජනනය කරනු ලැබූ අතර, පුද්ගලික වාහන පාවිච්චි කිරීමට පොදු මහජනතාව තුළ ඇති කැමැත්ත සහ ස්ථායී විකිණුම් මිල හේතුකොටගෙන ඉල්ලුම වැඩි විය.

විමසුමට ලක් කෙරෙන වසර තුළදී ඉහළ තත්වයේ වාහන ආනයනය සහ රජය විසින් හඳුන්වාදෙන ලද දැඩි විමෝචන පාලන නියාමනයන් වැනි තත්වයන් යටතේ සුපර් ඩීසල් සහ 95 ඔක්ටේන් පෙට්‍රල් මඟින් සැලකිය යුතු ආකාරයේ වැඩිවීමක් වාර්තා කරනු ලැබ ඇත. මේ ප්‍රවණතාව 2018 වසරේදීද පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. භූමිතෙල් ඉල්ලුමෙහි ඉහළ යෑමක් ඇතිව තිබුණේ ප්‍රධාන වශයෙන්ම වාණිජ වාහන හිමියන් විසින් භූමිතෙල් අයථා ලෙස භාවිත කිරීම නිසා වන අතර, භූමිතෙල් සහ ඩීසල් අතර විශාල මිල වෙනසක් පැවති බැවින් සහ සියලු පිරවුම්හල්වල ලංකා පෙට්‍රල් සහ සුපර් ඩීසල් සිල්ලර අලෙවි පහසුකම් තිබීම නිසා එම තත්වය උග්‍ර අතට හැරී තිබිණි.

සංස්ථාව විසින් 95 ඔක්ටේන් පෙට්‍රල් ලීටර මිලියන 178.5ක අලෙවියක් වාර්තා කර ඇති බැවින් එය 19%ක වැඩිවීමක් වූ අතර, ඩීසල් පාරිභෝජනය වැඩිවී ඇත්තේ 2%කින් පමණි. ඩීසල් වාහනවලට වඩා වැඩි ඉන්ධන පිරිමැසුමකින් යුත් වාහන ප්‍රමාණය වැඩිවීමත් සමඟ ඩීසල් සඳහා වූ ඉල්ලුම ස්ථාවර වූ අතර, විමසුමට ලක් කෙරෙන වසර තුළදී එය වර්ධනය වී ඇත්තේ සුළු වශයෙන් පමණක් වීම නිසා නියෝජිතයින්ට මෙන්ම සිල්ලර අලෙවියටද ඉන් බලපෑමක් එල්ල වී ඇත. විමසුමට ලක් කෙරෙන වසර තුළදී පිරවුම්හල් සංඛ්‍යාව 20කින් වැඩි වූ නමුදු, 2016 සහ 2017 අතර කාලපරිච්ඡේදය තුළ නිකුත් කරන ලද ලිපි අනුව සිදුකිරීමට නියමිතව තිබුණු ඉදිකිරීම් තවමත් කෙරෙමින් පවතින අතර, මේ පිරවුම්හල් දැනට පවතින පිරවුම්හල්වලට වඩා දියුණු පහසුකම්වලින් සමන්විත වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

**ප්‍රවාහන අංශයේ ශුද්ධ ලාභය / (පාඩුව)**





ප්‍රවාහන අංශයේ ඉල්ලුම සම්බන්ධයෙන් වැඩිවීමක් ඇතිව තිබුණු නමුදු, ආනයන වියදම සහ වෙනත් අදාළ වියදම්

පියවීමට විකිණුම් මිල ප්‍රමාණවත් නොවන බැවින්, පෙට්‍රල් සහ ඔටෝ ඩීසල් අලෙවියෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රු. බි. 27.7ක ප්‍රවාහන අංශ පාඩුවක් සිදු විය. පිරිවැය දැක්වෙන මිල යාන්ත්‍රනයක අවශ්‍යතාව මෙහිදී මනාව මතුව ඇත.

## බලශක්ති අංශය

බලශක්ති ජනන අංශයේ ලාභය




පැවති කාලගුණ තත්ත්වය හේතු කොටගෙන කර්මාන්තවල මෙන්ම ගෘහස්ථ පාරිභෝගිකයින්ගේද විදුලි බල භාවිතය ඉහළ ගිය බැවින් බලශක්ති අංශය සඳහා වූ ඉන්ධන අලෙවිය තියුණු ලෙස ඉහළ ගියේය.


ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දෙවැනියට ඉහළම ආදායම් උත්පාදනය බලශක්ති අංශයෙන් සැපයුණු අතර, එමඟින් රු. බි. 109 ක ආදායමක් උපයනු ලැබුවේ 2016 වසරේ ආදායම වූ රු. බි. 91 ට සාපේක්ෂව 20% ක වැඩිවීමක් සහිතවය. මේ වසරේ ලාභදායීත්වයට වැඩිම දායකත්වයක් සැපයූ එමඟින් රු. බි. 19 ක ලාභයක් ලැබිණි. ඩීසල් මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රු. බි. 37.7 ක ආදායමක් ජනනය වූ නමුදු, එමඟින් රු. බි. 0.16 ක ශුද්ධ අලාභයක් සිදුව තිබිණි. අදාළ අංශයේ ලාභදායීත්වයට වැඩිම දායකත්වයක් සැපයුණේ 800 දැවි තෙල් මඟින් වන අතර, ඉපැයූ ලාභය රු. බි. 10.7 ක් විය. නැප්තා ආදායම රු. බි. 14.9 ක් වූ අතර. ඉපැයූ ලාභය රු. බි. 3.16 ක් විය. බලශක්ති අංශයෙන් ලැබුණු ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා කිසිදු බාධාවකින් තොරව සැපයුම් ලබාදීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකිවීම සතුටට කරුණකි.

## ගුවන් තෙල් අංශය

මෙම වසර තුළදී ගුවන් තෙල් අංශය මඟින් රු. බි. 43 ක ආදායමක් උපයමින්, පසුගිය වසරට සාපේක්ෂව 34% ක වැඩිවීමක් වාර්තා කරනු ලැබ ඇති අතර, රු. බි. 1.93 ක ලාභයක් හිමි කරගෙන ඇත. පිරිවැය දැක්වෙන මිල ක්‍රමය හඳුන්වාදීමත් සමඟ ජාත්‍යන්තර තෙල් මිල ගණන් අනුව ජෙට් ඒ-1 සහ ඒවිගෑස් මිල ගණන් අඩුවී ඇත. ජෙට් ඒ-1 දේශීය පාරිභෝගිකයින්ගෙන් ලැබෙන ඉල්ලුම ඉහළ යමින් පවතින අතර, සංචාරක කර්මාන්තයේ ව්‍යාප්තියත් සමඟ එය තවදුරටත් වැඩිදියුණු කරගැනීමට අවස්ථාවක් ඇත.

## කර්මාන්ත අංශය

කර්මාන්ත අංශයේ ලාභය







ලාභදායිත්වයට දෙවැනියට වැඩිම දායකත්වය සැපයුණේ මේ අංශයෙනි. කර්මාන්ත අංශයෙන් ලැබුණු ආදායම රු. බි. 12.72 ක් වූ අතර, එය කලින් වසරට වඩා 10%ක අඩුවීමකි. මේ අංශයට වැඩිම දායකත්වයක් සැපයුවේ 800 දැවි තෙල් මඟින් වන අතර, එමඟින් රු. බි. 3.44 ක ලාභයක් උපයනු ලැබිණි.

2016 වසරේදී තාර ලාභ උපයන මට්ටමක පැවති නමුදු, මෙවර එහි විකිණුම් මඟින් රු. මි. 13.4 ක පාඩුවක් ඇති විය. ආනයනයේදී දැරීමට සිදුවූ අධික වියදම හේතුවෙන් වසර ආරම්භයේදී ආනයනය කරන ලද තොග සංස්ථාවේ ගබඩාවල රඳවා තිබුණු බැවින් විමසුමට ලක් කෙරෙන වසර තුළදී නිෂ්පාදන සැපයුම් තත්වය ඉහළ ගොස් තිබිණි. තරගකරුවන් විසින් වඩා අඩු මිල ගණන්වලට නිෂ්පාදන ආනයනය කළ බැවින් සංස්ථාවෙන් වෙනුවට තරගකරුවන්ගෙන් නිෂ්පාදන මිලදීගැනීමේ තත්වයක් ඇතිව තිබිණි. කෙසේවුවද, 2017 අවසාන භාගය වන විට ප්‍රමාණාත්මක දළ ලාභයක්ද වාර්තා කරමින් සිය සමස්ත තාර තොගය විකුණා අවසන් කිරීමට සංස්ථාවට හැකි විය. සපුගස්කන්ද පිරිපහදුවේදී තාර සැකසීමට නව පියවර ගනු ලැබ ඇති අතර, එම තාර 2018 වන විට වෙළෙඳපාළට පැමිණ, අහිමි වූ වෙළෙඳපොළ කොටස යළි ලබාගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකියාව ලබා දෙනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

## ගෘහස්ථ අංශය

භූමිතෙල් ඉතා ඉහළ සහනාධාරකරණයක් සහිත මිලකට සපයනු ලැබූ අතර, ගෘහස්ථ අංශය ආශ්‍රිතව දිගින් දිගටම පාඩු සිදුවිය. මේ අංශයේ රු. බි. 5.2ක පාඩුවක් සිදුවිය. භූමිතෙල් විකිණුම් ප්‍රමාණය රු. බි. 8.4ක් වූ අතර, එමඟින් රු. බි. 5.4 ක ශුද්ධ පාඩුවක් ජනනය කෙරිණි. එල්. පී. ගෑස් අලෙවිය රු. මි. 589 සිට රු. මි. 1,822 දක්වා ඉහළ නැංවුණු අතර, එමඟින් රු. මි. 273 ක ලාභයක් ලැබිණි.

**ගෘහස්ථ අංශයේ ලාභය/අලාභය**






## කෘෂි අංශය

කෘෂි අංශයේ විකිණුම් රු. මි. 41 සිට රු. මි. 75 දක්වා ඉහළ ගොස් ඇති නමුදු, පාඩුවද රු. මි. 90 සිට රු. මි. 121 දක්වා ඉහළ ගොස් ඇත.

විමසුමට ලක් කෙරෙන වසර තුළදී ISO 18001 සහ OHSHAS සඳහා ISO කාර්යසාධන විමසුම් පවත්වනු ලැබිණි.

එසේම, අපජලය සැකසීමේ බලාගාරයේ ඉදිකිරීම් කටයුතු 95%ක් සම්පූර්ණත්වය කරා ළඟා වී ඇති අතර, එය ළඟදීම ක්‍රියාත්මක වනු ඇත. ඉහළ ශක්‍යතාවන් සහිත ප්‍රදේශවල සිපෙට්කෝ කෘෂි රසායන නියෝජිතයින් පත් කරමින් බෙදාහැරීම් ජාලය සම්බන්ධ වැඩිදියුණු කිරීම් සිදු කරන අතරම, මාතර දිස්ත්‍රික්කය සඳහා නව තොග රැඳවුම්හිමියකු පත්කිරීමටද පියවර ගනු ලැබිණි. එයට අමතර වශයෙන්, නව නිෂ්පාදන තුනක්ද වෙළෙඳපොළට හඳුන්වාදෙනු ලැබිණි.

ග්ලයිෆොසේට් තහනම නිසා සිදුවූ ආදායම් අහිමිවීම සමනය කිරීමට මෙය වැදගත් වී ඇත. නව කළමනාකාරීත්වයත් සමඟ 2018 වසරේදී තවත් ඉහළ වර්ධනයක් අත්පත් කරගැනීමට අපි අපේක්ෂා කරන්නෙමු.



# පිරිපහදුව

## සමස්ත කාර්යසාධනය

2017 වසර තුළදී මර්බන් 95.6% ක් සහ DAS බොරතෙල් 4.4% ක් සකසනු ලැබිණි.

සැකසූ බොර තෙල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,950,000 ක් වූ අතර, සාමාන්‍ය පිවිසුම් ප්‍රමාණය දිනකට ටොන් 4687 ක් සහ දිනදර්ශන දිනයකට ටොන් 4510 ක් විය. පිරිපහදුව 96.23%ක මෙහෙයුම් කාල කාර්යක්ෂමතාවකින් යුතු දින 351.22 ක් පුරා ක්‍රියාත්මක කෙරිණි.

බොර තෙල් ටොන් එකක් සැකසීම සඳහා සමස්ත පිරිවැය පහත දැක්වෙන පරිදි වේ.

| බොර තෙල් ටොන් එකක් සඳහා සමස්ත සැකසුම් පිරිවැය | 2017 (රු) | 2016 (රු) | % වැඩිවීම |
|---|---|---|---|
| ඉන්ධන භාවිතය, සහ බැංකු ගාස්තු රහිතව | 2,139.18 | 1,937.15 | 10.429 |
| ඉන්ධන භාවිතය සහිත වුවත් බැංකු ගාස්තු රහිතව | 4,754.36 | 3,572.80 | 33.07 |

පෙර වසරට සාපේක්ෂව, දැවි තෙල් සහ ගෑස් පාරිභෝජනය ප්‍රමාණාත්මක වශයෙන් 11.01%කින් වැඩි වූ නමුදු, වෙළෙඳපොලේ දැවි තෙල් සහ ගෑස් සඳහා වූ විශාල මිල වැඩිවීම සහ රුපියලේ අගය අඩුවීම නිසා වටිනාකම අතින් 52.5%කින් පමණ වැඩි විය.

පෙර වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් එකක් සඳහා සැබෑ සමස්ත මෙහෙයුම් පිරිවැය 32.17%කින් වැඩි වී තිබිණි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ වසර තුළදී භාවිත ඉන්ධන සහ ගෑස් පිරිවැය වැඩිවීමය.


## ගින්දර සහ ආරක්ෂාව

අදාළ වසර තුළදී කුඩා ගින්නක් වාර්තා වුවද, භාණ්ඩ හෝ දේපලවලට හානියක් සිදු නොවිණි. විධායක සහ විධායක නොවන පිරිස් සඳහා ගිනි පුහුණු පන්ති පවත්වන ලද අතර, ගිනි සම්බන්ධ අභ්‍යාස නිතිපතා පවත්වනු ලැබිණි. සියලු ගිනි එන්ජින්, ගිනි දිය පොම්ප සහ සෙසු උපකරණ නිතිපතා පරීක්ෂා කර, විගණනය කරන ලද අතර, උපකරණ මනා ක්‍රියාකාරී තත්වයෙන් පවත්වාගනු ලැබිණි. සියලු සේවකයින් සඳහා හුස්මගැනීමේ යන්ත්‍ර භාවිතයද ඇතුළුව ආරක්ෂක පුහුණුව නිතිපතා ලබාදෙනු ලැබිණි. ඉලක්ක පදනම් කරගත් ආරක්ෂක සම්මාන වැඩසටහන සමඟ මුදල් සම්මාන පිරිනැමීමද කලින් මෙන්ම ''මාසයේ වීරයා'' සම්මානයද පැවැත්විණි. නිතිපතා ආරක්ෂක විගණන, පරීක්ෂා සහ ගෘහස්ථ සේවා සමීක්ෂණද පැවැත්විණි. මෙහෙයුම්, ඉංජිනේරු සහ කළමනාකරණ ආරක්ෂාව පිළිබඳ රැස්වීම් සෑම කාර්තුවකම පවතුවනු ලැබිණි. ආරක්ෂා, සෞඛ්‍ය සහ පරිසර සතිය 2017 නොවැම්බර් 20 සිට 27 දක්වා පැවැත්විණි.


## ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුම

ලාෆ්ස් ගෑස් ලිමිටඩ් සහ ලිට්රෝ ගෑස් වෙත සපයන ලද එල්. පී. ගෑස් සැපයුම් ප්‍රමාණයන් පිළිවෙළින් මෙට්‍රික් ටොන් 2,539 ක් සහ මෙට්‍රික් ටොන් 16,764 ක් වූ අතර, ලංකා විදුලිබල මණ්ඩලයට සහ වීෂියා පවර් වෙත සපයන ලද 800 දැවි තෙල් ප්‍රමාණයන් පිළිවෙළින් මෙට්‍රික් ටොන් 165,991 ක් සහ මෙට්‍රික් ටොන් 4,964 ක් විය.





# ආයතනික පාලනය




මනා ආයතනික පාලනය මඟින් කොටස් හිමියන්ගේ අගය සහ සංස්ථාවේ සම්පත් ආරක්ෂා කිරීම හා උපාය මාර්ගික අරමුණු සපුරාගැනීම සඳහා සවිමත් පදනමක් සපයනු ලබයි. සෘජුභාවයේ ඉහළම මට්ටම් රඳවා ගනිමින් සහ උපරිම ආකාරයෙන් යහපාලනය පවත්වාගැනීමේදී අවශ්‍ය වන අනුකූලතාවන් අනුව ක්‍රියාකාරීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් හා ක්‍රියාකාරකම් පිළිබඳව මහජන ව්‍යාපාර කමිටුව (COPE) මඟින් සිදු කරනු ලබන ස්වාධීන විමසුම සහ පොදු මහජනතා විසින් දක්වනු ලබන උනන්දුව ඉතා වැදගත් වෙයි.

## පාලන කාර්යරාමුව




## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය

සංස්ථාවේ ගාමක බලය වන්නේ ආයතනයේ උපාය මාර්ගය, මූල්‍ය සහ පිළිගැනීම කෙරෙහි බලපාන මෙන්ම රටේ ජනතාවගේ ජීවිතවලට වැදගත් වන තීරණ ගැනීම සඳහා වරින් වර කැඳවනු ලබන, ඉහළම සුදුසුකම් සහ පළපුරුද්ද සහිත අධ්‍යක්ෂ මණ්ඩලයයි. මේ කරුණුවලදී, අධ්‍යක්ෂ මණ්ඩලය සිය සාමූහික ශක්‍යතාවන් මෙහෙයවන්නේ 1961 වසරේ අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත මඟින් එයට පැවරී ඇති කාර්යභාරයට අනුකූල වන පරිදි ආයතනික පාලනය සම්බන්ධ ඉහළම මට්ටම් තහවුරු කරගැනීම සඳහාය. අධ්‍යක්ෂවරුන්ගේ කාර්යභාරයන් සහ වගකීම්, ඔවුන්ගේ නිවැරදි සංයුතිය මෙන්ම ඔවුන්ගේ අදාළ තනතුරු හා සම්බන්ධ කාලසීමාවන් අර්ථදැක්වීමද ඔවුන්ට පැවරී ඇති කාර්යයකි.

මණ්ඩලය පත් කරනු ලබන්නේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමන් විසින් වන අතර, මහා භාණ්ඩාගාරයේ සහ රේඛීය අමාත්‍යංශයේ නියෝජිතයකු මණ්ඩලයට ඇතුළත්වීම අත්‍යවශ්‍ය වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ පමණක් විධායක මට්ටමට අයත් වන අතර, සෙසු පිරිස විධායක නොවන මට්ටමට අයත් වේ. මෙයට පෙර, ඉහත සඳහන් කරන ලද තනතුරු දෙකම එකම පුද්ගලයකු විසින් දරනු ලැබූ නමුදු, විගණන විමසුමක් අනුව මෙම වසරේදී එම තනතුරු දෙක වෙන් කරනු ලැබිණි.

| නම | තනතුර | පත්වීම |
|---|---|---|
| ටී. ජී. ජයසිංහ මහතා | සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ | 2015.10.12 |
| ඩී. සී. ෂෙහාන් සෙනෙවිරත්න මහතා | අධ්‍යක්ෂ | 2015.10.12 |
| සමන් ප්‍රනාන්දු මහතා | අධ්‍යක්ෂ | 2016.03.17 |
| ප්‍රසාද් ගල්හේන මහතා | අධ්‍යක්ෂ | 2015.10.12 |
| රසංග හරිශ්චන්ද්‍ර මහතා | අධ්‍යක්ෂ | 2015.10.12 |

| | | |
|---|---|---|
| එම්. ජී. ජයසේන මහතා | අධ්‍යක්ෂ | 2015.10.12 |
| කේ. වී. විමලෙන්තිරරාජා | අධ්‍යක්ෂ | 2015.11.19 |
| මහාචාර්ය මොනිෂ් ගුණවර්ධන මහතා | සභාපති | 2016.05.05 |
| නදුන් ප්‍රනාන්දු මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | 2016.05.05 |
| දම්මික රණතුංග මහතා | සභාපති | 2017.05.29 |
| මහාචාර්ය ඩබ්ලිව්. එල්. ප්‍රසන්න පෙරේරා මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | 2017.05.29 |
| ආර්. වී. නිමල් ජයසුන්දර මහතා | අධ්‍යක්ෂ | 2017.05.29 |
| ශෂී ධනතුංග මහතා | අධ්‍යක්ෂ | 2017.05.29 |
| ඩබ්ලිව්. එස්. පෙරේරා මහතා | අධ්‍යක්ෂ | 2017.05.29 |

| නම | තනතුර | ඉල්ලා අස්වීම |
|---|---|---|
| ටී. ජී. ජයසිංහ මහතා | සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ | 2017. 01. 27 |
| ඩී. සී. ෂෙහාන් සෙනෙවිරත්න මහතා | අධ්‍යක්ෂ | 2017. 05. 23 |
| සමන් ප්‍රනාන්දු මහතා | අධ්‍යක්ෂ | 2017. 05. 22 |
| ප්‍රසාද් ගල්හේන මහතා | අධ්‍යක්ෂ | 2017. 05. 22 |
| රසංග හරිශ්චන්ද්‍ර මහතා | අධ්‍යක්ෂ | 2017. 05. 28 |
| එම්. ජී. ජයසේන මහතා | අධ්‍යක්ෂ | 2017. 03. 02 |
| මහාචාර්ය මොනිෂ් ගුණවර්ධන මහතා | සභාපති | 2017. 05. 05 |
| නදුන් ප්‍රනාන්දු මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | 2017. 05. 05 |

සටහන: විමසුමට ලක් කෙරෙන වසර තුළදී කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්විණි.

## 2017 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගිත්වය

සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වෙන අතර, අවශ්‍ය වූ අවස්ථාවලදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවනු ලබයි. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ආරාධනා මත රැස්වීම්වලට සහභාගි වෙයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් න්‍යායපත්‍රයක් අනුව පැවැත්වෙන අතර, රැස්වීම්වලට පෙර ආයතනික කළමනාකාරීත්වය විසින් අදාළ සවිස්තරාත්මක පසුබිම් තොරතුරු අධ්‍යක්ෂවරුන්ට ලබාදෙනු ලැබේ. අදාළ වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 16 ක් පැවැත්විණි. ඒ රැස්වීම්වලදී අධ්‍යක්ෂවරුවන්ගේ සහභාගිත්වය පහත වගුව මඟින් දැක්වේ.



| නම තනතුර | දිනය හා රැස්වීම් අංක | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017.01.11 | 2017.01.18 | 2017.03.02 | 2017.03.02 | 2017.04.04 | 2017.05.05 | 2017.06.02 | 2017.06.09 | 2017.07.07 | 2017.07.28 | 2017.09.04 | 2017.10.02 | 2017.10.20 | 2017.11.14 | 2017.11.24 | 2017.12.21 |
| | 1193 | 1194 | 1195 | 1196 | 1197 | 1198 | 1199 | 1200 | 1201 | 1202 | 1203 | 1204 | 1205 | 1206 | 1207 | 1208 |
| ටී. ජී. ජයසිංහ මහතා සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ | ✓ | ✓ | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● |
| ඩී. සී. ෂෙහාන් සෙනෙවිරත්න මහතා අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | × | ✓ | ✓ | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● |
| සමන් ප්‍රනාන්දු මහතා අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● |
| ප්‍රසාද් ගල්හේන මහතා අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | × | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● |
| රසංග හරිශ්චන්ද්‍ර මහතා අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● |
| එම්. ජී. ජයසේන මහතා අධ්‍යක්ෂ | ✓ | ✓ | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● |
| කේ. ඩී. විමලෙන්තිරරාජා මහතා අධ්‍යක්ෂ | ✓ | × | ✓ | ✓ | × | ✓ | ✓ | × | × | ✓ | ✓ | ✓ | ✓ | × | ✓ | ✓ |
| මහාචාර්ය මොනිෂ් ගුණවර්ධන මහතා සභාපති | - | - | ✓ | ✓ | ✓ | ✓ | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● |
| නදුන් ප්‍රනාන්දු මහතා කළමනාකාර අධ්‍යක්ෂ | - | - | ✓ | ✓ | ✓ | ✓ | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● |
| දම්මික රණතුංග මහතා සභාපති | - | - | - | - | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | × | ✓ |
| මහාචාර්ය ඩබ්ලිව්. එල්. ප්‍රසන්න පෙරේරා මහතා අධ්‍යක්ෂ | - | - | - | - | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | × | ✓ | ✓ | × |
| ආර්. ඩී. නිමල් ජයසුන්දර මහතා අධ්‍යක්ෂ | - | - | - | - | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ශෂී ධනතුංග මහතා අධ්‍යක්ෂ | - | - | - | - | - | - | × | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ඩබ්ලිව්. එස්. පෙරේරා මහතා අධ්‍යක්ෂ | - | - | - | - | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| අතුල බණ්ඩාර හේරත් මහතා අධ්‍යක්ෂ | - | - | - | - | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | × | ✓ | ✓ | ✓ | ✓ |

සටහන : පැමිණි ✓ නොපැමිණි × ඉල්ලා අස්විය ● නව අයදුම්කරුවන් -

රැස්වීම් ගණන 2017 - 16

## අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය

වර්ෂ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත අනුව නැවත පත්කිරීමේ පදනමට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ වසර තුනක කාලපරිච්ඡේදයක් නොඉක්මවන ආරම්භක ධූර කාලයන් අධ්‍යක්ෂවරුන්ට හිමිය. තීරණ ගැනීමට පෙර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික කළමනාකාරීත්ය වෙතින් සහ අවශ්‍ය වුවහොත්, බාහිර වෘත්තිකයින් වෙතින්ද අදාළ තොරතුරු සපයාගනු ලබයි. අදාළ තොරතුරු නිසි කලට වෙලාවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙමින් මණ්ඩලයට සිය වගකීම් කාර්යක්ෂමව ඉටුකිරීමේ හැකියාව සැලසීමට ආයතනික කළමනාකාරීත්වය බැඳී සිටියි.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

සංස්ථාවේ සාර්ථකත්වය සහ තිරසාරත්වය උදෙසා වන සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. එහි කාර්යභාරය මූලික වශයෙන්ම යොමු වන්නේ හිමිකරුවන්ගේ ඉහළම අභිලාෂයන් රැකෙන පරිදි කටයුතු කරන අතරම සංස්ථාවේ උපාය මාර්ගික දිශානතීන් සහ සමස්ත කාර්යසාධනය උදෙසා මනා නායකත්වයක් ලබාදීම කෙරෙහිය.

සංස්ථාවේ දැක්ම සපුරාලීම සඳහාද අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටියි. මේ වගකීම ඉටුකිරීමේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ උපාය මාර්ගය හඳුනාගැනීම, එහි මෙහෙයුම් කාර්යසාධනය සහ මූල්‍ය ප්‍රතිඵල අධීක්ෂණය මෙන්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආයතනික පාලන කාර්යරාමුව පිළිබඳ උත්තරීතර භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා වන ඉහළම වගවීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. එසේම, සංස්ථාපිත අවශ්‍යතා සහ ආචාරධර්ම පිළිබඳ ප්‍රමිතීන් අනුව කටයුතු කිරීමේ වගකීමෙන්ද ඔවුන් බැඳී සිටියි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය බලතල හෝ කාර්යභාරයන් ඕනෑම අධ්‍යක්ෂවරයකු හෝ සේවකයකු වෙත පැවරිය හැකි වන අතර, එසේ බලතල පවරනු ලබන සෑම අයෙකු විසින්ම, ඔහු හෝ ඇය වෙත පැවරෙන බලතල හෝ කාර්යභාරය අධ්‍යක්ෂ මණ්ඩලයේ පොදු හා විශේෂ අධීක්ෂණයන්ට යටත්ව ක්‍රියාත්මකකිරීම හෝ ඉටුකිරීම කළ යුතු වෙයි. ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරීම මෙන්ම ඒවා සාර්ථකව ක්‍රියාත්මක වන බව තහවුරු කරගැනීම මගින් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් ඵලදායී ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය උත්සාහ දරයි. අභ්‍යන්තර සහ බාහිර විගණකවරුන් මෙන්ම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායමේ සියලු සාමාජිකයින් සමග අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සෘජුවම සන්නිවේදන කටයුතු සිදු කරයි.

ඉහත සඳහන් කළ ක්ෂේත්‍රවලට අමතර වශයෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය වාර්තා, ආයතනික සැලැස්ම සහ ක්‍රියා සැලැස්ම සඳහා අනුමැතිය ලබාදීම මෙන්ම නිතිපතා පදනමකින් මූල්‍ය කාර්යසාධනය විවරණය කිරීම සම්බන්ධ වගකීමද අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. මූලික පත්වීම්, කාර්යමණ්ඩල උසස්වීම්, ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ආයෝජන සහ ආයතනික පාරිභෝගිකයන්ට ණය පහසුකම් ලබාදීම සම්බන්ධ අනුමැතීන් සඳහා අවසර ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අධීක්ෂණය කෙරෙයි.

## උප කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලයට විගණන කමිටුවේ සහයෝගය ලැබෙන අතර, එමඟින් මණ්ඩලයේ ඇතැම් මූලික කාර්යභාරයන් ක්‍රියාත්මක කෙරෙයි. එයට අමතර වශයෙන් කළමනාකරණ කමිටුව, තොග විමසුම් කමිටුව, ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණ ඇගයීම් කමිටුව යනාදී වශයෙන් උප කමිටු හතරක් ඇත.

## විගණන කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලයට වගවීමෙන් යුතුව විගණන කමිටුව කළමනාකාරීත්වයෙන් ස්වාධීන කාර්යභාරයක් ඉටුකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් විගණන කමිටුව සමන්විත වෙයි. විගණන කමිටුවේ සංයුතිය, ඉටුකරනු ලබන කාර්යභාරය, රැස්වීම් සංඛ්‍යාව සහ සහභාගිත්වය මේ වාර්ෂික වාර්තාවේ 68 සහ 69 පිටුවල සවිස්තරාත්මකව දක්වා ඇත.

## කළමනාකරණ කමිටුව

කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් හෝ තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් අතරින් එක් අයෙකු කමිටුවේ සභාපති ලෙස කටයුතු කරයි. කාර්ය ප්‍රධානියා අදාළ රැස්වීම්වලටද සහභාගි වෙයි. විමසුමට ලක් කෙරෙන වසර තුළදී මේ කමිටුව රැස්වූයේ නැත.

## තොග විමසුම් කමිටු

පවතින තොගවල තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව තොග විමසුම් කමිටුව විසින් ඉදිරි මාස තුන සඳහා වන තොග අවශ්‍යතාව ඇගයීමට ලක් කරනු ලබයි. CPSTL, IOC, PUCSL සහ විදුලිබල මණ්ඩල නියෝජිතයින්ගේ සහභාගිත්වය සහිතව එය සතිපතා රැස්වෙයි. රටට අවශ්‍ය වනු ඇතැයි කල්තියා අනුමාන කරනු ලබන ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන හැකියාවන් සහ ටැංකි ගබඩා ධාරිතා යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමෙන් අනතුරුව ආනයන ප්‍රමාණයන් සහ නැව්ගත කිරීම් සම්බන්ධ කටයුතු සැලසුම් කෙරෙයි. නිතිපතා කෙරෙන ආනයන, පිරිපහදු හා රැඳවුම් වියදම් අවමකරන අතරම, රටේ ඉන්ධන සැපයුම අවහිරතාවකින් තොරව පවත්වා ගනිමින් කටයුතු කිරීමට සංස්ථාවට මේ සමීප අධීක්ෂණ ක්‍රියාවලිය මඟින් හැකියාව ලබාදෙනු ලබයි.

## ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණ ඇගයීම් කමිටුව

භාණ්ඩ, නිෂ්පාදන, සේවාවන් හා කාර්යයන් මිලදීගැනීමට ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය (NPA) විසින් මාර්ගෝපදේශන පද්ධතියක් නිකුත් කරනු ලැබ ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා විනිවිදභාවය සහතික කරගැනීමට, පමාවන් අවම කරගැනීමට සහ මූල්‍ය වශයෙන් වඩාත් වාසිදායී හා ගුණාත්මක වශයෙන් හොඳම සේවාවන් සහ සැපයුම් ලබාගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශන යටතේ තාක්ෂණ ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව කටයුතු කරයි. තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් එම මිලදීගැනීම්වල තාක්ෂණික අංශය කෙරෙහි අවධානය යොමු කරනු ලබන අතර, ප්‍රසම්පාදන කමිටුව විසින් මිලදීගැනීමක වෙනත් අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලබයි.

මිලදීගැනීමෙහි වටිනාකම අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පහත දැක්වෙන ප්‍රසම්පාදන කමිටු ක්‍රියාත්මක වෙයි.

- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
- අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුව
- අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව
- ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව
- ප්‍රදේශීය ප්‍රසම්පාදන කමිටුව

## හිමිකරුවන් හා සබඳතා

සංස්ථාවේ ව්‍යාපාර අඛණ්ඩතාව එහි සියලු හිමිකරුවන් සමඟ පවතින සුහද හා අර්ථවත් සබඳතාව මත රඳා පවතියි. සංස්ථාව සහ එහි හිමිකරුවන් අතර අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අවබෝධ කරගෙන සිටියි. අධ්‍යක්ෂවරුන්ගේ අදහස අනුව, සංස්ථාවේ ඉහළම මුල්හිමිකාරත්ව සබඳතා හා පාලන පාර්ශ්වය වන්නේ ශ්‍රී ලංකා රජයයි. සංස්ථාවේ මෙහෙයුම් පාලනය කිරීම සඳහා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශය, මහා භාණ්ඩාගාරය සහ ශ්‍රී ලංකා මහබැංකුව සමඟ සංස්ථාව සමීපව කටයුතු කරයි. සංස්ථාව විසින් ප්‍රධාන ව්‍යාප්ති වැඩසටහන් සහ අරමුදල්කරණය සම්බන්ධ උපදෙස් සහ මඟපෙන්වීමද එම ආයතනවලින් ලබාගනු ලබයි. සභාපති / කළමනාකාර අධ්‍යක්ෂවරයා රජය සමඟ කටයුතු කරන ප්‍රධානතම සම්බන්ධීකාරක පුද්ගලයා වන අතර, අදාළ සන්නිවේදනයන් වාචිකව මෙන්ම ලිඛිතවද සිදු කෙරෙයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නීතිමය වශයෙන් අවශ්‍ය වන සහ වෙනත් අදාළ තොරතුරු හැකි උපරිම අයුරින් රජයට ලබාදෙනු ලබයි.

## අභ්‍යන්තර පාලනයන්

ගැටලුවකින් තොරව ක්‍රියාත්මකවීම සඳහා සංස්ථාවට ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් අත්‍යවශ්‍ය වේ. මෙම පද්ධතියෙන් අපේක්ෂා කෙරෙනුයේ සංස්ථාවේ වත්කම් ආරක්ෂා කරගැනීමට සහ මනා වාර්තා පවත්වාගැනීම හා විශ්වාසදායී තොරතුරු ඉදිරිපත්කිරීම සිදු කෙරෙන බව තහවුරු කරගැනීමය. මෙම අභ්‍යන්තර පාලන පද්ධතිය මඟින් මූල්‍ය, මෙහෙයුම් හා අනුකූලතා පාලනයන් මෙන්ම අවදානම් කළමනාකරණය ඇතුළු සියලු ආකාරයේ පාලනයන් ආවරණය කෙරෙයි. ප්‍රායෝගික වශයෙන්, අභ්‍යන්තර පාලන පද්ධතිය මඟින් කරනු ලබන්නේ ප්‍රතිපත්ති සහ ව්‍යාපාර අරමුණු සපුරාගැනීම සඳහා අසමත්වීම් සම්බන්ධ අවදානම ඉවත් කිරීමට අවදානම් කළමනාකරණ අංශයේ සඳහන් පරිදි පිළිගත හැකි අවදානම් පරාසයක් තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන අවදානම් ප්‍රදේශ පාලනය කිරීමය. ඒ අනුව, අභ්‍යන්තර පාලන පද්ධතිය මඟින් කළ හැකි වන්නේ කළමනාකරණ හා මූල්‍ය තොරතුරු සහ වාර්තා හෝ මූල්‍ය පාඩු හා වංචා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශන වළකාලන නිරපේක්ෂ නොවන නමුදු, පිළිගත හැකි ආකාරයේ තහවුරු කිරීමක් සැපයීම පමණි.

සියලු අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් සහ ඒවායේ ප්‍රාමාණිකත්වය මෙන්ම ඵලදායීතාව විමසා බැලීම සහ අභ්‍යන්තර පාලන කටයුතු සම්බන්ධ වැඩිදියුණුකිරීම් සඳහා නිර්දේශයන් ඉදිරිපත් කිරීම සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශයට භාරවී ඇත.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය මෙහෙයවනු ලබන්නේ වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරීවරයකු විසිනි. විගණන කමිටුව විසින් අනුමත කරන ලද විගණන සැලසුම් මඟින් අභ්‍යන්තර පාලන කටයුතු ඇගයීම, අවදානම් ප්‍රදේශ හඳුනාගැනීම සහ ගනුදෙනු සම්බන්ධ පූර්ණත්වය තහවුරු කරගැනීම යනාදිය සිදුකෙරෙයි. එයට අමතර වශයෙන් කළමනාකාරීත්වයට නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීමේ අරමුණ ඇතිව විශේෂ විමර්ශන පැවැත්වීමටද ඒවා යොදාගැනෙයි. නිෂ්පාදන හානි හා ආදායම් අඩුවීම හා සම්බන්ධ ප්‍රදේශවලට අදාළ අවදානම් හඳුනාගැනීම, විගණන ගැටලුවලට පිළිතුරු සමඟ විගණකාධිපතිවරයාගේ වාර්තාව සාකච්ඡා කිරීම සහ සිදු කෙරෙන සැබෑ කටයුතු සමඟ විගණන සැලසුම් පිළිබඳ කලින් කලට විමසුම් සිදුකිරීම යනාදිය අභ්‍යන්තර විගණනය මඟින් සිදු කෙරෙන සෙසු කටයුතු වේ.

## ආයතනික කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කලට අනුමත කරනු ලබන උපාය මාර්ගික දිශානතීන්, ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් මත පදනම්ව සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ විසින් සංස්ථාවේ සාමාන්‍ය කටයුතු කළමනාකරණය කරනු ලබයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන පරිපාලනය ප්‍රදේශීය කාර්යාලවලටද අදාළ වන පරිදි පිරිපහදු මෙහෙයුම් සහ ප්‍රධාන කාර්යාල මෙහෙයුම් යනාදී වශයෙන් මූලික කාණ්ඩ දෙකකට වෙන් කෙරෙයි.

පිරිපහදු මෙහෙයුම්වල ප්‍රධානත්වය පිරිපහදු කළමනාකරු විසින් දරනු ලබන අතර, විදුලි හා උපකරණ, නිෂ්පාදන හා මෙහෙයුම්, නඩත්තු හා ව්‍යාපෘති සහ තාක්ෂණ සේවා වැනි විවිධ මූලික තාක්ෂණික අංශවලට අදාළ නියෝජ්‍ය පිරිපහදු කළමනාකරුවන්ගේ සහාය ඔහුට ලැබෙයි.

වඩාත් යහපත් කළමනාකරණයක් සඳහා, ප්‍රධාන කාර්යාලය ඒකක කිහිපයකට වෙන් කෙරෙන අතර, ඒ සෑම ඒකකයකම ප්‍රධානත්වය දරනු ලබන්නේ සංස්ථාවේ එදිනෙදා කටයුතුවලදී සභාපතිතුමාට / කළමනාකාර අධ්‍යක්ෂතුමාට සහාය වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයකු හෝ කළමනාකරුවකු විසිනි. ආයතනික කළමනාකරුවන් අදාළ ක්ෂේත්‍රවල අවශ්‍ය කුසලතා, පළපුරුද්ද සහ විද්වත් හා වෘත්තීය සුදුසුකම් ලැබූ වෘත්තිකයන්ය.

## අනුකූලතාව සහ විනිවිදභාවය

සංස්ථාවේ සාර්ථකත්වය සහ තිරසාරත්වය සඳහා අදාළ සියලු නීතිරීති, රෙගුලාසි, ප්‍රමිතීන්, හොඳම ක්‍රමවේදයන් සහ ආචාරධර්ම සංග්‍රහයන් යනාදියට අනුකූලව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආයතනික පාලනය සැකසෙන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ විශිෂ්ට ක්‍රමවේද සංග්‍රහයේ සහ 2003 වසරේදී මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශයේ පළ කර ඇති මාර්ගෝපදේශයන් ඇසුරිනි. සවිමත් ආයතනික පාලන ක්‍රමවේදයන් සහතික කෙරෙන එම අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටියි.

සියලු කටයුතුවලදී විනිවිදභාවය පවත්වාගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කැපවෙයි. වගවීම තහවුරු කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) සහ අදාළ රෙගුලාසි අනුව කටයුතු කරයි. වර්ෂ 1971 අංක 38 දරන මුදල් පනතට අනුකූලව සංස්ථාවේ එදිනෙදා මෙහෙයුම් අතරට අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධ කරනු ලැබ ඇත. මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පළ කර, පාර්ලිමේන්තුවේදී සම්මත කරගැනෙයි. මුදල් පනතට සහ ප්‍රමිත අනුකූලව, විගණකාධිපතිවරයා විසින් සංස්ථාවේ බාහිර විගණනය සිදුකරනු ලබයි.


02
TITAN AVIATION
ACTROS
WP LY - 2361
JETA-1
CPC-021



# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, වර්ෂ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තියට අනුකූලව, 2017 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමාගම් සමූහයේ වාර්ෂික වාර්තාව සමඟ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙසේ ඉදිරිපත් කරනු ලබයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යනු වර්ෂ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත කරන ලද රජයට අයත් ව්‍යාපාර ආයතනයකි. මෙය පාලනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසිනි.

සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 යන ලිපිනයෙහිය.

මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS / LKASs) සහ වර්ෂ 1971 අංක 38 දරන මූල්‍ය පනතේ ප්‍රතිපාදන මෙන්ම ඉන් අනතුරුව එයට සිදු කරන ලද සංශෝධනවලට අනුකූල වන පරිදි අදාළ අනාවරණයන්ද සහිතව සකසා ඉදිරිපත් කරනු ලැබ ඇත.



## ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදු කිරීම සහ විකිණීම සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වෙයි. සංස්ථාව විසින් සිය ඛනිජ තෙල් නිෂ්පාදන අතරින් ඇතැම් ඒවා අපනයනය කිරීමද සිදු කරනු ලබයි.

## අනුබද්ධ සමාගම

2/3ක කොටස් හිමිකාරීත්වයක් සහිත සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL) නමැති එක් අනුබද්ධ සමාගමක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව ඇත. ඉන්ධන ගබඩා කිරීම හා බෙදාහැරීම් පහසුකම් සැලසීම සහ තොරතුරු තාක්ෂණ සේවාවන් සැපයීම CPSTL හි ප්‍රධාන ක්‍රියාකාරකම් වෙයි.

## සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන

සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) විසින් නියමිත පරිදි අත්සන් කරන ලදුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වර්ෂ 2017 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කෙරේ.

## මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

සංස්ථාවේ සහ එහි සමූහයේ කටයුතු පිළිබඳ තත්වය සම්බන්ධ සත්‍ය සහ නිවැරදි අදහසක් ඉදිරිපත් කෙරෙන පරිදි සමූහයේ සහ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සැකසීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳී සිටියි. මේ සමඟ 72 සිට 105 දක්වා වූ පිටුවල දැක්වෙන විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, හිමිකාරත්ව වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය, කැපීපෙනෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් වර්ෂ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ වර්ෂ 1971 අංක 38 දරන මූල්‍ය පනත මඟින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අශ්‍යතාවන්ට අනුකූල වන පරිදි සකසා ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වේ.

වසර තුළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනස්වීම් 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම' පිළිබඳ අංක 01 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය විසින් සදහන් කර ඇති පරිදි කලින් වසරෙහි යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුකූල වූ, යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විමසුමට ලක් කර ඇති වසර තුළදී වෙනස්වීම් නොතිබිණි.

## ආදායම සහ ලාභය

2017 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සමඟ සංසන්දනාත්මක අගයයන් පහත දැක්වේ.

| | 2017 රු. බිලි. | 2016 රු. බිලි |
|---|---|---|
| ආදායම | **516.77** | **475.05** |
| වෙළෙඳ බදු(තීරු බදු සහ ජ.ගො.බ) රහිතව | (70.27) | (51.99) |
| ශුද්ධ වෙළෙඳ ආදායම | **446.50** | **423.06** |
| වෙළෙඳ පිරිවැය | (418.96) | (326.44) |
| දළ ලාභය | **27.54** | **96.62** |
| වෙනත් මෙහෙයුම් ආදායම | 0.68 | 0.61 |
| භූමිතෙල් සහනාධාරය | - | 2.98 |
| විකුණුම් සහ බෙදාහැරීම් වියදම් | (15.50) | (14.41) |
| පරිපාලන වියදම් | (4.96) | (4.38) |
| මූල්‍ය ගාස්තු | (10.53) | (11.40) |
| මූල්‍ය ආදායම | 11.06 | 8.37 |
| හුවමාරු අනුපාත විචල්‍යතාව | (4.92) | (8.83) |
| බදු පෙර ලාභය / (අලාභය) | **3.37** | **69.55** |

## බදු අයකිරීම

වර්ෂ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන අනුව, දළ ලාභයෙන් සියයට විසි පහක් ලාභාංශ වශයෙන් රජයට ගෙවන ලද්දේ නම්, 2011/12 බදු වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි, වසර 5ක කාලපරිච්ඡේදයක් සඳහා ලාභයෙන් සහ ආදායමෙන් ආදායම් බදු ගෙවීමෙන් සංස්ථාව නිදහස් කරනු ලැබිණි. කෙසේවුවද, 2016 සිට ඉදිරියට, සංස්ථාව විසින් අනුමත අපනයන සඳහා 12%ක්, ශේෂවී ඇති බදු අය කළ හැකි ආදායම සඳහා 28%ක් සහ බෙදාහැරිය හැකි ලාභ සඳහා 25%ක්ද ලෙස ආදායම් බද්දක් ගෙවිය යුතු වේ.

## විශේෂ ගාස්තුව

2014 වසර තුළදී, මහා භාණ්ඩාගාරය විසින් විශේෂ ගාස්තුවක් ලෙස රු. බි. 10ක් ගෙවන ලෙස උපදෙස් දුන් අතර, එම ගාස්තුව 2014 වසර සඳහා රු. මි. 250ක්, 2015 වසර සඳහා රු. මි. 750ක් සහ 2016 සිට 2024 දක්වා කාලපරිච්ඡේදය සඳහා වසරකට රු. මි. 1,000ක් වන වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරන මෙන්ද ඉල්ලා සිටිනු ලැබීය.

## දේපල, පිරියත සහ උපකරණ

සංස්ථාවේ සහ එහි සමූහයේ දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර 89 වැනි පිටුවේ 08 වැනි සටහනෙහි දක්වා ඇත.

## දායකත්ව ප්‍රාග්ධනය

2017 දෙසැම්බර් 31 වැනිදා වන විට සංස්ථාවේ සමස්ත දායකත්ව ප්‍රාග්ධනය රුපියල් මිලියන 28,487.125ක් විය.

සංචිත

සංස්ථාවේ සංචිත පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2017 රු. මි. | 2016 රු. මි |
|---|---|---|
| ප්‍රාග්ධන සංචිතය | 4,992.686 | 4,992.686 |

## අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්

වසර තුළදී ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් පහත පරිදි වේ.

| | 2017 රු. මි. | 2016 රු. මි |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් | 1.388 | 1.762 |

## ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

සංස්ථාව සමඟ සෘජු සහ වක්‍ර ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව මූල්‍ය ප්‍රකාශනවල 29 වැනි සටහනෙහි අනාවරණය කර ඇත.

## අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

අවදානම් කළමනාකරණය පිළිබඳ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. මේ සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව තුළ ඵලදායී සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් පිහිටුවනු ලැබ ඇත. සංස්ථාව විසින් අවදානම් කළමනාකරණය සඳහා ගනු ලබන විශේෂිත පියවර අවදානම් කළමනාකරණය නමැති කොටස යටතේ පිටු අංක 61 සිට 66 දක්වා විස්තර කර ඇත.

## ආයතනික පාලනය
## අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශ කර සිටින පරිදි

- සංස්ථාව සිය ව්‍යාපාරය පවත්වාගෙන යෑමේදී අදාළ වන සියලු නීති හා රෙගුලාසි පිළිගන්නා අතර, අදාළ නීති හා රෙගුලාසි උල්ලංඝනය කෙරෙන කිසිදු ක්‍රියාකාරකමකට සම්බන්ධ නොවේ.

- අධ්‍යක්ෂවරුන් සංස්ථාව හා සම්බන්ධ ගිවිසුම් පිළිබඳව සියලු භෞතිකමය අභිලාෂයන් ප්‍රකාශ කර ඇත.

- මෙය අවධානයෙන් යුතුව සාර්ථකත්වය කරා ගෙන යා හැකි ප්‍රවර්තන ව්‍යාපාරයක් වන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ ආයතනික/ව්‍යාපාර සැලසුම් විමසුමට ලක්කිරීමෙන් පසුව ඉදිරි අනාගතයේදී සිය මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් සංස්ථාව සතුව තිබීම පිළිබඳව තෘප්තිමත්භාවයට පත්ව සිටියි. ඒ අනුව, ප්‍රවර්තන ව්‍යාපාර සංකල්පය මත පදනම්ව සංස්ථාවේ සහ එහි සමාගම් සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකසනු ලබයි.

- අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා නියාමන මෙන්ම අවදානම් කළමනාකරණය ආවරණය වන පරිදි අභ්‍යන්තර පාලන කටයුතු පිළිබඳ විවරණයක් පවත්වා, ඒවායේ ඵලදායීතාව සහ සාර්ථක පවත්වාගැනීම පිළිබඳ පිළිගත හැකි නිසැකත්වයක් ලබාගෙන ඇත.
- ආයතනික පාලන නීතිරීති සහ රෙගුලාසි හා සම්බන්ධ අනුකූලතා ක්‍රියාවලීන් සහ පිළිවෙත් මෙම වාර්තාවේ 48 සිට 54 දක්වා පිටුවල විස්තර කර ඇත.

## මානව සම්පත්

සිය ව්‍යාපාර අරමුණු සහ දැක්ම යථාර්ථයක් බවට පත්කරලීම උදෙසා මානව සම්පත් අංශය විසින් ඉටු කරනු ලබන වටිනා කාර්යභාරය සංස්ථාව විසින් හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව එහි මානව සම්පත් ප්‍රාග්ධනය ඉහළ නැංවීමට සහ ආයතනික ඉලක්ක හා අභිමතාර්ථ සපුරාගැනීම සඳහා ඔවුන්ගේ දායකත්වය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට පියවර ගණනාවක් ගනු ලැබ ඇත. දේශීය හා විදේශීය පුහුණුවීම් ඔස්සේ සිය දැනුම හා කුසලතා අඛණ්ඩව ඉහළ නංවාගැනීම සඳහා සියලු සේවක කාණ්ඩ වෙත ප්‍රමාණවත් අවස්ථා සැපයීම කෙරෙහි විශේෂ අවධානයක් අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිය මඟින් යොමු කෙරෙයි. මානව සම්පත් අතර ඉහළ මට්ටමේ තාක්ෂණික හා කළමනාකාරීත්ව ශක්‍යතාවක් පවත්වාගැනීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සංස්ථාවේ ප්‍රමුඛතම අභිමතාර්ථයක් බවට පත්ව ඇත.

## පවතින නඩු කටයුතු

අධ්‍යක්ෂවරුන්ගේ සහ සංස්ථාවේ නීතිඥයින්ගේ අදහස අනුව, මූල්‍ය ප්‍රකාශනවල 26 වැනි සටහන යටතේ අනාවරණය කර ඇති, සංස්ථාවට එරෙහිව දැනට පවතින නඩු කටයුතු මඟින් සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය හෝ එහි අනාගත මෙහෙයුම් කෙරෙහි කිසිදු භෞතික බලපෑමක් එල්ල නොවනු ඇත.

## නීති හා රෙගුලාසි සම්බන්ධ අනුකූලතාව

අදාළ නීති හා රෙගුලාසි උල්ලංඝනය කෙරෙන කිසිදු ක්‍රියාකාරකමක සංස්ථාව නියැළී නැත.

## පරිසර සංරක්ෂණය

අදාළ පරිසර නීති හා රෙගුලාසි අනුව කටයුතු කිරීමට සංස්ථාව හැකි ඉහළම මට්ටමෙන් කටයුතු කර ඇත.

## සංස්ථාපිත ගෙවීම්

අදාළ සියලු පරිපාලනමය හා සංස්ථාපිත අධිකාරීන් වෙත ගෙවීමට නියමිත සියලු සංස්ථාපිත ගෙවීම් පවතින මූල්‍යමය ශක්‍යතාවන් මඟින් නිසි කලට ගෙවනු ලැබ ඇති බව සිය උපරිම දැනුම හා විශ්වාසය පරිදි අධ්‍යක්ෂවරු තෘප්තිමත්භාවයට පත්ව සිටිති.

## මූල්‍ය තත්ව ප්‍රකාශන දිනයට පසු සිදුවීම්

102 වැනි පිටුවේ මූල්‍ය ප්‍රකාශනයේ 27 වැනි සටහන මඟින් අනාවරණය කර ඇති සංශෝධන හැර මූල්‍ය ප්‍රකාශනවල සංශෝධන සිදුකළ යුතු වන තරම් වැදගත්කමකින් යුතු කිසිදු සිදුවීමක් මූල්‍ය තත්ව ප්‍රකාශන දිනයට පසුව සිදුවී නැත.

## ප්‍රවර්තන ව්‍යාපාරය

අනාගතයට අදාළව මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීම සහ වඩා සවිමත් වාණිජමය ශක්‍යතාවක් අත්පත් කරගැනීම සඳහා සංස්ථාවේ ව්‍යුහය වැඩිදියුණු කිරීමේ අදහස ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික සැලසුම සකසා ඇත. ඒ අනුව, ප්‍රවර්තන පදනමක් මත මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබේ.

## විගණකවරුන් පත්කිරීම

සංස්ථාවේ විගණකවරයා වන්නේ විගණකාධිපතිවරයායි. ඔහු පත් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තියේ ප්‍රතිපාදන අනුවය. වර්ෂ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 31 වැනි වගන්තියට අනුව විගණකවරයාගේ වේතනය තීරණය කෙරෙනු ඇත.


## විගණකවරයාගේ වේතනය සහ සංස්ථාව සමඟ ඇති ගිවිසුම් සම්බන්ධ බැඳියාව

වර්ෂ 2017 දෙසැම්බර් 31 වැනිදායින් අවසන්වූ වසර සඳහා විගණන ගාස්තු ලෙස සංස්ථාව විසින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 2ක් විගණකවරුන්ට ගෙවනු ලැබිණි. අධ්‍යක්ෂවරුන් දන්නා ආකාරයට, සංස්ථාව හෝ එහි අනුබද්ධ සමාගම සමඟ ඇති ගිවිසුම් සම්බන්ධ වෙනත් කිසිදු සම්බන්ධතාවක් හෝ බැඳියාවක් විගණකවරුන්ට නැත.

## වාර්තාවේ අන්තර්ගතයන් පිළිගැනීම

වර්ෂ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තිය මඟින් ඉල්ලා ඇති පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම වාර්ෂික වාර්තාවේ අන්තර්ගතයන් මෙයින් පිළිගනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරමින් සහ ඒ වෙනුවෙන් මෙම වාර්ෂික වාර්තාව අත්සන් කරනු ලබන්නේ:



**දම්මික රණතුංග**
සභාපති



# අවදානම් කළමනාකරණ වාර්තාව

විචල්‍ය සමාජ, දේශපාලනික සහ ආර්ථික පරිසරයක් තුළ මෙරට ක්‍රියාත්මක වන මෙරට සුවිශාලතම ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුම්කරු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම්වල අන්තර්ගත කොටසක් බවට අවදානම් කළමනාකරණය පත්ව ඇත.

## අවදානම් කළමනාකරණයේ කාර්යභාරය

- පරිසර, වෙළෙඳපොළ සහ අභ්‍යන්තර අර්බුදවලට ගොදුරුවීමෙන් සංස්ථාව ආරක්ෂා කරගැනීම
- මනා සමතුලිත වර්ධනය සහ අවදානම
- දිගුකල් පැවැත්ම සහතික කරයි
- ගින්දර හෝ අනතුරු වැනි හානිකාරී තත්ත්වයන්ගෙන් අපගේ සේවකයන්, පාරිභෝගිකයන්, සාමාන්‍ය ජනතාව සහ සංස්ථාවේ වත්කම් ආරක්ෂා කරයි

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ
අවදානම් කළමනාකරණ කාර්යරාමුව




ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත, මුදල් පනත සහ මූල්‍ය රෙගුලාසි, යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයන්,මහජන ව්‍යපාර සදහා වන විශිෂ්ටතම ක්‍රමවේදයන්

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව සකසා ඇත්තේ සංස්ථාවට බලපාන ප්‍රධාන අවදානම් කල්තියා හඳුනාගෙන ඒවා විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, අවහිරතාවකින් තොරව දැයට බලශක්ති සැපයුම ලබාදීමේ අරමුණ ඇතිව ඒ අවදානම් ඵලදායී අයුරින් කළමනාකරණය කිරීම සඳහාය. එමඟින් ඵලදායී සැලසුම්කරණය සහ තීරණ ගැනීම සඳහා පසුබිම සැකසෙන පරිදි සිය අනාගත ක්‍රියාකාරකම් අඛණ්ඩව ක්‍රියාත්මක වන සහ පාලනයකින් යුත් ආකාරයකට සිදුකිරීමට සංස්ථාවට හැකියාව ලැබෙයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සවිමත් ආරක්ෂක ආකාර දෙකක් මඟින් වඩාත් බලගැන්වී ඇත:

අභ්‍යන්තර පාලන පද්ධතිය
අභ්‍යන්තර හා බාහිර විගණන

වර්ෂ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත, වර්ෂ 1971 අංක 38 දරන මුදල් පනත, මූල්‍ය රෙගුලාසි, යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශනයන්, රාජ්‍ය ව්‍යාපාර සඳහා වන ප්‍රශස්ත ක්‍රමවේදයන් සහ තවත් විවිධ නියාමනයන් මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුවට සවිමත් පදනමක් ස්ථාපිත වී ඇත.

1. අභ්‍යන්තර පාලන පද්ධතිය

ඉහත සඳහන් වූ පනත්වලට අනුකූලව සැලසුම් කරන ලද අර්ථ දක්වන ලද ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් සහිත පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සංස්ථාව සතුව ඇත. එමඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා සම්බන්ධ අවදානම් හඳුනාගැනීමට, කළමනාකරණය කරගැනීමට සහ වළක්වා ගැනීමට සංස්ථාවට හැකියාව ලැබෙයි.

2. අභ්‍යන්තර හා බාහිර විගණනය

අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේදී අභ්‍යන්තර හා බාහිර විගණන කටයුතු මඟින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කෙරෙයි. අභ්‍යන්තර හා බාහිර විගණකවරුන් විසින් හඳුනාගනු ලබන අවදානම් කළමනාකරණය කරගැනීමට විසඳුම් ක්‍රියාමාර්ගයන් හා වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීම සඳහා මූල්‍ය හා වෙනත් මෙහෙයුම් පද්ධතිවල සැකැස්ම හා ඵලදායීතාව පරීක්ෂා කෙරෙනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවනු ලබන විගණන කමිටුව මඟින් වැදගත් විගණන තොරතුරු හා කළමනාකරණ ප්‍රතිචාර විමසුමට ලක් කෙරෙයි.

## අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන උපාය මාර්ගයන්

අවදානම් කළමනාකරණය සඳහා සංස්ථාව විසින් යොදවනු ලබන උපාය මාර්ගයන් අවදානමෙහි ස්වභාවය සහ බරපතළකම මත රඳා පවතී. අවදානමක් හඳුනාගත් විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පහත දැක්වෙන පියවර අනුගමනය කරනු ලබයි:

- එය සිදුවීමේ හැකියාව වළකාලීම
- අවදානම වෙනත් පාර්ශ්වයකට මාරු කිරීම
- අවදානමෙහි ප්‍රතිඵල භාරගෙන ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලන ව්‍යුහය

සංස්ථාවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුවේ ඵලදායීත්වය සඳහා මනාව අර්ථ දක්වන ලද පාලන ව්‍යුහයක සවිමත්බව සැපයෙයි.

අවදානම් කළමනාකරණයේ ඉහළම වගකීම සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතින අතර, අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක මට්ටම්වල පාලන කමිටු මඟින් එය තවදුරටත් දරනු ලබයි. එම කමිටු ක්‍රියාත්මක වන්නේ පැහැදිලිව අර්ථ දක්වන ලද කාර්යභාරයන් සහ වගකීම් සහිතවය.

පාලනය සම්බන්ධයෙන් මේ වාර්තාවට ඇතුළත්ව ඇති කොටසෙහි පාලන ව්‍යුහය පිළිබඳව තවදුරටත් විස්තර කර ඇත.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මුහුණ දෙන අවදානම්

සංස්ථාව මුහුණ දෙන අවදානම් සහ ගනු ලබන අවදානම් කළමනාකරණ පියවර සමඟ අවදානම තවදුරටත් නිශේධනය කිරීම සඳහා වන යෝජනා පිළිබඳ කෙටි විස්තරයක් පහත දක්වා ඇත.

### ආර්ථික අවදානම

**අවදානම** – රටේ උද්ධමන අනුපාතය මඟින් සංස්ථාවට පීඩනය එල්ල වෙයි. ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම සඳහා වන වෙළෙඳපොළ ප්‍රමුඛයා මෙන්ම රජයට අයත් ආයතනයක් ලෙස ලාභ ඉපැයීමට වඩා සමාජ හා ආර්ථික තත්වයන් සපුරාලීම සඳහා අධික ලෙස සහනාධාර ලබාදීම යටතේ ඇතැම් ඛනිජ තෙල් නිෂ්පාදන සපයනු ලැබේ. ඛනිජ තෙල්වල සුළු වෙනස්කිරීම් මඟින් වුවද සමස්ත ආර්ථිකයටම අතිවිශාල බලපෑමක් එල්ල වෙයි.

**බලපෑම** – උද්ධමන අනුපාතය වැනි සෘණාත්මක ආර්ථික සාධක මඟින් පිරිවැය ඉහළ නංවන අතරම ආදායම පහළ දමමින් ලාභ තත්වයන් අහිමි කරවයි.

**ප්‍රතිචාරය** – සංස්ථාවේ ලාභදායීත්වය මෙන්ම රටේ සමාජ ආර්ථික තත්වයන් තුලනය කිරීමේ අරමුණ ඇතිව තරගකාරී මිල ගණන්වලට ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවි කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකියාව ලැබෙන පරිදි ප්‍රබල පිරිවැය කළමනාකරණ වැඩසටහන් නිතර ක්‍රියාත්මක කෙරෙයි.

**යෝජනා** – පිරිවැය නියෝජනය වන මිල යාන්ත්‍රණයක් හඳුන්වාදිය යුතුය

### පාරිභෝගික භාණ්ඩ මිල අවදානම

**අවදානම** – ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සංචිත නොමැති අතර, බලශක්ති අංශයෙන් සැලකිය යුතු කොටසක් සපයනු ලබන්නේ ඛනිජ තෙල් ආනයනයන් මඟිනි. එබැවින් මිල ගණන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලනයෙන් බැහැරව මුළුමනින්ම සැපයුම්කරුවන් අත රැඳී පවතී.

**බලපෑම** – ලෝක තෙල් මිල ගණන් ඉහළ යෑම විකිණුම්, ලාභ සීමාවන් සහ මුදල් තත්වය කෙරෙහි අයහපත් ලෙස බලපායි.

**ප්‍රතිචාරය** – රටේ පවතින තොගවල තත්වය නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලබන තොග විමසුම් කමිටුව ගෝලීය මිල උච්චාවචනයන්, ප්‍රවණතා සහ මිල ආශ්‍රිත අවස්ථා විශ්ලේෂණය කිරීමෙන් පසු මිලදීගැනීම් ප්‍රශස්ත මට්ටමට ගෙන ඒමට කටයුතු කරයි.

**යෝජනා**
- පිරිවැය නියෝජනය වන මිල යාන්ත්‍රණයක් හඳුන්වාදිය යුතුය
- ලෝක වෙළෙඳපොළේ මිල ගණන් පහත වැටුණු විට තොග ගබඩා කිරීමට ගබඩා ධාරිතාව වැඩි කළ යුතුය

### නිෂ්පාදන අවදානම

**අවදානම** – පිරිපහදු කළ නිෂ්පාදන ලබාගැනීම සඳහා බොර තෙල් දේශීය වශයෙන් සකසනු ලැබේ.

**බලපෑම** – නිෂ්පාදන ප්‍රමාණයේ ගුණාත්මකබව සහ නාස්තිය මඟින් ලාභදායීත්වයට බලපෑම් එල්ල වෙයි.

**ප්‍රතිචාරය** – පිරිපහදුවේ නිෂ්පාදන ප්‍රමාණය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ධාරිතාව හා පිරිපහදු තාක්ෂණය ප්‍රශස්ත මට්ටමට පත් කළ යුතුය.

**යෝජනා**
- පිරිපහදු මෙහෙයුම් ඉහළ නැංවිය යුතුය
- පිරිපහදු කරන ලද නිෂ්පාදන ප්‍රමාණයන් ගබඩා කිරීමට ගබඩා ධාරිතාව වැඩිකළ යුතුය

## මෙහෙයුම් අවදානම

**අවදානම**

ක්‍රියාවලීන් හා පද්ධතිවල කාර්යක්ෂමතාව මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඵලදායීතාවට බලපෑම් එල්ල වෙයි.

**බලපෑම**

පාලනයන් නොමැතිවීම හෝ අකාර්යක්ෂම පාලයන් සහ පද්ධති බිඳවැටීම් මඟින් සම්පත් මෙන්ම කාලයද විශාල වශයෙන් අපතේ යන අතර, එමඟින් සැපයුම් සම්බන්ධ විනිවිදභාවය, අඛණ්ඩතාව සහ ගුණාත්මකබව මෙන්ම සමස්ත ලාභදායිත්වයටද බලපෑම් එල්ල වෙයි.

**ප්‍රතිචාරය**

පැහැදිලිව අර්ථ දක්වන ලද මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය.

- මෙහෙයුම් ගැටලු වහාම විසඳීම සඳහා පවතින විගණන ක්‍රියාවලීන් යොදාගැනීම අඛණ්ඩව පවත්වා ගත යුතුය.
- උපාය මාර්ගික ව්‍යාපාර සඳහා රජය විසින් ස්ථාපිත කරන ලද සම්මුතීන් සහ ක්‍රමවේදයන් අඛණ්ඩව පවත්වාගත යුතුය.

**යෝජනා**

පවතින නවතම තාක්ෂණය මෙන්ම විගණන ශිල්පක්‍රම නිසි ලෙස භාවිතයට ගැනීමට හැකි වන පරිදි සැකසුම් පාලන පද්ධති යාවත්කාලීන කර, එමඟින් පුද්ගලික අංශය සමඟ උරෙන් උර ගැටී තරග කිරීමට සංස්ථාවට හැකියාව ලබාදීම.

## ආරක්ෂක අවදානම

**අවදානම**

සංස්ථාව විසින් හසුරුවනු ලබන ඉතා ඉහළ විචල්‍යතාවකින් යුතු නිෂ්පාදන සඳහා දැඩි ආරක්ෂක ප්‍රමිතීන් අවශ්‍ය වෙයි.

**බලපෑම**

ආරක්ෂක ප්‍රමිතීන් පිළිබඳ අවධානය නොමැතිවීමෙන් ව්‍යාපාර මෙහෙයුම් කෙරෙහි බලපෑම් එල්ල වන අතර, සංස්ථාවේ මිනිස් ජීවිත හා භෞතික වත්කම් අනතුරට පත් කෙරෙයි.

**ප්‍රතිචාරය**

- ආයතනික සෞඛ්‍යය සහ ආරක්ෂාව සම්බන්ධ ප්‍රතිපත්ති හා ක්‍රමවේද නිවැරදිව පවත්වාගත යුතුය.
- අවදානම් අවම කරගැනීම හෝ දුරුකිරීම සම්බන්ධ නිතිපතා පුහුණුව සේවකයින්ට ලබාදිය යුතුය.

**යෝජනා**

සියලු සේවකයින් සඳහා අඛණ්ඩ පුහුණු අවස්ථා පෙළක් ස්ථාපිත කළ යුතුය.

## වෙළෙඳපොළ අවදානම

**අවදානම**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පුද්ගලික අංශයේ එක් තරගකාරයකු පමණක් සහිත තරගකාරී ප්‍රමුඛතමයෙකි

**බලපෑම**

තරගකාරීත්වය මෙන්ම සාර්ව ආර්ථික තත්වයන් සම්බන්ධයෙන් පාරිභෝගිකයන් අතර ඇති ආකල්ප වෙනස්වීම මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදායම් සීමාවන් සහ මුදල් තත්වයට බලපෑම් එල්ල වෙයි.

**ප්‍රතිචාරය**

- නිෂ්පාදන ගොනුව විවිධාංගීකරණය කළ යුතුය
- පාරිභෝගිකයන් සමඟ තිරසර ගිවිසුම් ඇතිකර ගත යුතුය
- ණයකරුවන්ගෙන් කෙරෙන එකතුකිරීම් වැඩිකර ගත යුතුය

**යෝජනා**

රජයේ ආයතනවලින් ලැබිය යුතු ගෙවීම් පාලනය ඇතුළු ණය පාලනය ඉහළ නැංවීම.

## මානව සම්පත් අවදානම

**අවදානම**

ඉහළ ගුණාත්මකභාවයකින් යුතු කාර්යමණ්ඩලයක් බඳවා ගැනීම, පුහුණුකිරීම සහ රඳවාගැනීම දියුණු වෙමින් පවතින කර්මාන්තයක සැමවිටම නොවෙනස්ව තිබිය යුතු අවශ්‍යතාවකි. මිනිස් ශ්‍රමය ආශ්‍රිත නීතිමය ගැටලු මතුවීම අඩු කරන හෝ නැත්තටම නැති කරන අතරම, මානව සම්පත උපරිම ප්‍රශස්ත බවින් යුතුව පවත්වාගැනීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා ඇති අභියෝගයන්ය.

**බලපෑම**

ප්‍රමාණවත් නොවන, නොමනා පරිදි ස්ථානගත නොකරන ලද හෝ නුසුදුසු ශ්‍රම සංචිතයක් මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවන් සහ එමඟින් ඛනිජ තෙල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය මෙන්ම පිළිගැනීම කෙරෙහිද අහිතකර අයුරින් බලපෑම් එල්ල වෙයි. මානව සම්පත් සම්බන්ධ නීති ගැටලු යනු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අනවශ්‍ය වියදමකි.

**ප්‍රතිචාරය**

- ප්‍රබල පුහුණු තන්ත්‍රයක් ස්ථාපිත කළ යුතුය
- සාධාරණ සේව්‍ය - සේවක සබඳතාවන් ගොඩනගා ගැනීම සඳහා සේවකයන් සමඟ දෙපාර්ශවයටම වාසි සැලසෙන සහභාගිත්ව යාන්ත්‍රණයන් සහ නියෝජනයන් ස්ථාපිත කළ යුතුය
- පීඩාකාරී මට්ටම් පහත දැමීම සඳහා සේවක සුබසාධනය, දිරිදීමනා සහ වෙනත් ප්‍රතිලාභ සැලසුම් ස්ථාපිත කළ යුතුය

**යෝජනා**

වරදක් සඳහා ලබාදෙන දඬුවම් සේවකයින්ට එකම අයුරින් පැහැදිලි වන ලෙස ඉදිරිපත් කරන අතරම, කාර්යසාධනය පදනම් කරගත් ප්‍රසාද ඇගයීම් සහ උසස්වීම් ක්‍රමයක් හඳුන්වාදිය යුතුය.

## තොරතුරු තාක්ෂණ අවදානම

**අවදානම**

තොරතුරු හුවමාරුව සහ සාක්ෂි පාදක කරගත් තත්-කාලීන තීරණ ගැනීම නූතන ඛනිජ තෙල් අංශයේ ව්‍යාපාර මෙහෙයුම් සඳහා ඉතා වැදගත් වෙයි. මේ සඳහා අරමුණට ඉතා වැදගත් වන නවතම තාක්ෂණය අඛණ්ඩ පදනමකින් යුතුව යොදාගැනීම අවශ්‍ය වෙයි.

**බලපෑම**

අවිධිමත් ලෙස දත්ත හා තොරතුරු රැස්කිරීම මෙන්ම දත්තවල නිරවද්‍යතාව හා ආරක්ෂාව නොසලකා කටයුතු කිරීම සංස්ථාවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව කෙරෙහි විශාල වශයෙන් සහ අහිතකර ලෙස බලපායි.

**ප්‍රතිචාරය**

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය ගනුදෙනු වාර්තාකිරීම සඳහා SAP පද්ධතිය යොදාගත යුතුය
- තොරතුරු තාක්ෂණ දැනුවත්කිරීම් හා භාවිත විගණනයක් පැවැත්වීම මෙන්ම නව තාක්ෂණය භාවිතය සම්බන්ධයෙන් කාර්යමණ්ඩලය පුහුණුකිරීම හා නැවත පුහුණුකිරීම සිදුකළ යුතුය

**යෝජනා**

- SAP පද්ධතිය සම්බන්ධ පරිපාලන අයිතීන් පිළිබඳ පූර්ණ පාලනය පවත්වා ගත යුතුය

## විනිමය අනුපාත අවදානම

**අවදානම**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දේශීය ව්‍යාපාර ගනුදෙනු සිදු කෙරෙන්නේ ශ්‍රී ලංකා රුපියල්වලින් වන අතර, ඉන්ධන මිලදීගැනීම් සහ ණය ගෙවීම් සිදු කරනු ලබන්නේ ඇමෙරිකානු ඩොලර්වලිනි.

**බලපෑම**

ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අඩුවීම මඟින් හුවමාරු අනුපාත නිසා සිදුවන පාඩු ඉහළ නැංවෙයි.

**ප්‍රතිචාරය**

සියලු බැංකු විසින් ඉදිරිපත් කරනු ලබන විනිමය අනුපාත දෛනික පදනමකින් අධීක්ෂණය කෙරෙන අතර, වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය කිරීමෙන් පසුව බැංකු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන්වලට නොව වෙළෙඳපොළ අනුපාතවලට අනුව ඩොලර් මිලදීගැනීම සිදු කළ යුතුය.

**යෝජනා**

- රජයට අයත් වාණිජ බැංකු වෙතින් ඩොලර් මිලදීගැනීම් සිදුකිරීමට සීමා වනු වෙනුවට, සහතික ලත් ඕනෑම වාණිජ බැංකුවකින් තරගකාරී අනුපාතවලට ඇමෙරිකානු ඩොලර් මිලදීගැනීමට ස්වයංපාලනයක් ඇතිකර ගත යුතුය
- ඇමෙරිකානු ඩොලර් ණය ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ යුතුය

## පොලී අනුපාත අවදානම

**අවදානම**

අභ්‍යන්තර වශයෙන් අරමුදල් ජනනය කරගත නොහැකි වූ විට අවහිරතාවකින් තොරව රටට ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ණයට අරමුදල් ලබාගනියි.

**බලපෑම**

ණය ලබාගැනීම් සඳහා අය කෙරෙන පොලිය, පොලී වියදම සහ මූල්‍ය ගාස්තු ඔස්සේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභදායීත්වයට අහිතකර අයුරින් බලපෑම් එල්ල කරයි.

**ප්‍රතිචාරය**

විදෙස් විනිමය ණය පොලී අනුපාතය අඩු කළ යුතුය.

**යෝජනා**

- රජය විසින් සහනාධාර සංඝටකය නොපමාව පියවිය යුතුය
- සහනාධාර සංඝටක ලැබීම් ලෙස බැංකු ණය අතරින් කිසියම් ප්‍රමාණයක් රජයට පියවිය හැකිය

## ද්‍රවශීලතා අවදානම

**අවදානම**

සංස්ථාවේ මූල්‍ය වගකීම් නිසි කාලයට සපුරාලීමට නොහැකිවීම ද්‍රවශීලතා අවදානමේ ප්‍රතිඵලයකි

**බලපෑම**

නිසි කාලයේදී අදාළ ගෙවීම් පියවීමට ආයතනයට නොහැකි වූ විට අමතර පොලී ගෙවීම මඟින් පොලී වියදම, මුදල් ප්‍රවාහය සහ වගකීම් තත්ත්වය කෙරෙහි අහිතකර බලපෑමක් එල්ල වෙයි. එයට අමතර වශයෙන්, වත්කමක් කඩිනමින් විකිණීමට නොහැකිවීම මඟින් අපේක්ෂිත ලාභදායීත්වය අවහිර වෙයි.

**ප්‍රතිචාරය**

- අනාගත ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා සංස්ථාවේ ද්‍රවශීලතා තත්වය නිරන්තරව අධීක්ෂණය කළ යුතුය
- සංස්ථාව විසින් බැංකු සහ මහා භාණ්ඩාගාරය සමඟ පවත්වාගනු ලබන සුහද සබඳතා ඔස්සේ විවිධාංගීකරණය වූ අරමුදල් උපාය මාර්ග සකසනු ලැබ ඇත
- සංස්ථාවේ ලාභදායීත්වය සහ ද්‍රවශීලතා තත්වය තුලනය කිරීම මඟින් අමතර මුදල් නිසි පරිදි ආයෝජනය කෙරෙයි

**යෝජනා**

රජයේ ආයතනද ඇතුළත්ව ණයකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් එකතු කරගැනීම් තවදුරටත් වැඩිදියුණු කරගත යුතුය

## ණය අවදානම

**අවදානම**

ණය අවදානම ඇති වන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය නිෂ්පාදන ණයට අලෙවි කරන විටය.

1. අක්‍රමිකතා අවදානම - පාරිභෝගිකයකු විසින් සිදු කරනු ලබන ගෙවීම් අක්‍රමිකතා නිසා ඇති විය හැකි පාඩු අක්‍රමිකතා අවදානම නම් වෙයි.
2. සාන්ද්‍රණතා අවදානම - කිසියම් පාරිභෝගිකයකු, අංශයක් හෝ නිෂ්පාදනයක් සඳහා අධික ණය පහසුකම් සැලසීමෙන් සාන්ද්‍රණතා අවදානම ඇති වෙයි.

**බලපෑම**

නිසි කාලයේදී අදාළ ගෙවීම් පියවීමට ආයතනයට නොහැකි වූ විට පොලී වියදම, මුදල් ප්‍රවාහය සහ වගකීම් තත්වය කෙරෙහි අහිතකර බලපෑමක් එල්ල වෙයි. එයට අමතර වශයෙන්, වත්කමක් කඩිනමින් විකිණීමට නොහැකිවීම මඟින් අපේක්ෂිත ලාභදායීත්වය අවහිර වෙයි.

**ප්‍රතිචාරය**

- විවිධ අංශ වෙත පිරිනැමෙන නිෂ්පාදන කාණ්ඩ ගණනාවක් සහිත වන සේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලැබීම් විවිධාංගීකරණය කළ යුතුය.
- රජයට ගෙවිය යුතු වන බදු සහ තීරුබදු යනාදියේ කොටසක් ලෙස රජයේ ආයතනවලින් ලැබිය යුතු වන ගෙවීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පියවාගත යුතුය.

**යෝජනා**

වසර අවසානයේදී ලැබිය යුතු වන ගෙවීම්වලින් 75% ක් පමණ රජයට අයත් ආයතනවලින් ලැබිය යුතු වන බැවින් සහ එමඟින් පියවාගැනීම් සම්බන්ධ කටයුතු කිරීමේදී අනවශ්‍ය පීඩනයක් සංස්ථාවට එල්ල වන බැවින්, රජයේ ආයතන වෙත ලබාදෙන ණය පහසුකම් ප්‍රමාණය තවදුරටත් අඩුකළ යුතුය.


HYUNDAI
25DF -7

# විගණන කමිටු වාර්තාව




ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවට පත් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත උපකමිටුවක් වන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වෙයි. සිය අනාවරණයන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලබන විගණන කමිටුවේ මූලික කාර්යභාරය වනුයේ මූල්‍ය වාර්තාකරණයේ සහ විගණන ක්‍රියාවලියේ සුපැහැදිලි අවංකභාවය සහතික කිරීම සහ මනා අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධතීන් පවත්වා ගැනීමය. කමිටුවේ වගකීම් අතරට පහත දැක්වෙන කරුණු ඇතුළත් වෙයි.

- ව්‍යාපාර මෙහෙයුම්වල අනුකූලතාවන් අධීක්ෂණය
- මූල්‍ය ප්‍රකාශනවල සුපැහැදිලි අවංකභාවය සහ ඒවායේ අඩංගු වැදගත් වාර්තාකරණ තීන්දු ඇතුළත් කිරීම. මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ අනාවරණයන්හි ප්‍රාමාණිකත්වය සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන විවරණය කිරීම.
- අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ක්‍රියාකාරකම් සහ ඵලදායීත්වය.
- අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධතීන්වල ඵලදායීත්වය.
- සංස්ථාව නිරාවරණය වන අවදානම්, අවදානම නිවාරණයට ගන්නා පියවර සහ ඒවායේ ඵලදායීත්වය විවරණය කිරීම.
- වසර සඳහා විගණන සැලැස්ම සාකච්ඡා කර අනුමත කිරීම

**කමිටුවේ සංයුතිය**

විමසුමට ලක් කෙරෙන වසර තුළදී, සංස්ථාව විසින් විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වනු ලැබ ඇති අතර, ඒවා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටු සාමාජිකයන් ලෙස විධායක නොවන අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබිණි. 75 වැනි විගණන කමිටු රැස්වීමේදී කේ. ඒ. විමලෙන්තිරරාජා මහතා (සභාපති), ප්‍රසාද් ගල්හේන මහතා, රසාංග හරිශ්චන්ද්‍ර මහතා සහ සමන් ප්‍රනාන්දු මහතා යන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙක් කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළහ. කෙසේවුවද, 76 වැනි විගණන කමිටු රැස්වීමේදී කේ. ඒ. විමලෙන්තිරරාජා මහතා (සභාපති), ආර්. ඒ. එන්. ජයසුන්දර මහතා සහ අතුල බණ්ඩාර හේරත් මහතා යන විධායක නොවන අධ්‍යක්ෂවරු තුන්දෙනෙක් විගණන කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළ අතර, 77 වැනි සහ 78 වැනි විගණන කමිටු සඳහා සාමාජිකයන් ලෙසද ඔව්හු දිගටම කටයුතු කළහ.

පොදු වාණිජ ව්‍යාපාරයන්හි විගණන කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද, භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති වගකීම් පරාසය, අධිකාරී සබඳතා සහ විශේෂිත කාර්යභාරයන් ආවරණය වන පරිදි කමිටුවේ විගණන ප්‍රඥප්තිය සකසා ඇත.

**විගණන කමිටුවේ කාර්යභාරයන්**

සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතීන්වල ප්‍රාමාණිකත්වය, කාලපරාසය සහ පැවැත්ම මෙන්ම ව්‍යාපාර මෙහෙයුම්වලට අනුකූල වන පරිදි, මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ නිරාවරණයන්වල ප්‍රාමාණිකත්වය කමිටුව සතුය. මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා උපයෝගී කර ගැනෙන ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත (SLFRS-LKAS) ඇතුළු මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සඳහා සකසා ගත් සහ අනුකූලතාව සහිත ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ඒකමිතියද එමඟින් සහතික කෙරෙයි. ඉහත කරුණුවලට අමතර වශයෙන්, සංස්ථාව අනාවරණය වන අවදානම් සහ අවදානම නිවාරණය කිරීමට ගන්නා පියවර සහ ඒවායේ ඵලදායීත්වයද කමිටුව මඟින් විවරණය කෙරෙයි.

## විගණන කමිටුව විසින් ඉටු කරනු ලබන කාර්යයන්

සිය වගකීම් ඉටුකිරීම සඳහා විගණන කමිටුව විසින් පහත දැක්වෙන කාර්යයන් සිදු කරනු ලැබිණි.

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත වත්කම් ආරක්ෂා කිරීමට අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රාමාණිකත්වය විවරණය කරනු ලැබිණි.
- සංස්ථාව විසින් මුහුණ දෙන ලද මූලික උපාය මාර්ගික ගැටලු සාකච්ඡා කරනු ලැබිණි.
- අභ්‍යන්තර විගණන වාර්තා සහ විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තා සහ එයින් පසු සිදු කෙරුණු නිරීක්ෂණයන් පිළිබඳව සාකච්ඡා කරනු ලැබිණි.
- 2017 වසර සඳහා වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම විවරණය කර අනුමත කරනු ලැබිණි.

**රැස්වීම්**

විමසුමට ලක් කරන ලද වසර තුළදී ඉහත දක්වන ලද පරිදි ඔවුන් වෙත පැවරුණු කාර්යභාරයන් පිළිබඳව සාකච්ඡා කිරීමට විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වනු ලැබ ඇත.

**අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය**

අභ්‍යන්තර පාලනයන් ඇගයීම, අවදානම් ප්‍රදේශ හඳුනාගැනීම සහ වසර ආරම්භයේදී විගණන කමිටුව විසින් අනුමත කරන ලද විගණන සැලසුම ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබන විගණන ක්‍රියාවලීන් හරහා සිදු කෙරෙන ගනුදෙනුවල නිරවද්‍යතාව සහ පූර්ණත්වය පරීක්ෂා කිරීම අභ්‍යන්තර විගණනයේ මූලික ක්‍රියාවලීන්ට අයත් වෙයි. විගණණ ක්‍රියාවලිය අතරතුරදී හඳුනාගනු ලබන කරුණු අවධානයට ලක්කිරීම සඳහා විගණන ගැටලු ඉදිරිපත් කෙරෙයි.

ඉහත සඳහන් කරුණුවලට අමතර වශයෙන්, වැදගත්කමින් යුතු විවිධ කරුණු පිළිබඳව නිරීක්ෂණ සහ නිර්දේශයන් කළමනාකාරීත්වය වෙත සැපයීම සඳහා වන විශේෂ විමර්ශන, නිෂ්පාදන හානිවීම්, ආදායම් පහළ වැටීම හා සම්බන්ධ අවදානම් හඳුනාගැනීම විගණකාධිපතිවරයාගේ වාර්තා පිළිබඳ සාකච්ඡා සහ විගණණ ගැටලුවලට පිළිතුරු සැපයීම මෙන්ම වාර්ෂික විගණන සැලසුම සහ සැබැවින්ම සිදු කරන ලද වැඩ කටයුතුමත පදනම්ව අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ කාර්යසාධනය සම්බන්ධ කලින් කලට සිදු කෙරෙන විවරණයන් යනාදියටද අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සම්බන්ධ වෙයි.

විමසුමට ලක් කරන ලද වසර තුළදී අභ්‍යන්තර විගණනය මඟින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ සාරාංශය.

- 2017 වසරේ කාර්තුවලට අදාළ මූල්‍ය ප්‍රකාශන සාකච්ඡා කරනු ලැබිණි.
- 2016 දෙසැම්බර් 31 වැනිදා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සාකච්ඡා කරනු ලැබිණි.
- අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධ ප්‍රාමාණිකත්වය විවරණය කර දුර්වලතාවන් පිළිබඳ අදහස් අදාළ පාර්ශ්වයන්ට සන්නිවේදනය කරනු ලැබිණි.
- විගණන කමිටු රැස්වීමේදී අභ්‍යන්තර විගණන වාර්තාව සාකච්ඡා කරනු ලැබිණි.
- 2015 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකාධිපති වාර්තාව සඳහා ලබාදෙන ලද (Cope) කෝප් නිර්දේශවල වත්මන් තත්වය සාකච්ඡා කරනු ලැබිණි.
- පූර්ව විගණන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ විණි.

## නිගමනය

සංස්ථාවේ අනුමැතිය ලද ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි සංස්ථාවේ කටයුතු කළමනාකරණය කෙරෙන බවට සහතිකයක් සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය මඟින් සැපයෙන නමුදු, විගණන කමිටුව මඟින් නිර්දේශ කරනු ලබන පරිදි ඇතැම් ගැටලු විසඳීම සඳහා අභ්‍යන්තර පරීක්ෂාවන් සහ තුලනයන් ඇතුළු යම් පියවර ගත යුතු බව විගණන කමිටුවේ අදහස වේ.



**සභාපති - විගණන කමිටුව**
කේ. ඒ. විමලේන්තිරරාජා


ලංකා
LANKA




# මූල්‍ය ප්‍රකාශ

| දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා | | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|---|
| | සටහන | 2017 | 2016 | 2017 | 2016 |
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආදායම | 2 | 446,502.378 | 423,061.051 | 447,177.005 | 423,443.612 |
| විකුණුම් පිරිවැය | | (418,961.837) | (326,440.767) | (425,879.817) | (332,658.956) |
| **දළ ලාභය** | | **27,540.541** | **96,620.284** | **21,297.188** | **90,791.908** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 3 | 670.446 | 3,588.439 | 878.366 | 3,772.090 |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | | (15,498.189) | (14,411.946) | (2,479.327) | (2,583.524) |
| පරිපාලන වියදම් | | (4,959.844) | (4,383.873) | (8,977.987) | (8,448.049) |
| **මෙහෙයුම් ලාභය** | **4** | **7,752.954** | **81,412.904** | **10,718.241** | **83,525.172** |
| විනිමය අනුපාත විචලනය | | (4,922.004) | (8,828.798) | (4,922.004) | (8,828.798) |
| මූල්‍ය ආදායම් | 5 | 11,067.082 | 8,374.112 | 11,256.523 | 8,464.482 |
| මූල්‍ය වියදම් | 6 | (10,530.811) | (11,404.537) | (10,654.884) | (11,571.312) |
| **බදු පෙර ලාභය / (අලාභය)** | | **3,367.221** | **69,553.681** | **6,397.876** | **71,589.544** |
| ආදායම් බදු වියදම | 7 | (1,897.594) | (16,526.602) | (2,398.332) | (17,150.545) |
| **වසර සඳහා ලාභය / (අලාභය)** | | **1,469.627** | **53,027.081** | **3,999.545** | **54,439.000** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| **ලාභය හෝ අලාභය සඳහා වර්ගීකරණය නොකෙරෙන අයිතම** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම සම්බන්ධ ලාභ/(අලාභ) නැවත ඇගයීම | 18 | (887.512) | 120.866 | (982.459) | 364.729 |
| දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධ නැවත තක්සේරුකරණය | | 10,210.907 | - | 10,210.907 | |
| වෙනත් විස්තීර්ණ ආදායම් මත බදු | | - | - | 12.761 | (33.409) |
| ලාභයට හෝ අලාභයට පසු නැවත වර්ගීකරණය කෙරෙන හෝ නොකෙරෙන අයිතම | | | | | |
| අලවිය සඳහා පවතින මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | 10.1 | (0.500) | (10.000) | (0.500) | (10.000) |
| **වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් / (වියදම්)** | | 9,322.895 | 110.866 | 9,240.709 | 321.320 |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම / (වියදම), බදු පසු** | | **10,792.522** | **53,137.947** | **13,240.254** | **54,760.320** |
| **මුළු විස්තීර්ණ ආදායම සම්බන්ධිත :** | | | | | |
| ආයතනයේ හිමිකරුවන් | | 10,792.522 | 53,137.947 | 12,334.458 | 54,110.625 |
| පාලනය කළ නොහැකි අයිතිය | | - | - | 905.795 | 649.695 |
| | | **10,792.522** | **53,137.947** | **13,240.254** | **54,760.320** |

පිටු අංක 76 සිට 105 දක්වා සඳහන් වන සටහන් මූල්‍ය ප්‍රකාශ වල අත්‍යවශ්‍ය කොටස් වේ.

| දෙසැම්බර් 31 | සටහන | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016 |
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 8 | 23,608.585 | 13,505.655 | 40,363.333 | 30,305.510 |
| ආයෝජන වත්කම් | 8.3 | 40.128 | 41.575 | 40.128 | 41.575 |
| අස්පෘශ්‍ය වත්කම් | 8.4 | - | - | 0.278 | 7.609 |
| පරිපාලිත සමාගමේ ආයෝජනය | 9 | 5,000.000 | 5,000.000 | | - |
| ජංගම නොවන මූල්‍ය වත්කම් | 10 | 29,874.032 | 35,595.461 | 29,874.032 | 35,595.461 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 11 | 8,963.641 | 10,326.708 | 9,407.896 | 10,768.432 |
| | | **67,486.385** | **64,469.399** | **79,685.668** | **76,718.588** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 13 | 44,152.978 | 35,476.885 | 44,559.109 | 35,888.223 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 11 | 86,990.589 | 48,397.975 | 90,589.895 | 52,446.899 |
| කෙටි කාලීන ආයෝජන | 14 | 10,685.474 | 28,065.844 | 10,685.474 | 28,065.844 |
| මුදල් හා මුදල් සමාන දෑ | 15 | 9,385.759 | 14,579.410 | 10,859.879 | 17,034.827 |
| | | 151,214.800 | 126,520.114 | 156,694.357 | 133,435.793 |
| **මුළු වත්කම්** | | **218,701.185** | **190,989.513** | **236,380.025** | **210,154.381** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | | | |
| දායකත්ව ප්‍රාග්ධනය | 16 | 28,487.125 | 28,487.125 | 28,487.125 | 28,487.125 |
| ප්‍රාග්ධන සංචිතය | 17.1 | 4,992.686 | 4,992.686 | 4,992.686 | 4,992.686 |
| මූල්‍ය වත්කම් මත සංචිතය | 10.1 | (21.500) | (21.000) | (21.500) | (21.000) |
| නැවත තක්සේරුකරණ සංචිතය | 17.2 | 10,210.907 | - | 10,210.907 | - |
| රඳවාගත් ඉපැයුම් | | (218,723.543) | (219,305.658) | (206,949.442) | (209,073.494) |
| පාලන කළ නොහැකි අයිතිය | | - | - | 8,387.732 | 7,616.937 |
| **මුළු ස්කන්ධය** | | **(175,054.325)** | **(185,846.847)** | **(154,892.492)** | **(167,997.746)** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 18 | 1,708.014 | 753.561 | 3,182.004 | 1,987.632 |
| විලම්බිත බදු | 23 | - | - | 1,017.152 | 1,005.757 |
| ණය හා ණය ලබාගැනීම් | 19 | 189.898 | 265.858 | 189.898 | 1,176.909 |
| | | 1,897.912 | 1,019.419 | 4,389.055 | 4,170.298 |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 20 | 212,140.166 | 182,095.327 | 207,166.030 | 179,661.102 |
| ණය හා ණය ලබාගැනීම්වල ජංගම කොටස | 19.1 | 75.959 | 37.980 | 75.959 | 525.780 |
| කෙටි කාලීන ණය ලබාගැනීම් | 21 | 179,641.473 | 193,683.634 | 179,641.473 | 193,794.948 |
| | | 391,857.598 | 375,816.940 | 386,883.462 | 373,981.829 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **218,701.185** | **190,989.513** | **236,380.025** | **210,154.381** |

පිටු අංක 76 සිට 105 දක්වා සඳහන් වන සටහන් මූල්‍ය ප්‍රකාශ වල අත්‍යවශ්‍ය කොටස් වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් 2017 දෙසැම්බර් 31 වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කටයුතු සහ එදිනෙන් අවසන් වූ වසර සඳහා එහි ලාභ සම්බන්ධව සත්‍ය සහ නිවැරදි දැක්මක් ඉදිරිපත් කෙරෙයි.

**වී. එන්. වීරසූරිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර, අත්සන් තබන ලද්දේ,

**එන්. ආර්. ආර්. ජයසේකර**
වැඩබලන සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ

**ආර්. ඒ. එන්. ජයසුන්දර**
අධ්‍යක්ෂ

**ඩබ්ලිව්. එස්. පෙරේරා**
අධ්‍යක්ෂ

2018 ඔක්තෝබර් 16 වැනිදා කොළඹදී

| දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා | සටහන | සංස්ථාව 2017 | සංස්ථාව 2016 | සමූහය 2017 | සමූහය 2016 |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ** | 24 | (10,869.586) | 68,415.926 | (8,969.099) | 72,468.682 |
| ගෙවන ලද පොලිය | **6** | (10,530.811) | (11,404.537) | (10,654.884) | (11,579.468) |
| ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂිකය | **18** | (127.985) | (122.286) | (225.201) | (234.210) |
| ගෙවන ලද බදු / රැඳවුම් බදු | | (3,565.621) | (2,357.487) | (3,697.737) | (2,526.976) |
| **මෙහයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය කරන ලද (භාවිතා කළ) ශුද්ධ මුදල්** | | (25,094.003) | 54,531.617 | (23,546.922) | 58,128.029 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 11.791 | 42.332 | 15.427 | 93.603 |
| දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | **8** | (818.529) | (477.658) | (1,651.819) | (1,391.070) |
| ලාභාංශ ආදායම | | **243.105** | 292.502 | 0.105 | 0.002 |
| **ලැබූ පොලිය** | 5 | 11,057.737 | 8,374.112 | 11,247.178 | 8,464.482 |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 1,115.053 | 1,183.072 | 1,115.053 | 1,183.072 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | 21,981.159 | (15,424.235) | 21,981.159 | (15,424.235) |
| | | | | - | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කල ශුද්ධ මුදල්** | | 33,590.316 | (6,009.875) | 32,707.103 | (7,074.146) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ගෙවන ලද ලාභාංශය | | - | (10,000.000) | (135.000) | (10,162.500) |
| ලබාගත් අලුත් ණය / ණය ආපසු ගෙවීම | | (14,080.140) | (71,200.033) | (15,478.991) | (71,973.537) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද/ (භාවිතා කල) ශුද්ධ මුදල්** | | (14,080.140) | (81,200.033) | (15,613.991) | (82,136.037) |
| **මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | (5,583.827) | (32,678.292) | (6,453.810) | (31,082.154) |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 12,022.125 | 44,700.416 | 14,366.228 | 45,448.382 |
| **වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **15** | **6,438.298** | **12,022.125** | **7,912.418** | **14,366.228** |

පිටු අංක 76 සිට 105 දක්වා සඳහන් වන සටහන් මූල්‍ය ප්‍රකාශ වල අත්‍යවශ්‍ය කොටස් වේ.

## සංස්ථාව

| දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා | දායක ප්‍රාග්ධනය | නැවත තක්සේරුකරණ ලද සංචිත | ප්‍රාග්ධන සංචිත | මූල්‍ය වත්කම් මත සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **2016 ජනවාරි 1 වැනිදා වන විට ශේෂය** | 28,487.125 | - | 4,992.686 | (11.000) | (262,453.604) | (228,984.793) |
| වසර සඳහා ලාභය | - | - | - | | 53,027.081 | 53,027.081 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | **(10.000)** | 120.866 | 110.866 |
| ගෙවන ලද ලාභාංශය | | | | | (10,000.000) | (10,000.000) |
| **2016 දෙසැම්බර් 31 වන විට ශේෂය** | **28,487.125** | - | 4,992.686 | (21.000) | (219,305.658) | (185,846.847) |
| | | | | | | |
| වසර සඳහා ලාභය | | | | | 1,469.627 | 1,469.627 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | (0.500) | (887.512) | (888.012) |
| නැවත තක්සේරු අතිරික්තය | | **10,210.907** | | | | 10,210.907 |
| **2017 දෙසැම්බර් 31 වැනිදා වන විට ශේෂය** | 28,487.125 | 10,210.907 | 4,992.686 | (21.500) | (218,723.543) | (175,054.325) |

පිටු අංක 76 සිට 105 දක්වා සඳහන් වන සටහන් මූල්‍ය ප්‍රකාශ වල අත්‍යවශ්‍ය කොටස් වේ.

## සමූහය

| දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා | දායක ප්‍රාග්ධනය | නැවත තක්සේරු කරන ලද සංචිත | ප්‍රාග්ධන සංචිත | මූල්‍ය වත්කම් මත සංචිත | රඳවාගත් ඉපැයුම් | කොටස්හිමියන්ගේ අරමුදල | පාලනය කළ නොහැකි අයිතිය | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **2016 ජනවාරි 1 වැනිදා වන විට ශේෂය** | 28,487.125 | - | 4,992.686 | (11.000) | (253,259.777) | (219,790.966) | 7,096.913 | (212,694.053) |
| වසර සඳහා ලාභය | | | | | 53,896.412 | 53,896.412 | 542.588 | 54,439.000 |
| වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් | | | | **(10.000)** | 224.213 | 214.213 | 107.107 | 321.320 |
| ගෙවන ලද ලාභාංශය | | | | | (10,000.000) | (10,000.000) | (162.500) | (10,162.500) |
| **2015 සඳහා ඒකාබද්ධ සංශෝධනය** | | | | | 65.658 | 65.658 | 32.829 | 98.487 |
| **2017 ජනවාරි 1 දිනට ශේෂය** | 28,487.125 | | 4,992,686 | (21,000) | (209,073.494) | (175,614.683) | 7,616.937 | (167,997.746) |
| | | | | | | | | |
| වසර සඳහා ලාභය | | | | | 3,066.354 | 3,066.354 | 933.191 | 3,999.545 |
| වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් | | | | (0.500) | (942.302) | (942.802) | (27.395) | (970.198) |
| නැවත තක්සේරුකරණ අතිරික්තය | | **10,210.907** | | | - | 10,210.907 | - | 10,210.907 |
| ගෙවන ලද ලාභංශය | | | | - | - | - | (135.000) | (135.000) |
| | | | | | | | | |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 28,487.125 | 10,210.907 | 4,992.686 | (21.500) | (206,949.442) | (163,280.225) | 8,387.732 | (154,892.492) |

පිටු අංක 76 සිට 105 දක්වා සඳහන් වන සටහන් මූල්‍ය ප්‍රකාශ වල අත්‍යවශ්‍ය කොටස් වේ.

## 1.1 ආයතනික තොරතුරු

### පොදු

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (සංස්ථාව) යනු 1961 වර්ෂයේ අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත අනුව සංස්ථාපිත කර, ශ්‍රී ලංකාවේ දේශීය වශයෙන් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සංස්ථාවකි. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 යන ලිපිනයෙහි පිහිටා ඇත.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

| ආයතනය | ප්‍රධාන ක්‍රියාකාරකම |
|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදුකිරීම සහ විකිණීම |
| අනුබද්ධ ආයතනය<br>ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම |

### මව් ආයතනය සහ පරිපාලිත සමාගම

සංස්ථාව පවතින්නේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශය යටතේය. අධ්‍යක්ෂවරුන්ගේ අදහස අනුව, සංස්ථාවේ පරමාධිකාරී මව් හිමිකාරත්වය සහ පාලන පාර්ශ්වය වන්නේ ශ්‍රී ලංකා රජය වේ.

### නිකුත් කිරීම සඳහා අධිකාරීත්වය ලබාදීමේ දිනය

2018 ඔක්තෝබර් 16 වැනිදා අධ්‍යක්ෂ මණ්ඩල විධිනියෝගයක් අනුව 2016 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන නිකුතුව සඳහා අවසර ලබාදෙනු ලැබිණි.

### අනුකූලතා ප්‍රකාශය

විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ව ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන හා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (මූල්‍ය ප්‍රකාශන) යනාදියෙන් සමන්විත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එය අයත් සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකසා ඇත්තේ 1971 වසරේ අංක 38 දරන මුදල් පනතේ ප්‍රතිපාදන හා පසුකලෙක එහි සිදුකරන ලද සංශෝධන මඟින් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/ LKASs) අනුකූලවය.

## 1.2 පිලියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සකසා ඇත්තේ, ඓතිහාසික පිරිවැය පදනම මත හා උපචිත වියදම් පදනම යටතේ වන අතර, සාධාරණ වටිනාකම යටතේ නිර්ණය කරනු ලැබ ඇති ඉඩම හා විකිණීමේ හැකියාව සහිතව පවතින මූල්‍ය වත්කම් සහ පවතින වටිනාකම යටතේ නිර්ණය කරනු ලබන වෙන්කර දක්වනු ලබන ප්‍රතිලාභ වගකීම සඳහා එය විදාළ නොවේ.

### ඉදිරිපත්කිරීම සහ ක්‍රියාකාරීත්ව විනිමය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ, ක්‍රියාකාරීත්ව විනිමය වන ශ්‍රී ලංකා රුපියල්වලින් වන අතර, විශේෂයෙන් සඳහන් කරනු නොලබන අවස්ථාවලදී සියලු වටිනාකම් ආසන්නතම මිලියනයට අනුව රවුම් අගයකට සකසනු ලැබේ.

### ප්‍රමාණාත්මකතා සහ සමූහනය

එක සමාන අයිතමවල එක් එක් ද්‍රව්‍ය කාණ්ඩය මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කෙරෙයි. එකිනෙකට වෙනස් ස්වභාවයෙන් සහ ක්‍රියාකාරීත්වයෙන් යුතු අයිතම ප්‍රමාණාත්මක නොවන්නේ නම් ඒවා වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කෙරෙයි.

### ඒකාබද්ධ කිරීමේ පදනම

2017 දෙසැම්බර් 31 වන විට සහ එදිනෙන් අවසන් වූ වසර සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සමන්විත වන්නේ සංස්ථාවේ සහ එහි අනුබද්ධ සමාගමේ (එක්ව ගත් විට සමූහය ලෙස හැඳින්වෙන) විස්තරවලිනි.

අනුබද්ධ සමාගම් යනු සමූහය විසින් පාලනය කෙරෙන ආයතන වේ. පාලනය නිසි පරිදි සිදු වන්නේ ආයෝජිතයා සමඟ ඇති වන සබඳතාවයෙන් හිමි වන විචල්‍ය ලැබීම් සඳහා සමූහය සම්මුඛ වූ විට හෝ ඒ සඳහා අයිතීන් ඇති විට සහ ආයෝජිතයා සම්බන්ධයෙන් එයට ඇති බලතල මඟින් එම ලැබීම් සඳහා බලපෑමක් සිදුකිරීමට එයට හැකියාව ඇති විටය.

සුවිශේෂ වශයෙන්, සමූහය විසින් ආයෝජිතයා පාලනය කරනු ලබන්නේ සමාගම සතුව පහත සඳහන් කරුණු පවතින්නේ නම් පමණක්ම වේ:

- ආයෝජකයා මත බලය (එනම්, ආයෝජිතයාගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට පවත්නා හැකියාව එයට ලබාදෙන දැනට පවතින අයිතීන්)
- ආයෝජකයා සමඟ එයට ඇති සබඳතාව මඟින් විචල්‍ය ලැබීම් සම්බන්ධයෙන් ඇති සම්මුඛතාව, හෝ අයිතීන්
- ලැබීම් සම්බන්ධ බලපෑමක් කිරීමට සිය බලය උපයෝගී කරගැනීමට ඇති හැකියාව

සාමාන්‍යයෙන්, ඡන්ද අයිතීන්ගේ බහුතරයක් මඟින් පාලනය සිදු වන්නේ යැයි යන උපකල්පනයක් පවතී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් හි කොටස්වලින් 2/3ක් ඇති අතර, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් යනු සිය අනුබද්ධ ආයතනය ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සලකනු ලබයි.

පාලනය සම්බන්ධ ඉහත සඳහන් කරුණු තුන අතරින් එකක හෝ වැඩි ගණනක වෙනස්කම් ඇති බව දත්ත හා තත්වයන් මඟින් දැක්වෙන්නේ නම්, ආයෝජකයකු පාලනය කරන්නේද, නැද්ද යන වග සමූහය විසින් නැවත සලකා බලනු ලැබේ. සමූහය විසින් අනුබද්ධ ආයතනයක පාලනය ලබාගන්නා විට අනුබද්ධ ආයතනයේ ඒකාබද්ධකිරීම ආරම්භ වන අතර, එම අනුබද්ධ ආයතනයේ පාලනය සමූහයට අහිමි වන විට එය අවසන් වෙයි. අදාළ වසර තුළදී ලබාගත් හෝ අහිමිවූ අනුබද්ධ ආයතනයක වත්කම්, වගකීම්, ආදායම සහ වියදම් සමූහය විසින් අනුබද්ධ ආයතනය පාලනය කිරීම ආරම්භ කරන දිනයේ සිට අවසන් කරන දිනය දක්වා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වෙයි.

විශේෂයෙන් සඳහන් කර නොමැති නම්, අනුබද්ධ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකසනු ලබන අතර, ඒ සඳහා අදාළ වන්නේ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයකි.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී, අන්තර් ශේෂයන් හා ගනුදෙනු, ආදායම් හා වියදම් සැලකිල්ලට නොගැනෙයි.

#### පාලනය කල නොහැක අයිතිය

අනුබද්ධිත ආයතනයේ ලාභ හෝ අලාභ හා විස්තීර්ණ ආදායම් පරිපාලන සමාගමේ හිමිකරුවන්ට සහ පාලනය කළ නොහැකි අයිතියේ සෘණ වටිනාකමක් යටතේ උවද ආරෝපණය කෙරේ.

## 1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

විශේෂයෙන් වෙනත් ආකාරයක් සඳහන් කර නොමැති නම්, යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති කලින් වසරවල ප්‍රතිපත්ති වලට අනුගත වී ඇත.

#### සංසන්දනාත්මක තොරතුරු

වඩාත් පැහැදිලි ලෙස ඉදිරිපත්කිරීමක් සඳහා සහ වත්මන් වසරට අදාළ කරුණු සමඟ සංසන්දනාත්මක වන සේ, අදාළ පරිදි කලින් වසරවල මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කිරීම සහ වර්ගීකරණය සකසනු ලැබ ඇත.

#### අඛණ්ඩ පැවැත්ම

මෙම මූල්‍ය ප්‍රකාශන සකසා ඇත්තේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා සමූහය අඛණ්ඩ පැවැත්මෙන් ව්‍යාපාර කටයුතු සිදු කරන්නේය, එනම් පුරෝකථනය කළ හැකි අනාගතයක් උදෙසා මෙහෙයුම් කටයුතු සිදු කරන්නේය යන උපකල්පනය මත පදනම්වය. එබැවින්, 2017 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා සකසන ලද මූල්‍ය වාර්තාවන්ට අනුව සංස්ථාවට හා සමූහයට පිළිවෙළින් රු. මිලියන 175,054 ක සහ රු. මිලියන 154,892 ක සෘණාත්මක ස්කන්ධ තත්වයක් ඇති විට වුවද, සිය මෙහෙයුම්වල ප්‍රමාණාත්මක අඩු කිරීමේ හෝ භෞතික වශයෙන් සීමාකිරීමේ අදහස හෝ අවශ්‍යතාව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නැතැයි උපකල්පනය කෙරෙයි.

#### තීරණාත්මක ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පනයන් යොදාගැනීම අවශ්‍ය වෙයි. එහිදී කළමනාකාරිත්වය විසින් සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සිය තීරණය ක්‍රියාවේ යෙදවීමද අවශ්‍ය වෙයි. තීරණ හා ඇස්තමේන්තු පදනම් වන්නේ කලින් ලද අත්දැකීම් සහ පවතින තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ඇතුළු වෙනත් සාධක මතය. එහෙයින්, සැබෑ අත්දැකීම සහ ප්‍රතිඵල මෙම තීරණ සහ ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ අදාළ උපකල්පන නිරන්තරයෙන් සිදු කෙරෙන පදනමක් මත විමසුමට ලක් කෙරෙන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන් සිදුකෙරෙන සංශෝධන සුදුසු පරිදි පිළිගනු ලැබේ. ඉහළ මට්ටමේ තීන්දු තීරණ හෝ සංකීර්ණතාවක් සම්බන්ධ ක්ෂේත්‍ර හෝ අනුමානයන් හා ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවලට ඉතා වැදගත් වන ක්ෂේත්‍ර පහත දැක්වෙන පරිදි අදාළ සටහන්වල විස්තර කෙරෙයි:

- නිශ්චිත ප්‍රතිලාභ බැදීම් - පාරිතෝෂිකය සටහන් අංක 1.4.12
- මූල්‍ය වත්කම් සම්බන්ධ හානිකරණ සටහන් අංක 1.4.14
- දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධ ඵලදායී ආයු කාල : සටහන් අංක 1.4.6
- විලම්භිත බදුකරණය : සටහන් අංක 1.4.2

## 1.4 ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

### 1.4.1 ආදායම් හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලා එනු ඇති බව සහ ආදායම මෙන්ම දැරීමට සිදුවූ හෝ සිදු වන වියදම් විශ්වාසදායී අයුරින් මැනගත හැකි යැයි යන අනුමානයේ පිහිටා අදායම හඳුනාගනු ලැබෙයි. ලැබී ඇති හෝ ලැබීමට නියමිත ගෙවීම්වල සාධාරණ වටිනාකම සැලකිල්ලට ගනිමින්, ගිවිසුම් ප්‍රකාරව අර්ථ නිරූපණය කරන ලද ගෙවීම් පිළිබඳ වගන්ති හා වෙළෙඳ බදුවල ශුද්ධ අගය අවධානයට ලක් කරමින් අදායම තීරණය කරනු ලැබේ. සිය සමස්ත ආදායම් සැකසීම්වලදී මූලික වගකීමෙන් බැඳී සිටින්නා මෙන්ම, තොග ලැයිස්තු සහ ණය අවදානම් සඳහා මුහුණදීමට එයට සිදු වන බැවින්ද සිය සමස්ත ආදායම් සැකසීම් සම්බන්ධයෙන් මූලිකත්වය දරන්නේ තමන්ය යන අවසන් නිගමනයට සමූහය පැමිණ ඇත.

ආදායම් හඳුනාගැනීමේ කටයුත්ත සඳහා පහත දැක්වෙන විශේෂිත ක්‍රමවේදයන්ද සපුරාලිය යුතුය.

### භාණ්ඩ අලෙවිය

නිෂ්පාදනවල අයිතිය සම්බන්ධ කැපීපෙනෙන අවදානම් සහ ප්‍රතිලාභයන් මිලදීගනු ලබන්නා වෙත පැවරී ඇති විට, සැලකිල්ලට ගත් අගය ආපසු ලබාගත හැකි යැයි අනුමාන කළ හැකි විට, භාණ්ඩ හා සම්බන්ධිත වියදම් හා භාණ්ඩ ආපසු ලැබිය හැකි තත්වයන් විශ්වාසදායී අයුරින් තක්සේරු කළ හැකි, භාණ්ඩ සමඟ කළමනාකරිත්වය අඛණ්ඩව සම්බන්ධධ නොවන විට හා ආදායම් වටිනාකම විශ්වාසදායී ලෙස මැනගත හැකි වන විට නිෂ්පාදන අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලැබේ.

### පොලී ආදායම හා වියදම්

මූල්‍ය උපාංග සඳහා, පොලී වියදම් සහ ආදායම වාර්තා කරනු ලබන්නේ සඵල පොලී අනුපාතය උපයෝගී කරගනිමින් වන අතර, තක්සේරුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් මූල්‍ය උපාංගයේ අපේක්ෂිත ආයු කාලය හෝ කෙටි කාලපරිච්ඡේදයක් පුරා, අදාළ වන පරිදි, මූල්‍ය වත්කමෙහි හෝ වගකීමෙහි ශුද්ධ ධාරක වටිනාකමට නිවැරදි අයුරින් වට්ටම්කරණය කරනු ලබන අනුපාතය එය වේ.

එකතුකිරීම් ශක්‍යතාව පිළිබඳව සැකයක් නොපවතින්නේ නම් එකතුවූ වටිනාකම ලෙස පොලී ආදායම හඳුනාගනු ලැබේ. ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ මූල්‍ය ආදායම යටතේ පොලී ආදායම ඉදිරිපත් කෙරෙන අතර, මූල්‍ය වියදම යටතේ පොලී වියදම ඉදිරිපත් කෙරෙයි.

### ලාභාංශ

ගෙවීම් ලැබීමට කොටස්කරුවන්ගේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

### කුලී ආදායම

කල්බදු කාලසීමාවන් සඳහා ඍජු-රේඛීය පදනමක් මත කුලී ආදායම සලකා බැලෙන අතර, ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායමට එය ඇතුළත් කෙරෙයි.

### දේපල, පිරියත හා උපකරණ අලෙවිය සම්බන්ධ ලාභය / (අලාභය)

දේපල, පිරියත හා උපකරණ අලෙවිය සම්බන්ධ ලාභය / (අලාභය) අලෙවිය සිදුවූ කාලපරිච්ඡේදය තුළදී හඳුනාගනු ලබන අතර, වෙනත් ආදායම් යටතේ ඇතුළත් කරනු ලැබේ.

### ආයෝජන සුරැකුම්පත් හා සම්බන්ධ ඉපැයීම් හෝ අලාභයන්

ගනුදෙනුව සිදු වන දිනය වන විට සැලකිල්ලට ගනු ලබන ස්කන්ධ කොටස් අලෙවිය සහ මූල්‍ය ක්‍රියාකාරිත්වයන් හා සම්බන්ධ ලැබීම් හෝ අලාභයන් ගනු ලැබේ.

### වෙනත් ආදායම්

උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනාගනු ලැබේ.

### 1.4.2 වියදම් හඳුනාගැනීම

කාර්යක්ෂමතා තත්වයකින් යුතුව ව්‍යාපාරය පවත්වා ගැනීම සහ දේපල, පිරියත හා උපකරණ නඩත්තුකිරීම සම්බන්ධයෙන් දැරීමට සිදු වන සියලු වියදම් අදාළ කාලපරිච්ඡේදය සඳහා වන ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කර ඇත.

### බදු අයකිරීම

කාලය සඳහා වන බදු වියදම් වර්තමාන සහ විලම්භිත බදු තුළ අඩංගු වේ.

### (i) වර්තමාන බදු

වර්තමාන සහ කලින් පැවති කාලපරිච්ඡේදයන් සඳහා වන පවතින ආදායම් බදු වත්කම් සහ වගකීම්, මූල්‍ය ප්‍රකාශනවල වාර්තා වී ඇති පරිදි හා 2006 වසරේ අංක 10 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන හා එහි සංශෝධන අනුව ගණනය කරන ලද ආදායම් සහ වියදම් සම්බන්ධ සංරචක මත පදනම්ව බදුකරණ අධිකාරීන් වෙතින් ආපසු ලැබීමට හෝ ගෙවීමට අපේක්ෂිත මුදල් අනුව ගණනය කරනු ලැබේ.

ස්කන්ධ හෝ වෙනත් සවිස්තරාත්මක ආදායම් හා ඍජුව සම්බන්ධ යැයි හඳුනාගනු ලබන අයිතමයන් ආශ්‍රිත වර්තමාන ආදායම් බදු ආදායම් ප්‍රකාශනයේ නොව, ස්කන්ධ හෝ වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගනු ලැබේ.

### (ii) විලම්භිත බදුකරණය

මූල්‍ය ප්‍රකාශ දිනය වන විට, වත්කම් හා වගකීම් හා සම්බන්ධ බදු පදනම් මෙන්ම මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණීය අගය අතර වූ තාවකාලික විචලන මත වගකීම් ක්‍රමය උපයෝගී කරගනිමින් විලම්භිත ආදායම් බදු සඳහා ප්‍රතිපාදන වෙන් කෙරෙයි.

ව්‍යාපාර සංකලනයක් නොවන ගනුදෙනුවක වත්කම් හෝ බැරකම් පිළිබඳව මූලික හඳුනාගැනීම මඟින් විලම්භිත කරන ලද ආදායම් බදු ගෙවීම හැර බදු ගෙවීම්වල සෑම තාවකාලික වෙනසක්ම විලම්භිත බදු මඟින් හඳුනාගෙන ඇති අතර, එය ගණකාධිකරණ ලාභ හෝ බදු ලාභ හෝ අලාභ වෙත බලපෑමක් නොකරයි.

අඩු කළ හැකි තාවකාලික විචලන, උපයෝගී නොකළ බදු වත්කම් හා බදු අලාභවල ඉදිරියට ගෙන ගිය අගය සඳහා වූ බදු

පැනවිය හැකි ලාභයක් තිබීමේ සම්භාවිතාවක් තිබෙනතාක් හා අඩු කළ හැකි තාවකාලික විචලන උපයෝගී නොකළ බදු වත්කම් හා අලාභවල ඉදිරියට ගෙන ගිය අගය ඒ සඳහා උපයෝගී කළ හැකි නම් අඩු කළ හැකි තාවකාලික විචලනවලට අදාළ විලම්භිත ආදායම් බදු වත්කම් හැර ව්‍යාපාරික සංකල්පයක් නොවන ගනුදෙනුවක් නොවන්නා වූද, එම ගනුදෙනු අවස්ථාවේදී ගණනය කළ ලාභය හෝ බදු පැනවිය හැකි ලාභයට හෝ පාඩුවට බලපෑමක් නොවන්නා වූද වත්කම් හෝ වගකීමක් මුල්වරට හඳුනාගැනීමේදී පැනනගින විලම්භිත ආදායම් බදු වත්කම් පිළිගැනේ. සෑම මූල්‍ය තත්ව වාර්තා ප්‍රකාශ දිනකම විලම්භිත ආදායම් බදු වත්කම් අගය සමාලෝචනයට පාත්‍රවී සමස්තයක් වශයෙන් උපයෝගී කරගෙන ප්‍රමාණවත් බදු පැනවිය හැකි ලාභයක් තිබීමේ සම්භාවිතාව තවදුරටත් වෙළෙඳ නොවන තරමට එම ආදායම බදු වත්කමින් අඩු කෙරෙයි. හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් සෑම මූල්‍ය තත්ව වාර්තා ප්‍රකාශ දිනකම නැවත ඇගයීමට ලක් කෙරෙන අතර, ඉදිරි කාලයේදී බදුවලට යටත් වීමට ඉඩ ඇති ලාභ මඟින් විලම්භිත බදු වත්කම් නැවත පියවාගැනීමට හැකි වීමේ සම්භාවිතාව පවතින්නේ යැයි යන අදහසෙහි පිහිටා හඳුනාගනු ලැබේ.

විලම්භිත ආදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කරනුයේ වත්කම අලෙවිකරණ හෝ වගකීම් පියවන වසරට අදාළ අපේක්ෂිත බදු අනුපාතය අනුව වන අතර, එය පදනම්ව ඇත්තේ මූල්‍ය ප්‍රකාශන දිනයට බලපවත්වන හෝ ප්‍රමාණාත්මකව බලපවත්වන බදු අනුපාත (හා බදු නීතීන්) මතය. ස්කන්ධය සෘජුවම හඳුනාගනු ලැබ ඇති අයිතමයන්ට අදාළ විලම්භිත ආදායම් බදු හඳුනාගෙන ඇත්තේ ආදායම් ප්‍රකාශනයේ නොව, ස්කන්ධයටය.

### (iii) විකුණුම් බදු

වත්කම් මිලදීගැනීමේදී හා සේවාවන් ලබාගැනීමේදී දරන ලද විකුණුම් බදු, බදු අධිකාරීන්ගෙන් අයකරගත නොහැකි අවස්ථාවන්හිදී වත්කම් හා වියදම්වල කොටසක් ලෙස හඳුනාගන්නා අවස්ථාවන්හිදී හැර ආදායම්, වියදම් හා වත්කම් විකුණුම් බදු වට්නාකම ලෙස හඳුනාගෙන ඇත. බදු බලධාරීන්ට අදාළව ලැබිය යුතු හා ගෙවිය යුතු අලෙවි බදු මුදල මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු මුදල් හා ගෙවිය යුතු මුදල් යටතේ ඇතුළත්ය.

### ණයගැනීම් පිරිවැය

වත්කම්වල අපේක්ෂිත භාවිතය හෝ අලෙවිය සඳහා සූදානම්වීම පිණිස ප්‍රමාණවත් කාලපරිච්ඡේදයක් අවශ්‍යයෙන්ම ලබාගන්නා වත්කම් පවරාගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම බලපානු ලබන සාමාන්‍ය සහ විශේෂිත ණය ගැනීම් පිරිවැය, එවැනි වත්කම් අපේක්ෂිත භාවිතයට ලක්කිරීම හෝ අලෙවිකිරීම සඳහා ප්‍රමාණවත් පරිදි සූදානම් වන තුරු පිරිවැයට එකතු කර ඇත. අනෙකුත් සියලු ණයගැනීම් පිරිවැය ඒවා සිදු වන කාලපරිච්ඡේදයන්වලදී වියදම් කරනු ලැබේ.

## 1.4.3 විදේශ විනිමය ගනුදෙනු හා ශේෂයන්

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කෙරෙන්නේ සංස්ථාවේ ක්‍රියාකාරී හා ඉදිරිපත්කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලිනි. විදෙස් විනිමය මඟින් සිදු කෙරෙන ගනුදෙනු මූලික වශයෙන් වාර්තා කෙරෙනුයේ ගනුදෙනුව සිදු කෙරෙන දිනය වන විට ක්‍රියාත්මක වන ක්‍රියාකාරී විනිමය අනුපාතවලිනි.

විදෙස් විනිමය මඟින් දැක්වෙන මුදල්මය වත්කම් හා වගකීම්, වාර්තා කරන දිනය වන විට ක්‍රියාත්මකව පවතින විනිමය හුවමාරු අනුපාතයට අනුව නැවත පරිවර්තනය කරනු ලැබෙයි. සියලු විචල්‍යතා ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කෙරෙයි. ඓතිහාසික පිරිවැය පදනමට අනුව විදෙස් විනිමය මඟින් ගණනය කරනු ලබන මුදල්මය නොවන අයිතමයන්, ආරම්භක ගනුදෙනුව සිදු වන දිනවල පවතින හුවමාරු අනුපාත උපයෝගී කරගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

වෙළෙඳපොළ සාධාරණ මිල අනුව විදේශ විනිමය මඟින් ගණනය කරන ලද මුදල්මය නොවන අයිතමයන්, සාධාරණ අගය තීරණය කළ දිනයේ විනිමය අනුපාතය උපයෝගී කරගනිමින් පරිවර්තනය කරනු ලැබේ. සාධාරණ අගය අනුව ගණනය කළ මුදල්මය නොවන අයිතම පරිවර්තනයෙන් ලැබෙන ලාභ හෝ පාඩු, අයිතමයේ සාධාරණ අගය වෙනස්වීමෙන් ලැබෙන ලාභය හෝ පාඩුව අනුව හඳුනාගනු ලැබේ.

## 1.4.4 ජංගම හා ජංගම නොවන වර්ගීකරණය

ජංගම/ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව සමූහය විසින් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වත්කම් හා බැඳීම් ඉදිරිපත් කරනු ලබයි. වත්කමක් ජංගම ලෙස වර්ගීකරණය කෙරෙනුයේ පහත දැක්වෙන තත්වයන් ඇති විටය:

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ නිෂ්කාශනය අපේක්ෂිත හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කෙරෙන්නේ නම්
- මූලික වශයෙන්ම වෙළෙඳ අරමුණු සඳහා තබාගෙන සිටින්නේ නම්
- වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු මාස දොළහක් ඇතුළත නිෂ්කාශනයවීමට අපේක්ෂිත නම්

හෝ

- වාර්තාකරණ දිනයෙන් පසු අවම වශයෙන් මාස දොළහකටවත් පසු වගකීමක් පියවීම පිණිස භාවිතා කිරීම හෝ හුවමාරු කිරීම සීමා නොකළ මුදල් හෝ මුදල් සමාන දෑ.

අනෙක් සියල්ල ජංගම නොවන වත්කම් ලෙසට වර්ගීකරණය කෙරේ. වගකීමක් ජංගම ලෙස වර්ගීකරණය කෙරෙනුයේ:

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ පියවීමට අපේක්ෂා කරන විට
- මූලිකවම වෙළෙඳ අරමුණු සඳහා තබාගත් විට
- වාර්තාකරන කාලසීමාවෙන් පසු මාස දොළහක් තුළ පියවීමට ඇති විට

හෝ

- වාර්තාකරණ කාලසීමාවෙන් පසු අවම අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීමක් පියවීමෙන් විලම්භනය කිරීමට කොන්දේසි විරහිත අයිතියක් නැත

සමූහය අනෙක් සියලු වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි.
විලම්භිත බදු වගකීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කෙරෙයි.

**1.4.5 සාධාරණ අගය තීරණය කිරීම**

සමූහය විසින් සෑම වාර්තාකරණ දිනයකදීම ස්කන්ධ ආයෝජන වැනි මූල්‍ය උපාංග සහ භූමිය වැනි මූල්‍යමය නොවන වත්කම් සාධාරණ අගය මත මනිනු ලබයි. සාධාරණ අගය මත මනිනු ලබන මූල්‍ය උපාංග සහ මූල්‍යමය නොවන වත්කම් සඳහා වන සාධාරණ අගය ආශ්‍රිත අනාවරණයන් හෝ සාධාරණ අගයයන් අනාවරණය කෙරෙන අවස්ථාවලදී පහත සටහන්වල සාරාංශගත කෙරෙයි:

- දේපල, පිරියත හා උපකරණ (සටහන 8)
- ආයෝජන දේපල (සටහන 8.3)
- මූල්‍ය උපාංග (ක්‍රමක්ෂය වූ පිරිවැයේදී සැලකිල්ලට ගත් ඒවාද ඇතුළත්ව) (සටහන 12.1)

මිනුම්කරණ දිනය වන විට වෙළෙඳපොළ සහභාගිත්වකරුවන් අතර ක්‍රමවත් ගනුදෙනුවකින් වත්කමක් විකිණීම සඳහා ලැබෙන හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිල සාධාරණ අගය නම් වේ. සාධාරණ අගය මැනගැනීම පදනම් වන්නේ වත්කම විකිණීම හෝ වගකීම පැවරීම හා සම්බන්ධ ගනුදෙනුව සිදු වන්නේ පහත දැක්වෙන කුමන ස්ථානයකදීද යන උපකල්පනය මතය:

- වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළෙඳපොළ තුළ හෝ
- ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති විට, වත්කම හෝ වගකීම සඳහා වඩාත්ම වාසිදායක වන වෙළෙඳපොළ තුළ.

ප්‍රධාන හෝ වඩාත්ම වාසිදායක වෙළෙඳපොළ හා සම්බන්ධවීමට සමූහයට හැකි විය යුතුය.

වෙළෙඳපොළ සහභාගිත්වකරුවන් සිය ඉහළම අභිලාෂ අනුව කටයුතු කරන්නේ යැයි උපකල්පනය කරමින්, වත්කම හෝ වගකීම සඳහා මිල නියම කිරීමේදී වෙළෙඳපොළ සහභාගිත්වකරුවන් විසින් යොදාගනු ලබන උපකල්පනයන් උපයෝගී කරගනිමින් වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මැනගනු ලැබේ.

මූල්‍යමය නොවන වත්කමක සාධාරණ අගය මැනීමකදී අදාළ වත්කම එහි ඉහළම හා හොඳම භාවිතයට උපයෝගී කරගැනීම මඟින් හෝ එම වත්කම ඉහළම හා හොඳම භවිතයට උපයෝගී කරගන්නා තවත් වෙළෙඳපොළ සහභාගිත්වකරුවකුට එය විකිණීම මඟින් ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට වෙළෙඳපොළ සහභාගිත්වකරුවකුට ඇති හැකියාව සැලකිල්ලට ගැනෙයි.

නිරීක්ෂණාත්මක අදාල කරුණු භාවිතය උපරිමකරණය කරමින් හා නිරීක්ෂණාත්මක නොවන කරුණු භාවිතය අවමකරණය කරමින්, සාධාරණ අගය මැනගැනීම සඳහා අදාළ අවස්ථාවලදී ප්‍රමාණවත් වන සහ ඒ සඳහා ප්‍රමාණවත් දත්ත පවතින තක්සේරුකරණ ශිල්ප ක්‍රම සමූහය විසින් යොදාගනු ලැබේ. භූමිය හා ආයොජන දේපල වැනි වැදගත් වත්කම් සහ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් වැනි වැදගත් බැඳීම් හා සම්බන්ධ තක්සේරුකරණය සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ වෙයි.

සාධාරණ අගය අනාවරණය කිරීම් සම්බන්ධ කාර්යය සඳහා, වත්කමෙහි හෝ වගකීමෙහි ස්වභාවය, ලක්ෂණ හා අවදානම් මත පදනම්ව සමූහය විසින් වත්කම් හා වගකීම් කාණ්ඩ තීරණය කරනු ලැබ තිබේ.

**1.4.6 දේපල, පිරියත සහ උපකරණ**

දේපල, පිරියත සහ උපකරණවලට අදාළ එදිනෙදා සේවා වියදම් හැර සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිත හානි කරන වටිනාකම අඩු කළ පිරිවැයට දක්වනු ලැබේ.

**මිනුම්**

වත්කම් ලෙස සැලකෙන දේපල, පිරියත සහ උපකරණ එකී වත්කම් අත්පත් කරගැනීම හෝ ඉදිකිරීම හෝ අහඹු වියදම් සමඟ වන තක්සේරු කිරීම සඳහා සෘජුවම අදාළ වන මිලට මූලික වශයෙන් මැනීම සිදු කෙරෙයි.

ස්ව ඉදිකිරීම් වත්කම්වල පිරිවැයවලට ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය හෝ වත්කම එහි අපේක්ෂිත භාවිතාව සඳහා ක්‍රියාකාරී තත්වයකට ගෙන ඒම පිණිස වැය කළ වෙනයම් පිරිවැය සහ එම අයිතම පිහිටා ඇති භූමියෙන් ඉවත් කිරීමට සහ ප්‍රතිස්ථාපනය කිරීමට යන පිරිවැය සහ සුදුසු වත්කම් ණයට ගැනීමෙ පිරිවැය ඇතුළත් වේ. එවැනි පිරිවැයට දේපල, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට සිදු වන අවස්ථාවන්වලදී දරන්නට සිදු වන පිරිවැය පිළිගැනීමට අවශ්‍ය උපමානයන් සපුරා තිබේ නම් එයද ඇතුළත් වේ.

**පිරිවැය ආකෘතිය**

පිරියත සහ උපකරණ සඳහා සංස්ථාව විසින් පිරිවැය ආකෘතියක් අදාළ කරගන්නා අතර, මිලදී ගන්නා හෝ ඉදිකිරීමේදී වන පිරිවැය ඒ සමඟ ඇති විය හැකි අනුෂාංගික වියදම්ද අඩුවෙන් ඒකරාශී කරන ලද ක්ෂයවීම සහ ඕනෑම ඒකරාශී කරන ලද හානිකරන අලාභයන්ද සමඟ වාර්තා කරනු ලබයි.

**ප්‍රතිතක්සේරුකරණ ආකෘතිය**

ප්‍රතිතක්සේරුකරණ දිනට පසු හඳුනාගනු ලබන දෝෂ ආශ්‍රිත අලාභයන් රහිතව සාධාරණ අගය යටතේ ඉඩම් අගය මැනීම සිදු කෙරෙයි. ප්‍රතිතක්සේරුකරණය කරන ලද ඉඩමක සාධාරණ අගය එහි ධාරණීය වටිනාකමෙන් භෞතික වශයෙන් වෙනස් නොවන බව සහතික කරගැනීම සඳහා තක්සේරුකරණයන් නිතර සිදු කරනු ලැබේ. ප්‍රතිතක්සේරුකරණයේ කිසියම් අතිරික්තයක් ඇත්නම් එය ස්කන්ධය වත්කම් ප්‍රතිතක්සේරුකරණ සංචිතයට බැර කරනු ලැබෙන අතර, අදායම් ප්‍රකාශනයේ එම වත්කම සම්බන්ධයෙන්ම කලින් හඳුනාගෙන ඇති ප්‍රතිතක්සේරු අගය අඩුවීමක් ආපසු වැඩිවීමක් බවට හරවා ඇත්නම්, එහිදී වැඩිවූ අගය ආදායම් ප්‍රකාශනයෙන් හඳුනාගනු ලැබේ. ප්‍රතිතක්සේරුකරණ හිඟයක් ඇත්නම්, ආදායම් ප්‍රකාශනයෙන් එය හඳුනාගනු ලබන අතර, වත්කම් ප්‍රතිතක්සේරුකරණ සංචිතයේ හඳුනාගනු ලබන එම වත්කමෙහිම අතිරික්තයක් ඇත්නම් එය තුලනය කෙරෙයි.

අයිතිය ඉවත් කිරීමේදී, විකුණනු ලබන කිසියම් දේපලක් හා සම්බන්ධ ප්‍රතිතක්සේරුකරණ සංචිතයක් ඇත්නම් රඳවාගත් ඉපැයුම් වෙතට එය මාරු කරනු ලැබේ.

**පසු පිරිවැය**

දේපල, පිරියත සහ උපකරණ ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, අයිතමයන්ගේ අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබේනම් සහ එම පිරිවැය නියත වශයෙන්ම මැනිය හැකිනම් එම කොටසේ පවත්නා මිලට හඳුනාගෙන ඇත.

**ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය**

දේපල, පිරියත සහ උපකරණ ආශ්‍රිත අනාගත ආර්කථි ප්‍රතිලාභය ප්‍රතිෂ්ඨාපනය කිරීමට හෝ පවත්වා ගැනීමට සිදු කරන අලුත්වැඩියාවන් සහ නඩත්තුව සඳහා වන පිරිවැය, ආදායම් ප්‍රකාශය වෙතින් වැය වූ ලෙස සඳහන් කෙරේ.

**ඉවත් කිරීම**

දේපල, පිරියත සහ උපකරණවල පවත්නා වටිනාකම, ඒවා විකිණීමේදී හෝ එමගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන අවස්ථාවලදී ඉවත් කරනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ ආශ්‍රිත කිසියම් අයිතමයක් ඉවත්කිරීමේදී ඇති වන ලාභය හෝ පාඩුව එම අයිතමය ඉවත් කරනු ලබන විට ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කෙරෙයි.

**ක්ෂයවීම**

භූමියට නිශ්චිත නොවන ආයු කාලයක් ඇතැයි සැලකෙන බැවින් එය ක්ෂයවීමට ලක් නොවේ. භාවිතය සඳහා ලැබෙන දිනයෙන් ආරම්භ වන පරිදි විවිධ ආකාරයේ දේපලවල තක්සේරු කරන ලද ඵලදායී ආයු කාලයන් සඳහා අදාළ වන කාලපරිච්ඡේදයන් සඳහා සෘජු රේඛීය පදනම මත සමූහය විසින් ක්ෂයවීම් අගය කරනු ලබයි. දේපල ඉවත්කිරීම සිදුකරන දිනයේදී ක්ෂයවීම අවසන් වෙයි.

ව්‍යාපාර සැලසුම සහ උපාය මාර්ගයන්, භාවිතයේ අපේක්ෂිත මට්ටම් සහ කළමනාකරණ තීරණ උපයෝගී කරගනිමින් සිදුකරනු ලබන අනාගත සංවර්ධන කටයුතු වැනි සාධක මත පදනම්ව දේපල, පිරියත සහ උපකරණ ආශ්‍රිත තක්සේරු කරන ලද ආයු කාලයන්, අතිරික්ත අගයයන් හා ක්ෂයවීම් ක්‍රම යනාදිය සමූහය විසින් වාර්ෂිකව විමසුමට ලක් කරනු ලබයි.

වත්කම්වල තක්සේරු කරන ලද ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත පරිදි වේ:

| වත්කම් | වසර |
|---|---|
| ගොඩනැගිලි | වසර 35 - 50 |
| ටැංකි | වසර 20 - 40 |
| නල මාර්ග | වසර 5 - 40 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර | වසර 5 - 10 |
| දොඹකර සහ පොම්ප | වසර 10 - 15 |
| වාහන | වසර 4 - 5 |
| බෝයාව | වසර 10 |
| ගෘහභාණ්ඩ, සවිකිරීම් සහ කාර්යාල උපකරණ | වසර 3 - 10 |
| SPM පහසුකම - ටැංකි පරිශ්‍රය | වසර 40 |
| මත්තල ගුවන් පහසුකම - ඉන්ධන නල | වසර 40 |
| ඉන්ධන නල පද්ධතිය | වසර 40 |
| අභ්‍යන්තර මාර්ග ජාලය සහ වැට | වසර 20 |
| මීටර් සහ විද්‍යුත් පද්ධතිය | වසර 10 |
| ගිනි නිවීම් ක්‍රම පද්ධතිය | වසර 10 |
| වෙනත් වත්කම් | වසර 08 |
| මුතුරාජවෙල PLEM | වසර 10 |

අවම වශයෙන් එක් එක් මූල්‍ය වසර අවසානයේදීවත් වත්කම්වල අවශේෂ අගයයන්, ඵලදායී ආයු කාලය සහ ක්ෂයවීමේ ක්‍රමය සමාලෝචනය කර අවශ්‍ය වන්නේ නම් සුදුසු පරිදි සකසනු ලබයි.

**කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්**

කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් පිරිවැයෙහි දක්වා ඇත. ගොඩනැගිලි ඉදිකිරීම්, ප්‍රධාන යන්ත්‍රාගාරය හා යන්ත්‍රසූත්‍ර සහ පද්ධති සංවර්ධනය වැනි සෘජුවම දරන ලද ප්‍රාග්ධන මට්ටමේ වියදම් ප්‍රාග්ධනීකරණය වීමට නියමිතය.

**මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

දේපල, පිරියත සහ උපකරණවල ධාරණ ප්‍රමාණය නැවත අයකර ගැනීමට නොහැකි ලෙස ඇතැම් අවස්ථා වෙනස්වීම්වලදී

පෙන්නුම් කරන විට ඒවා හානිකරණය කිරීම සඳහා සමාලෝචනය කරනු ලබයි. වත්කම් ධාරණ ස්වභාවය ඒවායේ නැවත අයකර ගත හැකි මට්ටම ඉක්මවා යන ප්‍රමාණය සඳහා හානිකරණය වන අලාභ හඳුනාගෙන ඇත. නැවත අයකර ගත හැකි ප්‍රමාණය වනුයේ වත්කම්වල සාධාරණ අගයෙන් විකිණුම් පිරිවැය සහ භාවිත අගය අඩුකිරීමේදී වන ඉහළ ප්‍රමාණයයි.

හානිකරණය කිරීම ඇගයීම සඳහා වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි මුදල් ප්‍රවාහ (මුදල් උත්පාදන ඒකක) සඳහා අඩුම මට්ටමින් වත්කම් කාණ්ඩ කර ඇත. අඩු වූ මූල්‍ය නොවන වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම අඩුකිරීම ආපසු හැරවිය හැකි වන පරිදි සමාලෝචනය කර ඇත.

### 1.4.7 ආයෝජන දේපල

**හඳුනාගැනීමේ පදනම**

ආයෝජන දේපල යනු කුලී ඉපැයීම සඳහා පවත්වාගෙන යන දේපල හෝ ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා හෝ එම අවස්ථා දෙකම සඳහා රඳවා ගත්, එහෙත් ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාවලියේදී අලෙවි කිරීමක් සිදු නොවන දේපල වේ.

**මැනීම**

මූල්‍ය ප්‍රකාශනවල පිරිවැය ක්‍රමය යටතේ ආයෝජන වත්කම් ගණනය කර ඇත. ඒ අනුව, වත්කමක් ලෙස හඳුනාගැනීමෙන් අනතුරුව, දේපල එහි සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණය කරන ලද අලාභයන් අඩුකර දක්වා ඇත.

**ක්ෂයවීම**

මිලදී ගත් දින සිට ඉවත් කරන ලද දිනය දක්වා වත්කම් වර්ගයේ තක්සේරු කරන ලද ආයු කාලය පදනම් කරගෙන සරල රේඛීයව ක්ෂයවීම් දක්වා ඇත.

**ඉවත්කිරීම**

ඉවතලන අවස්ථාවලදී හෝ අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති නිසා වත්කම් සම්පූර්ණයෙන්ම ඉවත් කළ විට ආයෝජන ඉවත් කරනු ලබයි. භවිතයේ වෙනසක් ඇති අවස්ථාවලදී පමණක් ආයෝජන දේපල මාරුකිරීම් සිදුකරනු ලබයි.

### 1.4.8 අස්පෘශ්‍ය වත්කම්

**හඳුනාගැනීමේ පදනම**

කිසියම් වත්කමකට අදාළ වන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා එනු ඇත්නම් සහ 'අස්පෘශ්‍ය වත්කම්' පිළිබඳ LKAS 38 නම් වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව වත්කමෙහි පිරිවැය නිවැරදිව මැනිය හැකි යැයි උපකල්පනය කෙරෙන්නේ නම් එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ.
මූලික හඳුනාගැනීමෙන් පසුව, එකතු වූ ණය හිලව් සහ එකතු වූ හානි ආශ්‍රිත අලාභයන් ඇත්නම් ඒවා අඩු කිරීමෙන් පසුව ලැබෙන පිරිවැය අගය මත අස්පෘශ්‍ය වත්කම් සැලකිල්ලට ගැනේ.

### 1.4.9 අනුබද්ධ සමාගමෙහි ආයෝජනය

**හඳුනාගැනීමේ පදනම**

හානි ආශ්‍රිත අලාභයන් ඇත්නම් ඒවා අඩු කිරීමෙන් පසුව ලැබෙන පිරිවැයට අනුබද්ධ සමාගමෙහි ආයෝජනය දක්වා ඇත.

### 1.4.10 තොග

තොග තක්සේරු කරනු ලබනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන්ම වඩාත් අඩු අගයටය. ශුද්ධ උපලබ්ධිත අගය යනු සම්පූර්ණ කිරීමට ඇස්තමේන්තුගත පිරිවැය හා අලෙවිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය අඩුකිරීමෙන් පසු සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් වශයෙන් අදාළ අගයට විකිණිය හැකි මිලයි. ශුද්ධ උපලබ්ධිත අගය අගයනු ලබන්නේ මෑතකාලීන වෙළෙඳපොළ ගනුදෙනු ඔස්සේ වාර්තාකරණ දිනයට පවතින වෙළෙඳපොළ තත්වයන් සහ මිල සැලකිල්ලට ගනිමිනි.

භාණ්ඩ තොග වර්තමාන තත්වයට ගෙන ඒමට අදාළ වූ පිරිවැය පහත දැක්වෙන පිරිවැය සූත්‍රයන් උපයෝගී කරගෙන ගණනය කරනු ලැබේ.

| අමුද්‍රව්‍ය | පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල |
|---|---|
| **නිමි භාණ්ඩ** | |
| අ) පිරිපහදු කළ නිෂ්පාදන | සෘජු ද්‍රව්‍ය, සෘජු කුලී හා ණය ගැනීමේ පිරිවැය හැර සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් වූ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයේ උචිත අනුපාත අගය |
| ආ) ආනයන | පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල |
| | සෘජු ද්‍රව්‍ය, සෘජු කුලී හා ණය ගැනීමේ පිරිවැය හැර සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් වූ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයේ උචිත අනුපාත අගය |

| | |
|---|---|
| ආ) ආනයන | පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල |
| වෙනත් නිමි භාණ්ඩ | බරතැබූ සාමාන්‍ය පදනම මත මිලදී ගැනිම් පිරිවැය |
| පාරිභෝජන භාණ්ඩ සහ අමතර කොටස් | බරතැබූ සාමාන්‍ය පදනම මත මිලදී ගැනිම් පිරිවැය |

### 1.4.11 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යනු අත ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු හා වටිනාකම වෙනස්වීමේ සුළු අවදානමකට පමණක් භාජනය විය හැකි හා මුදල්වලට ක්ෂණිකව පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ද්‍රවශීල ආයෝජනයන්ය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන දෑවලට ඇතුළත් වනුයේ අත ඇති මුදල්, බැංකු තැන්පතු හා බැංකු අයිරාවල ශුද්ධ හිඟ අගයන්ය. කෙටි කල් පිරීමේ ආයෝජනයන්ද, එනම් ලබාගත් දිනයේ සිට තුන් මසක් හෝ ඊට අඩු, මුදල් සමාන දෑ ලෙස සැලකේ.

### 1.4.12 ප්‍රතිපාදන හා වගකීම්

#### ප්‍රතිපාදන

ආර්ථික ප්‍රතිලාභයන් පිළිබිඹු කරන, සම්පත් ගලා යෑමේ සම්භාවිතාවයන්ට අදාළ බැඳියාව පියවීම සඳහා අවශ්‍ය වූ විට බැඳියාවේ අගය සම්බන්ධයෙන් විශ්වසනීය ඇස්තමේන්තුවක් සකස්කළ හැකිවීම හා අතීත සිද්ධීන් හේතුකොටගෙන සංස්ථාවට වත්මන් (නීතිමය හෝ සම්මුතියකින්) බැඳියාවක් තිබෙන විට ප්‍රතිපාදන හඳුනාගැනේ. ප්‍රතිපාදන සියල්ලම හෝ ඒවායින් කොටසක් ප්‍රතිපූර්ණය කිරීම සමාගමක් අපේක්ෂා කරන විට එවැනි ප්‍රතිපූර්ණයන් හඳුනාගන්නේ වෙනම වත්කමක් වශයෙනි. නමුත් මෙය බලපානුයේ ප්‍රතිපූර්ණය නියත වශයෙන් සහතික නම් පමණි. කිසියම් ප්‍රතිපාදනයන් වෙනුවෙන් වූ වියදම් ඕනෑම ප්‍රතිපූර්ණයක ආදායම් ප්‍රකාශනයක ඇතුළත් කෙරේ. මුදලේ වර්තමාන කාල අගයේ ප්‍රවර්තන වෙළෙඳ අගය පිළිබිඹු වන බදු අය කිරීමට පෙර අනුපාතිකයන් මත අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් හා අදාළ පරිදි වගකීමට ආවේනික වූ අවදානම මත ප්‍රතිපාදන තීරණය වේ. වට්ටම් යොදාගන්නා විට කාලයාගේ ඇවෑම නිසා ප්‍රතිපාදනයේ වැඩි වීම පොලී වියදමක් ලෙස සලකනු ලැබේ.

#### නිශ්චිත ප්‍රතිලාභ බැඳීම - පාරිතෝෂිකය

පාරිතෝෂික සම්බන්ධව මූල්‍ය තත්ව ප්‍රකාශනය තුළ හඳුනාගත් වගකීම, ප්‍රක්ෂේපණ ඒකක ණය ක්‍රමය භාවිතා කර වාර්තාකරණ කාලසීමාව අවසන වගකීමේ වර්තමාන අගයයි. නිශ්චිත බැඳීමේ වර්තමාන අගය, උපකල්පන ගණනාවක් භාවිතා කරමින් උපචිත පදනම මත තීරණය කරන සාධක මත රඳා පවතී. පාරිතෝෂික පිරිවැය තීරණය කිරීම සඳහා භාවිතා කරන මෙම උපකල්පනයන්ට, වට්ටම් අනුපාතිකය, අපේක්ෂිත කාර්ය මණ්ඩල පිරිවැටුම සහ වැටුප් වර්ධක අනුපාතය ඇතුළත් වේ. මෙම උපකල්පනයන්ට සිදු කරන කිසියම් වෙනස්කමක් පාරිතෝෂික බැඳීමේ ධාරක අගයට බලපායි.

කළමනාකාරිත්වය සෑම වසරක් අවසානයේදීම සුදුසු වට්ටම් අනුපාත තීරණය කරයි. මෙය, නිශ්චිත ප්‍රතිලාභ බැඳීම පියවීම සඳහා අවශ්‍ය කරන බවට අපේක්ෂා කරන තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය තීරණය කිරීම සඳහා භාවිතා කළ යුතු පොලී අනුපාතයයි. වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී, කළමනාකාරිත්වය ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත බැඳුම්කර සඳහා ගැඹුරු වෙළෙඳපොළක් නොමැති කල්හි රජයේ බැඳුම්කරවල පොලී අනුපාතය සලකා බලයි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම සඳහා වන අනෙකුත් ප්‍රධාන උපකල්පනයන් වර්තමාන වෙළෙඳපොළ තත්ත්වයන් මත පදනම් වේ.

LKAS 19 - සේවක ප්‍රතිලාභ සමඟ අනුකූල වන පරිදි සියලුම ස්ථිර සේවකයින්ගේ සේවය ආරම්භයේදී විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් යටතේ, සේවකයකු සම්බන්ධව වගකීම ලැබෙන්නේ අඛණ්ඩ සේවයේ වසර 5ක් සම්පූර්ණ වීමෙන් පමණි.

මෙය බාහිරව අරමුදල් සපයන නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් නොවේ.
උපචිත ලාභ සහ පාඩු අය කෙරෙන්නේ ඒවා ඇති වන කාලසීමාවේ විස්තීර්ණ ආදායම තුළය.

#### නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වයන් සඳහා සේවකයෝ සුදුසුකම් ලබති. සංස්ථාව විසින් සේවක මාසික දළ වැටුපෙන් 15%ක් 3%ක් පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත දායක කරනු ලබන අතර, සේවකයන් විසින් සේවය සපයන කාලවල වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ වාර්තා කරනු ලබයි.

### 1.4.13 ප්‍රාග්ධන සංචිතය

රජයේ ඒකාබද්ධ අරමුදලින් නිශ්චිතව ලැබූ මුදල් හා ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අලෙවියෙන් ලැබුණු ශුද්ධ අගය ප්‍රාග්ධන සංචිතයට බැර කර ඇත.

### 1.4.14 මූල්‍ය උපකරණ

සමූහය උපකරණයන්ගේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වයක් වූ විට මූල්‍ය වත්කම් සහ වගකීම් සාධාරණ අගයකින් යුතුව හඳුනාගැනේ. මූල්‍ය වත්කම් සහ වගකීම් (ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයක ඇති මූල්‍ය උපකරණ හැර) අත්පත් කරගැනීම හෝ නිකුත් කිරීමට සෘජු ලෙස සම්බන්ධ වන ගනුදෙනු පිරිවැය, මූලික හඳුනාගැනීමේදී සුදුසු ලෙස මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයට එක්කිරීම හෝ අඩුකිරීම හෝ කරනු ලැබේ. ගනුදෙනු පිරිවැය, ලාභ හෝ පාඩු තුළ ඉක්මනින් හඳුනාගැනෙන ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණ අත්පත්කරගැනීමට සම්බන්ධ වේ.

වත්කම් වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම කල් ඉකුත් වූ විට හෝ සමූහය විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ

ප්‍රතිලාභ මාරු කළ විට මූල්‍ය වත්කම් ශේෂ පත්‍රයෙන් ඉවත් කෙරේ. ගිවිසුම් තුළ නිශ්චිතව දක්වා ඇති බැඳීම අවලංගු කර ඇති හෝ කල් ඉකුත් වී ඇති විට මූල්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් ඉවත් කෙරේ.

මූලික හඳුනාගැනීමේදී, සමූහය විසින් පහත වර්ගයන් යටතේ මූල්‍ය උපකරණ වර්ගීකරණය කරනු ලැබේ.

(i) **ණය සහ ලැබීම්**

ණය සහ ලැබීම් යනු ව්‍යුත්පන්න නොවන සහ සක්‍රිය වෙළෙඳපොළ තුළ දක්වා නොමැති ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් වේ. සමූහයේ ණය සහ ලැබීම්වලට වෙළෙඳ ලැබීම්, කාර්ය මණ්ඩල ණය සහ මුදල් සමාන දෑ අයත් වන අතර, ජංගම සහ ජංගම නොවන වත්කම් යන දෙකටම ඇතුළත් වේ. ණය සහ ලැබීම්, ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ EIR හි අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් සැලකිල්ලට ගෙනය.

(ii) **කල්පිරීමේ ආයෝජන**

ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීමක් සහ ස්ථිර කල්පිරීමක් ඇති මූල්‍ය වත්කම්, කල්පිරීම දක්වා රඳවාගත් ගනයට අයත් වන අතර, එය කෙරෙන්නේ එම වත්කම් කල්පිරීම දක්වා රඳවා තබාගැනීමට සමූහයට හැකියාව සහ ධනාත්මක අදහස ඇති විටය.

මූලික මැනීමෙන් පසුව කල්පිරීමේ ආයෝජන ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය මඟින් මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ ඵලදායී පොලී අනුපාතයේ අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් සැලකිල්ලට ගෙනය.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කල්පිරීමේ ආයෝජනවලට, කල්පිරීම දක්වා රඳවාගැනීමේ අදහස අනුව ලබාගත් භාණ්ඩාගාර බැඳුම්කර අයත් වේ.

(iii) **අලෙවිය සඳහා ලද හැකි ආයෝජන** (AFS)

අලෙවිය සඳහා ලද හැකි ආයෝජන යනු මෙම වර්ගයට නම් කරන ලද හෝ වෙනත් වර්ගයක් යටතේ වර්ගීකරණය නොකළ ව්‍යුත්පන්න නොවන අලෙවි ආයෝජනයන් වේ. සංස්ථාවේ අලෙවිය සඳහා ලද හැකි ආයෝජනවලට ස්කන්ධ ආරක්ෂණ (ලැයිස්තුගත කළ සහ නොකළ) තුළ ආයෝජනයන් අයත් වේ. අලෙවිය සඳහා ලද හැකි ආයෝජන මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගත් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු සමඟ සාධාරණ අගය මත මැනුම් කර ආයෝජන මූල්‍ය තත්ව ප්‍රකාශනයෙන් ඉවත් කෙරෙන තෙක් අලෙවිය සඳහා ලද හැකි ආයෝජන සංචිතය තුළට බැර කෙරෙන අතර, එහිදී සමුච්චිත ආදායම හෝ පාඩුව අනෙක් වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනාගැනේ. නැතහොත් ලාභ හෝ පාඩු ප්‍රකාශනයට අලෙවිය සඳහා ලද හැකි ආයෝජන සංචිතය වෙතින් සමුච්චිත පාඩුව නැවත වර්ගීකරණය කරන විට ආයෝජනය හානිකරණය වන ලෙස තීරණය කෙරේ. දක්වන ලද ස්කන්ධ ආයෝජනවල සාධාරණ අගයන් තීරණය කෙරෙන්නේ සක්‍රිය වෙළෙඳපොළ තුළ මිල මඟිනි.

(iv) **ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වගකීම්**

ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වගකීම්වලට වෙළෙඳ සහ වෙනත් ගෙවීම්, ණය ගැනීම් සහ කෙටි කාලීන ණය ගැනීම් අයත් වේ.

මූලික හඳුනාගැනීමෙන් පසුව, පොලී සහිත ණය සහ ණය ගැනීම් ක්‍රමක්ෂය පිරිවැය අනුව ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කර මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ ඵලදායී පොලී අනුපාතයේ අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් හෝ ආධික්‍යය සැලකිල්ලට සැලකිල්ලට ගෙනය. ඵලදායී පොලී අනුපාත ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය තුළ අන්තර්ගත වී ඇත.

**මූල්‍ය වත්කම් හානිකරණය**

සෑම වාර්තාකරණ දිනකම, සමූහය විසින් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට විෂය මූලික සාක්ෂ්‍යයක් ඇතිද යන්න අගයනු ලබයි. අපහායන පාඩුවක් සඳහා විෂය මූලික සාක්ෂියක් ඇතිද යන්න තීරණය කිරීමට භාවිතා කරන නිර්ණායකවලට පහත කරුණු ඇතුළත් වේ:

ණයකරුවාගේ පැහැදිලි මූල්‍යමය දුෂ්කරතාවය
පොලී හෝ මුදල ගෙවීම පැහැර හැරීම

ණය ගනු ලැබූ තැනැත්තා බංකොලොත් වන බවට හෝ වෙනත් මූල්‍යමය අසංවිධානාත්මක බවකට පත්වීමට ඉඩ ඇතිවීමත සහ ගෙවීම් පැහැර හැරීමට බලපාන හිඟයන්ගේ වෙනස්කම් හෝ ආර්ථික තත්වයන්ගේ වෙනස්කම් වැනි තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහවල මැනිය හැකි අඩුවීමක් පවතින බවට නිරීක්ෂණය කළ හැකි දත්ත

ස්කන්ධ ආරක්ෂාව සම්බන්ධව ගත් විට ආරක්ෂණයේ පිරිවැයට වඩා එහි සාධාරණ අගය දිගින් දිගටම අඩුවීමද වත්කම් හානිකරණය වන බව පෙන්වන ලක්ෂණයකි. මෙම තීරණයට වැදගත් විනිශ්චයක් අවශ්‍ය වේ. මෙය විනිශ්චය කිරීමේදී කළමනාකාරිත්වය තවත් බොහෝ සාධක අතර මෙම සාධක ඇගයීමට ලක් කරයි. ආයෝජනයක සාධාරණ අගය එහි පිරිවැයට වඩා අඩු වන ප්‍රමාණය සහ කාලසීමාව, මූල්‍යමය සුවතාවය සහ ආයෝජකයින් වෙත පෙනී යන කෙටිකාලීන ව්‍යාපාර පෙනුම සහ කර්මාන්ත සහ ආංශික කාර්යසාධනය, තාක්ෂණයේ වෙනස්වීම්, මෙහෙයුම් සහ මුදල් ප්‍රවාහ ඇතුළු සාධක.

එවැනි සාක්ෂි පවතී නම්, සංස්ථාව විසින් පහත දැක්වෙන පරිදි අපහායන පාඩුවක් හඳුනාගනු ලබයි:

(i) **ක්‍රමක්ෂය වූ පිරිවැය අනුව මූල්‍ය වත්කම් පාඩුව**

ක්‍රමක්ෂය වූ පිරිවැය අනුව මූල්‍ය වත්කම් පාඩුව යනු ණයෙහි හෝ ලැබීම්වල ක්‍රමක්ෂය පිරිවැය හා උපකාරකවල මුල් ඵලදායී පොලී අනුපාතයෙන් වට්ටම් කළ තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගයන්ගේ වෙනසයි. වත්කමෙහි ධාරක ප්‍රමාණය දීමනා ගිණුමක් භාවිතා කර මෙම ගිණුමෙන් සෘජුව හෝ වක්‍රව අඩු කෙරේ.

(ii) **අලෙවිය සඳහා ලද හැකි වත්කම**

සමුච්චිතගත අපහායන පාඩුව යනු වත්කමෙහි මුල් පිරිවැය සහ මැනීමේ දිනයේදී එහි සාධාරණ අගය අතර වෙනස වන අතර, මෙහිදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් අපහායන පාඩු අඩු කෙරේ.

හානියේ ප්‍රමාණය අඩු වන්නේ නම් ක්‍රමාක්ෂය වූ පිරිවැයෙහි මූල්‍ය වත්කම් ආශ්‍රිත අපහායන පාඩු යථා කාලයන්හිදී ප්‍රතිවර්තය කෙරෙන අතර, අපහායනය හඳුනාගැනීමෙන් පසුව ඇති වන සිදුවීමකට එම පාඩුව නිරපේක්ෂ වශයෙන් සම්බන්ධ කළ හැකිය. වෙළෙඳ කටයුතු සඳහා ඇති ස්කන්ධ උපකරණ සම්බන්ධයෙන් සිදු වන අපහායන පාඩු ප්‍රත්‍යාවර්ත නොකෙරේ.

වෙළෙඳ කටයුතු සඳහා ඇති ස්කන්ධය අපහායනය වන අවස්ථාව තීරණය කිරීම සඳහා සමූහය විසින් LKAS 39 මාර්ගෝපදේශකත්වය අනුගමනය කරනු ලබයි.

**මූල්‍ය උපකරණ හිලව්කරණය**

හඳුනාගත් ප්‍රමාණයන් හිලව්කිරීමට බලාත්මක නීතිමය අයිතියක් ක්‍රියාත්මකව පවතින්නේ නම් සහ ශුද්ධ පදනමක් මත පියවීම් කිරීමට හෝ වත්කම් භාරගැනීමට සහ ඒ සමඟම වගකීම් පියවීමට අදහසක් ඇත්නම්, මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව්කරණය කෙරෙන අතර, ශුද්ධ අගය ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කෙරෙයි.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතීන් යටතේ අවසර ලැබුණු විට පමණක්, හෝ සමූහයේ වෙළෙඳ ක්‍රියාකාරීත්වය වැනි එක සමාන ගනුදෙනු සමූහයකින් ඇති වන ලාභ හෝ පාඩු සඳහා ආදායම් සහ වියදම් ශුද්ධ පදනමක් මත ඉදිරිපත් කෙරෙයි.

**සාධාරණ අගය තීරණය කිරීම**

මූල්‍ය තත්ව ප්‍රකාශන දිනය වන විට සක්‍රිය වෙළෙඳපොළ තුළ වෙළෙඳ කටයුතු සඳහා යොදවන ලද මූල්‍ය උපකරණවල සාධාරණ අගය පදනම් වන්නේ ගනුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩුකිරීමකින් තොරව ඉදිරිපත් කරන ලද වෙළෙඳපොළ මිල මතය.

සක්‍රිය වෙළෙඳපොළක වෙළෙඳ කටයුතු සඳහා යොමු නොකළ සෙසු සියලු මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය තීරණය කෙරෙන්නේ ප්‍රශස්ත තක්සේරුකරණ ශිල්පක්‍රම උපයෝගී කර ගනිමිනි. වට්ටම් සහිත මුදල් ප්‍රවාහ ක්‍රමය, වෙළෙඳපොළ නිරීක්ෂක මිල ගණන් පවතින සමාන උපකරණ සඳහා වන සැසඳීම් සහ වෙනත් අදාළ තක්සේරුකරණ මාදිලි යනාදිය තක්සේරුකරණ ශිල්පක්‍රමවලට ඇතුළත් වෙයි.

වත්මන් වෙළෙඳපොළ ගනුදෙනු හෝ නිරීක්ෂණාත්මක වෙළෙඳපොළ දත්ත නොමැති තක්සේරුකරණ ශිල්පක්‍රම උපයෝගී කරගනිමින් සාධාරණ අගය සහිතව ඇතැම් මූල්‍ය උපකරණ වාර්තා කෙරෙයි. ඒවායේ සාධාරණ අගය තීරණය කරනු ලබන්නේ තක්සේරුකරණ මාදිලිය හා වඩාත්ම ප්‍රශස්ත මාදිලි උපකල්පනයන් හා අදාළ වන සමූහයේ හොඳම ඇස්තමේන්තුව උපයෝගී කර ගනිමිනි.

මූල්‍ය උපකරණවල සාධාරණ අගයයන් පිළිබඳ විශ්ලේෂණයක් ඒවා මනිනු ලබන ආකාරය පිළිබඳ වැඩිදුර විස්තර 12. 1 සටහනෙහි දක්වා ඇත.

**1.4.15 අවිනිශ්චිත වගකීම්, නීති කටයුතු සහ කැපවීම්**

අවිනිශ්චිත වගකීම් යනු ආර්ථික ප්‍රතිලාභ මාරුවීම අනුමාන කළ නොහැකි හෝ නිවැරදිව මැනගත නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් වගකීම් මඟින් පමණක් තහවුරු වනු ඇතැයි සිතිය හැකි තත්වයන්ය. මූල්‍ය තත්ව ප්‍රකාශනය මඟින් අවිනිශ්චිත වගකීම් හඳුනාගනු නොලබන නමුදු, ඒවා ඉතා දුරස්ත නොවන්නේ නම් අනාවරණය කෙරෙයි.

## 1.5 නිකුත් කළ එහෙත් තවමත් ක්‍රියාත්මක නොවන ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පහත SLFRS නිකුත් කර ඇති අතර ඒවා ක්‍රියාත්මක වන්නේ අනාගතයේදී බැවින් මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ඒවා අදාල කර නැත. ඒම SLFRS මඟින් සමූහය විසින් වර්තමානයේ සකසන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මත යම් බලපෑමක් තිබෙන නමුත් ඇති අනාගත මූල්‍ය ප්‍රකාශන සඳහා පදනම් වෙනු ඇත.

අ) SLFRS 9 - මූල්‍ය උපකරණ: වර්ගීකරණය සහ මැනීම
නිකුත් කරන ලද SLFRS 9 මඟින් LKAS 39 හට ආදේශ වීම පළමු අදියර පිළිබිඹු කෙරෙන අතර මූල්‍ය උපකරණවල වර්ගීකරණය සහ මැනීමට අදාළ වේ. මෙයට මූල්‍ය වත්කම්වල හානිකරණය ගණනය කිරීම සඳහා වන නව ආපේක්ෂිත ණය පාඩු මාදිලියද ඇතුළත් වේ.

මෙම ප්‍රමිතිය 2018 ජනවාරි මස 01 වෙනි දිනෙන් පසු බලාත්මක වෙනු ඇත.

ආ) SLFRS 15 - පාරිභෝගිකයින් සමඟ ගිවිසුම් වෙතින් ආදායම

ආදායම හඳුනාගත යුත්තේද, ඒසේනම් කොපමණක්ද සහ කෙදිනද යන්න තීරණය කිරීම සඳහා විස්තීර්ණ රාමුවක් SLFRS 15 මඟින් ස්ථාපිත කරයි. එය, SLFRS 18 ආදායම, SLFRS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත් සහ IFRIC 13 පාරිභෝගික ලැදියා වැඩසටහන ඇතුළුව පවතින ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශයට ආදේශ වෙයි. මෙම ප්‍රමිතිය 2018 ජනවාරි මස 01 වෙනි දිනෙන් පසු බලාත්මක වෙනු ඇත.

එම ප්‍රමිති බලාත්මක වීමෙන් පසුව සංස්ථාව ඒවා අදාළ කරගනු ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ පළ කරන දිනය වන විට විස්තරාත්මක සමාලෝචනය නොනිම් ලෙස පැවති අතර මූල්‍ය ප්‍රතිඵල නිසි ලෙස තක්සේරු කළ නොහැක.

පහත දැක්වෙන ප්‍රමිතීන්, සංශෝධන සහ වැඩිදියුණුකිරීම් මඟින් සමූහයේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇති වන්නේ යැයි අපේක්ෂා නොකෙරෙයි.

- ඒකාබද්ධ මෙහෙයුම්වල අභිලාෂයන් ඇතුළත්කිරීම සඳහා අදාළ ගිණුම්කරණය (SLFRS 11 සංශෝධන)
- රෙගුලාසිමය සැකසූ ගිණුම් (SLFRS 14)
- කල්බදු (SLFRS 16)
- රෙගුලාසිමය සැකසූ ගිණුම් (SLFRS 14)
- ක්ෂයවීම් සහ හිලව්කරණය පිළිබඳ පිළිගත් ක්‍රමවල වර්ගීකරණය (LKAS 16 සහ LKAS 38 සංශෝධන)
- වෙන්ව ප්‍රකාශිත මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධ ක්‍රමය (LKAS 27 ආශ්‍රිත සංශෝධන)
- ආයෝජන සමාගමක් සහ එහි සහකාර හෝ ඒකාබද්ධ ව්‍යාපාරයක් අතර වත්කම් අලෙවිය හෝ දායකත්වය (SLFRS 10 සහ LKAS 28 ආශ්‍රිත සංශෝධන)
- ආයෝජන ආයතන: ඒකාබද්ධකරණ සුවිශේෂතා යෙදවීම (SLFRS 10, SLFRS 12 සහ LKAS 28 ආශ්‍රිත සංශෝධන).
- අනාවරණ කිරීම් (LKAS 1 ආශ්‍රිත සංශෝධන)

### 1.6 නව දේශීය ආදායම් පනත

2017 සැප්තැම්බර් 07 වන දින නව දේශීය ආදායම් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත වූ අතර, 2018 අප්‍රේල් 01 වනදා සිට බලාත්මක වේ. එම පනත මඟින් සමූහය විසින් වර්තමානයේ සකසන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති කෙරෙහි යම් බලපෑමක් කෙරෙනු ඇති අතර, අනාගත මූල්‍ය ප්‍රකාශන සඳහාද එය පදනම් වනු ඇත.

පනත බලාත්මක වීමෙන් පසුව සංස්ථාව එයට අනුකූලව කටයුතු කරනු ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පළ කරන දිනය වන විට විස්තරාත්මක සමාලෝචනය නොනිමි ලෙස පැවති අතර, මූල්‍ය ප්‍රතිඵල නිසි ලෙස තක්සේරු කළ නොහැක.

| 2. ආදායම | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| දේශීය | 473,956.995 | 439,454.172 | 473,956.995 | 439,454.172 |
| අපනයන | 42,814.169 | 35,117.794 | 42,814.169 | 35,117.794 |
| නැව් ඉන්ධන සැපයීම | - | 478.988 | 233.906 | 478.988 |
| පර්යන්ත ගාස්තුව හා වෙනත් | - | - | 440.722 | 382.561 |
| මුළු ආදායම | 516,771.164 | 475,050.954 | 517,445.792 | 475,433.515 |
| අඩු කළා: නිෂ්පාදන බදු හා ජාතිය ගොඩනැගීමේ බද්ද | (70,268.786) | (51,989.903) | (70,268.786) | (51,989.903) |
| **ශුද්ධ ආදායම** | **446,502.378** | **423,061.051** | **447,177.006** | **423,443.612** |

| 3. වෙනත් මෙහෙයුම් ආදායම් | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආයෝජන දේපළ මත ආදායම | 38.359 | 38.634 | 38.359 | 38.634 |
| භූමිතෙල් සහනාධාරය | - | 2,982.000 | - | 2,982.000 |
| සේවක ණය පොළී | 210.318 | 161.980 | 563.085 | 477.960 |
| කුලී ආදායම | 10.328 | 18.512 | 12.994 | 21.089 |
| දේ.පී.උ. ඉවත් කිරීම මත ලාභය / (පාඩුව) | (4.914) | 36.414 | (1.319) | 87.659 |
| පිරවුම්හල් උපකරණ අලවියෙන් ලාභය | 22.728 | 15.429 | 22.728 | 15.429 |
| ලාභාංශ ආදායම | 243.105 | 292.502 | 0.105 | 0.002 |
| විවිධ ආදායම | 150.523 | 42.968 | 242.415 | 149.317 |
| | 670.446 | 3,588.439 | 878.366 | 3,772.090 |

| 4. මෙහෙයුම් ලාභය | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| පහත සඳහාන් වියදම් ගෙවීමෙන් පසු ප්‍රකාශිත මෙහෙයුම් ලාභය | | | | |
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 1.388 | 1.762 | 11.172 | 9.114 |
| විගණකවරුන්ගේ වේතන | 2.000 | 2.108 | 3.800 | 3.874 |
| ක්ෂයවීම් (සටහන 8) | 726.476 | 642.800 | 1,604.831 | 749.721 |
| ප්‍රචාරණ වියදම් | 26.763 | 37.491 | 26.763 | 37.491 |
| නීති ගාස්තු හා වෙනත් වෘත්තීය ගාස්තු | 156.435 | 125.467 | 156.435 | 125.467 |
| අවසර නොදුන් වැට් | 2,252,653 | 1,345.762 | 2,252,653 | 1,345.762 |
| මහා භාණ්ඩාගාරයට විශේෂ ගාස්තු | 1,000.000 | 1,000.000 | 1,000.000 | 1,000.000 |

| 5. මූල්‍ය ආදායම | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු වලින් ලද පොළී ආදායම | 4,041.318 | 4,142.346 | 4,230.759 | 4,232.716 |
| නේවාසික විදේශ මුදල් ගිණුම් වෙතින් පොලී ආදායම | 0.843 | 0.883 | 0.843 | 0.883 |
| ණය ඉන්වොයිස් සහ කල් ඉකුත් වූ වෙළඳ ණය මත පොළී ආදායම | 30.241 | 26.748 | 30.241 | 26.748 |
| ලංවිම/පෞ. විදුලි සමාගම්/ගුවන් තෙල් ණය වෙතින් පොලී ආදායම | 3,561.130 | 676.857 | 3,561.130 | 676.857 |
| භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පොලී ආදායම | 3,433.551 | 3,527.277 | 3,433.551 | 3,527.277 |
| | **11,067.082** | **8,374.112** | **11,256.523** | **8,464.482** |

| 6. මූල්‍ය වියදම් | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| දිගුකාලීන ණය සඳහා පොලී | 39.879 | 50.513 | 163.952 | 217.288 |
| විදේශ විනිමය බැංකු ණය පොලී | 10,457.912 | 11,340.254 | 10,457.912 | 11,340.254 |
| වෙනත් මූල්‍ය පිරිවැය | 33.020 | 13.770 | 33.020 | 13.770 |
| | **10,530.811** | **11,404.537** | **10,654.884** | **11,571.312** |

| 7. බදු වියදම් | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **ජංගම බදු:** | | | | |
| ජංගම ආදායම් බදු | 1,407.719 | 12,186.470 | 1,907.505 | 12,401.254 |
| පෙර වසරවල ඌන ප්‍රතිපාදන | - | - | (23.205) | 45.782 |
| බෙදාහැරිය හැකි ලාභ මත බද්ද | 489.876 | 4,340.132 | 489.876 | 4,340.132 |
| **විලම්භිත බදු:** | | | | |
| තාවකාලික වෙනස්කම් ඇති වීම සහ ප්‍රත්‍යාවර්තනය | - | - | 24.16 | 363.378 |
| | **1,897.594** | **16,526.602** | **2,398.332** | **17,150.545** |
| **ආදායම් බදු වියදම - ආදායම් ප්‍රකාශය** | | | | |
| **ආදායම් බදු වියදම - වෙනත් විස්තීර්ණ ආදායම්** | **-** | **-** | **(12.761)** | **33.409** |
| **මුළු ආදායම් බදු වියදම්** | **1,897.594** | **16,526.602** | **2,385.571** | **17,183.955** |

ජංගම බදු වියදම් සහ බදුවලට පෙර ලාභයේ සසැඳුමක් පහත දක්වා ඇත.

| | | | | |
|---|---|---|---|---|
| **බදු වලට පෙර ගිණුම්කරණ ලාභය** | **3,367.221** | **69,553.681** | **6,397.876** | **71,589.544** |
| එකතු කළා: ඉඩනොදුන් වියදම් | 1,195.579 | 1,086.100 | 2,521.222 | 2,363.373 |
| අඩු කළා : ඉඩදිය හැක වියදම් සහ නිදහස් කරන ආදායම් | (1,711.796) | (3,309.971) | (2,952.876) | (4,495.215) |
| **ගැලපුම්කළ වෙළඳ ලාභය** | **2,851.004** | **67,329.811** | **5,966.222** | **69,457.702** |
| අඩු කළා : බදු අලාභ | (2,707.151) | (23,563.094) | (2,939.276) | (24,410.830) |
| එකතු කළා: වසරේ බදු අලාභ | 4,883.713 | - | 4,883.713 | - |
| **බදු අය කළ හැකි ආදායම** | **5,027.567** | **43,766.717** | **7,910.660** | **45,046.872** |
| **ආදායම් බදු** | | | | |
| 28% | 1,407.719 | 12,136.716 | 1,407.719 | 12,136.716 |
| සහන අනුපාත | - | 49.754 | 499.787 | 264.538 |
| පෙර වසරේ ඌන ප්‍රතිපාදන | - | - | (23.205) | 45.782 |
| බෙදා හැරි හැකි ලාභය මත බදු | 489.876 | 4,340.132 | 489.876 | 4,340.132 |
| ආදායම් ප්‍රකාශය සඳහා විලම්භිත බදු | - | - | 24.156 | 363.378 |
| තාවකාලික වෙනස්කම් නිර්මාණය කිරීම සහ ආපසු හැරවීම - OCI | - | - | (12.761) | 33.409 |
| **ආදායම් බදු වියදම** | **1,897.594** | **16,526.602** | **2,385.571** | **17,183.955** |

බදු ගෙවීමට අදාළ 2002/03, 2013/14 සහ 2014/2015 යන වර්ෂ සඳහා පිළිවෙළින් රු. මි. 2,755, රු. මි. 100 සහ රු. මි. 723 බැගින් වන වටිනාකමට තක්සේරු අගයයන් නිකුත් කරනු ලැබ ඇති අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එම තක්සේරු අගයයන් සඳහා වලංගු අභියාචනා ඉදිරිපත් කරනු ලැබ ඇත.

2007/08 තක්සේරු වසර සඳහා, අභියාචනා අධිකරණ නියෝගය මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රු. මි. 399ක වටිනාකමකින් යුතු ආදායම් බදු ප්‍රමාණයක් ගෙවීමට නියම කෙරිණි.

| 8. | දේපළ, පිරියත සහ උපකරණ | ඉඩම් සහ ගොඩනැගිලි | පැවරුං දේපල | පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | SPM සංකීර්ණය | මෝටර් වාහන | ගෘ./ සවිකිරීම, කා.උප සහ වෙනත් වත්කම් | නොනිමි ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **8.1** | **පිරිවැය** | | | | | | | | |
| | 01/01/2017 දිනට ශේෂය | 4,492.661 | 1.016 | 11,030.379 | 2,142.422 | 989.683 | 2,204.191 | 1,430.084 | 22,290.433 |
| | එකතු කිරීම්/මාරු කිරීම් | 1,035.884 | - | 189.878 | 95.851 | 332.244 | 62.276 | (897.604) | 818.529 |
| | නැවත ඇගයීම | 10,210.907 | - | - | - | - | - | - | 10,210.907 |
| | ඉවත් කිරීම් | (1.564) | - | (5.347) | - | - | (9.048) | - | (15.960) |
| | 31/12/2017 දිනට ශේෂය | **15,737.888** | **1.016** | **11,214.907** | **2,238.273** | **1,321.927** | **2,257.419** | **532.480** | **33,303.909** |
| | | | | | | | | | |
| **8.2** | **ක්ෂය වීම** | | | | | | | | |
| | 01/01/2017 දිනට ශේෂය | 686.357 | 0.397 | 4,735.372 | 1,290.634 | 460,184 | 1,611.834 | - | 8,784.778 |
| | වර්ෂය සඳහා අය | 113.140 | - | 562.846 | 9.585 | 178.617 | 58.671 | - | 922.858 |
| | ඉවත් කිරීම් | (1.560) | - | (1.968) | - | - | (8.784) | - | (12.313) |
| | | | | | | | | | |
| | 31/12/2017 දිනට ශේෂය | 797.937 | 0.397 | 5,296.249 | 1,300.219 | 638.801 | 1,661.721 | - | 9,695.324 |
| | | | | | | | | | |
| | **31.12.2017 දිනට ශුද්ධ පොත් වටිනාකම** | **14,939.951** | **0.619** | **5,918.658** | **938.054** | **683.126** | **595.699** | **532.480** | **23,608.585** |
| | | | | | | | | | |
| | 31.12.2016 දිනට පිරිවැය | 4,492.661 | 1.016 | 11,030.376 | 2,142.422 | 989.683 | 2,204.191 | 1,430.084 | 22,290.433 |
| | 31.12.2016 දිනට ක්ෂය වීම | 686.357 | 0.397 | 4,735.372 | 1,290.634 | 460.184 | 1,611.834 | - | 8,784.778 |
| | 31.12.2016 **දිනට ශු.පො.ව** | 3,806.304 | 0.619 | 6,295.004 | 851.788 | 529.499 | 592.357 | 1,430.084 | 13,505.655 |

2017 දෙසැම්බර් 31 වැනිදා සිට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භූමිය මැනීම සඳහා වන සිය ගිණුම්කරණ ප්‍රතිපත්තිය ප්‍රතිතක්සේරුකරණ මාදිලියට වෙනස් කරනු ලැබ ඇති අතර, ප්‍රතිත්කසේරු වටිනාකම් 2017 දෙසැම්බර් 31 වැනිදා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරනු ලැබ ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිය භූමියේ සාධාරණ අගය තීරණය කිරීම සඳහා පිළිගත් ස්වාධීන තක්සේරුකරුවකු වන තක්සේරුකරණ දෙපාර්තමේන්තුව යොදවනු ලැබීය. සාධාරණ අගය තීරණය කරනු ලබන්නේ වෙළඳපොළ පදනම් කරගත් සාක්ෂ්‍ය ආශ්‍රිත සාධක මඟිනි. මෙයින් අදහස් වන්නේ තක්සේරුකරු විසින් සිදුකරනු ලබන තක්සේරුකරණයන් පදනම් වන්නේ විශේෂිත දේපල හා සම්බන්ධ ස්වභාවික පරිසරය, ස්ථානය හෝ තත්වය ආශ්‍රිත සක්‍රිය වෙළෙඳපොළ මිල ගණන් මත බවය.

පිරිවැය මාදිලිය උපයෝගී කරගනිමින් භූමි මිනුම් කරනු ලැබුවේ නම්, ධාරණීය වටිනාකම් පහත පරිදි වනු ඇත.

| | සංස්ථාව | |
|---|---|---|
| | 2017 රු. මිලියන | 2016 රු. මිලියන |
| පිරිවැය/ ධාරණීය වටිනාකම | 1,644.141 | 642.563 |

| දේපළ, පිරියත සහ උපකරණ (සමූහය) | ඉඩම් සහ ගොඩනැගිලි | පැවරුං දේපල | පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | SPM සංකීර්ණය | මෝටර් වාහන | ගෘ./ සවිකිරීම, කා.උප සහ වෙනත් වත්කම් | නොනිමි ප්‍රාග්ධන වැඩ | සමූහයේ එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පිරිවැය** | | | | | | | | |
| 01/01/2017 දිනට ශේෂය | 10,536.063 | 1.016 | 19,871.172 | 4,942.831 | 2,211.523 | 10,926.066 | 2,227.628 | 50,716.300 |
| එකතු කිරීම්/මාරු කිරීම් | 1,172.615 | - | 246.657 | 95.851 | 865.170 | 246.701 | (975.174) | 1,651.819 |
| නැවත ඇගයීම | 10,210.907 | - | - | - | - | - | - | 10,210.907 |
| ඉවත් කිරීම් | (1.564) | - | (5.347) | - | (1.925) | (9.104) | - | (17.941) |
| 31/12/2017 දිනට ශේෂය | 21,918.021 | 1.016 | 20,112.482 | 5,038.682 | 3,074.768 | 11,163.662 | 1,252.454 | 62,561.085 |
| | | | | | | | | |
| **ක්ෂය වීම** | | | | | | | | |
| 01/01/2017 දිනට ශේෂය | 1,220.895 | 0.397 | 8,342.376 | 3,446.104 | 1,576.584 | 5,824.433 | - | 20,410.790 |
| වර්ශය සඳහා අය | 161.288 | - | 921.139 | 170.132 | 256.557 | 292.097 | - | 1,801.214 |
| ඉවත් කිරීම් | (1.560) | - | (1.968) | - | (1.925) | (8.798) | - | (14.252) |
| | | | | | | | | |
| 31/12/2017 දිනට ශේෂය | 1,380.623 | 0.397 | 9,261.547 | 3,616.237 | 1,831.216 | 6,107.732 | - | 22,197.752 |
| | | | | | | | | |
| **31.12.2017 දිනට ශුද්ධ පොත් වටිනාකම** | **20,537.397** | **0.619** | **10,850.935** | **1,422.446** | **1,243.552** | **5,055.930** | **1,252.454** | **40,363.333** |
| | | | | | | | | |
| 31.12.2016 දිනට පිරිවැය | 4,492.661 | 1.016 | 11,030.376 | 2,142.422 | 989.683 | 2,204.191 | 1,430.084 | 50,716.300 |
| 31.12.2016 දිනට ක්ෂය වීම | 686.357 | 0.397 | 4,735.372 | 1,290.634 | 460.184 | 1,611.834 | - | 20,410.790 |
| 31.12.2016 දිනට ශු.පො.ව | 3,806.304 | 0.619 | 6,295.004 | 851.788 | 529.499 | 592.357 | 1,430.084 | 30,305.510 |

| 8.3 ආයෝජන දේපල | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පිරිවැය** | | | | |
| වසර මුල ශේෂය | 57.891 | 57.891 | 57.891 | 57.891 |
| එකතු කළා: එක් කිරීම්/මාරු කිරීම් | - | | - | - |
| වසරේ අවසානයේ ශේෂය | 57.891 | 57.891 | 57.891 | 57.891 |
| **ක්ෂය වීම** | | | | |
| වසර මුල ශේෂය | 16.316 | 14.869 | 16.316 | 14.869 |
| එකතු කළා: වසර සඳහා අය කිරීම් | 1.447 | 1.447 | 1.447 | 1.447 |
| වසර අවසානයේ ශේෂය | 17.763 | 16.316 | 17.763 | 16.316 |
| **ශුද්ධ පොත් අගය** | 40.128 | 41.575 | 40.128 | 41.575 |

ආයෝජන වත්කම්වල කොළඹ තර්ස්ටන් පාරේ දේපළ, මල් පාර දේපළ සහ කුලියට ලබාදුන් පිරවුම්හල් අයත් වේ.

| විස්තරය | | සාධාරණ වටිනාකම රුපියල්. මිලියන |
|---|---|---|
| අංක. 80. මල් පාර කොළඹ 07<br>අංක 22/1, තර්ස්ටන් පාර, කොළඹ | } | 40.000 |
| පිරවුම් හල් | | 18.283 |

| 8.4 අස්පෘශ්‍ය වත්කම් | සමූහය | | | |
|---|---|---|---|---|
| | ERP පද්ධතිය | SAP බලපත්‍රය | ස්වයංක්‍රීය පද්ධතිය | එකතුව |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පිරිවැය / ධාරක අගය** | | | | |
| වසර ආරම්භයේදී ශේෂය | 412.497 | 9.380 | 37.793 | 459.670 |
| එක් කිරීම්/මාරු කිරීම් | - | - | - | - |
| වසර අවසානයේදී ශේෂය | **412.497** | **9.380** | **37.793** | **459.670** |
| **ක්‍රමක්ෂය කිරීම්** | | | | |
| වසර ආරම්භයේදී ශේෂය | 411.914 | 7.987 | 32.160 | 452.061 |
| වසරේ අය කිරීම | 0.304 | 1.393 | 5.634 | 7.331 |
| වසර අවසානයේදී ශේෂය | 412.219 | 9.380 | 37.794 | 459.392 |
| **ධාරක අගය** | | | | |
| 2017.12.31 දිනට | **0.278** | - | - | **0.278** |
| **2016.12.31 දිනට** | **0.582** | **1.393** | **5.633** | **7.609** |

| 9. පරිපාලිත සමාගම් වල ආයෝජන | | | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 |
| | හිමිකාරත්වය % | හිමිකාරත්වය % | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 66.67% | 66.67% | 5,000.000 | 5,000.000 | - | - |
| | | | **5,000.000** | **5,000.000** | - | - |

| 10. ජංගම නොවන මූල්‍ය වත්කම් | සටහන | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016 |
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ලැයිස්තුගත ස්කන්ධය ආයෝජන | 10.1 | 29.000 | 29.500 | 29.000 | 29.500 |
| ලැයිස්තුගත නොකළ ස්කන්ධය ආයෝජන | 10.2 | 0.540 | 5.626 | 0.540 | 5.626 |
| ස්කන්ධය නොවන ආයෝජන | 10.3 | 29,844.492 | 35,560.335 | 29,844.492 | 35,560.335 |
| | | **29,874.032** | **35,595.461** | **29,874.032** | **35,595.461** |

| 10.1. ලයිස්තුගත ස්කන්ධ ආයෝජන | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ලංකා සිමෙන්ති සමාගම | | | | |
| සාමාන්‍ය කොටස් සඳහා රු. 10/බැගින් 5,000,000 ගෙවන ලදී | 29.500 | 39.500 | 29.500 | 39.500 |
| සාධාරණ අගය ස්කන්ධය වෙත මාරු කිරීම | (0.500) | (10.000) | (0.500) | (10.000) |
| | **29.000** | **29.500** | **29.000** | **29.500** |

| 10.2. ලයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජන | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **එක්සත් ප්‍රවෘත්ති පත්‍ර ලංකා සමාගම** | | | | |
| රු. 10/- බැගින් වූ සාමාන්‍ය කොටස් 61,206 | 0.539 | 0.539 | 0.539 | 0.539 |
| **ලංකා ලේලන්ඩ් සමාගම** | | | | |
| රු. 10/- බැගින් වූ සාමාන්‍ය කොටස් 100 | 0.001 | 0.001 | 0.001 | 0.001 |
| **ජාත්‍යන්තර සමූපකාර ඛනිජ තෙල් සංගමය** | | | | |
| සම්පූර්ණයෙන්ම ගෙවූ ඇඩො. 100/- කොටස් 5,499 | | | | |
| ඇ. එ. ජනදයේ පිහිටුවන ලද | 5.086 | 5.086 | 5.086 | 5.086 |
| අඩු කළා: අපහායන සඳහා ප්‍රතිපාදන | (5.086) | - | (5.086) | - |
| | **0.540** | **5.626** | **0.540** | **5.626** |

අලෙවිය සඳහා ආයෝජන පවතින්නේ යැයි වර්ගීකරණය කරන ලද මිල ගණන් සඳහන් නොකළ ආයෝජන පිරිවැය අනුව සැලකිල්ලට ගැනෙයි. වාර්තාකරණ දිනය වන විට ණය අවදානම සඳහා වන උපරිම නිරාවරණය වෙළෙඳ කටයුතු සඳහා පවතින්නේ යැයි වර්ගීකරණය කරනු ලැබ ඇති සමකොටස් සුරැකුම්වල ධාරක වටිනාකම වේ. අපහායන ප්‍රතිපාදනයක් සිදු කර ඇති ජාත්‍යන්තර සහයෝගිතා ඛනිජ තෙල් සංගමය හැරුණු විට අලෙවිය සඳහා පවතින්නේ යැයි වර්ගීකරණය කරනු ලැබ ඇති මූල්‍ය වත්කම් කිසිවක් කල් පමාවූ හෝ අපහායනය වූ ඒවා නොවේ.

| 10.3. ස්කන්ධ නොවන ආයෝජන | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ස්ථාවර තැන්පතු ආයෝජන | 5.000 | 5.000 | 5.000 | 5.000 |
| භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනය | 29,839.492 | 35,555.335 | 29,839.492 | 35,555.335 |
| | 29,844.492 | 35,560.335 | 29,844.492 | 35,560.335 |

| 11. වෙළඳාම සහ අනෙකුත් ලැබීම් | සංස්ථාව | | | |
|---|---|---|---|---|
| | 2017 | | 2016 | |
| | ජංගම | ජංගම නොවන | ජංගම | ජංගම නොවන |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වෙළෙඳ ලැබීම් | 76,956.161 | - | 33,262.256 | - |
| වෙනත් ලැබීම් | 7,640.116 | 0.667 | 6,804.863 | 0.667 |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් | 282.587 | 6,024.786 | 1,315.836 | 7,372.314 |
| අත්තිකාරම් | 2,057.605 | - | 6971.339 | - |
| සේවකයින්ට ණය සහ අත්තිකාරම් ගෙවීම | 54.119 | 2,938.187 | 43.681 | 2,953.727 |
| | **86,990.589** | **8,963.641** | **48,397.975** | **10,326.708** |

වෙළඳ ලැබීම්වලට හානිකරණය සඳහා වන ප්‍රතිපාදන හි හැසිරීම පහත දක්වා ඇත.

| | සංස්ථාව | |
|---|---|---|
| | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන |
| ජනවාරි 01 වන දිනට ශේෂය | 49.621 | 52.099 |
| අඩු කළා: පියවා ගන්න ලද ප්‍රමාණය | - | |
| අඩු කළා කපා හළ මුදල | - | (1.092) |
| එකතු කළා: වසරේ ප්‍රතිපාදන | (0.343) | (1.386) |
| **දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **49.278** | **49.621** |

| 12 මූල්‍ය උපකරණ වර්ගය අනුව මූල්‍ය වත්කම් | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ණය සහ ලැබීම් | | | | |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 86,096.650 | 38,476.763 | 86,875.269 | 41,981.305 |
| බැංකු මත තැන්පත් කිරීම් | 5,168.258 | 27,149.417 | 5,168.258 | 27,149.417 |
| අතැති මුදල් හා බැංකු මුදල් | 9,385.759 | 14,579.410 | 10,859.879 | 17,034.827 |
| අලෙවිය සඳහා ලද හැකි මූල්‍ය වත්කම් | | | - | |
| ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජනය | 29.540 | 35.126 | 29.540 | 35.126 |
| කල්පිරීම දක්වා රඳවා ගත් | | | - | |
| භාණ්ඩාගාර බැඳුම්කර මත ආයෝජනය | 35,361.708 | 36,476.761 | 35,361.708 | 36,476.761 |
| **එකතුව** | **136,041.915** | **116,717.477** | **138,294.654** | **122,677.437** |

| වර්ගය අනුව මූල්‍ය වගකීම් | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් | | | | |
| ණය ගැනීම් | 179,907.331 | 193,987.471 | 179,907.331 | 195,497.637 |
| වෙළඳ හා අනෙකුත් ගෙවීම් | 183,282.528 | 146,061.828 | 177,816.873 | 143,480.550 |
| **එකතුව** | **363,189.859** | **340,049.300** | **357,724.204** | **338,978.187** |

## 12.1 මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගය

පහතින් දැක්වෙන්නේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ ලෙස වර්ගීකරණය කෙරෙන සමූහයේ මූල්‍ය උපකරණවල ධාරණීය වටිනාකම් සහ සාධාරණ අගය පිළිබඳව වර්ග අනුව සිදුකරන ලද සැසඳුමකි.

| දෙසැම්බර් 31 දිනට | | ධාරක අගය | | සාධාරණ අගය | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016 |
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **මූල්‍ය වත්කම්** | | | | | |
| ජංගම නොවන මූල්‍ය වත්කම් | | | | | |
| ලැයිස්තුගත ස්කන්ධ ආයෝජන | 12.1.1 | 29.000 | 29.500 | 29.000 | 29.500 |
| ලැයිස්තුගත නොවු ස්කන්ධ ආයෝජන | 12.1.2 | 0.540 | 5.626 | 0.540 | 5.626 |
| ස්ථාවර තැන්පතු සඳහා ආයෝජන | 12.1.3 | 5.000 | 5.000 | 5.000 | 5.000 |
| භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන | 12.1.1 | 29,839.492 | 35,555.335 | 29,662.613 | 32,758.459 |
| වෙළෙඳ සහ වෙනත් ලැබීම් | 12.1.4 | 86,096.650 | 38,476.763 | 86,096.650 | 38,476.763 |
| කෙටි කාලීන ආයෝජන | | | | | |
| බැංකු තැන්පතු | 12.1.3 | 5,163.258 | 27,144.417 | 5,163.258 | 27,144.417 |
| රජයේ බැඳුම්කර | 12.1.1 | 5,522.215 | 921.426 | 5,480.095 | 912.937 |
| මුදල් හා මුදල් සමාන දෑ | 12.1.4 | 9,385.759 | 14,579.410 | 9,385.759 | 14,579.410 |
| | | **136,041.915** | **116,717.477** | **135,822.915** | **113,912.112** |
| | | | | | |
| **මූල්‍ය වගකීම්** | | | | | |
| ණය සහ ණය ගැනුම් | 12.1.3 | 265.858 | 303.837 | 265.858 | 303.837 |
| වෙළෙඳ සහ වෙනත් ගෙවීම් | 12.1.4 | 183,282.528 | 146,061.828 | 183,282.528 | 146,061.828 |
| කෙටි කාලීන ණය ගැනීම් | 12.1.4 | 179,641.473 | 193,683.634 | 179,641.473 | 193,683.634 |
| | | **363,189.859** | **340,049.299** | **363,189.859** | **340,049.299** |

**සාධාරණ අගය තීරණය කිරීම**

**තක්සේරුකරණ මාදිලිය**

පිටතින් ලබාගන්නා මිල ගණන් හෝ මාදිලි සඳහා වන නිරීක්ෂණාත්මක මිලකිරීම් ඇතුළත් කිරීම් ඇසුරු කරමින් සාධාරණ අගය තීරණය කරනු ලබන සියලු මූල්‍ය උපකරණ සඳහා ස්වාධීන මිල තීරණය කිරීම හෝ තක්සේරුකරණය ලබාගනු ලැබේ. සක්‍රිය වෙළෙඳපොළකදී, වෙළෙඳ කටයුතු සඳහා උපයෝගී කරගත් මිල ගණනක සෘජු නිරීක්ෂණය සිදු කළ නොහැකි විය හැකිය. එවැනි අවස්ථාවන්හිදී, සමූහය විසින් වඩාත් අදාළ සහ විශ්වාසදායී යැයි සැලකෙන තොරතුරුවලට වැඩි බරක් ලබාදෙමින් මූල්‍ය උපකරණයේ සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා විකල්ප වෙළෙඳපොළ තොරතුරු උපයෝගී කරගනු ලබයි.

12.1.1 මිල ගණන් ඉදිරිපත් කර ඇති ස්කන්ධ සහ භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධ ආයෝජන ආශ්‍රිත සාධාරණ අගය පදනම් වන්නේ වාර්තාකරණ දිනය වන විට වෙළෙඳපොළ තුළ ඉදිරිපත් කරනු ලැබ ඇති මිල මතය

12.1.2 පිරිවැයට ගෙන එන ලයිස්තුගත නොවු ස්කන්ධ ආයෝජනවල සාධාරණ අගය ආයෝජනයේ ප්‍රමාණාත්මක බව සලකා බලා එහි සාධාරණ අගයට සමාන බව උපකල්පනය කෙරේ.

12.1.3 පොලී අනුපාත, බැංකුවේ ණය අගය, සහ උපකරණයේ අවදානම් ලක්ෂණ. 2017 දෙසැම්බර් 31 වැනිදා වන විට තැන්පතු, ණය සහ ණය ගැනීම් සම්බන්ධ ධාරණීය වටිනාකම් සාධාරණ අගයෙන් භෞතික වශයෙන් වෙනස් නොවේ.

12.1.4 ප්‍රධාන වශයෙන්ම මේ උපකරණවල කෙටි කාලීන කල්පිරීම් හේතුකොටගෙන මුදල් සහ මුදල් සමාන දෑ, වෙළෙඳ හා වෙනත් ලැබීම්, වෙළෙඳ හා වෙනත් ගෙවීම් මෙන්ම කෙටිකාලීන ණය ගැනීම් ඒවායේ ධාරණීය වටිනාකම්වලට ආසන්න වෙයි.

## 12.2 සාධාරණ අගය පිළිබඳ ධූරාවලිය

සමූහය විසින් මූල්‍ය කටයුතු හා සම්බන්ධ සාධාරණ අගය තීරණය කිරීම සහ අනාවරණය කිරීම සඳහා පහත දැක්වෙන ධූරාවලිය උපයෝගී කරගනු ලබයි.

**1 වැනි මට්ටම:** සක්‍රිය වෙළෙඳපොළ තුළ එක සමාන වත්කම් හෝ වගකීම් සඳහා ඉදිරිපත් කළ (සකසන නොලද) මිල ගණන්;

**2 වැනි මට්ටම:** වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි කැපීපෙනෙන බලපෑමක් ඇති කරන යොමුකිරීම් සඳහා වන වෙනත් ශිල්පක්‍රම සෘජු හෝ වක්‍ර ආකාරයෙන් නිරීක්ෂණාත්මකය;

**3 වැනි මට්ටම:** නිරීක්ෂණාත්මක වෙළෙඳපොළ දත්ත නොවන වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි කැපීපෙනෙන බලපෑමක් ඇති කරන යෙදවුම් උපයෝගී කරගන්නා ශිල්පක්‍රම.

මට්ටම අනුව සාධාරණ අගය සම්බන්ධයෙන් වාර්තා වූ මූල්‍ය උපකරණවල විශ්ලේෂණයක් පහත වගුව මඟින් දැක්වෙයි

| දෙසැම්බර් 31 දිනට | සංස්ථාව | | | |
|---|---|---|---|---|
| | 2017 | | | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| | මට්ටම් 1 | මට්ටම් 2 | මට්ටම් 3 | එකතුව |
| මූල්‍ය වත්කම් - විකිණීම සඳහා ලබා ගත හැකි | | | | |
| ලැයිස්තුගත කොටස් ආයෝජන | 29.000 | - | - | 29.000 |
| ලැයිස්තුගත නොකළ කොටස් ආයෝජන | - | - | 0.540 | 0.540 |
| | 29.000 | - | 0.540 | 29.540 |

| 13. තොග | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| බොර තෙල් | 10,025.945 | 11,099.275 | 10,025.945 | 11,099.275 |
| වෙනත් අමු ද්‍රව්‍ය | 692.765 | 1,455.355 | 692.765 | 1,455.355 |
| නිමි නිෂ්පාදන | 30,188.447 | 18,921.623 | 30,195.263 | 18,926.799 |
| අන්තර් මධ්‍ය නිෂ්පාදන | 655.401 | 1,392.528 | 654.036 | 1,390.817 |
| වෙනත් ද්‍රව්‍ය සහ සැපයුම් | 2,999.244 | 3,009.276 | 3,542.842 | 3,549.874 |
| අඩු කළා: මන්දගාමී ලෙස චලන අයිතම සඳහා ප්‍රතිපාදන | (408.823) | (401.172) | (551.741) | (533.896) |
| | **44,152.978** | **35,476.885** | **44,559.109** | **35,888.223** |

| 14. කෙටි කාලීන ආයෝජන | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| බැංකු තැන්පතු | 5,163.258 | 27,144.417 | 5,163.258 | 27,144.417 |
| රජයේ බැඳුම්කර | 5,522.215 | 921.426 | 5,522.215 | 921.426 |
| | **10,685.474** | **28,065.844** | **10,685.474** | **28,065.844** |

| 15. මුදල් හා මුදල් සමාන දෑ | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **මුදල් හා මුදල් සමාන දෑ සඳහා අදාල උපාංග** | | | | |
| බැංකුවේ සහ අතැති මුදල් | 9,385.759 | 14,579.410 | 10,859.879 | 17,034.827 |

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන දෑ වලට පහත දේ අයත් වේ:

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| මුදල් සහ මුදල් සමාන දෑ | 9,385.759 | 14,579.410 | 10,859.879 | 17,034.827 |
| බැංකු අයිරා (සටහන 21) | - | - | - | (111.314) |
| | 9,385.759 | 14,579.410 | 10,859.879 | 16,923.513 |
| එකතු කළා/අඩු කළා: විදේශ මුදල් පරිවර්තනය සඳහා ගැලපුම් | (2,947.462) | (2,557.285) | (2,947.462) | (2,557.285) |
| | 6,438.298 | 12,022.125 | 7,912.418 | 14,366.228 |

| 16. දායක ප්‍රාග්ධනය | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| දෙසැම්බර් 31 වන දිනට ශේෂය | 28,487.125 | 28,487.125 | 28,487.125 | 28,487.125 |

2003 වසරේදී, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත වත්කම් මාරුකිරීම පොත් අගයයන් මත සිදුකරනු ලැබ තිබිණි. එයින් පසුව ක්‍රියාවලියේදී එකඟවූ අගයයන් මත පදනම්ව ඉහත ගනුදෙනු වාර්තා කිරීමට තීරණය කරනු ලැබ තිබිණි. මෙහි බලපෑම ප්‍රාග්ධන සංචිතය යටතේ සකසනු ලැබ තිබිණි.

| 17.1 ප්‍රාග්ධනය සංචිත | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| දෙසැම්බර් 31 වන දිනට ශේෂය | 4,992.686 | 4,992.686 | 4,992.686 | 4,992.686 |

පාර්ලිමේන්තුව මඟින් කිසිදු බලයලත් ප්‍රාග්ධන ප්‍රමාණයක් නිශ්චය කර නැත.

| 17.2 නැවත තක්සේරු කරන සංචිත | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| නැවත තක්සේරු අතිරික්තය (සටහන 8) | 10,210.907 | - | 10,210.907 | - |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 10,210.907 | - | 10,210.907 | - |

භූමියේ සාධාරණ අගය සම්බන්ධ ඉහළයෑම් සහ ස්කන්ධය තුළ කලින් හඳුනාගන්නා ලද වත්කමක ඉහළයෑමක් හා සම්බන්ධ පහළයෑම් වාර්තාකිරීමට ප්‍රතිතක්සේරුකරණ සංචිතය යොදාගැනෙයි.

| 18. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීයාව | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ජනවාරි 01 වන දිනට ශේෂය | 737.973 | 845.526 | 1,972.044 | 2,398.663 |
| අඩු කළා: වසර තුළ කළ ගෙවීම් | (127.985) | (122.286) | (225.201) | (401.713) |
| | 609.988 | 723.240 | 1,746.843 | 1,996.950 |
| එකතු කළා: වාර්තමාන සේවා පරිවැය | 98.989 | 40.761 | 183.216 | 105.981 |
| පොලී පිරිවැය | 95.936 | 94.838 | 253.897 | 233.841 |
| ආයුගණක (ලාභ)/අලාභය | 887.512 | (120.866) | 982.459 | (364.729) |
| | 1,692.425 | 737.973 | 3,166.415 | 1,972.045 |
| එකතු කළා: චින වාරය /චිල්චිල්චිල්/නයිලොන්/සීපීචිස්ටිචිල් සේවක ප්‍රතිලාභ | 15.589 | 15.588 | 15.589 | 15.588 |
| **දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **1,708.014** | **753.561** | **3,182.004** | **1,987.632** |
| **විශ්‍රාම ප්‍රතිලාභ බැදීම මත වියදම** | | | | |
| වර්තමාන සේවා පිරිවැය | 98.989 | 40.761 | 183.216 | 105.981 |
| පොලී වියදම | 95.936 | 94.838 | 253.897 | 233.841 |
| | 194.925 | 135.599 | 437.113 | 339.823 |
| | | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| ආයුගණක (ලාභ) / අලාභය | 887.512 | (120.866) | 982.459 | (364.729) |
| | 887.512 | (120.866) | 982.459 | (364.729) |

LKAS 19 - සේවක ප්‍රතිලාභ මඟින් නිර්දේශ කරන ලද පරිදි 'ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය' උපයෝගී කරගනිමින් වෘත්තීය සමාගමක් වන ඇක්චුරිස් ඇන්ඩ් මැනෙජ්මන්ට කන්සල්ටන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2017 දෙසැම්බර් 31 වැනිදා වන විට පැවැති විශ්‍රාම ප්‍රතිලාභ වගකීම පිළිබඳ ගණනක තක්සේරුකරණය සිදුකරනු ලැබිණි.

| **මූලික ආයුගණක උපකල්පන පහත පරිදි වේ:** | | |
|---|---|---|
| අපේක්ෂිත වැටුප් වර්ධක | 30% වසර 3 කට වරක් | 1% |
| අපේක්ෂිත කාර්ය මණ්ඩල පිරිවැටුම | 4.3% | 4.4% |
| පොලී / වට්ටම් අනුපාතය | 10.5% | 13% |
| විශ්‍රාම යන වයස | 60 years | 60 years |
| සේවකයින් ගණන | 2573 | 2577 |
| මර්ත්‍යතාව | A 1967/70 Mortality Table | |

2017 දෙසැම්බර් 31 වැනිදා වන විට විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මිනුම්කරණය තුළ නියතව පවත්වාගත් සෙසු සියලු විචලයතා සමඟ ක්‍රියාත්මක කරන ලද මූලික උපකල්පනවල සිදුකළ හැකි වෙනසක් සඳහා අදාළ සංවේදීතාව පහත දැක්වෙන වගුව මඟින් විදහා දැක්වෙයි. මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සහ විස්තීකරණ ආදායම් ප්‍රකාශනයේ සංවේදීතාව යනු වසර සඳහා වන ලාභ හෝ අලාභ සහ විශ්‍රාම බැඳියාව හා සම්බන්ධ වට්ටම් අනුපාතයේ සහ වැටුප් වර්ධකයේ උපකල්පිත සංශෝධනවල බලපෑමයි.

| උපකල්පනය | උපකල්පනයේ වෙනස | සංස්ථාව | |
|---|---|---|---|
| | | ආදායම් ප්‍රකාශය මත සංවේදීතා බලපෑම | විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම මත සංවේදීතා බලපෑම |
| | | 2017 | 2017 |
| | | රු. මිලියන | රු. මිලියන |
| වට්ටම් අනුපාතය @10.5% | ඒකක 1% කින් වැඩි විය | 102.737 | (102.737) |
| | ඒකක 1% කින් අඩු විය | (115.981) | 115.981 |
| | | | |
| වැටුප් වර්ධකය @ 30% | ඒකක 1% කින් වැඩි විය | (166.017) | 166.017 |
| | ඒකක 1% කින් අඩු විය | 143.593 | (143.593) |

| 19. ණය සහ ණය ගැනීම් | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| භාණ්ඩාගාර (A.D.B) ණය | 189.898 | 265.858 | 189.898 | 265.858 |
| මහජන බැංකුව | - | - | - | 911.051 |
| | **189.898** | **265.858** | **189.898** | **1,176.909** |

**19.1. ණය සහ වාරිකයන්ගේ වර්තමාන කොටස**

| | | | | |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර (A.D.B) ණය | 75.959 | 37.980 | 75.959 | 37.980 |
| මහජන බැංකුව | - | - | - | 487.800 |
| | 75.959 | 37.980 | 75.959 | 525.780 |

| 19.2 දෙසැම්බර් 31 වනදා සිට වසර පහකින් ගෙවිය හැකි ණය පහත පරිදිය: | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වසර 2 ක් තුළ ගෙවිය යුතු මුදල | 151.919 | 75.959 | 151.919 | 1,051.559 |
| වසර 3-5 ක් තුළ ගෙවිය යුතු මුදල | 113.939 | 227.878 | 113.940 | 651.130 |
| | **265.858** | **303.837** | **265.858** | **1,702.689** |

**ණය ගැනිම්වල ධාරක අගය සාධාරණ අගය ලෙස සැලකේ**

a) භාණ්ඩාගාර (A.D.B) ණය - (පොළිය වසරකට 14.0%) 2001 ජුනි මස සිට රු. මි. 37,977 බැගින් වූ අර්ධ වාර්ෂික හතලිහකින් ගෙවිය යුතුය.

| 20. වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් | 2017 | 2016 | 2017 | 2016 |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ගෙවිය යුතු විදේශ බිල්පත් | 159,573.421 | 139,805.406 | 159,573.421 | 139,805.406 |
| අනෙකුත් ණය හිමියන් | | | - | - |
| - දේශීය ආදායම් හා රේගු දෙපාර්තමේන්තුව | 28,857.637 | 36,033.499 | 29,349.155 | 36,180.551 |
| - උපචිත වියදම් | 22,229.416 | 4,967.092 | 15,242.779 | 1,250.427 |
| - ආපසු ගෙවිය හැකි තැන්පතු සහ වෙනත් | 1,479.691 | 1,289.330 | 3,000.674 | 2,424.718 |
| | **212,140.166** | **182,095.327** | **207,166.030** | **179,661.102** |

දේශීය ආදායම් සහ රේගු දෙපාර්තමේන්තු සඳහා අදාළ ගෙවීම්වලට නිෂ්පාදන බදු සහ ජා.ගො.බ සහ ආදායම් බද්ද ඇතුළත් වෙයි. නැවත අයකර ගත හැකි අගය එකතුකළ බද්ද වෙනත් ලැබීම් යටතට ඇතුළත් කර ඇත.

| 21. කෙටි කාලීන ණය ගැනීම් | 2017<br>රු. මිලියන | 2016<br>රු. මිලියන | 2017<br>රු. මිලියන | 2016<br>රු. මිලියන |
|---|---|---|---|---|
| බැංකුව සහ වෙනත් ණය | | | - | |
| - වසරක් ඇතුළත සම්පූර්ණයෙන් ගෙවිය යුතු ණය | 179,641.473 | 193,683.634 | 179,641.473 | 193,683.634 |
| - බැංකු අයිරා | - | - | - | 111.314 |
| | 179,641.473 | 193,683.634 | 179,641.473 | 193,794.948 |

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත නිකුත් කළ ඇ. ඩො. මි. 1,800 ක් සඳහා භාණ්ඩාගාර ඇපකර මඟින් ණය ගැනීම් සහතික කර ඇත. සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ආනයන බිල්පත් මූල්‍යයනය කිරීමට කෙටි කාලීන ණය ලබාගෙන ඇත.

අදාළ වන පොලී අනුපාතය 2017 මැයි දක්වා වර්ෂයකට 5%ක් වූ අතර, එය ජූනි මාසයේ සිට වර්ෂයකට 5.5% දක්වා ඉහළ නැංවිණි.

| 22. සේවකයින් | 2017<br>රු. මිලියන | 2016<br>රු. මිලියන | 2017<br>රු. මිලියන | 2016<br>රු. මිලියන |
|---|---|---|---|---|
| **කර්ය මණ්ඩල පිරිවැය** | | | | |
| වැටුප් හා වේතන | 3,776.350 | 4,109.662 | 6,560.133 | 9,213.139 |
| නිර්වචනය කරන ලද දායක සැලැස්ම | 377.211 | 443.150 | 826.759 | 892.698 |
| නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම (සටහන 18) | 1,082.437 | 14.733 | 1,419.572 | (24.906) |
| | **5,235.997** | **4,567.545** | **8,806.464** | **10,080.931** |

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රු. මි. 251,307 ක බදු පාඩුවක් (2016 දී රු. මි. 249,279) ඉදිරියට ගෙන ආ අතර, එය අනාගත බදු ලාභයන්ගෙන් පියවීමට හැකිය. විලම්භිත බදු වත්කම එම රු. මි. 70,365 (2015 දී රු. මි. 69,798) ක පාඩුව තුළ ගිණුම්ගත කර නැත.

## 23. විලම්බිත බදු-CPC

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රු. මි. 251,307 ක බදු පාඩුවක් (2016 දී රු. මි. 249,279) ඉදිරියට ගෙන ආ අතර, එය අනාගත බදු ලාභයන්ගෙන් පියවීමට හැකිය. විලම්භිත බදු වත්කම එම රු. මි. 70,365 (2015 දී රු. මි. 69,798) ක පාඩුව තුළ ගිණුම්ගත කර නැත.

| 23.1 විලම්බිත බදු සමූහය | සමූහය | |
|---|---|---|
| | 2017<br>රු. මිලියන | 2016<br>රු. මිලියන |
| කාල සීමාව ආරම්භයේ ශේෂය | 1,005.757 | 544.863 |
| ඒකාබද්ධ කිරීම් සඳහා ගැලපුම් | - | 64.107 |
| තාවකාලික වෙනසකම් ඇතිවීම සහ ප්‍රත්‍යාවර්තනය - ආදායම් ප්‍රකාශය | 24.156 | 363.378 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | (12.761) | 33.409 |
| **කාලසීමාව අවසානයේ ශේෂය** | **1,017.153** | **1,005.757** |
| | | |
| විලම්භිත බදු වත්කම් | (241.806) | (241.366) |
| විලම්භිත බදු වගකීම් | 1,258.959 | 1,247.123 |
| **ශුද්ධ විලම්භිත බදු වගකීම** | **1,017.153** | **1,005.757** |

| 23.2 හඳුනාගත් විලම්භිත බදු වත්කම් සහ වගකීම් | 2017 - රු. මිලියන | | 2016 - රු. මිලියන | |
|---|---|---|---|---|
| | තාවකාලික වෙනස | විලම්භිත බදු වගකීම් / (වත්කම්) | තාවකාලික වෙනස | විලම්භිත බදු වගකීම් / (වත්කම්) |
| **විලම්භිත බදු වගකීම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් | 11.836 | 1,258.959 | 355.728 | 1,247.123 |
| | | | | |
| **විලම්භිත බදු වත්කම්** | | | | |
| තොගය | (1.025) | (19.208) | (1.371) | (18.183) |
| ප්‍රතිපාදන | 0.845 | (24.494) | (8.133) | (25.338) |
| සේවක ප්‍රතිලාභ සැලසුම | (29.037) | (198.104) | (30.50) | (169.068) |
| බදු අලාභය | 28.776 | 0.000 | 78.325 | (28.776) |
| | **11.395** | **1,017.153** | **394.045** | **1,005.757** |

සඵල බදු අනුපාතයක් උපයෝගී කරගනිමින් විලම්භිත බද්ද ගණනය කරනු ලැබ ඇත. බදු අය විය යුතු ආදායමෙහි විවිධ මට්ටම් සඳහා අදාළ වූ බහුවිධ බදු අනුපාතයන් හේතුකොටගෙන එම අනුපාතය 13.7% සිට 13.44% දක්වා පහළ වැටී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2017 දෙසැම්බර් 31 වැනිදා වන විට විලම්භිත බදු වගකීමෙහි රු. මි. 11,395ක ඉහළයෑමක් සිදුවිය.

| 24. මෙහෙයුම් මඟින් උපදවන ලද මුදල් | 2017 | 2016 | 2017 | 2016 |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| අඛණ්ඩ මෙහෙයුම් මඟින් බදු පෙර ලාභය/(අලාභය) | 3,367.221 | 69,553.681 | 6,397.876 | 71,589.544 |
| **ගැලපීම්:** | | | | |
| ක්ෂය වීම | 924.305 | 839.354 | 1,802.661 | 1,640.295 |
| ක්‍රමක්ෂය කිරීම | - | - | 7.331 | 9.741 |
| විදේශ මුදල් පරිවර්තන | (390.177) | 1,062.286 | (390.177) | 1,062.286 |
| ලාභාංශ ආදායම | (243.105) | (292.502) | (0.105) | (0.002) |
| පොලී ආදායම | (11,057.737) | (8,374.112) | (11,247.178) | (8,464.482) |
| හානිකරන සඳහා දීමනා | 5.086 | | 5.086 | (39.054) |
| පොලී වියදම | 10,530.811 | 11,404.537 | 10,654.884 | 11,571.312 |
| විශ්‍රමික ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 194.925 | 135.599 | 437.113 | 339.823 |
| දේපළ, පිරියත හා උපකරණ අලෙවියෙන් (ලාභය) /අලාභය | (8.144) | (36.414) | (11.739) | (87.660) |
| | - | - | | |
| **කාරක ප්‍රග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | **3,323.186** | **74,292.430** | **7,655.753** | **77,621.803** |
| | | | | |
| **කාරක ප්‍රග්ධන වෙනස්වීම්** | | | | |
| තොග (වැඩිවීම)/අඩුවීම | (8,676.093) | 5,558.227 | (8,670.886) | 5,475.724 |
| වෙළඳාම සහ අනෙකුත් ලැබීම්වල (වැඩිවීම)/අඩුවීම | (37,229.546) | (20,189.713) | (36,782.459) | (21,261.227) |
| වෙළඳාම සහ අනෙකුත් ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම | 31,712.867 | 8,754.984 | 28,828.492 | 10,632.381 |
| **මෙහෙයුම් ක්‍රියාකරකම් වලින් උත්පාදනය වන/(භාවිතා වන) මුදල්** | **(10,869.586)** | **68,415.926** | **(8,969.099)** | **72,468.682** |

## 25. මෙහෙයුම් කාණ්ඩ

| මෙහෙයුම් කාණ්ඩ | ප්‍රවාහන | බලශක්ති | ගුවන් | කාර්මික | ගබඩා සහ ප්‍රවාහන | අනෙකුත් | ගැලපීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **ආදායම** | | | | | | | | |
| විකුණුම් පිරිවැය | 275,874.377 | 103,585.136 | 42,903.823 | 12,689.379 | 689.223 | 10,393.307 | - | **446,135.245** |
| අන්තර් කාණ්ඩ | - | - | - | - | 13,486.924 | - | (13,486.924) | **-** |
| මුළු ආදායම | 275,874.377 | 103,585.136 | 42,903.823 | 12,689.379 | 14,176.147 | 10,393.307 | (13,486.924) | **446,135.245** |
| **ප්‍රතිපල** | | | | | | | | |
| මෙහෙයුම් ලාභය | (15,902.445) | 22,758.544 | 3,052.839 | 4,052.796 | 3,207.941 | (4,087.518) | (2,363.916) | **10,718.241** |
| විනිමය අනුපාතික විචලනය | (3,475.364) | (1,183.789) | - | (82.684) | - | (180.167) | - | **(4,922.004)** |
| මූල්‍ය පිරිවැය | (6,680.284) | (2,241.235) | (1,116.264) | (151.790) | (124.073) | (341.236) | | **(10,654.882)** |
| මුදල් ආදායම් | | | | | 189.441 | | 11,067.082 | **11,256.223** |
| **බදු ගෙවීමට පෙර ලාභය/(අලාභය)** | (26,058.093) | 19,333.520 | 1,936.575 | 3,818.322 | 3,273.309 | (4,608.921) | 8,703.166 | **6,397.876** |
| ආදායම් බදු වියදම් | | | | | (309.825) | | (2,088.507) | **(2,398.332)** |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | (26,058.093) | 19,333.520 | 1,936.575 | 3,818.322 | 2,963.484 | (4,608.921) | 6,614.659 | **3,999.545** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | | | | |
| **ලාභ සඳහා වර්ගීකරණ නොකල අයිතම** | | | | | | | | |
| විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සැලැස්ම මත ප්‍රති-මැනුම් ලාභය/(පාඩුව) | | | | | (94.947) | | (887.513) | **(982.459)** |
| දේපළ, පිරියත හා උපකරණ නැවත තක්සේරු කිරීම | | | | | | | 10,210.907 | **10,210.907** |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් මත බදු | | | | | 12.761 | | | **12.761** |
| **ලාභ හෝ අලාභයට පසුව නැවත වර්ගීකරණය කළ හැකි හෝ වෙනස් කළ හැකි අයිතම:** | | | | | | | | |
| ශුද්ධ ලාභය/(පාඩුව) අලවිය සඳහා මූල්‍ය වත්කම් | | | | | | | (0.500) | **(0.500)** |
| **වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම්/(වියදම්)** | **(26,058.093)** | **19,333.520** | **1,936.575** | **3,818.322** | **2,881.298** | **(4,608.921)** | **15,937.554** | **13,240.254** |

## 26. අසම්භාව්‍ය වගකීම්, බැඳීම් සහ නඩු ක්‍රියාමාර්ග

### අසම්භාව්‍ය වගකීම්

2017 දෙසැම්බර් 31 වැනිදා වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අසම්භාව්‍ය වගකීම් පහත පරිදි වේ:නැව් පමාකුලී ඉල්ලීම් ඇමෙරිකානු ඩොලර් 4,322,822.50 කි.

කෙසේවෙතත්, වාර්තාකරණ දිනයෙන් පසු සාකච්ඡා / බේරුම්කාර ක්‍රියාවලිය මත පදනම්ව ඉහත වගකීම් මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනාගැනෙනු ඇත.

ඉහත දේට අමතරව මූල්‍ය ප්‍රකාශ දිනය වන විට පැවති වෙනත් ප්‍රමාණාත්මක අසම්භාව්‍ය වගකීම් කිසිවක් නොතිබිණි.

### බැඳීම්

2017 දෙසැම්බර් 31 වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රමාණාත්මක බැඳීම් පහත පරිදි වේ.

### බැංකු වෙත බැඳීම්

සංස්ථාව, වසර අවසානයෙන් පසු ප්‍රසම්පාදනය සිදුකරන බොර තෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම සඳහා ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ පිළිවෙළින් රු. මි. 22,034 සහ රු. මි. 3,982 ක (ඇ. ඩො. මි. 142,074 සහ ඇ. ඩො. මි. 25,677) අගයකින් යුතු ණයවර ලිපි ස්ථාපිත කරන ලදී.

### වාර්තාකරණ දිනය වන විට නිම නොවී පැවති නඩු

2017 දෙසැම්බර් 31 වන විට පහත දැක්වෙන පරිදි නිරාකරණය නොවූ නඩු 243 ක් තිබිණි:

| නඩු වර්ගය | නඩු ගණන 2016 | |
|---|---|---|
| | සංස්ථාව | සමූහය |
| කම්කරු උසාවියේ නඩු | 04 | 10 |
| දිස්ත්‍රික් අධිකරණ නඩු | 18 | 28 |
| මහාධිකරණ නඩු | 06 | 10 |
| අභියාචනාධිකරණ නඩු | 13 | 17 |
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | 16 | 24 |
| මානව හිමිකම් කොමිසම | 33 | 33 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 38 | 47 |

ඉහත නඩු අතරින් පහත නඩුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට විෂය මූලික වේ:

කොමර්ෂල් බැංකුව විසින් හෙජින් ගනුදෙනුව සම්බන්ධයෙන් ඇ.ඩො.මි. 8,648,300 ක් සමඟ එහි පොලිය සහ වෙනත් වියදම් ඉල්ලා කොළඹ වාණිජ ගොනුකරනු ලැබ ඇත.

ඉහත සඳහන් නඩුව තවමත් පවතින බැවින් ඒ හා සම්බන්ධ ප්‍රතිපාදන සිදුකර නැත.

## 27. වාර්තාකරණ දිනයට පසු සිදුවීම්

වාර්තාකරණ දිනයට පසු සිදුවූ සෑම මූල්‍යමය වටිනාකමක් සහිත සිදුවීමක්ම අවශ්‍ය අවස්ථාවන් හි දී සලකා බලා අදාළ මූල්‍ය ප්‍රකාශනවලට නිසි ගැලපීම්/අනාවරණයන් සිදු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

## 28. මූල්‍ය අවදානම් කළමනාකරණය

සංස්ථාවේ ක්‍රියාමාර්ග විවිධ මූල්‍ය අවදානම්වලට නිරාවරණය වේ, වෙළෙඳපොළ අවදානම (විනිමය අවදානම, පොලී අනුපාත අවදානමද ඇතුළුව), ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ මිල අවදානම. අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අනුමත කළ ප්‍රතිපත්ති යටතේ කළමනාකාරිත්වය විසින් ආපදා කළමනාකරණය සිදු කරගෙන යනු ලබයි. සමූහයේ මෙහෙයුම්වලට අදාළව කළමනාකාරිත්වය විසින් මූල්‍ය අවදානම් හඳුනාගැනීම සහ ඇගයීම සිදුකරනු ලබයි. සමූහයේ සමස්ත අවදානම් කළමනාකරණ වැඩසටහන් සමූහයේ මූල්‍ය කාර්යසාධනයට අයහපත් බලපෑමක් ඇතිවීම අඩුකිරීමේ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක වේ.

සමූහයේ ප්‍රධාන මූල්‍ය උපකරණ, ස්ථාවර තැන්පතු, රජයෙ සුරැකුම්පත්, ඇමෙරිකානු ඩොලර් තැන්පතු සහ මුදල් යනාදියෙන් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණවල ප්‍රධාන අරමුණ වන්නේ සමූහයේ ද්‍රවශීලතාවය නඩත්තු කිරීම සහ ආයෝජනය කළ

අරමුදල් මත වන මූල්‍ය ප්‍රතිලාභ උපරිමකරණය කිරීමයි. සමූහයට, එහි ව්‍යාපාරික කටයුතුවලින් එන වෙළෙඳ ලැබීම් සහ වෙළෙඳ ගෙවීම් වැනි වෙනත් විවිධ මූල්‍ය උපකාරක ඇත.

(a) **වෙළෙඳපොළ අවදානම**

(i) **විදේශ විනිමය අවදානම**

සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කරනු ලබන විට විනිමය ගණුදෙනු මඟින් මූලික වශයෙන් ඇමෙරිකානු ඩොලර් සම්බන්ධව ඇති වන විනිමය හුවමාරුව අවදානමට අනාවරණය වේ. දේශීය ගනුදෙනුවලදී සංස්ථාවේ විනිමය ශ්‍රී ලංකා රුපියල් වන අතර, වාර්තාකරණ අරමුණුවලදී අනෙක් සියලුම විනිමය විදේශ විනිමය ලෙස සැලකෙයි. සමහර බැංකු ශේෂ, වෙළෙඳ ලැබීම් සහ වෙළෙඳ ගෙවීම් විදේශ විනිමයෙන් නාමකරණය කරයි.

අනෙකුත් සියලු විචල්‍යයන් ස්ථායීව පවතින විට ඇමෙරිකානු ඩොලර් නාමකරණය කළ වගකීම්වල සාධාරණ අගයේ සිදු වන වෙනස්කම් හේතුවෙන් සංස්ථාවේ බදුවලට පෙර ලාභය ඇමෙරිකානු ඩොලර් විනිමය අනුපාතයේ විය හැකි වෙනස්කම්වලට වන සංවේදීතාවය පහත වගුවෙන් දැක්වෙයි.

| | 2017 දෙසැම්බර් 31 වන දිනට වටිනාකම | වසර අවසාන විනිමය අනුපාතය | විනිමය අනුපාතයේ වෙනස්කම් | බදුවලට පෙර ලාභය මත බලපෑම්* |
|---|---|---|---|---|
| | (ඇ.ඩො.) මිලියන | | | රු. මිලියන |
| ණය සහ ණයගැනුම් (ඇ.ඩො.) | 1,158 | 155.0855 | 1% වැඩිවීම | (1,796) |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් (ඇ.ඩො.) | 1,023 | 155.0855 | 1% වැඩිවීම | (1,587) |

* බදුවලට පෙර ලාභය මත වන බලපෑම යනු කෘත්‍යාත්මක විනිමය ශ්‍රී ලංකා රුපියල් වූ විට ඇමෙරිකානු ඩොලර්වලින් නම් කරන ලද අදාළ වගකීම්වල සාධාරණ අගයේ වෙනස්කමේ ප්‍රතිඵලයක් වේ.

ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇති සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පරිවර්තන සහ ගනුදෙනු අවදානම යන දෙකම තුළින් විදේශ විනිමය උච්චාවචනයන්ගේ බලපෑම ලබයි. විදේශ විනිමය අනුපාතවල වෙනස්කම්, ප්‍රමාණාත්මක පිරිවැය, මිලදීගැනීම් සහ විදේශ විනිමය මඟින් විවිධ පාර්ශ්වවලින් ලබාගත් සේවා යනාදියට බලපායි. විශේෂයෙන්ම, ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව අඛණ්ඩව අවප්‍රමාණය වීම මඟින් ආනයනය කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන සහ වෙනත් මිලදීගැනීම්වලින් ඇති වන බලපෑම මත මෙහෙයුම් සහ මූල්‍ය ප්‍රතිඵලවලට සෘජුවම බලපායි.

(ii) **පොලී අනුපාත අවදානම**

සමූහයේ පොලී අනුපාත අවදානම ප්‍රධාන වශයෙන්ම මතු වන්නේ රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතු ආකාරයෙන් වන ණයගැනීම් සහ ආයෝජන වෙතිනි. සැපයුම්කරු ණය සම්බන්ධව ගත් විට, පවතින වෙළෙඳපොළ අනුපාත වෙතින් පොලී අනුපාත විශාල වශයෙන් වෙනස් වේ. රාජ්‍ය වාණිජ බැංකු දෙක ඔස්සේ විදේශ විනිමය ණය ලබාගැනෙන්නේ සාකච්ඡා කරන ලද පොලී අනුපාත මතය. සමූහය අඛණ්ඩ පදනමින් පොලී නිරාවරණ විශ්ලේෂණය කරන අතර, ලන්ඩන් අන්තර් බැංකු පිරිනැමුම් අනුපාතය (LIBOR) සහ මුදල් වෙළෙඳපොළ අනුපාත අධීක්ෂණය කරයි.

(b) **ණය අවදානම**

ණය අවදානම යනු, පාරිභෝගිකයකු ගිවිසුම්ගත බැඳීම් සපිරීමට අසමත් වූ විට සංස්ථාවට සිදු වන මූල්‍ය පාඩුවයි. සංස්ථාවේ පාරිභෝගිකයන් බොහොමයක් ස්වාධීන ශ්‍රේණිගත කර නොමැති බැවින් පාරිභෝගිකයින්ගේ ගුණාත්මක බව සලකනුයේ ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය, අතීත අත්දැකීම් සහ වෙනත් ගුණාත්මක සාධක මතය. සංස්ථාව ණය ප්‍රතිපත්තියක් ස්ථාපනය කර ඇති අතර, ණය සීමාවක් ලබාදීමට පෙර සෑම නව පාරිභෝගිකයෙකුම ණය යෝග්‍යතාව සඳහා තනි තනිව විශ්ලේෂණය කෙරේ. සංස්ථාවේ ණය ප්‍රතිපත්තිය සපිරීමට අසමත් වන පාරිභෝගිකයින්ට සංස්ථාව සමඟ ගනුදෙනු කළ හැකි වන්නේ මුදල් පදනම මත පමණි.

මුදල් සහ මුදල් සමාන දෑවලින්ද බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතුවලින් මෙන්ම ගෙවීමට ඇති ලැබීම් සහ බැඳීම් සහිත ගනුදෙනු ඇතුළු පාරිභෝගිකයින්ට ණය නිරාවරණය මඟින්ද ණය අවදානම ඇතිවේ.

(c) **ද්‍රවශීලතා ආදායම**

සංස්ථාවේ මූල්‍ය අංශය මඟින් මුදල් ප්‍රවාහ සැලසුම්කරණය සහ පුරෝකථනය කරනු ලබයි. තම විවිධ මූල්‍ය බැඳීම් සහ වඩා හොඳ ප්‍රතිඵල සඳහා කෙටි කාලීන අතිරික්ත සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය තුළින් මූල්‍ය අංශය අඛණ්ඩවම ලද හැකි අරමුදල් අධීක්ෂණය කරයි.
කාරක ප්‍රාග්ධනය කළමනාකරණය සඳහා ශේෂයට ඉහළින් තබාගත් අතිරික්ත මුදල්, ඉතිරිකිරීමේ ගිණුම් සහ කෙටි කාලීන යළි මිලදීගැනීම් ආයෝජන, භාණ්ඩාගාර බැඳුම්කර සහ ඇමතුම් තැන්පතු වැනි පොලී උපයන මූල්‍ය උපකරණ තුළ ආයෝජනය

කෙරේ. වාර්තාකරණ දිනය අනුව, සංස්ථාව විසින් රඳවාගන්නා ලද මුදල් සහ මුදල් සමාන දෑ රු. මිලියන 9,386ක් සහ කෙටි කාලීන තැන්පතු රු. මිලියන 10,685, ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම පිණිස මුදල් ප්‍රවාහ උත්පාදනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පහත වගුව ගිවිසුම්ගත කල්පිරීමේ දිනයට ඉතිරිව ඇති කාලසීමාව මත පදනම්ව සංස්ථාවේ ව්‍යුත්පන්න වගකීම් අදාළ කල්පිරීමේ කාණ්ඩවලට බෙදා ඇති අයුරු පෙන්වයි.

| 2017 දෙසැම්බර් (රුපියල් මිලියන) | | | | | |
|---|---|---|---|---|---|
| | මාස 3 කට අඩු | මාස 3 සිට මාස 12 දක්වා | අවුරුදු 1 සිට 2 දක්වා | අවුරුදු 3 සිට 5 දක්වා | අවුරුදු 50 වැඩි |
| බැංකු ණය ගැනීම් | 97,239 | 82,403 | | | |
| දිගු කාලීන ණය | 38 | 38 | 76 | 114 | - |
| | 97,277 | 82,441 | 76 | 114 | - |

**(d) මිල අවදානම**

සංස්ථාව, ඇමෙරිකානු ඩොලර් සහ වෙනත් විනිමය මඟින් ආනයනය කරන ඛනිජ තෙල් නිෂ්පාදන (බොර තෙල් සහ නිමි නිෂ්පාදන) සහ විදේශ රටවලින් ආනයනය කෙරෙන අනෙක් අමුද්‍රව්‍ය සම්බන්ධ භාණ්ඩ මිල අවදානමට නිරාවරණය වී ඇත. ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර අලෙවි මිල තීරණය කිරීමේදී ජාත්‍යන්තර ඉන්ධන මිල චලනයන් අනුව පිරිවැය පරාවර්තිත යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවේ. සංස්ථාව නිරන්තරව සතිපතා තොග සමාලෝචන රැස්වීම් පවත්වන අතර, එහිදී අවශ්‍ය අනාගත ආනයන සඳහා අනාගත නිෂ්පාදන අවශ්‍යතා සාකච්ඡා කර සැලසුම් කෙරේ. එමෙන්ම, සංස්ථාව, සුදුසු හා කාලීන කළමනාකරීත්ව තීරණ ගැනීමට ඛනිජ තෙල් නිෂ්පාදනවල මූල්‍ය තොරතුරු ලබාදීමෙන් මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධතා පවත්වයි.

## 29. ගිවිසුම් සහ අදාළ පාර්ශව ගනුදෙනු තුළ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමනාකාරීත්වයේ පිරිස් ලෙස සැලකෙයි. පහත සඳහන් අවස්ථාවලදී හැර කිසිදු අධ්‍යක්ෂවරයෙකුට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හෝ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ගිවිසුම් සම්බන්ධව කිසිදු සෘජු හෝ වක්‍ර සබඳතාවක් නැත:

2017 මැයි 29 වැනිදා සිට දම්මික රණතුංග මහතා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සභාපතිවරයා වන අතර, ආර්. ඩී. එන්. ජයසුන්දර මහතා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වේ.

හිටපු සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ ටී. පී. ජයසිංහ මහතා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයකු වූ අතර, 2017 ජනවාරි 27 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි එයින් ඉල්ලා අස්විය.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ හිටපු සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ ඩී. සී. එස්. සෙනෙවිරත්න මහතා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයකු වූ අතර, 2017 මැයි 23 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි එයින් ඉල්ලා අස්විය.

**ප්‍රධාන කළමනාකාරීත්වයේ පිරිස් වෙත ගෙවීම්**

| | සංස්ථාව | |
|---|---|---|
| | 2017 | 2016 |
| | රු. මිලියන | රු. මිලියන |
| කෙටි කාලීන ප්‍රතිලාභ | 1.388 | 1.762 |

ඉහත වගුවෙහි සඳහන් කරන ලද අගයන් ප්‍රධාන කළමණාකාරිත්වයට සම්බන්ධ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

අදාළ පාර්ශ්ව සමඟ පහත ගනුදෙනු සිදු කෙරිණි.

| ගනුදෙනුව | 2017<br>රු. මිලියන | 2016<br>රු. මිලියන |
|---|---|---|
| **අදාළ පාර්ශව වෙත අලෙවි කිරීම සහ ලබාදුන් සේවා** | | |
| **අනුබද්ධ ආයතනය** | | |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 482.747 | 452.532 |
| **අනෙත් අදාළ පාර්ශව** | | |
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 21.600 | 19.600 |
| | 504.347 | 472.132 |
| **සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබෙන සේවාවන්** | | |
| **අනුබද්ධ ආයතනය** | | |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 13,025.648 | 11,835.401 |
| | 13,025.648 | 11,835.401 |
| **අදාළ පාර්ශව වෙත ලබාදුන් ණය මුදල*** | | |
| **අනුබද්ධ ආයතනය** | | |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 331.605 | 302.870 |
| **අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන්** | | |
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 9.405 | 8.145 |
| | 341.010 | 311.015 |
| **අදාළ පාර්ශ්ව වෙත ගෙවිය යුතු මුදල්** | | |
| **අනුබද්ධ ආයතනය** | | |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 6,979.634 | 3,589.441 |

* මුදල් ප්‍රමාණයන් වර්ගීකරණය කර ඇත්තේ පිළිවෙළින් වෙළෙඳ හා අනෙකුත් ලැබීම් සහ වෙළෙඳ හා අනෙකුත් ගෙවීම් වශයෙනි.

අදාළ පාර්ශව සමඟ ගනුදෙනුවල කොන්දේසි සහ නියමයන්

අදාළ පාර්ශව සමඟ සිදු කරන අලෙවි කිරීම් සහ කරන ලද මිලදීගැනීම් අතේ දුරින් කෙරෙන ගනුදෙනුවල ඇති නියමයන්ට සමානව සිදු කෙරෙයි. වසර අවසානයේ ගෙවීමට ඇති ශේෂයන් අනාරක්ෂිත වන අතර පොලී රහිත වේ. අදාළ පාර්ශවවල ලැබීම් සහ ගෙවීම් සම්බන්ධව කිසිදු ඇපකරයන් නැත.

ශ්‍රී ලංකා රජය විසින් සෘජු ලෙසම සංස්ථාව පාලනය කරනු ලබන බැවින්, LKAS 24 හා සම්බන්ධ 'ආශ්‍රිත පාර්ශව අනාවරණයන්' අනුව ආශ්‍රිත පාර්ශවයන් ලෙස ශ්‍රී ලංකා රජය විසින් පාලනය වන, ඒකාබද්ධව පාලනය වන හෝ කැපීපෙනෙන ලෙස බලපෑමක් ලබන, රජයට අයත් සමාගම් සහ රජයට සම්බන්ධ වෙනත් ආයතන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සැලකිල්ලට ගනු ලැබ ඇත.

### 30. ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයේ මූලික අරමුණ වන්නේ ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වාගැනීම සහ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ බැඳියාවන් ආරක්ෂා කරමින් අඛණ්ඩ පැවැත්ම පවත්වා ගැනීමයි. වර්තමාන වසරේදී රු. මිලියන 10,792 ක ලාභයක් ඉපැයීමට සහ එය සෘණාත්මක ශුද්ධ වත්කම් තත්වය අඩුකිරීමට සංස්ථාවට හැකි විය. කෙසේවෙතත්, කලින් වසරවලදී සිදුවූ සමුච්චිත අලාභයන් හේතුකොටගෙන 2017 දෙසැම්බර් 31 දා වන විටත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රු. මිලියන 175,054 ක සෘණාත්මක ශුද්ධ වත්කම් තත්වයක් පැවතිණි. ශ්‍රී ලංකා රජයේ මූල්‍ය සහාය රහිතව සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පවත්වාගැනීමට සංස්ථාවට ඇති හැකියාව පිළිබඳව සැක සහිත බව බාහිර විගණකවරු තම විගණන වාර්තාවේ සඳහන් කර ඇත.

සංස්ථාව විසින් දරන ලද සුවිසල් පාඩුවලට විශාල වශයෙන් හේතු වූයේ සිල්ලර මිල රජය මඟින් තීරණය කරන බැවින් ඛනිජ තෙල් නිෂ්පාදන ඉහළ සහන මිලකට අලෙවි කිරීමයි. එවැනි පාඩු ආවරණය කරගැනීමට 1971 අංක 38 දරන මුදල් පනතේ 17 වන වගන්තිය අනුව සංස්ථාව රජයේ සහනාධාර ලැබීමට හිමිකම් ලබයි. සංස්ථාවට සහනාධාර ලබාදෙන්නේ නම් සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වය ජයගත හැකිය.



# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | } පීඊඊ/ඒ/සීපීසී/1/17/01 | |
| ඔබේ අංකය / உமது இல. / Your No. | } | |
| දිනය / திகதி / Date | } 2018 නොවැම්බර් 30 දින | |

සභාපති

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන හා සංස්ථාවේ හා එහි පරිපාලිතයෙහි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි විස්තර කර ඇති කරුණු පදනම් කරගෙන මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

(අ) මතය - සංස්ථාව

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ විස්තර කර ඇති කරුණු වල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා විසින් දරන්නා වූ මතය වේ.

(ආ) මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ විස්තර කර ඇති කරුණු වල බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා විසින් දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව හා පරිපාලිතය අතර ගිවිසුමක් නොමැති වීම නිසාවෙන් අන්තර් සමාගම් ගණුදෙනු වලින් ජනිත වී ඇති ගෙවිය යුතු ශේෂය (රු.මිලියන 6,979.63) හා ලැබිය යුතු ශේෂය (රු. මිලියන 7,650.56) සමඟ රු.මිලියන 670.93 ක හිලව් නොවූ ශේෂයක් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන්හි දක්නට ලැබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) පහත දැක්වෙන කරුණු මත පදනම්ව සමාලෝචිත වර්ෂය සඳහා පරිපාලිතයේ (CPSTL) මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.

(i) සමාලෝචිත වර්ෂයේ අවසානයට සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) වෙතින් ලැබිය යුතු යැයි සඳහන් වටිනාකම හා එයට අනුරූපීව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල ගෙවිය යුතු යැයි සඳහන් වටිනාකම අතර රු.මිලියන 670.93 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මේ තුළ රු.මිලියන 548.66 ක මතභේදයට තුඩුදුන් වටිනාකමක් ද විය.කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශන වල හානිකරණයන් සඳහා රු.මිලියන 163.62 ක වෙන් කිරීමක් පමණක් සිදු කර ඇත.

(ii) ලංකා ඉන්දියානු තෙල් සමාගමෙන් (LIOC) ලද ශේෂ තහවුරු කිරීම් වලට අනුව,සමාගමට ගෙවිය යුතු වටිනාකම රු.මිලියන 432.77 ක් වන අතර ඊට අනුරූපීව සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්වනු ලබන වටිනාකම රු. මිලියන 457.40 කි.එහෙයින්, එම ශේෂයන් දෙක අතර එකඟ නොවූ වටිනාකම රු.මිලියන 42.63 කි.

(iii) තොග අයිතමයන් සඳහා රු.මිලියන 142.92 ක වෙන් කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණු අතර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි ආදායම් බදු , ආර්ථික සේවා ගාස්තු (ESC) හා එකතු කළ අගය මත බදු (VAT) වල ගෙවිය යුතු වටිනාකම හා ඊට අනුරූපීව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන වාර්තාවල පෙන්නුම් කරනු ලබන වටිනාකමත් අතර රු.මිලියන 436.78 ක වෙනසක් නිරීක්ෂණය විය.එබැවින් එම ශේෂයන් වල නිරවද්‍යතාව,සම්පූර්ණත්වය හා පැවැත්ම පිළිබඳව විගණනයේදී ගැටළු සහගත විය.

(v) 2008 හා 2010 වර්ෂවල පැවැති අයකර නොගත් අතිරික්ත ගෙවීම් වූ උපයන විට ගෙවීම් බදු (PAYE) හා යෙදවුම් මත වූ එකතු කළ අගය මත බදු (Input VAT) පිළිවෙලින් රු.මිලියන 6.8 ක් හා රු.මිලියන 8.06 ක් නැවත අයකර නොගැනීම විගණනයේදී ගැටළු සහගතය.කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මේ සම්බන්ධව කිසිදු වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

(vi) රඳවා ගැනීමේ බදු (WHT) හා නිමවුම් මත වූ එකතු කළ අගය මත බදු (Output VAT) වල ගෙවිය යුතු වටිනාකම් පිළිවෙලින් රු.මිලියන 19.09 ක් හා රු.මිලියන 13.91 ක් වූ අතර එම ගෙවුම් ශේෂයන් නිරවුල් කිරීමකින් තොරව වසරින් වසර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනැවිත් තිබුණු බැවින් එම වටිනාකම් වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී ගැටළු සහගත විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(vii) දල වශයෙන් රු.මිලියන 5,045 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති වත්කම්හි ඒවායේ ඵලදායී ආර්ථික ජීව කාලය යලි තක්සේරු කිරීමකින් තොරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක (LKAS 16) හි ඇති ප්‍රතිපාදන වලට අනුව ගිණුම්ගත කිරීම සමාගමේ ප්‍රතිපත්තිය විය. තවද සමාගම ආරම්භයේ සිටම එහි වත්කම් ප්‍රත්‍යාගණනය කර නොමැති අතර ඒ සඳහා යෝග්‍ය ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තියක් ස්ථාපනය කර නොතිබුණි.එබැවින් මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ජංගම නොවන වත්කම් මගින් එහි සාධාරණ වටිනාකම පිළිබිඹු නොවිය.

(viii) වටිනාකම රු.මිලියන 36.3 ක එකතුවකින් යුත් ගණුදෙනු හතරක් පෙර වර්ෂයේ ගැලපුම් ලෙස LKAS 08 ට අනුව මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත යුතු අතර එම ගණුදෙනු සමාලෝචිත වර්ෂයේ ගණුදෙනු වැරදි සහගත ලෙස හඳුනාගෙන තිබුණි.මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභය හා වර්ෂය අවසානයේ රඳවාගත් ඉපයුම් රු. මිලියන 19.12 කින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ix) සමාගම විසින් එහි ව්‍යවසාය සම්පත් සැළසුම් පද්ධතිය (ERP) වන SAP පද්ධතියට ඇතුලත් කර ඇති තොග අයිතම වර්ග 250 කට අයත් විශාල තොග ප්‍රමාණයක වටිනාකම් පද්ධතියට ඇතුලත් කර නොතිබුණි.එබැවින් තොග අයිතම අගය කිරීමේ නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය පිළිබඳව විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය.

### 2.2.2 සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන

#### 2.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.ගි.ප්‍ර) අනුගතවීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර 2 හි 11 වන ඡේදය - තොග

තොග, ගබඩාව තෙක් රැගෙන ඒමට දරන ලද සියලු වියදම් තොග පිරිවැය වශයෙන් සැලකිය යුතුය.එසේ වුවද තෙල් ආනයනය සඳහා වටිනාකම රු මිලියන 55,327.9 ක් වූ නිෂ්පාදන බද්ද තොග පිරිවැය ලෙස නොසළකා ආදායමට එරෙහිව අඩුකර තිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ සත්‍ය විකුණුම් පිරිවැය හා අවසාන තොග පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් නොකෙරුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර 16 හි දේපළ, පිරියත හා උපකරණ -51 හා 36 ඡේද

දල වශයෙන් රු.මිලියන 4,749 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කළ වත්කම් සංස්ථාව විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණේ එම වත්කම්වල ඵලදායි ජීවකාලය නැවත තක්සේරු කිරීමකින් තොරව සහ ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. තවදුරටත් විගණන නියැදි පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සංස්ථාව සතු ඉඩම් 15 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.එමනිසා එකී වත්කම්වල  නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී ගැටළු සහගත විය.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර 17 - කල්බදු - 08 ඡේදය

ගිණුම් ප්‍රමිතවල කල්බදු වත්කම්වලට අදාල විධිවිධානයන්ට පටහැනිව සංස්ථාවට කල්බදු හිමිකමක් පමණක් පවතින ඉඩම් සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීම සහ ප්‍රත්‍යාගණනය කර තිබුණි.

(ඈ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.36 - හානිකරණය

2017 වර්ෂයට අදාළව හානිකරණ පරීක්ෂාවක් සිදුකළ බවට කිසිදු සාක්ෂියක් විගණනයට වාර්තා නොවුණි.මේ නිසා විගණනයේදී එවැනි වත්කම් වල සාධාරණ අගයෙහි නිරවද්‍යතාවය පිළිබඳව සැකයක් පැවැතුණි.

### 2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව වෙතින් ලැබිය යුතු රු.මිලියන 1,135.8 ක ශේෂයක් 2010 වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණි. කෙසේවුවද දීර්ඝකාලයක් තිස්සේ පැවැති හිඟ ශේෂය විගණනයට පැහැදිලි නොවිය. සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල මේ සම්බන්ධයෙන් වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද වයස් විශ්ලේෂණයට අනුව 2013 වසරේ සිට ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වුවද 2017 වර්ෂය අවසාන වන තෙක්ම හිඟ හිටිව පැවැති රු.මිලියන 753 ක ලැබිය යුතු ශේෂයක් අය කරගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.තවද සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා හානිකරණයක් කර නොතිබුණි.

(ඇ) ලැබී තිබූ සනාථන අනුව 2007 සිට 2009 අතර කාලය තුළ තෙල් මිලදී ගැනීම වෙනුවෙන් සළකා බලන වර්ෂයේ මහජන බැංකුවට සංස්ථාව විසින් රු.මිලියන 3847.1 ක වටිනාකමක් ගෙවිය යුතු විය.කෙසේවුවද එය සංස්ථාවේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

**2.2.2.3 නොසැසඳූ වෙනස්කම්**

තෙල් ගබඩා කිරීම සහ බෙදාහැරීමේ (ටර්මිනල් ගාස්තු, ප්‍රවාහන ගාස්තු, පොලී ගෙවීම් ආදී) ගාස්තු ලෙස රු.මිලියන 206.4 ක් හා රු.මිලියන 177 ක නොසැසඳූ වෙනස්කම් පිළිවෙලින් 2017 සහ 2016 වර්ෂයන්වල සංස්ථාවේ සහ පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන වල නිරීක්ෂණය විය.

**2.2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

සංස්ථා මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවට සංස්ථාව විසින් ගෙවිය යුතු මුදල රු.7,278,958,430 ක් විය.කෙසේ වුවද ශ්‍රී ලංකා රේගු වාර්තා අනුව සංස්ථාවෙන් ලැබිය යුතු මුදල සටහන් වූයේ රු.5 ,782, 668 ,839 ක් ලෙසය.කෙසේ වුවද රු.1,496, 289 ,591 ක වෙනස සඳහා හේතු විගණනයට පැහැදිලි නොවිය.

**2.2.2.5 විගණනයට සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශයේ සඳහන් වෙනත් ලැබිය යුතු ශේෂය තුල එකතු කල අගය මත බදු (වැට්) එකතුවක් ලෙස ගත් විට රු. 423,905,381ක් දීර්ඝ කාලයක් පුරා සඳහන් වී තිබුණි. ඉන් රු.326,391,518යන වටිනාකම 2010 වර්ෂයේ සිට පැවැතුණි. මේ සම්බන්ධයෙන් ශේෂය තහවුරු කර ගැනීම සඳහා අදාල වන බදු ඉන්වොයිස් හා වෙනත් අදාල තොරතුරු හා ලිපිලේඛන විගනනය සඳහා ඉදිරිපත් වී නොතිබුණි. එමනිසා එම ශේෂය අයකරගැනීම විගණනයේදී ගැටළු සහගතය.

(ආ) කෙසේ වෙතත් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ බදු වාර්තාවල වැඩිපුර ගෙවීමක් වාර්තා නොවුවත් මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට රු. 376,000,065 ක වැඩිපුරගෙවීමක් වාර්තා විය. තවදුරටත් වෙනත් ලැබිය යුතු ශේෂයක් යටතේ දක්වා ඇති මෙම ශේෂය විකල්ප ක්‍රියාමාර්ග මගින් නැවත අයකර ගැනීමට ඇති හැකියාව තහවුරු කර ගැනීමට නොහැකි විය.

### 2.2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුලු වෙළෙඳ ණය ප්‍රමාණය වූ රු. මිලියන 76,616 රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන වලින් පිළිවෙලින් රු.මිලියන 65,979 ක් සහ රු.මිලියන 10,637 කින් සමන්විත විය. පෙරවර්ෂයේ හිඟහිටි ශේෂය වූ රු.මිලියන 33,387 සමඟ සැසඳීමේදී සියයට 129 කින් වැඩි වී තිබුණි.2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම්වල වයස් විශ්ලේෂණය පහත පරිදිය.

| කාලපරිච්ඡේදය | කාණ්ඩය | | එකතුව |
|---|---|---|---|
| | රාජ්‍ය අංශ | රාජ්‍ය නොවන | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වසරකට අඩු | 56,867 | 10,240 | 67,107 |
| වසර 1-2 | 7,387 | 81 | 7,468 |
| වසර 2-3 | 55 | 46 | 101 |
| වසර 3-4 | 498 | 236 | 734 |
| වසර 4-5 | 832 | 1 | 833 |
| වසර 5ට වැඩි | 340 | 33 | 373 |
| **එකතුව** | **65,979** | **10,637** | **76,616** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ගුවන් සමාගම් දෙකකින් ලැබිය යුතු ශේෂය රු.මිලියන 52.5 කි. 2011 වර්ෂයේ සිට හිඟ හිටව තිබුණි.කෙසේ වුවද සංස්ථාව එකී පාරිභෝගිකයන්ට අඛණ්ඩව බනිජ තෙල් සපයා තිබුණේ වර්තමාන ගෙවීම් සංස්ථාවට සිදුකර තිබුනද දීර්ඝ කාලීන හිඟහිටි ශේෂයන් අයකර ගැනීමකින් තොරවය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වෙළෙඳ ණයගැති ශේෂය රු.මිලියන 50,255.07 ක් වූ අතර එය පෙර වර්ෂයේ හිඟහිටි ශේෂය වූ රු.මිලියන 13,223.70 සමඟ සැසඳීමේදී එය සියයට 280 කින් ඉහළ ගොස් තිබුණි.

මෙ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙර විගණන වාර්තා වල සඳහන් කර ඇති පරිදි සුමට ක්‍රියාකාරීත්වය සඳහා දෙපාර්ශවය විසින් එළඹිය යුතු විධිමත් ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොමැතිව සංස්ථාව විසින් විදුලිබල උත්පාදනය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට වසර කිහිපයක සිට බනිජ තෙල් අලෙවි කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වටිනාකම මුලු වෙළෙඳ ණයගැති ශේෂයෙන් සියයට 66 ක ප්‍රමාණයකින් සමන්විත වී තිබුණි.එයින් රු.මිලියන 16,377 ක වටිනාකමකින් යුතු ඉන්වොයිස් 2017 වර්ෂයේදී නිකුත් කළ ඒවා විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, මහජන බැංකුවෙන් හා ලංකා බැංකුවෙන් තෙල් ආනයන සඳහා කෙටිකාලීන විදේශ ණය මුදල්වලට අදාලව රු.මිලියන 10,530 ක පොලී පිරිවැයක් සංස්ථාව විසින් දරා තිබුණි.ඒ අනුව හිඟහිටි ශේෂයන් නියමිත කාලයේදී අයකර ගැනීම තුළින් සංස්ථාවට රු.මිලියන 10,530 ක පොලී පිරිවැය සැළකිය යුතු ලෙස අඩුකරගැනීමට හැකිව තිබුණි.

(ඈ) පෙර විගණන වාර්තාවල සඳහන් වුවද, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මුලු ණයගැති ශේෂය තුළ ඇතුළත් ප්‍රධාන ගණුදෙනුකරුවන් 15 දෙනෙකුගේ හිඟහිටි ශේෂය වූ රු.මිලියන 53,346.6 ක් හෝ සියයට 70 කට අදාළව විධිමත් ගිවිසුමකට නොඑළඹ බනිජ තෙල් සපයා තිබුණි.එම නිසා මෙය පැහැර හැරීමේ අවදානම ඉහළ මට්ටමක පැවැතුණි.

**2.3 නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | |
| (i) මාර්ගෝපදේශ අංක 4.2.3(ආ) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිපාලිත සමාගම එහි ඉලක්ක ළඟා කරගැනීමේ ඵලදායීතාවය කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි. |
| (ii) මාර්ගෝපදේශ අංක 4.2.6 | එක් එක් කාර්තුවේ අවසානයට දින 30 කට පෙර ත්‍රෛමාසික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) මාර්ගෝපදේශ අංක 4.3 | අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම වාර්තා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට රැස්වීමෙන් දින 10ක් ඇතුලත යැවිය යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (iv) මාර්ගෝපදේශ අංක 5.1.1 | සංස්ථාව විසින් සංයුක්ත සැළැස්මක් පිළියෙල කළද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන වූ සංයුක්ත සැළැස්මේ පිටපත් යාවත්කාලීන වූ වාර්ෂික අයවැය සමග මුදල් වර්ෂය ආරම්භයට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නොතිබුණි.. |
| (v) මාර්ගෝපදේශ අංක 5.2.2(ආ) | 2017 වර්ෂය තුළදී රු.මිලියන 307.8 ක වියදමක් දරමින් මෝටර් රථ හතක් මිලදී ගැනීම සඳහා එම වියදම් දැරීමට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා භාණ්ඩාගාර එකහත්වය ලබාගෙන නොතිබුණි. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | |
|---|---|
| (vi) මාර්ගෝපදේශ අංක 5.2.4 හා 5.2.5 | (i) මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර කෙටුම්පත් අයවැය අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සඳහා ලබා දී නොතිබුණි.<br>(ii) සංස්ථාවේ යාවත්කාලීන කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ අයවැයෙහි පිටපත් රේඛීය අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට, මහා භාණ්ඩාගාරයට හා විගණකාධිපතිට 2017 වර්ෂය ආරම්භ වීමට දින 15 කට ඉදිරිපත් කර නොමැත. |
| (vii) මාර්ගෝපදේශ අංක 7.4.2 | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව නිතිපතා රැස්වී නොමැති වීම හා නිසි වාර්තා තබා නොගැනීම හේතුවෙන් එම කමිටුව විසින් චක්‍රලේඛයේ සඳහන් වැදගත් කරුණු පිළිබඳව අවධානය යොමු කර ඇත්දැයි තහවුරු කර ගැනීමට නොහැකි විය. |
| (viii) මාර්ගෝපදේශ අංක 9.3 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස්වීම් ක්‍රියාපටිපාටියක් සංස්ථාවට නොතිබුණි. |
| (ix) මාර්ගෝපදේශ අංක 9.4 | 2017 වර්ෂයේදී සංස්ථාව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සේවකයන් 05 දෙනෙකු වෙනත් ආයතනයන්ට නිදහස් කර තිබුණු අතර එම සේවකයන්ට සංස්ථාවේ අරමුදල් වලින් දීමනා ගෙවා තිබුණි. |
| (x) මාර්ගෝපදේශ අංක 9.12 | සංස්ථාවේ සුභසාධක යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | පුරප්පාඩු වූ තනතුරක රාජකාරි ආවරණය කිරීම මාස 03 ක කාල සීමාවකට සීමා විය යුතුවේ. කෙසේ වුවද, කළමණාකරු (විමර්ෂණ), අලෙවි කළමණාකරු (සිල්ලර) ,ප්‍රාදේශීය කළමනාකරු (මධ්‍යම) ආදී A ශ්‍රේණියේ තනතුරු 18 ක් ද ඇතුළත්ව නිලධාරීන් 29 ක් 2017 දෙසැම්බර් 31 වන දිනට මාස 06 සිට වසර 09 ක් දක්වා කාලපරිච්ඡේදයක් සඳහා රාජකාරි ආවරණය කර තිබුණි. |
| (ඇ) 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 සහ 2013 නොවැම්බර් 04 දිනැති අංක එෆ්පී/06/35/02/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | සමාලෝචිත වර්ෂය සඳහා සේවකයින්ගේ වැටුප් වෙනුවෙන් සංස්ථාව විසින් රු.මිලියන 53,57ක උපයන විට ගෙවීම් බදු ඔවුන්ගේ වැටුපෙන් අඩු නොකොට එහි වියදමක් වශයෙන් දරා තිබුණි. |
| (ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | සංස්ථාව විසින් පාරිතෝෂික වෙන් කිරීම ගණනය කිරීමෙදී මූලික වැටුප, වෘත්තීය දීමනාව හා වැටුපෙන් සියයට 15 ක ප්‍රතිශතයක් වූ සේවකයින්ට ලබා දෙන විශේෂිත දීමනාව පදනම් කරගෙන ඇති අතර එය පනතේ සඳහන් නියමයන්ට පටහැනි විය. |
| (ඉ)රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (2006) - මාර්ගෝපදේශ අංක 4.2 | පසුගිය වසර 03 සඳහා වූ ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්මක් සංස්ථාව විසින් පිළියෙල කර නොතිබුණි. |
| ඊ) 2015 ජුලි 14 දිනැති අංක 04/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2009 සැප්තැම්බර් 18 දිනැති අංක 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව සංස්ථාවේ දේපල රක්ෂණය සම්බන්ධයෙන් පෞද්ගලික පාර්ශවයක් සමඟ 2017/2018 සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පසුගිය වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය වූ රු.මිලියන 69,553.7 ට එරෙහිව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතු මගින් රු.මිලියන 3,367.2 ක බදු පෙර ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 66,186.5 ක අඩුවීමක් සිදු වී තිබුණි. ජාත්‍යන්තර වෙළඳපොළේ මිල ගණන් වලට අනුරූපීව දේශීය වෙළඳපල මිල ගැලපුම් නොකිරීම, ඇ.එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අඛණ්ඩව අවප්‍රමාණය වීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.කෙසේ වුවද සේවක වේතන ගෙවීම,රජයට හා බදු විශේෂ ගාස්තු ගෙවීම සහ ජංගම නොවන වත්කම් ක්ෂයවීම ආදිය සැළකීමෙන් පසු සංස්ථාව විසින් රු මිලියන 153,136 ක දායකත්වයක් 2017 වර්ෂය තුළදී රටට ලබා දී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

3.2.1 ලාභදායීත්වය

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම්වලින් සියයට 6.6 ක ලාභ ආන්තිකයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී සියයට 29.6 ක් වූ ආන්තිකය සමඟ සැසඳීමේදී සියයට 23 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී දළ ලාභය ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දළ ලාභය වූ රු. මිලියන 96,620 හා සැසඳීමේදී රු. මිලියන 69,079 කින් හෙවත් සියයට 71 කින් අඩු වී තිබුණි.

සාරාංශගත කළ විස්තර පහත වගුවේ දැක්වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | විචලනය වාසිදායක/ (අවාසිදායක) | |
|---|---|---|---|---|
| | 2017 | 2016 නැවත සකසන ලද | | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | ප්‍රතිශතය |
| ආදායම | 446,502 | 423,061 | 23,441 | 5.5 |
| විකුණුම් පිරිවැය | (418,962) | (326,441) | (92,521) | (28.3) |
| **දළ ලාභය** | **27,541** | **96,620** | **(69,079)** | **(71)** |
| අනෙකුත් ආදායම් | 670 | 3,589 | (2,919) | (81.3) |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | (15,498) | (14,412) | (1,086) | (8) |
| පරිපාලන වියදම් | (4,960) | (4,384) | ( 576) | (13.1) |
| **මෙහෙයුම් ලාභය** | **7,753** | **81,413** | **(73,660)** | **(90.4)** |
| විනිමය අනුපාත වෙනස්වීම් | (4,922) | (8,829) | 3,907 | 44.25 |
| මූල්‍ය වියදම් | (10,531) | (11,404) | 873 | 8 |
| මූල්‍ය ආදායම් | 11,067 | 8,374 | 2,693 | 32 |
| ඉදිරි සුරැකුම් වියදම් | - | - | - | - |
| **ආදායම් බදු පෙර ලාභය/(පාඩුව)** | **3,367** | **69,554** | **(66,187)** | **(95)** |


### 3.2.2 ශුද්ධ ලාභය/(අලාභය)ට එරෙහිව ශුද්ධ වත්කම්

බදු පසු ශුද්ධ ලාභය රු.මිලියන 1,470 ක් සහ මුලු විස්තීර්ණ ආදායම රු.මිලියන 10,793 ක් 2017 වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලින් ජනිතවී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ රු.මිලියන 175,054 ක සෘණ ශුද්ධ වත්කම් තත්ත්වය නිරූපණය විය.එලෙසම සංස්ථාවට අයත් ඉඩම් කිහිපයක් මෙම වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනය නිසා සංස්ථාවේ සෘණ ශුද්ධ වත්කම් තත්ත්වය රු.මිලියන 10,211 කින් අඩු වී තිබුණි.මෙම අඛණ්ඩ සෘණ ශුද්ධ වත්කම් තත්ත්වයට, පෙර වර්ෂයන් තුලදී සංස්ථාව විසින් ඉදිරි සුරැකුම් ගණුදෙනුවලට අදාලව දරන ලද විශාල අලාභයන් හේතු වී තිබුණි.කෙසේවුවද සමාලෝචිත වර්ෂයේ සංස්ථාව රු මිලියන 3,367.2 ක බදු පෙර ශුද්ධ ලාභයක් වාර්තා කර තිබුනද පෙර වර්ෂවල සංස්ථාව විසින් විශාල වශයෙන්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අලාභයක් දැරීම සංස්ථාව නවදුරටත් සෘණ ශුද්ධ වත්කම් තත්ත්වයක් පැවැතිණි.එසේම රජයේ මූල්‍ය සහයක් නොමැතිව සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම ගැටලු සහගතය.2017 වර්ෂය සහ ඉකුත් වර්ෂ හතර සඳහා සංස්ථාවේ ශුද්ධ ලාභය/(පාඩුව) හා ශුද්ධ වත්කම් තත්ත්වය පහත සඳහන් වගුවෙහි හා රූප සටහනෙහි දැක්වේ.

| වර්ෂය | ශුද්ධ ලාභය/(අලාභය) | වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් තත්ත්වය |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| 2013 | (7,889) | (236,467) |
| 2014* | 1,129 | (232,257) |
| 2015* | (20,681) | (228,985) |
| 2016 | 53,027 | (185,847) |
| 2017 | 1,470 | (175,054) |



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 3.2.3 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලැබී තිබුණු තොරතුරු අනුව, සංස්ථාවේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාත | 2017 | 2016 |
|---|---|---|
| **ලාභදායිත්ව අනුපාත** | | |
| දළ ලාභ අනුපාතය (%) | 6.17 | 22.84 |
| මෙහෙයුම් ලාභ අනුපාතය (%) | 1.74 | 19.24 |
| ශුද්ධ ලාභ/(අලාභ) අනුපාතය (%) | 0.33 | 12.53 |
| **ද්‍රවශීලතා අනුපාත** | | |
| ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | 0.39:1 | 0.34:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන) | 0.27:1 | 0.24:1 |
| කාරක ප්‍රාග්ධනය (රු. මිලියන) | (240,643) | (249,297) |
| **ආයෝජන අනුපාත** | | |
| වත්කම් මත ප්‍රතිලාභය (%) | 0.67 | 27.76 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂ වල පැවැති වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ (2017 වර්ෂයේ රු මිලියන 212,140.16) හා කෙටිකාලීන ණය ගැනීම් වල (2017 වර්ෂයේ රු මිලියන 179,641.47) සැළකිය යුතු හිඟ හිටීම් පැවතීම නිසා සංස්ථාවේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය අඛණ්ඩව සෘණ තත්ත්වයක පැවැතුණි.

(ආ) තවදුරටත් සංස්ථාවේ ජංගම වත්කම් ජංගම වගකීම් වලින් සියයට 39 ක් පියවීම සඳහා පමණක් ප්‍රමාණවත් වේ.එබැවින් සංස්ථාවේ ජංගම වගකීම් පියවීමේ හැකියාව අර්බුදකාරී තත්ත්වයක පැවතුනි.

4 මෙහෙයුම් සමාලෝචනය

4. 1 කාර්යසාධනය

4.1.1 මෙහෙයුම් සහ සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂය තුල පහත සඳහන් ඛනිජ තෙල් නිෂ්පාදන වලින් සංස්ථාව පාඩු ලබා තිබුණි.ඔක්ටේන් 92, ඔක්ටේන් 95 සහ දේශීය භූමිතෙල් නිෂ්පාදනයන්ගෙන් සංස්ථාව අඛණ්ඩව පාඩු ලබා තිබුණි. තොරතුරු පහත දැක්වේ.

| අංශය | වර්ෂය සඳහා දරා තිබුණු ශුද්ධ අලාභය | |
|---|---|---|
| | 2017 | 2016 |
| | රු.මිලියන | රු.මිලියන |
| ප්‍රවාහනය | | |
| ඔක්ටේන් 92 | 16,201 | 8,251 |
| ඔක්ටේන් 95 | 2,370 | 1,291 |
| ඔටෝ ඩීසල් | 9,253 | - |
| විදුලිබල උත්පාදන | | |
| ඔටෝ ඩීසල් | 187 | - |
| කර්මාන්ත හා දේශීය | | |
| භූමිතෙල් | 5,460 | 2,982 |
| තාර | 13.49 | - |
| කෘෂි | | |
| කෘෂි රසායනික | 121 | 90 |

(ආ) 2017 වසර සඳහා ඛනිජතෙල් නිෂ්පාදන මත ලාභදායිත්වය (ලීටරයකට) පහත දැක්වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| නිෂ්පාදනය | විකුණුම් මිල | කොමිස් මුදල හැර විකුණුම් මිල | විකුණුම් පිරිවැය | දල ලාභය | මුලු පිරිවැය | ශුද්ධ ලාභය/ (අලාභය) | මුලු පිරිවැයේ ඇතුළත් මුලු බදු |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ඔක්ටේන් 95 | 128.00 | 123.72 | 100.84 | 22.88 | 136.99 | (13.27) | 60.33 |
| ඔක්ටේන් 92 | 117.00 | 113.00 | 90.94 | 22.06 | 126.38 | (13.39) | 53.14 |
| ඔටෝ ඩීසල් | 95.00 | 92.46 | 76.85 | 15.61 | 97.40 | (4.94) | 26.46 |
| සුපර් ඩීසල් | 110.00 | 106.75 | 83.42 | 23.33 | 104.24 | 2.51 | 29.01 |
| භූමිතෙල් | 49.00 | 42.85 | 63.91 | (21.06) | 70.41 | (27.56) | - |

**සටහන්**

- ආනයන පිරිවැය, දේශීය පිරිපහදු පිරිවැය, විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය, පරිපාලන පිරිවැය, මූල්‍ය පිරිවැය හා විනිමය අනුපාත වෙනස්වීමේ අලාභයන් ආදී පිරිවැය ලීටරයක සාමාන්‍ය පිරිවැය ගණනයේදී සැලකිල්ලට ගන්නා ලදී.
- රේගු ගාස්තු සාමාන්‍ය, වරාය අධිකාරි ගාස්තුවල සාමාන්‍ය නිෂ්පාදනය බදු හා ජාතිය ගොඩනැගීමේ බදුවල සාමාන්‍ය යන බදුවලින් ලීටරයක මුලු බදු සමන්විත වේ.

(ඇ) පසුගිය විගණන වාර්තා වල සඳහන් පරිදි, ද්‍රව ගෑස් විකිණීම සම්බන්ධයෙන් ගෑස් කර්මාන්තයේ පුද්ගලික ගෑස් සමාගමක් සහ සංස්ථාව අතර අත්සන් කළ ගිවිසුම 2006 ඔක්තෝබර් 20 වන දින කල් ඉකුත් වී තිබිණි.කෙසේවුවද ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එම සමාගමට ද්‍රව ගෑස් අඛණ්ඩව සපයා තිබුනේ  නව ගිවිසුමක් අත්සන් කිරීම හෝ කලින් එකඟතාව අලුත් කිරීමකින් තොරව විය.ඊට අමතරව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගිවිසුමකට නොඑළඹ වෙනත් පුද්ගලික  සමාගමකට  ද්‍රව ගෑස් වායුව සපයා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

### 4.2.1 ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය

ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් හඳුන්වා දෙන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) පිළිබඳව අදාළ පාර්ශවයන්ගේ වගකීම් සම්බන්ධයෙන් සංස්ථාව, ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම, මෙම පද්ධතිය විශේෂයෙන් ඉන්ධන තොග සමාලෝචනය කිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් ලෙස උපයෝජනය කර නොතිබුණි.

### 4.2.2 තාර ව්‍යාපාරය

සමාලෝචිත වර්ෂය තුලදී මුලු තාර බැරල් 74,445 ක් අලෙවි කර තිබූ අතර, පසුගිය වර්ෂයේ අලෙවි කළ බැරල් 217,948 ප්‍රමාණය සමඟ සංසන්දනය කරන විට එය සියයට 66 කින් පහත වැටී තිබුණි.තවද, 2016 වර්ෂයේ තාර ව්‍යාපාරයෙන් රු මිලියන 54.39 ක ශුද්ධ ලාභයක් උපයා තිබුණද 2017 වර්ෂයේ එය රු.මිලියන 13.49 ක ශුද්ධ ලාභයක් පෙන්නුම් කෙරුණි.මේ පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාව තුල තාර අලෙවිය පිළිබඳව ප්‍රමුඛතම ආයතනය ලෙස උපායමාර්ගික අලෙවිකරණ සැලැස්මක් හෝ වෙළඳපොල පිළිබඳ විධිමත් විශ්ලේෂණයක් සිදුකරන ලද බවට නිරීක්ෂණය නොවුණු අතර 2017 වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරී සැලැස්මෙහි තාර ව්‍යාපාරයට අදාල ප්‍රධාන ක්‍රියාකාරකම් විධිමත් පරිදි ඇතුලත් කර නොතිබුණි.

(ආ) තාර ආනයනය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකසා තිබුණද එය සැකසීමට පෙර විධිමත් වෙළඳපොල අධ්‍යයනයකින් පසුව සිදුකර තිබුණේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය.එහි ප්‍රතිඵලයක් ලෙස සලකා බලන වර්ෂය තුල හා පසුගිය වර්ෂ දෙකක කාලසීමාව තුල අයවැයගත තාර ඉල්ලුම හා සත්‍ය තාර ඉල්ලුම අතර පහත පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| වර්ෂය | අයවැයගත | සත්‍ය | විචලනය | |
|---|---|---|---|---|
| | මෙට්‍රික්ටොන් | මෙට්‍රික්ටොන් | මෙට්‍රික්ටොන් | ප්‍රතිශතය |
| 2015 | 114,000 | 13,793 | 100,207 | 88 |
| 2016 | 30,213 | 39,231 | 9,018 | 30 |
| 2017 | 28,474 | 13,400 | 15,074 | 53 |

(ඇ) සංස්ථාව විසින් තාර ව්‍යාපාරය සඳහා විධිමත් තොග පාලන පද්ධතියක් ස්ථාපිත කොට ක්‍රියාත්මක කර නොතිබුණි.ඒ අනුව, තොග වලට අදාල යලි ඇණවුම් මට්ටම, අවම සහ උපරිම තොග මට්ටම් නඩත්තු කර නොතිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණවත් ඉල්ලුමක් තාර තොග සඳහා පැවතියද දීර්ඝ කාලයක් මුලුල්ලේ නොපැවති තාර තොග විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) ස්වභාවික හානි සඳහා නිරාවරණය වන පරිදි තාර තොග ආරක්ෂාකාරී නොවන අන්දමින් ගබඩාකර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) තාර මිල තීරණය කිරීම අලෙවි අංශය මගින් සිදු කළද, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණ අතර අලෙවි අංශය මගින් සමහර අවස්ථා වලදී පිරිවැය ආවරණය නොවන පරිදි තාර මිල තීරණය කර තිබුණි.

(ඊ) වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ මගින් සෑම වර්ගයකම තාර මිල තීරණය කරනු ලැබුවද අගය රු.98,032,381 ක වට්ටම් ප්‍රමාණයක් 60/70 වර්ගයේ තාර සඳහා පසුගිය වර්ෂ කිහිපය තුලදී ලබා දී තිබුණි.එම වට්ටම් ප්‍රමාණයෙන් එකතුව රු.92,101,021 ක ප්‍රමාණයක් පෞද්ගලික පාර්ශව වෙත ලබා දී තිබුණි.කෙසේ වෙතත්, මෙම සම්බන්ධයෙන් විධිමත් ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් ස්ථාපිත කොට නොතිබුණි.
***වත්මන් කළමනාකරණයේ ලිඛිත පැහැදිලි කිරීමට අනුව, සංස්ථාවේ හිටපු සභාපති විසින් වට්ටම් ලබා දීම සිදු කළ ඇති බව සහ ඔවුන් මේ සම්බන්ධයෙන් වගකිය යුතු නොවන බව සඳහන් කර තිබුණි.***

(උ) තාර බැරලයක් කිලෝග්‍රෑම 180 කින් සමන්විත වන 60/70 වර්ගයේ පැවැති තාර බැරල් 60,000ක තොගය සම්බන්ධයෙන් පහත සඳහන් යෝජනා සඳහා 2017 ඔක්තෝබර් 19 වන දින අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබා දී තිබුණි.

- මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අවසන් වරට මිලදී ගැනීම සඳහා ගෙවූ අඩුම මිලට මාර්ග සංවර්ධන අධිකාරියට සහ එහි පරිපාලිත සමාගම් වලට තාර තොග විකිණීම.
- ඉහත තාර තොගය අවසන් වන තුරු බාහිර තාර ගැනුම්කරුවන් සඳහාද එම මිලටම සැපයීම.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සංස්ථාව විසින් තාර බැරල් 10,000 ක් (කි.ග්‍රෑ 1,800,000) මාර්ග සංවර්ධන අධිකාරියට සහ තාර බැරල් 13,000 ක් පෞද්ගලික සමාගමකට සඳහා පිළිවෙලින් තාර කිලෝග්රෑම් 1ක් රු.53.00 සහ රු.52.75 බැගින් අලෙවි කර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ii) කෙටි කාලයකින් පසුව, දේශීය වෙළඳපොලේ තාර මිල ගණන් රු.66.00 ත් රු.75.00 අතර දක්වා ඉහළ ගොස් තිබුණි.නමුත්, සංස්ථාව සතුව නිශ්චිත වෙළඳපොල ඇගයීමක් නොමැති වීම හේතුවෙන් එම මිල ඉහළයාමේ වාසිය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) නියැදි පරීක්ෂාවේදී තහවුරු වුණු පරිදි වැඩි මිලකට ඉල්ලුම් කර ඇති ගණුදෙනුකරුවන් ප්‍රතික්ෂේප කර තිබූ අවස්ථා පැවතුණි.එක් අවස්ථාවකදී, පෞද්ගලික පාර්ශවයන් විසින් රු.5,040,000 ක බැංකු ඇපකරයක් සහිතව තාර කිලෝග්‍රෑම් 1 ක් රු.56 බැගින් තාර බැරල් 500 ක් මිලදී ගැනීම සඳහා ඇණවුම් කර තිබුණි.කෙසේවෙතත්, තාර තොග නොමැති බව ප්‍රකාශ කර එම ඇණවුම ප්‍රතික්ෂේප කර තිබුණි.කෙසේ වුවද ඊට පසු, සංස්ථාව විසින් තාර කිලෝග්‍රෑම් 1 ක් රු.53 බැගින් තාර බැරල් 1,150 ක් වෙනත් පාර්ශවයක් වෙත අලෙවි කර තිබුණි.ඒ අනුව, සංස්ථාවට සිදු වූ පාඩුව රු.270,000 කි.

(iv) මුලු තොගයෙන් සියයට 17 ක් එනම් බැරල් 10,000 ක් පමණක් මාර්ග සංවර්ධන අධිකාරියට අලෙවිකර තිබුණි.කෙසේවෙතත්, මුලු තොගයෙන් සියයට 60 කට වඩා වැඩි ප්‍රමාණයක් පෞද්ගලික පාර්ශවයන් වෙත අලෙවි කර තිබුණු අතර එයින් සියයට 40 කට වඩා වැඩි ප්‍රමාණයක් පෞද්ගලික ගණුදෙනුකරුවන් දෙදෙනෙකු විසින් මිලදී ගෙන තිබුණි.

(v) සංස්ථාවේ විමර්ශන අංශය සහ අභ්‍යන්තර විගණන අංශය විසින් මේ සම්බන්ධයෙන් විමර්ශන දෙකක් සිදුකර තිබූ අතර ඔවුන් විසින් වෙන වෙනම වාර්තාවන් නිකුත්කර තිබුණි.එම වාර්තා වලට අනුව සමහර අක්‍රමිකතාවයන්, අභ්‍යන්තර පාලනයන්ගේ දුර්වලතායන් සහ හඳුනාගත් අලාභ සඳහා වගකිවයුතු පුද්ගලයින් අනාවරණය කර තිබුණි.කෙසේවුවද, අලාභ සඳහා වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව ක්‍රියාමාර්ග සහ දුර්වලතාවයන් හා අක්‍රමිකතාවයන් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සංස්ථාවේ කළමනාකරණය විසින් 2018 ඔක්තෝබර් 15 වන විටත් ගෙන තිබේද යන්න තහවුරු කරගැනීමට නොහැකි විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 4.2.3 කාර්යසාධනයක් නොමැති කොන්ත්‍රාත්තු

2016 අප්‍රේල් 16 දින West Coast Power Plant විදුලි බලාගාරයට දැවිතෙල් (low sulphur furnace oil) මෙට්‍රික් ටොන් 25000+/-5% ක සැපයුමක් වෙනුවෙන් කොන්ත්‍රාත්තුවක් අල්මසාෆි සමාගම වෙත ලබා දී තිබුණි.කෙසේ වුවද අල්මසාෆි සමාගම එකඟ වූ පරිදි දැවිතෙල් සැපයීමට අපොහොසත් විය.එහි ප්‍රතිඵලයක් වශයෙන් ලීටරයක් ර. 80 ක් වූ දැවිතෙල් වෙනුවට ලීටරයක් රු. 95 ක් වූ ඩීසල් සැපයීමට සංස්ථාවට සිදුවිය.ඒ අනුව සංස්ථාව විසින් ඩීසල් ලීටර 23,436,000 ඉන්වොයිස් 3 ක් යටතේ විදුලිබලාගාරයට (West Coast Power Plant) සපයා තිබුණි.එකී පුද්ගලික බලාගාරය ඉන්වොයිස් දෙකකට අදාලව ගෙවා තිබුණත්, දැවිතෙල් මිලට වඩා ඉහළ පිරිවැයක් වන බැවින් තෙවන ඉන්වොයිස් සඳහා ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදි. ඒ අනුව නියමිත කාලයට දැවි තෙල් සැපයීමට අපොහොසත් වීමෙන් රු.මිලියන 73 ක අලාභයක් සංස්ථාව දරන ලදි.ඒ අනුව ආසන්න වශයෙන් රු.මිලියන 322 ක අලාභයක් දැවිතෙල් වෙනුවට ඩීසල් භාවිතය නිසා සමස්තයක් ලෙස රටට අලාභයක් ඇතිවිය.එසේම සැපයුම්කරුවෙක් ලෙස ලියාපදිංචියේදී සැපයිය යුතු අවම අවශ්‍යතාවලින් සැපයුම්කරුවෙකු ලෙස ලද පෙර අත්දැකීම් සැලකිල්ලට නොගෙන සංස්ථාව අල්මසාෆි සමාගම සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි කරගැනීමට කටයුතු කර තිබුණි.

### 4.2.4 මාසික උපයෝගිතා ගාස්තුව රැස් කිරීම.

2013 ඔක්තෝබර් 29 දින ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 38/1140 අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ජනවාරි 01 දින සිට CODO හා TODO වලින් මාසික උපයෝගිතා ගාස්තුවක් රැස්කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.නමුත් මේ තීරණය විවිධ හේතු නිසා අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවී තිබුණි.මේ නිසා 2014 වර්ෂයේ සිට සංස්ථාව වාර්ෂිකව රු.මිලියන 300 කට වඩා අලාභ ලබා තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2017 කාල සීමාව තුලදී දළ වශයෙන් රු.මිලියන 1200 පමණ අලාභයක් සංස්ථාව දරා තිබුණි.මේ පිළිබඳව පසුගිය විගණන වාර්තා වලදීද සඳහන් කළද ඉහත සඳහන් කළ කණ්ඩායම් දෙකෙහිම බෙදාදෙන්නන්ගෙන් මාසික උපයෝගිතා ගාස්තුව (MUF) අය කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබිණි.

### 4.2.5 පොදු පරිශීලක පහසුකම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර ඉහත පොදු පහසුකම සඳහා වන කොටස්කරුවන්ගේ ගිවිසුම සහ කොටස් මිලදී ගැනීමේ ගිවිසුම්වල කාලය 2008 දෙසැම්බර් 31 වන දින ඉකුත්ව ගොස්

තිබුණි.එමනිසා 2011 වර්ෂයේ සිට මිල සූත්‍රය යාවත්කාලීන කර නොතිබුණි.එහි ප්‍රතිඵලයක් වශයෙන් එලෙසම සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව ගබඩා ගාස්තු තුල ඇතුලත් ණය පොලී කොටස රු.මිලියන 655.45 ක වෙන්කිරීමක් කළද ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්තය සමාගම විසින් ණය පොලී ලෙස සත්‍ය වශයෙන්ම දරා තිබුණේ රු.මිලියන 124.07 ක් පමණි.

**4.2.6 ප්‍රවාහන ගාස්තු**

ඛනිජ තෙල් නිෂ්පාදන බෙදාහැරීම හා ඒ සදහා වූ ගාස්තු අයකර ගැනීම CPSTL විසින් ප්‍රධාන මධ්‍යස්ථාන දෙකක් (කොලොන්නාව හා මුතුරාජවෙල) හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන 12 ක් හරහා සිදුකරනු ලබයි. 2017 වර්ෂය තුළදී ලීටර 6600 ක ධාරිතාවයකින් යුත් බවුසර් සඳහා හා මුතුරාජවෙල සහ කොලොන්නාව පර්යන්තය යන ස්ථානවලින් බෙදුම්කරුවන් වෙත තෙල් නිකුත් කිරීමට අදාල ගෙවා ඇති ප්‍රවාහන පිරිවැය සම්බන්ධයෙන් සිදුකල නියැදි පරීක්ෂාව සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රවාහන පහසුකම් සැපයීම සහ එයට අදාල ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්තය අතර ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකටවත් එළඹීමට කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එකිනෙක පාර්ශවයන්ගේ ක්‍රියා පිලිවෙත්, භූමිකාවන් සහ වගකීම් නිසි පරිදි අර්ථකථනය කර නොතිබුණි.

(ආ) මුතුරාජවෙල සහ කොලොන්නාව යන ස්ථානවල සිට බෙදුම්කරුවන්ගේ ස්ථාන අතර සත්‍ය දුර සංස්ථාව සැමවිටම විධිමත්ව පරීක්ෂා කර නොතිබුණි.එහි ප්‍රතිඵලයක් වශයෙන් ළඟම ස්ථානය මඟින් (මුතුරාජවෙලින් හෝ කොලොන්නාවෙන්) බෙදුම්කරුවන්ට තෙල් සැපයීමට කටයුතු කර තිබුණි.එමනිසා දළ වශයෙන් රු.මිලියන 36 ක අමතර ප්‍රවාහන පිරිවැයක් අවස්ථා 85 688 ක් තුළදී සංස්ථාව ප්‍රවර්තන වර්ෂයේදී දරා තිබුණි.

**4.2.7 නිෂ්පාදන බදු ගෙවීම**

විගණනයට ලබා ගත හැකිවූ තොරතුරු වලට අනුව නොභාරපතෙහි සඳහන් ප්‍රමාණය හෝ සත්‍ය වශයෙන් ලැබුණු තෙල් තොග වලින් වඩා වැඩි අගය මත පදනම්ව ආනයනය කළ පෙට්‍රල් හා ඩීසල් මත නිෂ්පාදන බදු ගෙවා තිබුණි.මෙය ශ්‍රී ලංකා රේගුව දීර්ඝකාලයකට පෙර හඳුන්වා දී තිබුණ අතර මෙම ක්‍රමවේදය සංස්ථාවට ප්‍රමාද ගාස්තු ගෙවීමේ අවදානම අඩුකරගැනීමට හේතුවන බව සංස්ථාව විසින් දක්වා තිබුණි.කෙසේවුවද මෙම භාවිතයේ නිවැරදිතාවය විගණනයේදී ගැටලු සහගත වී තිබුණි.

#### 4.2.8 ගාස්තු හා බදු අයකර ගැනීම

අපේක්ෂිත හා සත්‍ය ගුණත්වය අතර විශාල වෙනසක් පැවතීම නිසා 2017 ජනවාරි මස සංස්ථාව විසින් ඩීසල් නැවක් ප්‍රතික්ෂේප කර තිබුණි.කෙසේ වුවත් එම තොගය වෙනුවෙන් රේගු ගාස්තු හා බදු ලෙස රු 1,617,202,705 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණු අතර එහි වටිනාකම තුළ රු 648,029,889 ක නිෂ්පාදන බද්දක් ඇතුලත්ව තිබුණි.එකී ගෙවූ නිෂ්පාදන බද්ද නැවත අයකර ගැනීමට හෝ වෙනත් ගෙවීමකට අදාලව හිලව් කර ගැනීමට අදාළව එලදායී ක්‍රියාමාර්ග මාස 18 ක් ඉකුත්ව ගොස් තිබුණද සංස්ථාව විසින් ගෙන නොතිබුණි.

#### 4.2.9 වෛද්‍යාධාර යෝජනාක්‍රමය

2016 අගෝස්තු 11 දිනැති අංක 08/1186 දරණ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව, වෛද්‍යාධාර යෝජනා ක්‍රමය කළමණාකරනය කිරීම සංස්ථාව විසින් 2016 ජූලි 01 සිට අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ මාස 6 ක කාලයක් සඳහා මූලික හිමිකම් ලබාදීම සඳහා වැය වන පිරිවැය හෝ සුදුසු වෛද්‍ය රක්ෂණ සපයන්නෙකු තෝරා ගන්නා තෙක් සංස්ථාව විසින් දරා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. කෙසේවුවද 2018 ඔක්තෝබර් 01 දින වන විටත් එකී තීරණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 4.2.10 තෙල් ප්‍රවාහන නල මාර්ග ජාලය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දශක ගණනාවකට පෙර ස්ථාපිත කරන ලද නල මාර්ගයන් ඔස්සේ කොළඹ වරායේ සිට කොළොන්නාව තෙල් පර්යන්තය දක්වා ඛණිජ තෙල් ප්‍රවාහනය කරන අතර ඒවායින් සමහරක් අළුත්වැඩියා තත්ත්වයේ පැවතුණි. ඒවායින් සමහරක් අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයන් හේතුවෙන් ඇතැම් ඒවා දැනටමත් අතහැර දමා ඇති බව අනාවරණය විය.එබැවින් මෙම නල මාර්ග ප්‍රතිසංස්කරණය හෝ නවීකරණය කිරීම ඉතා හදිසි අවශ්‍යතාවයක් වනුයේ ජාතික අවශ්‍යතාවයට අදාල ඛනිජ තෙල් නිෂ්පාදන විශාල ප්‍රමාණයක් මෙම නල පද්ධතිය හරහා කොලොන්නාව තෙල් ගබඩා පර්යන්තය වෙත ලබාගන්නා බැවිනි.මෙම අබලන් නල මාර්ග හරහා ආනයනික නිෂ්පාදිත ඛනිජ තෙල් ප්‍රවාහනය නිසා ඛනිජ තෙල් අර්බුදයක් ඇති වීම සමස්ථ රටම අකර්මන්‍ය වීමේ හැකියාව විගණනයේ දී බැහැර කල නොහැක.

(ආ) මුතුරාජවෙල පර්යන්තයේ සිට කි.මී. 7.2ක් හා මුහුදු වෙරළේ සිට කි.මී. 6ක් පමණ දුරින් මුහුද මැද පිහිටුවා ඇති සිංගල් පොයින්ට් බෝයි මුරින් පහසුකම මාර්ගයෙන් මුතුරාජවෙල ස්ථාපිතයට සැපයීම් සිදු කෙරෙන අතර, මුහුදු රළ තත්ත්වය ඉතා දැඩිවන අවස්ථාවලදී හෝ අදාල පහසුකම පිළිබඳ නඩත්තු කටයුතු සිදුවන අවස්ථාවලදී වෙනත් විකල්ප සැපයුම් මාර්ගයක් නොවිය. නිෂ්පාදිත අන්තර් පර්යන්ත මාරු කිරීම සඳහා මුතුරාජවෙල පර්යන්තය හා කොළොන්නාව ස්ථාපිතය අතර සම්බන්ධකමක් නොවීම හේතුවෙන් එම පර්යන්ත දෙකෙහිම ප්‍රශස්ථ උපයෝජනයට බාධා මතුවී තිබුණි.

(ඇ) “රට හරහා නල මාර්ග ව්‍යාපෘතිය” ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2012 සැප්තැම්බර් 13 දින ලබා දී තිබුණද, එම ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 13 දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා දිවෙන රට හරහා නල මාර්ග ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පහත දැක්වේ.

| නලයේ ප්‍රමාණය (අඟල්) | නිෂ්පාදනය | වත්මන් තත්ත්වය |
|---|---|---|
| 10 | ඩීසල් | ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |
| 10 | අනෙකුත් පිරිපහදු කළ ඉන්ධන (Other White Oil) | අක්‍රියව පවතී |
| 10 | නැප්තා | අක්‍රියව පවතී |
| 12 | නැප්තා | අක්‍රියව පවතී. |
| 14 | දැවිතෙල් | ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |

### 4.2.11 ත්‍රිකුණාමලයේ තෙල් ගබඩා ටැංකි සංකීර්ණය

ඝණ මීටර 12,500(මෙට්‍රික් ටොන් 10,000) ධාරිතාවයෙන් යුත් තෙල් ටැංකි 100කින් සහ වෙනත් පහසුකම්ද ඇතුලත්ව 1930 දී මෙය ඉදිකර තිබුණි. වපසරියෙන් හෙක්ටයාර් 358.553ක් වන අතර තෙල් ටැංකි සංකීර්ණය ශ්‍රී ලංකා රජය විසින් බ්‍රිතාන්‍ය රජයේ නාවික කොමසාරිස්වරුන්ට වසර 999ක බද්දකට නිදහසට පෙර ලබා දී තිබුණි.1961 දී ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ලංකා ඛනිජ නීතිගත තෙල් සංස්ථාව විසින් ස්ටර්ලින් පවුම් 250,000ක් වාරික

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

තුනකින් ගෙවීමෙන් අනතුරුව ඉඩම, ටැංකි සංකීර්ණය,ගොඩනැගිලි සහ අනෙකුත් පහසුකම් පිළිබඳ හිමිකම 1964 අප්‍රේල් 01 දින සිට පවරා ගන්නා ලදී. නමුත් ඉහත ඉඩම සඳහා නිතීමය ලියවිල්ලක් රජයෙන් ලබා ගෙන නොතිබුණි.

2003 දී ශ්‍රී ලංකා රජය ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ සංස්ථාව සමඟ ගිවිසුමට එළඹ තිබූ අතර, ගබඩා පහසුකම් සහ ඉඩම වර්ෂ 35 ක කාල පරිච්ඡේදයකට ලංකා ඉන්දියන් තෙල් සමාගමට බදු දීමට සංස්ථාව එකඟ වී තිබුණු අතර එම ගිවිසුමට එළඹී දින සිට මාස 06ක් ඇතුළත කල්බදු ගිවිසුම ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. කෙසේ වුවද, සංස්ථාව මෙතෙක් කිසිදු කල්බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

### 4.2.12 තොග සමාලෝචන කමිටුව

පෙර විගණන වාර්තාවල සඳහන් පරිදි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) ජේසීටී(JCT) ඔයිල් බැංකුව හා ලංකා ඉන්දියානු ඔයිල් සමාගම් හා ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාජිකයන් සහ රේඛීය අමාත්‍යාංශයේ නිලධාරියෙකුගෙන් තොග සමාලෝචන කමිටුව සමන්විත වූ අතර, එහි රැස්වීම් සෑම සතියකම පවත්වා තිබුණි. කෙසේ වෙතත් තොග මට්ටම් එනම්, යළි ඇණවුම් මට්ටම, උපරිම මට්ටම, අවම මට්ටම, යළි ඇණවුම් ප්‍රමාණය ආදිය සම්බන්ධයෙන් සෑම ඛනිජතෙල් නිෂ්පාදනයකටම අදාල වාර්තා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පවත්වා නොතිබුණි. ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම ඉදිරිපත් කරන ලද තොග පවත්වා ගැනීමේ වාර්තාව පදනම් කරගෙන පමණක් ඛනිජ තෙල් නිෂ්පාදිත ඇණවුම් කළ යුතු ප්‍රමාණය තීරණය කර තිබුණි. ඛනිජ තෙල් නිෂ්පාදිත තොග පවත්වා ගැනීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු වාර්තාවක් සමාලෝචන කාර්යයන් සඳහා ඉහත කමිටුවට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේවුවද 2010 වර්ෂයේ සිට හඳුන්වාදුන් පරිගණක ගිණුම්කරණ පද්ධතිය හරහා අවශ්‍ය තොග සම්බන්ධ වාර්තාවන් ලබා ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

### 4.2.13 වත්කම් යළිතක්සේරු කිරීම

2012 මාර්තු 16 වන දින කමිටු තීරණ අංක 04/1114 අනුව තක්සේරු දෙපාර්තමේන්තුවට ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමට හා එය මාස තුනක කාලයක් ලබා දීමට සම්පූර්ණ කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.ඒ අනුව පසුව මෙකී කාර්යය සඳහා රු.මිලියන 5.5 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවීමට 2012 මැයි 14 දින තවදුරටත් අනුමැතියක් හිමිවිය.කෙසේනමුත්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

විගණනය සිදුකළ 2018 ඔක්තෝබර් 01 දින වන විටත් ඉඩම හා ගොඩනැගිලි තක්සේරු කිරීම සම්පූර්ණ කර නොතිබිණි.

**4.2.14 දඩ ගෙවීම්**

නැව් තෙල් මෙහෙයුම් කටයුතු උදෙසා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර ගැනීමේ පදනම යටතේ 2002 වසරේ සිට ගෙවිය යුතු ශේෂයක්ව පැවැති රු.57,736,913 ක් රේගු දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. කෙසේ වෙතත් මෙම ගෙවීම 2018 සැප්තැම්බර් 30 දින වන විටත් ප්‍රතිපූරණය කර නොතිබුණි.

**4.2.15 ඉදිරි සුරකුම් ගණුදෙනු**

ක්‍රියාත්මක කරන ලද විගණන පරීක්ෂාවන්ට අනුව, 2007 සිට 2009 දක්වා වූ කාල සීමාව තුල සිදුකරන ලද තෙල් මිලදී ගැනීම් වලට අදාලව සිදුකල ඉදිරි සුරකුම් ගණුදෙනු හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රටට දැරීමට සිදු වූ පාඩුව රු.මිලියන 14,028 කි.තවදුරටත් එ.ජ.ඩො. 8,648,300 ක් අයකරගැනීම වෙනුවෙන් කොමර්ෂල් බැංකුව සංස්ථාවට එරෙහිව නඩු පවරන ලදි.ඊට අමතරව ඉදිරි සුරකුම් ගණුදෙනු සම්බන්ධයෙන් මහජන බැංකුවේ ගිණුම් පොත්වල රු මිලියන 3,847.1 ක් ලැබිය යුතු ලෙස දක්වා තිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**4.3.1 සපුගස්කන්ද පිරිපහදුවේ ක්‍රියාකාරීත්වය**

1969 වර්ෂයේදී ස්ථාපිත, වර්ෂ 47 ක් පැරණි වූ මෙම පිරිපහදුවෙන් රටේ වැඩිවන බණිජතෙල් නිෂ්පාදිත අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී තිබුණු, ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇති සහ එමගින් පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමව උපරිම කිරීමට හැකිවන වෙනත් නවීන ලෝකයේ උසස් තාක්ෂණයන් සහිතව පහළ නිෂ්පාදන තුලින් පෙට්‍රල්, ඩීසල් වැනි ඉහළ වටිනාකම් ඇති නිෂ්පාදන ලබා ගැනීමට හැකි වන පරිදි මෙහෙයුම් කෙරෙන පිරිපහදු සමඟ සැසඳීමේ දී මෙම පිරිපහදුව ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් මෙහෙයුම් සිදු කෙරේ. කෙසේ වුවද, පිරිවැය ඵලදායිතා ආකාරයෙන් බණිජතෙල් නිෂ්පාදිත වෙළඳපොළට සැපයීම තහවුරු කර ගැනීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට මෙතෙක් නොහැකි වී ඇත. මෙම අරමුණ සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනය අවසන් වී ඇති අතර අවශ්‍ය ඉඩම් ප්‍රමාණය (අක්කර 35) අත්පත් කර ගෙන ඇති නමුත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති වීම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

හේතුවෙන් සංස්ථාවට මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී ඇත. පිළි ගෙවුම් කාලය වසර අටකට සහ පිරිවැය එ.ජ.ඩො බිලියන 2.1 කට ඇස්තමේන්තු කර ඇති මෙම ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය එ.ජ.ඩො. මිලියන 1,535 ක් විය හැක.තවදුරටත් එකී අරමුණ සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වශයෙන් දරන ලද රු.මිලියන 1003, 2018 ඔක්තෝබර් 01 වන විටත් ඌන උපයෝජිතව පැවතුණි.

## 4.4 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

### 4.4.1 ලිහිසි තෙල් සම්මිශ්‍රණ බලාගාරයක් ශ්‍රී ලංකාවේ පිහිටු වීම.

සංස්ථාවේ ලාභය වැඩි කරගැනීම හා ශ්‍රී ලංකාව තුළ ඉහළ යන ලිහිසි තෙල් ඉල්ලුමට සැපයුමක් අපේක්ෂාවෙන් සංස්ථාව හයිරැක්ස් ඔයිල් සමාගම(HOSB) සමග 2016 මැයි 06 දින ගොඩනැගීම, මෙහෙයවීම හා පවරා දීම (BOT) පදනම මත අවුරුදු 20 ක කාලසීමාවක් තුළ ක්‍රියාත්මක වන පරිදි ලිහිසි තෙල් සම්මිශ්‍රණ බලාගාරයක් ඉදිකිරීමට ගිවිසුමකට එළඹී තිබුණි.තවද, වෙනම බදු ගිවිසුම හා සැපයුම් ගිවිසුම (HOSB තුළින් නිපැයුම් ලබා ගැනීම සඳහා) සඳහාද එදිනම සංස්ථාව විසින් අත්සන් තබා තිබුණි.2017 දෙසැම්බර් 31 වන විට මෙම බලාගාරයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර තිබුණද 2018 ඔක්තෝබර් 01 වන දින දක්වාම එහි මෙහෙයුම් කටයුතු ආරම්භ වී නොතිබිණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණද කරනු ලැබේ.

(අ) තරගකාරී ආයතනයක් තෝරා ගැනීමේදී, පිළිගත හැකි ප්‍රසම්පාදන පටිපාටියකින් බැහැරව මැලේසියානු හයිරැක්ස් ඔයිල් සමාගම මගින් ලබා දෙන ලද යෝජනාව පමණක් සළකා බලා තිබුණි.

(ආ) ගිවිසුමෙ 2.24 හා 2.25 ඡේද අනුව HOSB විසින් අමු ද්‍රව්‍ය ආනයනය කිරීමේදී හා බලාගාරය තුල ඛනිජ තෙල් ව්‍යුත්පන්න (derivatives) කිරීමේදී , සංස්ථාව අවශ්‍ය නියාමනයන්, රාජ්‍ය අනුමැතිය හා බලපත්‍ර ලබාගත යුතු වේ.නමුත් මෙකී අනුමැතීන් හා බලපත්‍ර 2018 ඔක්තෝබර් 15 දින වන විටත් සංස්ථාව විසින් ලබාගෙන නොතිබිණි.කෙසේ වුවද බලාපොරොත්තු වූ පරිදි ගිවිසුම ක්‍රියාත්මක කිරීමට හා මෙම ව්‍යාපෘතිය තුළින් ප්‍රතිලාභ ලබා ගැනීමට අද දින දක්වාම කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් ගිවිසුම් අත්සන් කිරීමට පෙර යෝග්‍ය ශක්‍යතා අධ්‍යනයක් කර තිබෙද යන්න සහතික කරගැනීමට නොහැකි විය.කිහිපවිටකදීම කෙටුම්පත් කරන ලද ගිවිසුමෙහි වූ

කොන්දේසි පිළිබඳව නීතිපතිගේ අදහස විමසුවද සංස්ථාවේ නීති අංශයෙන් මේ සඳහා නීතිපතිගේ අදහස් සමග අනුකූලතාවයක් ඇතිද යන්න පිළිබඳව අනුමැතියක් ගිවිසුම අත්සන් කිරීමට පෙර ලබාගෙන නොතිබිණි.

**4.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් වත්කම් එම වත්කම් අත්පත්කර ගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි.

(අ) **වනාතමුල්ලේ පිහිටි හල්ගහකුඹුර ඉඩම** - එල්පී ගෑස් ව්‍යාපෘතිය සහ ක්‍රීඩා භූමියක් සඳහා රු.මිලියන 10.6කට මෙම ඉඩම අත්කර ගෙන තිබුණි. එසේ වුවත්, මෙම ඉඩමෙහි 700ක් පමණ නීති විරෝධී පදිංචිකරුවන් (දූර්වාසීන්) විසින් තම අවශ්‍යතා සඳහා යොදාගෙන තිබුණි.

(ආ) **මාහේන ඉඩම** - ලබා ගත හැකි වූ ලියවිලි අනුව, සංස්ථාව විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 0.625ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩම සංස්ථාවේ පොත්වල ගිණුම්ගත කර නොතිබුණි.කෙසේ වුවද 1986 වර්ෂයේ සිට එය පෙර අයිතිකරු විසින් භාවිතා කරමින් පැවතුණි.

(ඇ) **ආයෝජන** - 2017 දෙසැම්බර් 31 දිනට කොටස් වෙළඳ පොළේ ලියාපදිංචි කළ හා ලියාපදිංචි නොකළ සමාගම් හතරක සිදුකර තිබුණු ආයෝජනයෙහි ධාරණ අගය රු. මිලියන 29.54ක් විය. කෙසේ වෙතත් දිගු කාලයක සිට මේවායින් කිසිදු ලාභාංශයක් සංස්ථාවට ලැබී නොතිබුණි.

**4.6. අනෙකුත් ආයතන සඳහා මුදා හරින ලද සම්පත්**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 හා 2004 ජනවාරි 08 දිනැති අංක 21 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ සහ අතිගරු ජනාධිපති නිකුත් කළ පිළිවෙලින් 2006 ජනවාරි 04 දිනැති සී එස් ඒ/පී අයි/40 සහ 2010 මැයි 14 දිනැති අංක සී එස්/1/17/1 දරන ලිපිය මඟින් දක්වා ඇති උපදෙස්වලට පටහැනිව සංස්ථාව විසින් නිලධාරීන් 05 ක් සහ වාහන 01ක් වෙනත් ආයතන වෙත සමාලෝචිත වර්ෂයේ නිදහස් කර තිබුණු අතර සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් නිදහස් කළ කාර්ය මණ්ඩලයට පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා සහ වාහන සඳහා ඉන්ධන හා නඩත්තු වියදම් සඳහා දරා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**4.7 පුහුණුව**

මාගේ පෙර විගණන වාර්තාවල සඳහන් වුවද පුහුණුව සඳහා පුහුණු ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ සංස්ථාවේ සංවර්ධන ක්‍රියාකාරකම් 2018 ඔක්තෝබර් 01 වන දින තෙක් සංස්ථාව විසින් හඳුන්වා දී නොතිබුණි.එම නිසා අවිධිමත් පදනම මත නිලධාරීන් තෝරාගැනීම සහ අනුමතකිරීම් මත දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සිදුකර තිබුණි.ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ (MPRD,2017 මාර්තු 29 දිනැති අංක MPRD/ADM/15/02/40 (Com) දරණ ලිපිය අනුව විදේශ පුහුණු වැඩසටහන් වලට අදාළ ගැටළු කඩිනමින් හඳුනා ගැනීමට සංස්ථා කළමණාකාරිත්වයට උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වුවද කළමණාකාරිත්වය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.8 වෙළෙඳපල කොටස**

ඛනිජ තෙල් කර්මාන්තයේ වෙළෙඳපල ප්‍රමුඛයා ලෙස සංස්ථාව පත්ව සිටින අතර ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් සියයට 86 ක ප්‍රමාණයක් සංස්ථාව මඟින් සපයනු ලබයි.පසුගිය අවුරුදු කිහිපයක කාලය තුළ සංස්ථාවේ විකුණුම් පරිමාව ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි.

**5. තිරසාර සංවර්ධන අරමුණු ළඟාකරගැනීම.**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය"ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයට අදාලව සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ලෙස දිළිඳුකම තුරන්කිරීම, සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම, දැරිය හැකි විශ්වාසනීය, තිරසාර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම, භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය ආදී අරමුණු හඳුනාගෙන තිබුණද ඒ හා සම්බන්ධවන ඉලක්ක,පාදක කරන, බලක්ක ළඟාවිය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර ඉලක්ක වෙත කරා ළඟා වීම සඳහා අවශ්‍ය වන මූල්‍යමය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්ය සාධනය ඇගයීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන් ඇගයීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොපැවැතීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැළසුම් සකස් කිරීම ඉතා මන්දගාමී හෝ දුර්වල තත්ත්වයක පැවැති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

පෙර විගණන වාර්තාවල සඳහන් කළද අභන්තර විගණන අංශයේ පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂයේදිද කටයුතු කර නොතිබුණි. ලැබුණු තොරතුරුවලට අනුව අනුමත සේවක සංඛ්‍යාව වූ තනතුරු 42 අතරින් තනතුරු 09ක් හෝ සියයට 21 ක් 2017 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි.ඒ අතරින් තනතුරු 08 හෝ සියයට 62 ක ජ්‍යේෂ්ඨ නිලධාරී මට්ටම්වල විය.ප්‍රධාන අභන්තර විගණක තනතුර 2016 අගෝස්තු 10 දින සිට පුරප්පාඩුව පැවතුණි.

### 6.2 විගණන කමිටු

සංස්ථාවේ විගණන කමිටු මඟින් ගනු ලබන නිර්දේශයන් වධිමත්ව අධ්‍යක්ෂක මණ්ඩලය සමාලෝචනය කර නොතිබුණි.සංස්ථාවේ අදාල නිලධාරින් විසින් කමිටු විසින් ඉල්ලුම් කරන තොරතුරු සම්පූර්ණවත්, නියමිත කාලයේදිත් ලබා දීමට කටයුතු කර නොතිබුණු අවස්ථාවේ තවදුරටත් නිරීක්ෂණය විය.

### 6.3 ප්‍රසම්පාදනයන් සහ කොන්ත්‍රාත් ක්‍රියාවලි

2012 මාර්තු 22 වන දින, අංක 12/0295/510/003/TRB දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව බනිජ තෙල් මිලදී ගැනීමේදී දිගුකාලීන ණය පහසුකම් සමඟ වාර ගිවිසුම් වලට එළඹීමට හැකි සෑම විටම රේඛීය අමාත්‍යාංශය උත්සහ කළ යුතු අතර එසේ කිරීමට නොහැකි නම් පමණක් සතිපතා පදනමට හදිසි ගිවිසුම් වලට එළඹිය යුතුය.කෙසේ වෙතත් ඉහත තීරණයට පටහැනිව 2017 වර්ෂය තුළදී කොන්ත්‍රාත් 89 න් 43 ක්ම (නැවගත කිරීම්) හදිසි මිලදී ගැනීම් මගින් සිදුකර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**6.4 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන උපකරණයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| ප්‍රධාන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) කාර්යමණ්ඩල පරිපාලනය | බඳවා ගැනීම් පරිපාටිය හා උසස්වීම් අනුමත කර ගැනීමට අපොහොසත් වීම. |
| (ආ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | නියමිත කාලයේදී හිඟහිටි මුදල් එකතු කිරීම තුළින් ගෙවීම් පැහැර හැරීමේ අවදානම අඩු කිරීම සම්බන්ධයෙන් වූ පාලනයන්ගේ දුර්වලතා පැවතීම. |
| (ඇ) ප්‍රසම්පාදනය | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් සමඟ අනුකූල නොවීම. |
| (ඈ) සම්පත් උපයෝජනය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව සම්පත් යොදවා තිබීම. |
| (ඉ) තොරතුරු පද්ධති පාලනය | ප්‍රවර්තන වර්ෂය තුළ පෙර වර්ෂයන් සඳහා SAP පද්ධතිය තුළ ජර්නල් සටහන් කිරීමට නිලධාරීන්ට අවස්ථා පවතින අතර එබැවින්, SAP පද්ධති තුළ අනෙකුත් මොඩියුල සංශෝධනය කිරීමේ හැකියාව විගණනයේදී බැහැර කළ නොහැකි වීම.<br><br>තවද, SAP පද්ධතිය තුල එකම ගනුදෙනුකරු නමින් ගිණුම් කිහිපයක් ඇතුලත් කර තිබුණි. එබැවින්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

හානි සිදු කිරීම හා ණය සීමාවන් ,ණය කාලසීමාව හා අදාළ ණයගැති පාලනයන් අවභාවිත වීමේ හැකියාවක් පැවතීම.

| | |
|---|---|
| (ඊ) SAP ERP පද්ධතිය | (i) සංස්ථාවේ සෘජු මැදිහත්වීමකින් තොරව තෙවන පාර්ශවයකට පද්ධතියේ සියලු ක්‍රියාකාරකම් මෙහෙය වීමට අවස්ථාව ලැබීම.<br>(ii) ප්‍රවර්තන වර්ෂයේ අවසාන දිනට තොග පාලන ගිණුම සහ වත්කම් උප ලෙජරය අතර නිරීක්ෂණය වූ රු.මිලියන 858.9 ක වෙනස සැසඳීමට අපොහොසත් වීම.<br>(iii)උපයෝගීතාවය සහ නඩත්තුව, අත්පත්කරගැනීම හා විකුණුම් හා භෞතික තොග සත්‍යාපනය සහ SAP පද්ධතිය යාවත්කාලීන කිරීම ආදී වත්කම් කළමනාකරණ කටයුතු වලට ලිඛිත කාර්ය පටිපාටියක් හඳුන්වාදීමට අපොහොසත් වීම. |

**එච්.එම්. ගාමිණී විජේසිංහ**

**විගණකාධිපති**

## දස වසරක සාරාංශය

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 යළිප්‍රකාශිත | 2015 යළිප්‍රකාශිත | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **තොග නිෂ්පාදනවල දේශීය අලෙවිය** | | | | | | | | | | |
| (අ) අගය රු. මි. | | | | | | | | | | |
| පෙට්‍රල් | 66,434 | 60,055 | 65,158 | 90,499 | 117,600 | 132,398 | 140,885 | 127,879 | 145,476 | 158,843 |
| ඔටෝ ඩීසල් | 151,070 | 119,046 | 122,360 | 165,800 | 246,441 | 216,420 | 244,407 | 174,984 | 206,545 | 210,814 |
| සුපර් ඩීසල් | 885 | 866 | 1,170 | 1,588 | 3,540 | 4,152 | 5,104 | 5,998 | 8,006 | 9,439 |
| භූමිතෙල් | 14,000 | 9,755 | 10,711 | 12,804 | 18,100 | 16,803 | 15,366 | 9,831 | 8,605 | 9,053 |
| දැවි තෙල් | 66,220 | 33,157 | 35,792 | 49,991 | 84,790 | 60,651 | 70,021 | 34,841 | 52,971 | 80,796 |
| **එකතුව** | **298,609** | **222,879** | **235,191** | **320,682** | **470,471** | **430,424** | **475,783** | **353,533** | **421,603** | **468,948** |
| (ආ) ප්‍රමාණය - මෙට්‍රික් ටොන් දහස් | | | | | | | | | | |
| පෙට්‍රල් | 384 | 416 | 484 | 563 | 619 | 640 | 687 | 838 | 965 | 1,057 |
| ඔටෝ ඩීසල් | 1,371 | 1,427 | 1,422 | 1,849 | 1,930 | 1,559 | 1,757 | 1,579 | 1,875 | 1,920 |
| සුපර් ඩීසල් | 7 | 9 | 11 | 14 | 22 | 25 | 31 | 47 | 63 | 75 |
| භූමිතෙල් | 151 | 151 | 165 | 147 | 143 | 126 | 122 | 130 | 138 | 160 |
| දැවි තෙල් | 995 | 1,096 | 1,004 | 1,093 | 1,187 | 668 | 722 | 512 | 626 | 781 |
| **එකතුව** | **2,908** | **3,099** | **3,086** | **3,666** | **3,901** | **3,018** | **3,319** | **3,106** | **3,667** | **3,993** |
| (ආ) බනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර අලෙවි මිල | | | | | | | | | | |
| (දෙසැ. 31 දිනට කොළඹ ලීටරයකට මිල) | | | | | | | | | | |
| පෙට්‍රල් - ඔක්ටේන් 92 | 120 | 115 | 115 | 125 | 159 | 162 | 150 | 117 | 117 | 117 |
| ඔටෝ ඩීසල් | 70 | 73 | 73 | 76 | 115 | 121 | 111 | 95 | 95 | 95 |
| සුපර් ඩීසල් | 85.3 | 88.3 | 88.3 | 98.3 | 142 | 145 | 133 | 110 | 110 | 110 |
| භූමිතෙල් | 50 | 51 | 51 | 61 | 106 | 106 | 81 | 49 | 44 | 44 |
| දැවි තෙල් 800" | 33.9 | 34.9 | 40 | 52.2 | 92.2 | 92.2 | 92.2 | 80 | 80 | 80 |
| දැවි තෙල් 1500" | 31.7 | 32.7 | 40 | 50 | 65 | 90 | 90 | 80 | 80 | 80 |
| දැවි තෙල් 3500" | 25 | 26 | 40 | 50 | 65 | 90 | 90 | 80 | - | |
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | | | | | | | | |
| ආදායම | 341,670 | 237,663 | 256,329 | 356,442 | 512,910 | 490,381 | 525,182 | 376,734 | 423,061 | 446,502 |
| අලෙවි පිරිවැය | -334,849 | -232,271 | -269,316 | -420,227 | -540,439 | -464,374 | -499,956 | -337,119 | -326,441 | -418,961 |
| දළ ආන්තිකය | 6,821 | 5,392 | -12,987 | -63,785 | -27,529 | 26,007 | 25,226 | 39,615 | 96,620 | 27,541 |
| ශුද්ධ මෙහෙයුම් වියදම් හා පොලී | -21,557 | -16,745 | -13,936 | -30,572 | -62,041 | -33,897 | -24,532 | -55,637 | -27,067 | -24,174 |
| හෙජින් වියදම් | | | | | -7,612 | | | -3,864 | | |
| බදුවලට පෙර ලාභය/(අලාභය) | -14,736 | -11,353 | -26,923 | -94,357 | -97,182 | -7,890 | 694 | -19,886 | 69,553 | 3,367 |

| **රු. මි** | **2008** | **2009** | **2010** | **2011** | **2012** | **2013** | **2014** | **2015** | **2016** | **2017** |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්කන්ධ සහ වගකීම් | | | | | | | | | | |
| ප්‍රාග්ධනය | 1,000 | 1,000 | 1,000 | 3,500 | 3,500 | 3,500 | 3,500 | 28,487 | 28,487 | 28,487 |
| සංචිත | -2,416 | -14,038 | -38,369 | -134,736 | -232,045 | -239,967 | -236,791 | -257,472 | -214,334 | -203,541 |
| L / T වගකීම් | 10,908 | 32,779 | 28,478 | 27,646 | 1,998 | 1,351 | 703 | 342 | 266 | 190 |
| පාරිතෝෂිත පතිපාදන | 567 | 735 | 746 | 626 | 547 | 538 | 664 | 861 | 754 | 1708 |
| **එකතුව** | **10,059** | **20,476** | **8,145** | **-102,964** | **-226,000** | **- 234,578** | **-231,924** | **-227,782** | **-184,827** | **-173,546** |
| **නියෝජනය කළේ** | | | | | | | | | | |
| WIP ඇතුළු ස්ථාවර නැත්පතු | 4,624 | 5,041 | 8,280 | 8,850 | 9,599 | 13,136 | 13,676 | 13,915 | 13,547 | 23,649 |
| ආයෝජන | 2,542 | 2,542 | 2,542 | 5,042 | 5,058 | 5,044 | 14,942 | 41,725 | 40,595 | 34,874 |
| ශුද්ධ ජංගම වත්කම් | 2,893 | 12,893 | -18,967 | -116,856 | -240,657 | (252,758 | -260,542 | -283,422 | -238,969 | -231,680 |
| **එකතුව** | **10,059** | **20,476** | **-8,145** | **-102,964** | **-226,000** | **-234,578** | **-231,924** | **-227,782** | **-184,827** | **-173,157** |
| **සාරංශගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | | | | | | | | | |
| මෙහෙයුම් කටයුතුවලින් ලද (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය | -1,228 | 41,840 | -24,169 | -102,756 | -68,408 | -13,920 | -1,817 | 9,247 | 54,532 | -25,094 |
| ආයෝජන කටයුතුවලින් ලද (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය | 41 | -309 | -3,376 | -644 | 1,148 | -7,547 | -1,826 | -23,385 | -6,010 | 33,590 |
| මූල්‍ය කටයුතුවලින් ලද (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය | -1,001 | -21,340 | -4,379 | 119,017 | 62,540 | 7,232 | 28,745 | 41,036 | -81,200 | -14,080 |
| මුදල් හා මුදල් සමාන කිරීම් සඳහා ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | -2,188 | 20,191 | -31,924 | 15,617 | -4,720 | -14,235 | 25,102 | 26,897 | -32,678 | -5,584 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | 9,961 | 7,772 | 27,963 | -3,961 | 11,656 | 6,936 | -7,299 | 17,803 | 44,700 | 12,022 |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ | 7,772 | 27,963 | -3,961 | 11,656 | 6,936 | -7,299 | 17,803 | 44,700 | 12,022 | 6,438 |
| **ගිණුම්කරණ අනුපාතික** | | | | | | | | | | |
| **ලාභදායිතා අනුපාතික** | | | | | | | | | | |
| දළ ලාභ අනුපාතිකය | 2.00% | 2.30% | -5.10% | -17.90% | -5.40% | 5.30% | 4.80% | 10.50% | 22.80% | 6.18% |
| ශුද්ධ ලාභ අනුපාතිකය | -4.40% | -4.90% | -10.50% | -26.50% | -18.90% | -1.60% | 0.00% | -5.30% | 16.40% | 0.33% |
| **මෙහෙයුම් අනුපාතික** | | | | | | | | | | |
| ආදායමට පිරිවැය අනුපාතිකය | 102.60% | 102.70% | 109.40% | 121.80% | 108.90% | 97.80% | 97.70% | 93.00% | 80.90% | 98.14% |
| තොග විකුණුම් අනුපාතිකය | 9.34 | 8.13 | 8.04 | 10.7 | 10.89 | 7.3 | 7.77 | 6.44 | 8.53 | 9.48 |
| පොළී ආවරණය | -3.66 | -1.39 | -2.93 | -9.48 | -3.88 | 0.57 | 1.05 | -0.32 | 7.1 | 1.32 |
| **ද්‍රවශීලතා අනුපාතිකය** | | | | | | | | | | |
| ජංගම වත්කම් අනුපාතිකය | 0.98 | 1.06 | 0.82 | 0.58 | 0.43 | 0.39 | 0.34 | 0.31 | 0.34 | 0.39 |
| ක්ෂණික වත්කම් අනුපාතිකය | 0.69 | 0.86 | 0.57 | 0.45 | 0.28 | 0.24 | 0.19 | 0.21 | 0.24 | 0.27 |

## සමාප්ති සටහන

විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුවද, විසල් අරමුණක් සහිතව ක්‍රියාත්මක වන මෙම ක්ෂේත්‍රය තුළ රැඳෙමින්, ගෝලීය අර්බුද හමුවේ ව්‍යාපාර වටපිටාව අතිශයින් අවිනිශ්චිත සහ අස්ථාවර තත්වයකට පත් වෙමින් තිබියදී සහන සපයමින් ශ්‍රී ලාංකේය ජනතාවට සේවය සැපයීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පූර්ණ වශයෙන් කැපවී සිටියි. කුමක් සිදු වූවද අපගේ දේශයට ජවබලය සපයන්නට අපි නිබඳව ඔබ සමඟ රැඳී සිටින්නෙමු.

